


# සංක්‍රාන්තික යුක්තියේ අභියෝගය


13 වැනි වෙළුම 01 වැනි කලාපය
2016 මාර්තු - අප්‍රේල්
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශනයකි


ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු / නීතිඥ එස්. ජී. පුංචිහේවා / මහාචාර්ය ජයන්ත සෙනෙවිරත්න / නීතිඥ භවානි ෆොන්සේකා / නීතිඥ හොවාර්ඩ් වාර්නි / විජායි කේ. නාගරාජා
කථිකාචාර්ය ගල්කන්දේ ධම්මානන්ද හිමි / මහාචාර්ය කුමාර් ඩේවිඩ් / නීතිඥ ඒ. සුමන්දිරන් / යෝගේස්වරන් පියතුමා / ඇමති මනෝ ගනේෂන් / ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන
ඇමති මංගල සමරවීර / හිල්මී අහමඩ් / ඩියු ගුණසේකර / ටිල්වින් සිල්වා / වේලුපිල්ලේ කුහනේන්ද්‍රන් / මහාචාර්ය එස් පද්මනාදන් / ආණ්ඩුකාර ඔස්ටින් ප්‍රනාන්දු / රුවන්දි වක්වැල්ල


සංස්කරණය : ලයනල් ගුරුගේ

# පුරවැසියා වෙබ් අඩවිය

## පුරවැසි ජනජීවිතයට අදාළ,

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළු සියලුම නීති, අණපනත් සහ රෙගුලාසි
- පුරවැසියාට අදාළ ඉහළ අධිකරණයෙන් විනිශ්චිත නඩු තීන්දු සහ අනෙකුත් වැදගත් නඩු තීන්දු
- රාජ්‍ය හා පොදු ආයතනයන්හි ආකෘති පත්‍ර
- පුරවැසි ක්‍රියාකාරීත්වයේ නවීන තොරතුරු
- මූලික අයිතිවාසිකම්, යුතුකම් හා වගකීම්
- පුරවැසි ක්‍රියාකාරීත්වයෙන් ලබාගත් ජයග්‍රහණ පිළිබඳ විස්තර
- පුරවැසි සභා - පිළිබඳ තොරතුරු

---

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුව ත්‍රෛභාෂාවෙන්
පුරවැසියා වෙනුවෙන්ම

**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**

වෙතින්

**www.citizenslanka.org**

---



සාම විමර්ශී

සංස්කරණය **ලයනල් ගුරුගේ**

ISSN 955-1800-0061

13 වැනි වෙළුම 01 වැනි කලාපය 2016 මාර්තු - අප්‍රේල්

දුරකථනය 94-1-2370801/4
ෆැක්ස් 94-1-2370802
ඊ-මේල් cpa@cpalanka.org
වෙබ් www.cpalanka.org

# මේ තීරණාත්මක මොහොත

යුක්තිය, සාධාරණත්වය, සංහිඳියාව සහ ජාතික එක්සත්කම යනු නිතර අසන්නට කියවන්නට ලැබෙන මාතෘකා ය. මේ සම්බන්ධයෙන් සාඩම්බරයෙන් ඉදිරිපත් කෙරෙන වාක්‍යාලංකාර සහ ප්‍රායෝගික තත්ත්වය අතර ඇත්තේ විශාල පරතරයකි. සාමයේ නාමයෙන් සුදු පරෙවියන් මුදා හරින්නෝ ම තවත් විටෙක වෛරයේ සහ විෂමකොට සැලකීමේ ගිනි පුළිඟු දල්වති.

යුද්ධය නිමා වී වසර 6ක් ඉක්මවන විට ද නැවත යුද්ධයක් ඇතිවීම වළක්වා ගැනීමේ දිගු කාලීන හා කෙටිකාලීන පියවර නොගැනීමේ ප්‍රතිවිපාක අපට පෙනේ. බිහිසුණු යුද්ධයක් අවසන් වීමෙන් පසුව එළඹෙන සංක්‍රාන්තික සමය යනු සුවිශාල අවස්ථාවකි. මන්ද යත් සිදු වූ බිහිසුණු ක්‍රියාදාමය දෙස ආපසු හැරී බලා සමාලෝචනය කර අගතියට පත් සියලු පාර්ශ්වවලට උපරිම වශයෙන් සාධාරණය ඉෂ්ට කිරීම ම සංහිඳියා මනසක් ගොඩනැගීමේ පළමු පියවර වන හෙයිනි. මේ සම්බන්ධයෙන් පසුගිය දශක කිහිපයෙහි රටවල් ගණනාවක් ඇසුරෙන් ලද සාධනීය අත්දැකීම් තිබේ. එම අත්දැකීම්වල වටිනාකම් අපේ ගැටළු විසඳාගැනීමට පාදක කරගත යුතු ය.

නව ජනාධිපතිවරයකු හා නව ආණ්ඩුවක් ජනතාව විසින් පත් කරගනු ලැබීමෙන් අනතුරුව සංහිඳියා පිළිවෙතක් ඔස්සේ සංක්‍රාන්තිය යුක්තිය ඉෂ්ට කර ගැනීම පිළිබඳ නව බලාපොරොත්තු ඇති විය. එහෙත් සුපුරුදු පරිදි ඇතැම් පිරිස් ජාතිවාදය හා ආගම්වාදය අඩයාළමක් කර ගන්නා දේශපාලන අවස්ථාවාදය අනුව කටයුතු කරයි. නව ව්‍යවස්ථා සම්පාදනය සම්බන්ධයෙන් ඇති වී තිබෙන මතභේදාකාර තත්ත්වය ද එබඳු ය.

මෙහි දී වැදගත් වන්නේ ඇති කරගත් අධිෂ්ඨානය පසුබෑමකට ලක් වන්නට ඉඩ නොදී මනුෂ්‍යත්වයේ නාමයෙන් සංක්‍රාන්තික යුක්තිය ඉෂ්ට කිරීමේ ක්‍රියාදාමය ශක්තිමත් කිරීම ය. එසේ නොකර අවස්ථාවාදී දේශපාලනයේ ගිනි පිඹීම්වලින් බියට පත් ව පසුබෑවහොත් අනාගතයේ දී යළි විනාශකාරී අන්තයකට සමාජය තල්ලු වීම නොවැළැක්විය හැක්කකි. ●

විවිධ සහාය **මහින්ද රත්නායක, ළහිරු කිතලගම**

පරිගණක අක්ෂර / පිට කවරය / පිටු සැලසුම **වාක්‍යා රූ දු.ඇ. 011-2708377** මුද්‍රණය **ග්ලෝබ් ප්‍රින්ටින් වර්ක්ස් දු.ඇ. 0777-315971**

"සාම විමර්ශී" යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සාම හා ගැටුම් විශ්ලේෂණ ඒකකයේ සහ ප්‍රජා සහභාගිත්ව ඒකකයේ ප්‍රකාශනයකි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතු ව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොටගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක ව විමර්ශනයට භාජනය කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැප වී සිටී.

"සාම විමර්ශී" ප්‍රකාශනය, ශ්‍රී ලංකාවේ ගැටුම් විසඳා ගැනීමට බෙහෙවින් අදාළ වන ප්‍රශ්න පිළිබඳ ව, අපගේ සාම හා ගැටුම් විශ්ලේෂණ වැඩසටහන හා පොදු මහජනතාව ද අතර අන්තර් ක්‍රියාකාරීත්වයක් ඇතිකරවීමේ එක් මගකි. මෙහි අන්තර්ගත අදහස් මගින් අවශ්‍යයෙන් ම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ හෝ එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ අදහස් පිළිබිඹු නො වේ.

වැඩිදුරට විස්තර සඳහා පහත සඳහන් ලිපිනයෙන් විමසන්න.

සංස්කාරක, "සාම විමර්ශී"
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 24/2, 28 වෙනි පටුමග, මල් පාර, කොළඹ 07, ශ්‍රී ලංකාව.
දුරකථනය 94-11-2565304/06 ෆැක්ස් 94-11-4714460 ඊ-මේල් cpa@cpalanka.org වෙබ් www.cpalanka.org

# පටුන


**අරමුණ සාර්ථක කරගැනීම සඳහා ආණ්ඩුව එඩිතර විය යුතුයි** 3
ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු

**සංක්‍රාන්තික යුක්තිය** 7
නීතිඥ එස්. ජී. පුංචිහේවා

**බෙදුණු අතීතයකින් හවුල්කාර අනාගතයකට** 12
මහාචාර්ය ජයන්ත සෙනෙවිරත්න

**ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති යුක්තිය: වත්මන් අවස්ථා අත්පත් කර ගැනීම** 18
නීතිඥ භවානි ෆොන්සේකා

**ආණ්ඩුව වගවීමෙන් තබා ගැනීමේ වගකීම සිවිල් සමාජය සතුයි** 23
නීතිඥ හොවාර්ඩ් වාර්නි

**ආර්ථික සාධාරණත්වය, සංක්‍රාන්ති යුක්තියට අදාළ නැද්ද?** 27
විජායි කේ. නාගරාජා

**ගැටුමෙන් හානියට පත් නොවූ කෙනෙක් සොයාගන්නට බෑ** 34
කථිකාචාර්ය ගල්කන්දේ ධම්මානන්ද හිමි

**ජන විඥානය දියුණු කළ නොහැකි නම් අසාර්ථකයි** 40
මහාචාර්ය කුමාර් ඩේවිඩ්

**තීරණාත්මක පියවරයන් කීපයක් ගත්තත් රජයේ කටයුතු මන්දගාමියි** 46
නීතිඥ වී. සුමන්දිරන්

**සංක්‍රාන්ති යුක්තිය හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම** 51
යෝගේස්වරන් පියතුමා

**යුක්තිය ඉටුකිරීමෙන් සහජීවනය ගොඩනැගිය හැකියි** 55
අමාත්‍ය මනෝ ගනේෂන්

**ජාතික සංහිඳියාවක් ඇති කිරීමේ බලය මට ලබාදුන්නේ මැතිවරණයෙන්** 63
ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන

**පියවරෙන් පියවර අපි ඉදිරියට යන්නෙමු** 69
අමාත්‍ය මංගල සමරවීර

**වාර්ගික පදනමට වඩා වැදගත් වන්නේ ශ්‍රී ලාංකික පදනමයි** 73
හිල්මි අහමඩ්

**යුක්තිය ඉටුකිරීමට අවශ්‍ය නිර්දේශ එල්.එල්.ආර්.සී. වාර්තාවේ තියෙනවා** 75
ඩියු ගුණසේකර


**විග්නේෂ්වරන්ලාත් මහින්ද කල්ලියත් ජාතිවාදය අඩයාලමක් කරගෙන** 79
ටිල්වින් සිල්වා

**සංක්‍රාන්තික යුක්තිය ක්‍රියාවලියට සිවිල් සමාජයෙන් ලැබෙන බලපෑම මදි** 83
වේලුපිල්ලේ කුහනේන්ද්‍රන් / මහාචාර්ය එස්. පද්මනාදන්

**මහජන සහභාගිත්වය ප්‍රමාණවත් නෑ** 86
ආණ්ඩුකාර ඔස්ටින් ප්‍රනාන්දු

**සංක්‍රාන්තික යුක්තිය ඉටු කිරීමට තවමත් ප්‍රමාද නැත !** 91
ලයනල් ගුරුගේ

**නිහඬ වින්දිතයෝ: ස්ත්‍රීන් සහ සංක්‍රාන්ති යුක්තිය** 95
රුවෙන්දි වක්වැල්ල




ශ්‍රී ලංකාව තුළ 2016 වර්ෂය දක්වාම සිදු වූ අතුරුදහන් වීම්, ඝාතනය කිරීම්, ස්ත්‍රී දූෂණ, ළමා අපචාර, ඉඩම් ආරවුල් සඳහා නීතිය ක්‍රියාත්මක වන්නේද වරදකරුවන්ට දඬුවම් ලැබුණේද යන්න කතිකාවතට බඳුන් විය යුතුය. ප්‍රධාන දේශපාලන පක්ෂයන්ගේ බලය මත මෙවැනි ගැටලු සඳහා විසඳුම් සොයන යුගයක අසාධාරණයට ලක් වූ ජීවිත ජන මාධ්‍ය හරහා ප්‍රචාරණය වනුයේ දින දසුනකට යෙදූ ඡායාරූපයක් ලෙස පමණක් වීම කණගාටුදායකය.

වසරින් වසර නව දින දර්ශන මුද්‍රණය වීම සාමාන්‍ය සිදුවීමක් වන අතර පවතින දේශපාලන පක්ෂ මගින් තම බලය යොදාගෙන සත්‍යය වසන් කිරීමද සාමාන්‍ය කරුණකි. මෙය සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාවට පොදු වූ ගැටළුවක් වන අතර නව දින දර්ශනයක් විලාප දී කෑ ගසත්. දින දසුනේ මාර්තු 24 වන ජාත්‍යන්තර සත්‍ය දැනගැනීමේ දිනය විශේෂ කර මුද්‍රණය කර ඒ දිනය සැමරීමට හැකි වන සත්‍ය සමාජ අවකාශයක් නිර්මාණය වන තුරු බලා සිටීම බලාපොරොත්තුව වී තිබේ.

චිත්‍රය - **දිමුතු වන්නිආරච්චි**

# අරමුණ සාර්ථක කරගැනීම සඳහා ආණ්ඩුව එඩිතර විය යුතුයි



**ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු**
විධායක අධ්‍යක්ෂ
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

සංක්‍රාන්තික යුක්තිය සංහිඳියාවෙහි අත්‍යාවශ්‍ය අංගයක් වන බැවින් ශ්‍රී ලංකාවේ රජය සංක්‍රාන්තික යුක්තිය කෙරෙහි කැපවන බවට ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍ය මංගල සමරවීර මහතා 2015 සැප්තැම්බර් මස පැවති එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ සැසිවාරයේ දී පැහැදිලි ලෙස ම ප්‍රකාශ කොට සිටියේ ය. එබැවින් නඩු පැවරීම් පිළිබඳව කටයුතු කිරීම සඳහා විශේෂ නීතිඥ කාර්යාලයක්, එවැනි නඩු විභාග කිරීම සඳහා විශේෂ අධිකරණයක්, සත්‍ය සෙවීමේ කොමිසමක්, හානිපූරණ හා වන්දි ගෙවීම් සඳහා කාර්යාලයක් හා අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳව වූ කාර්යාලයක් යනාදී අංගවලින් සමන්විත වන යුක්ති යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම පිළිබඳව ශ්‍රී ලංකාවේ රජය සලකා



උතුරේ ජනතාවට ඉඩම් ඔප්පු ලබාදුන් අවස්ථාවක්....

www.colombotelegraph.com

බලමින් සිටින බව ද ඔහු විසින් එහි දී ප්‍රකාශයට පත් කරන ලදි. මෙම යාන්ත්‍රණයන් යුක්තිය සහ වගවීම, සත්‍යය, නැවත සිදු නොවීම සහ හානිපූරණයන් ආදී වශයෙන් වූ සංහිඳියාව දරා සිටින්නා වූ ආධාරකයන් හා අනුරූපී වේ. මෙසේ විදේශ අමාත්‍යවරයා විසින් දෙන ලද ප්‍රතිඥාවන් සැසිවාරයේ දී ශ්‍රී ලංකා රජයේ ද සම අනුග්‍රහයෙන් ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකාව පිළිබඳ එකඟතා යෝජනාව මගින් ද පිළිබිඹු විය. මෙම යෝජනාවත් සමගම මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයාගේ කාර්යාලයේ අනුග්‍රහයෙන් සැකසුණු ශ්‍රී ලංකාව පිළිබඳව වූ වාර්තාව ද නිකුත් කරනු ලැබූ අතර එමගින් ශ්‍රී ලංකා රජයේ හමුදා සහ එල්ටීටීඊය යන දෙපාර්ශ්වයම විසින් සිදු කරන ලද යුද අපරාධ සහ මානුෂවාදී නීතිය උල්ලංඝනය කිරීම් පිළිබඳව වූ සාක්ෂි පවතින බවට නිගමනය කර තිබිණි.

මේ සියල්ල ක්‍රියාවට නගමින් ශ්‍රී ලංකාවේ රජය අග්‍රාමාත්‍ය ක්‍රියාකාරී කණ්ඩායමක් ද ඒ යටතේ වූ අමාත්‍ය කාර්ය කණ්ඩායමක් ද ස්ථාපිත කරනු ලැබූ අතර සංහිඳියා යාන්ත්‍රණයන් පිළිබඳව මත විමසීමේ ලේකම් කාර්යාලයක් ද පිහිටුවනු ලැබිණි. අග්‍රාමාත්‍යවරයාගේ කාර්යාලය විසින් සංහිඳියා යාන්ත්‍රණයන් පිළිබඳ කාර්ය සාධක බලකායක් ද පත් කරනු ලැබූ අතර සංහිඳියා යාන්ත්‍රණයන් පිළිබඳව රට පුරා ම මහජන මත විමසීම් සිදු කිරීමට එයට බලය පැවරී ඇත. කාර්ය සාධක බලකාය සාමාජිකයින් එකොළොස් දෙනෙකුගෙන් සමන්විත සිවිල් සමාජ ව්‍යූහයක් වන අතර මෙම ලියුම්කරු එහි ලේකම්වරයා වෙයි. මෙය හැකි තරම් දුරට සියලු දෙනා ඇතුළත් කර ගන්නා ක්‍රියාදාමයක් බවට පත් වීම සහතික කරනු පිණිස එය විශේෂඥයන්ගෙන් මෙන් ම රටපුරා විසුරුණු නියෝජිතයන්ගෙන් ද උපදෙස් ලබා ගනී. කාර්ය සාධක බලකාය විසින් මත විමසීම් සිදු කිරීම සඳහා කලාපීය කාර්ය සාධක බලකායන් හඳුනාගනු ලබනු ඇති අතර එම මත විමසීම් නගර ශාලා ශෛලියේ මහජන රැස්වීම් සහ කේන්ද්‍රීය කණ්ඩායම් (Focus Group)

> මේ සියල්ල ක්‍රියාවට නගමින් ශ්‍රී ලංකාවේ රජය අග්‍රාමාත්‍ය ක්‍රියාකාරී කණ්ඩායමක් ද ඒ යටතේ වූ අමාත්‍ය කාර්ය කණ්ඩායමක් ද ස්ථාපිත කරනු ලැබූ අතර සංහිඳියා යාන්ත්‍රණයන් පිළිබඳව තොරතුරු විමසීමේ ලේකම් කාර්යාලයක් ද පිහිටුවනු ලැබිණි.

සාකච්ඡාවලින් සමන්විත වනු ඇත. ප්‍රධාන පරදු පාර්ශ්වයන්ගේ මත විමසීම් ජාතික මට්ටමෙහි දී ද සිදුවනු ඇත. උතුරේ සහ නැගෙනහිර දිස්ත්‍රික් මට්ටමින් මත විමසීම් පැවත්වෙනු ඇති අතර රටේ සෙසු පළාත්වල එය සිදුවනු ඇත්තේ පළාත් මට්ටමෙනි. කාර්ය සාධක බලකායේ වාර්තාව ප්‍රකාශයට පත් කරනු ඇති අතර බලකාය වෙත කරනු ලබන කරුණු ඉදිරිපත් කිරීම් තැපැල් මගින්, එහි වෙබ් අඩවිය වෙත සහ ඊමේල් මගින් ද සිදු කරනු ලැබිය හැකි ය.

අවධාරනාත්මකව කිව යුතු කරුණක් වන්නේ මෙම කාර්ය සාධක බලකාය විභාග කිරීමේ හෝ විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවක් නොවන බව ය. එහි එකම නිල පැවරුම වන්නේ සංක්‍රාන්තික යුක්තිය සඳහා වූ යාන්ත්‍රණයන් සකස් විය යුතු ආකාරය පිළිබඳව වූ මහජන මතයන් නිශ්චිත ලෙස දැන ගැනීම සහ දන්වා සිටීමයි. කාර්ය සාධක බලකාය වෙත දුක්ගැනවිලි ප්‍රකාශ කිරීම සහ පුද්ගලික අත්දැකීම් විස්තර කිරීම වැළැක්වීමක් සිදු නොවනු ඇති නමුත් බලකායේ විශේෂ උනන්දුව යොමු වනු ඇත්තේ සංහිඳියාව සඳහා වන යාන්ත්‍රණයන් සහ ඒවා සකස් විය යුතු ආකාරය පිළිබඳව වූ මහජන මතයන් සහ උපදෙස් වෙත ය.

සංක්‍රාන්තික යුක්තිය පිළිබඳව වන ශ්‍රී ලාංකීය රජයෙහි අවංකභාවය සහ කැපවීම පිළිබඳව සැකයක් නොමැත. නමුත් සංක්‍රාන්තික යුක්තිය සහ ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ දී එහි අවශ්‍යතාවය පිළිබඳව ජනමතය දැනුවත් කිරීමෙහි ලා ඔවුන් නායකත්වය ගත යුතු වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයන්හි වේගය, ප්‍රගතිය සහ අන්තර්ගතය මෙන්ම ආර්ථිකයෙහි "සියල්ල යහපත්-සාධකය" හෝ එය නොමැති වීම මගින් මෙම තත්ත්වය වඩාත් සංකීර්ණ කරනු ලැබිය හැකි ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පවත්වනු ලැබූ මහජන මත සමීක්ෂණයන් මගින් දැනුමෙහි පවත්නා විශාල හිඩැස් දක්වනු ලැබ ඇත. සංක්‍රාන්තික යුක්තිය පිළිබඳව නියැලි සහ දැනුමැති අයගේ මේ පිළිබඳව වූ අත්දැකීම් එම තත්ත්වය තහවුරු කරනවාටත් වඩා අසතුටුදායක මට්ටමකට වන බව කිව යුතු වේ. මෙම තත්ත්වය බහුතර ජනවර්ගය තුළ විශේෂයෙන් ම දක්නට ලැබෙන්නකි. ශ්‍රී ලාංකීය රජය මෙය සිදු නොකරන්නේ නම් මෙම සමස්ත උත්සාහය ම දැනුවත් බවින් තොර එකක් වනවා මෙන් ම සැබෑ සුජාතභාවයකින් ද තොර වූවක් වනු ඇත. වැඩිදුරටත් එමගින් ජනවාර්ගික බෙදීමෙහි පරාසය හා ගැඹුර කදිමට එළිදරව් කරනු ලබනු ඇත. එහි දී විශාල ලෙස වෙනස් වූ මතයන් මෙන් ම රටේ වෙනත් ප්‍රදේශ හා සසඳන කල උතුරේ සහභාගිත්වය යනාදිය පැහැදිලි වනු ඇත. ප්‍රතිඵලය කුමක් වුව ද රටෙහි සෑම ප්‍රදේශයක ම පුරවැසියන් මත විමසුම් ක්‍රියාදාමය සමග සම්බන්ධව කටයුතු කිරීම වැදගත් වේ. එම සම්බන්ධතාවය ක්‍රියාදාමයෙහි බලාපොරොත්තුව, අරමුණ හා සැලසුම යනාදිය පිළිබඳව විවේචනාත්මක වීම වුව ද කම් නැත. එය විශාල ලෙස වර්ජනය කිරීමක්, රටේ කුමන ප්‍රදේශයක සිදු වුව ද, ජාතියේ එක්ව බැඳුණු බව පෝෂණය කිරීම අරමුණු කොටගත් උත්සාහයනට එය පහරක් ම වනු ඇත. එමෙන් ම එය අවසන් වනු ඇත්තේ අහිමි වූ තවත් අවස්ථාවක් ලෙස ය.

ප්‍රධාන අර්බුදකාරී ගැටලු දිගින් දිගට ම පවතින අතර එමගින් උග්‍ර වූ හැඟීම් සහ ක්‍රියාදාමය වෙත වූ ප්‍රතිරෝධය ආකර්ශනය කර ගැනීම අනිවාර්ය වනු ඇත. පළමුව ගත්කල රාජපක්ෂ රෙජීමයේ ආධාරකරුවන් දැඩි ලෙස කියා සිටින්නේ මෙම උත්සාහයේ අරමුණ රණවිරුවන් යුද අපරාධකරුවන් බවට පත් කිරීම මිස අනෙකක්

වැදගත් කරුණ වන්නේ එය කළ යුතු බව මෙන්ම කළ හැකි බව ය. එය අසුරු සැණින් කළ යුත්තක් නොවිය යුතුවා මෙන් ම සංකීර්ණ ගැටගැසුණු වංගුවලින් පිරි මාවතක් හා දිග්ගැස්සුණු ක්‍රියාදාමයක් වීම ද සිදු නොවිය යුත්තකි.




තමන්ගේ අයිතිය ඉල්ලා උද්ඝෝෂණයක යෙදෙන උතුරේ ජනතාව.....

srilankabrief.org

නොවන බව ය. එසේ කරනු ලබන්නේ දෙමළ ඩයස්පෝරාව විසින් මැතිවරණ යාන්ත්‍රණයේ ග්‍රහණයට හසු කරගනු ලැබ ඇති බටහිර රටවල ආණ්ඩුවල පෙළඹවීම මතය යනුවෙන් ද ඔවුහු කියා සිටිති. ඒ අනුවම විශේෂ අධිකරණයක සිදුවන කුමන හෝ ජාත්‍යන්තර නියෝජනයක්, පොදු සමාවක් පිළිබඳව වූ යම් විශේෂ උනන්දුවක් හා ඇතැම් විට සිදුවිය හැකි යම් සීමිත නඩු පැවරීම් සංඛ්‍යාවක් වෙත ද වන ඔවුන්ගේ විරෝධය ද පෙළගැසී පවතී. මෙය රාජපක්ෂ ආධාරකරුවන්ටම සීමාවූවක් නොවන අතර බහුතර ජනවර්ගය අතර පුළුල්ව පැතිර පවත්නා තත්ත්වයක් වෙයි.

එබැවින් සංහිඳියාව සහ අර්ථාන්විත ජාතික ඒකාබද්ධ බවක් සඳහා සංක්‍රාන්තික යුක්තිය සතුව ඇති කේන්ද්‍රීය භූමිකාව සැලකිල්ලට ගෙන ශ්‍රී ලාංකීය රජය විසින් කළ යුතුව ඇත්තේ එම අරමුණ සාර්ථක කරවීම පිණිස එඩිතර ලෙස සටන් කිරීම ය. එහි දී ඉහත සඳහන් කරන ලද විරෝධයන් සමග මුහුණට මුහුණ ලා ගැටීමට රජයට සිදුවනු ඇත. විශේෂයෙන් ම මෙම ක්‍රියාදාමයෙහි අරමුණ ඇතැමුන් විසින් සිදු කරන ලද එදිරිවාදිකම් පිළිබඳව වූ චෝදනාවන්ගෙන් සන්නද්ධ හමුදාවන්ගේ ගෞරවය මුදාගෙන ආරක්ෂා කරගැනීම නොව හමුදා ධුරාවලීන් යුද අපරාධ අධිකරණයක් හමුවට ඇදගෙන යාමක් ම වන බවට වූ විකෘති චෝදනාව සමග මෙසේ ගැටීමට රජයට සිදුවනු ඇත. එසේ කොට රටට එය අවශ්‍යම බව තමන් දැඩි ලෙසම විශ්වාස කරන බව පැහැදිලිව හා හඬනගා කියා සිටින්නට රජය කටයුතු කළ යුතු ය. මෙම ක්‍රියාදාමය මානව හිමිකම් කවුන්සිලයෙහි කාලසටහනට බැඳ තැබීම ද නොකළ යුත්තක් වෙයි. වැදගත් කරුණ වන්නේ එය කළ යුතුබව මෙන්ම කළ හැකි බව ය. එය අසුරු සැණින් කළ යුත්තක් නොවිය යුතුවා මෙන් ම සංකීර්ණ ගැටගැසුණු වංගුවලින් පිරි මාවතක් හා දිග්ගැස්සුණු ක්‍රියාදාමයක් වීම ද සිදු නොවිය යුත්තකි. මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයා විසින් ශ්‍රී ලංකාව පිළිබඳව වූ යෝජනාව සම්බන්ධයෙන් මේ වසරේ ජූනි මාසයේ දී කවුන්සිලය ඉදිරියේ වාචික වාර්තාවක් ඉදිරිපත් කළ යුතුව ඇති අතර 2017 වසරේ මාර්තු මස දී අවසන් සවිස්තර වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.

සංක්‍රාන්තික යුක්තිය - සත්‍යයට ඇති අයිතිය, යුක්තිය සහ වගවීම, හානිපූරණයන් සහ යුද අපරාධ සහ ජාත්‍යන්තර මානුෂවාදී නීති උල්ලංඝනයන් ඇතුළු ඇදහිය නොහැකි තරම් නරක වූ මානව හිමිකම් උල්ලංඝනයන් ජනනය කරන්නා වූ ගැටුමෙහි මූලයන් නැවත ජනනය නොවීම - 2015 ජනවාරියෙහි දී කළඑළියට පැමිණි නව ශ්‍රී ලංකාව මුහුණ දිය යුතුවන, පැවැත්ම හෝ නොපැවැත්ම තීරණය කරන්නාවූ පරීක්ෂණයයි. එය අප අප හටම සිදුවන්නට ඉඩහැරී දෙය පිළිගැනීම පිළිබඳව වූවක් වෙයි; එය වසර තිහක් පුරාම වාගේ පැවති එම දුෂ්ඨ යුද්ධයෙහි දී අප එකිනෙකාට එරෙහිව භාවිත කළ සහ පෝෂණය කළ රිදවීම, හානි කිරීම සහ වෛරය පිළිබඳව වූවක් වෙයි. එම සත්‍යය පිළිගැනීමට ඒවාට පිළියම් කිරීම ඇරඹීමට සහ ඒ අනුව ඉදිරියට යාමට තරම් අප නිර්භීත, අවංක සහ පරිණත වූවන් ද?

බොහෝ දේ මෙය මත රඳා පවතී.



මෙම මූර්තියෙන් දැක්වෙන්නේ ලංකාවේ කාන්තාවන්ට විරුද්ධව සිදුවන අපරාධ පිළිබඳව නීතිය ක්‍රියාත්මක නොවීම සම්බන්ධවයි. නීති අංශයේ තිබෙන අක්‍රමිකතා, කාන්තාවන්ට විරුද්ධව සිදුවන ක්‍රියාවන් ආදිය මෙම මූර්තිය හැදීමට පදනම් විය. කාන්තාවන්ට යුක්තිය ලබාදීමට හෝ කිසිම අයුරකින් දේශපාලන විසඳුමක් හෝ වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් හෝ ගෙන නැත. එය සනාථ කිරීමට කාන්තාව නිර්වස්ත්‍රව සිටී. යකඩ කම්බියක් තුළින් පෙන්වීමට අදහස් කරන්නේ මෙවැනි ක්‍රියා කරන්නන්ව යකඩ අත් වලින් සිර කළ යුතුය යන බවයි. මේ බව ඊළඟ පරපුරද දැනගත යුතුයි.

මූර්තිය - **සර්මලා ෂන්ද්‍රදාසන්**

# සංක්‍රාන්තික යුක්තිය

'සංක්‍රාන්තික යුක්තිය' යන සිංහල වචන දෙක 'transitional justice' යන ඉංග්‍රීසි වචන දෙකේ ඍජු පරිවර්තනයකි. එහෙයින් ඊට ඇත්තේ පදගත පරිවර්තනයක අර්ථය විනා, රටවල් 25 ක පමණ භාවිතයෙන් ඊට ගැබ්වී ඇති සංස්කෘතික අර්ථය නොවේ. සංහිඳියාවට පෙරමග, දියුණු මනුෂ්‍යත්වයක් භාවිතයෙන් වෙනස් සමාජ පැවැත්මකට ප්‍රවේශවීම යන අරුත් එහි ගැබ්ව තිබේ. ශ්‍රී ලංකාවේදී නම්, 2009 දී ප්‍රභාකරන් මිය ගිය බව අසා උත්සවාකාරයෙන් කිරි බත් කෑ මිනිසා අද වන විට වෙනස් වී ඇතැයි යන පණිවුඩය ද එහි තිබිය යුතු ය.



නීතිඥ
**එස්. ජී. පුංචිහේවා**

එහෙත් අපේ රටේ සංහිඳියාවට පෙරමඟ භාවිත කිරීම හෙවත් අනෙක් ජාතීන්ට හිංසාකාරීවීම ගැන හෙවත් හිංසාකාරී වීමේ අදහස් දැරීම ගැන පසුතැවිල්ලක් දක්නට නැත. කොටින් කියතොත් අසවල් දහම අදහන බව ප්‍රසිද්ධ කරන ක්‍රියාවන්හි යෙදෙන මුත්, දයා කරුණා තෙතමනයක් හෝ මිත්‍රශීලි ගුණයක් හෝ දක්වන්නේ ටික දෙනෙකි. ඒ ටික දෙනා අනාගත සාමකාමී ශ්‍රී ලංකාවට ආශිර්වාදයකි. එහෙත් එවැනි සාමකාමී වටපිටාවකට සියලු මිනිසුන්ගේ සූදානමක් අවශ්‍යය. ඊට අවශ්‍ය මෙසේ විමසා සොයා බලන මිනිසුන් ය. එනම්, ''අම්මේ ඔබේ පුතුන් නැතිවුණා ද ? අක්කේ ඔබේ සැමියා මිය ගියා ද? දුවේ, පුතේ ඔබේ පියාත් මවත් දෙදෙනාම නැද්ද ? සැබැවින් ම සිදු වූ විපත ගැන අපට දුකයි'' ඊට මෙසේ ප්‍රතිචාර දක්වන මිනිසුන් ද සිටිය යුතු ය. එනම්, ''ඉතින් වුණ දේ වුණා ඉවරයි. අප ආයෙම තව දුරටත් කා කොටා ගත්තොත් ඉතිරි ව සිටින දරුවන්ටත් අනාගත දරුවන්ටත් රටක් නැති වේවි. අපි තරහා මරහා අමතක කර දමමු. තවත් එබඳු විපත්තියක්

picssr.com



අතුරුදහන් වූ තම සැමියා සොයන බිරිඳක්.....

සංහිඳියාවට පෙරමග, දියුණු මනුෂ්‍යත්වයක් භාවිතයෙන් වෙනස් සමාජ පැවැත්මකට ප්‍රවේශවීම යන අරුත් එහි ගැබ්ව තිබේ. ශ්‍රී ලංකාවේදී නම්, 2009 දී ප්‍රභාකරන් මිය ගිය බව අසා උත්සවාකාරයෙන් කිරි බත් කෑ මිනිසා අද වන විට වෙනස් වී ඇතැයි යන පණිවුඩය ද එහි තිබිය යුතු ය.

සිදු නොවන රටක් අපි හදමු'' මේ ටික වචනවලින් නොකියැවුණත්, සියලු උත්සාහයන්හි පැවතුණොත් රටට අලුත් ආලෝකයක් ද බලාපොරොත්තු නොවූ වාසනාවක් ද වන්නේ ය.

''සංක්‍රාන්තික යුක්තිය'' යන මානව අයිතිවාසිකම් භාෂාවෙන් කියන්නේ ඒ ටිකමය. එය භාවිතයට එන විට නෛතික හා සංස්කෘතික නියමයන් සමඟ එන චර්යා ධර්ම සමූහයක් වෙයි. ඒවා පොත් පත්වල පළ වූ විට දැනෙන්නේ ශාස්ත්‍රීය ප්‍රකාශන ලෙස මිස මනුෂ්‍යත්වයේ ප්‍රසාද සංග්‍රහයක් ලෙස නොවේ. එසේ වුව ද අපට එම ප්‍රවේශය ලබා ගැනීම සඳහා එම ලෝක අත්දැකීම් සමූහය දැනගත යුතු ය.

## "සංක්‍රාන්තික යුක්තිය" යනු කුමක් ද?'

කැරලි කෝලාහල, සිවිල් යුද්ධ ආදිය පැවතී එය කවරාකාරයකින් හෝ නැවතුණු පසු යළිත් එවැනි තත්වයක් ඇති නොවීම සඳහා නීතියේ ආධිපත්‍ය පිහිටුවීමට යෙදෙන එක්සත් ජාතීන්ගේ වැඩ පිළිවෙළකි. එහිදී, අතීතයේ නීතිය අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධ වගකීම ගැනීම, ඒ අනුව යුක්තිය පිහිටුවීම, ප්‍රතිසන්ධානය හෙවත් සංහිඳියාව ලබා ගැනීම සිදු වෙයි.

එය ලැබීම උදෙසා ජාතික ප්‍රයන්තයන් සමඟ බොහෝ ක්‍රියාකාරකම් සිදුවිය යුතු ය. ඊට අධිකරණ මෙන් ම අධිකරණ නොවන ක්‍රියාමාර්ග ඇතුළත් වේ. පුළුල් ජාතික සංවාද, සත්‍යය සෙවීම්, නඩු පැවරීම්, හානි පූරණය කිරීමේ වැඩ සටහන් සහ එම කටයුතු අනලස්ව කරන ආයතනික ප්‍රතිසංස්කරණ ද සිදු විය යුතු ය.

ඉහත කී සියලු ක්‍රියාමාර්ගයන්හි මූලික ඉලක්කය විය යුත්තේ හානියට, පිඩාවට පත් වූ ජනතාවන්ය. එය සිංහල, දෙමළ, මුස්ලිම් හෝ වෙනත් අය විය හැකි ය. සත්‍ය තොරතුරු සෙවීමේ දී ස්ත්‍රීන් හා ළමයින්ගෙන් ඒවා ලබා ගැනිම අනිවාර්ය විය යුතු අතර ඒ සඳහා ක්‍රමවේදයක් සකස් විය යුතු ය.

මේ ක්‍රියාමාර්ග හෙවත් 'සංක්‍රාන්තික යුක්තියෙහි' මූලික පදනම වන්නේ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සහ ඒ යටතේ ඇති වූ අන්තර් ජාතික මානව අයිතිවාසිකම් නීති කීපයකි. ඒ මෙසේ ය.

- අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීති
- අන්තර්ජාතික මානුෂවාදී නීති
- අන්තර්ජාතික අපරාධ නීති
- සරණාගතයන් පිළිබඳ අන්තර්ජාතික නීතිය

මෙම අන්තර්ජාතික නීති නිසි පරිදි පිළිපැදීමෙන් එම රටේ වැරදි කරන හෙවත් එම නීති උල්ලංඝනය කිරීමෙන් හානි සිදු වන්නේ එසේ කරන අයට මිස පොදු ජනතාවට නොවේ. පොදු ජනතාවට එයින් අයිතිවාසිකම් කීපයක් ලැබෙනු ඇත. එම අයිතිවාසිකම් කඩකරන නිලධරයන් සහ පාලකයන් වගකීමට බැඳී ඇත්තේ එ.ජා. ගිවිසුම් වලිනි. එම ගිවිසුම් වලින් ජනතාවට ලැබී ඇති අයිතිවාසිකම් මෙසේ ය.

- යුක්තියේ අයිතිවාසිකම
- සත්‍යයේ අයිතිවාසිකම
- හානියට වන්දි ලැබීමේ අයිතිවාසිකම
- උල්ලංඝනයන් නැවත ඇති නොවන බවට සහතිකයක් ලැබීමේ අයිතිවාසිකම.

## සංක්‍රාන්තික යුක්තිය ඉටුවන ක්‍රියාමාර්ග මොනවා ද?

පුළුල් ජනමත විමසීමක් අත්‍යවශ්‍ය ය. මතුපිට අදහස් නොව ගැඹුරු මානුෂික අදහස් ලබා ගැනීම ද ඊට තොරතුරු ලබාදීම ද වැදගත් වේ. ඒ සඳහා වැඩ මුළු සම්මේලන, ජනතා රැස්වීම්, සම්මන්ත්‍රණ, සාකච්ඡා, ප්‍රමාණාත්මක ගවේෂණ, දත්ත රැස් කිරීම් ආදිය, සංවිධාන කළ යුතු ය. මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මඟින් පුළුල් අවබෝධයක් ඇති කළ හැකි ය. එහෙත් එය අරමුණට හානි නොවන සංවිධානාත්මක එකක් විය යුතු අතර, නාට්‍ය සිද්ධි ආදිය ද ඇතුළත් විය හැකි ය.

අදහස් ලබා ගැනීමේ දී අතීතියේ අන්තර් ජාතික නීති උල්ලංඝනයන්ට ගොදුරු වී ඉතිරි වී සිටින අය, සිද්ධි ඇසූ දුටු අය ස්ත්‍රීන්, ළමයින්, සරණාගතයින්, විදේශගත වූවන්, අවතැන් වූවන්, සිවිල් හා ආගමික නායකයින්, මාධ්‍ය, වෘත්තීය සමිති, මානව අයිතිවාසිකම් සංවිධාන, දේශපාලන ක්‍රියාකාරිකයින්, වෘත්තීය වේදීන්, ව්‍යාපාර සංවිධාන, අතීත සටන් කරුවන්, ආදීන්ගෙන් තොරතුරු ලබාගත යුතු ය. ඊට අනවශ්‍ය හා හානිකර ප්‍රචාරයන් ලබා නොදිය යුතු ය. වාර්තාකරණය සත්‍ය හා සාධාරණ විය යුතු ය. අපේ රටේ මාධ්‍ය සංස්කෘතිය පවතින්නේ පහත් තත්වයක ය. සත්‍ය හා සාධාරණ වාර්තාකරණයක් වෙනුවට ඇත්තේ දේශපාලන වාසි උදෙසා සත්‍ය විනාශ කිරීමකි. විශේෂයෙන් පෞද්ගලික මාධ්‍යවලට ඕනෑම ජාතික ව්‍යාපාරයකට හානි කළ හැකි ය.

සත්‍ය සෙවීමේ කාර්යය උදෙසා, සත්‍ය කොමිෂන් සභා, පරීක්ෂණ කොමිෂන් සභා, තොරතුරු කොමිෂන් සභා පිහිටු විය හැකිය. එමගින් සොයන්නේ මොනවා ද? අතීතයේ විවිධ ජන කොටස්වලට



www.tamilnet.com

එල්.එල්.ආර්.සී. කොමිසමේ සාමාජිකයන් සාක්ෂි විමසන අවස්ථාවක්

**අපේ රටේ සංහිඳියාවට පෙරමඟ භාවිත කිරීම හෙවත් අනෙක් ජාතීන්ට හිංසාකාරීවීම ගැන හෙවත් හිංසාකාරී වීමේ අදහස් දැරීම ගැන පසුතැවිල්ලක් දක්නට නැත කොටින් කියතොත් අසවල් දහම අදහන බව ප්‍රසිද්ධ කරන ක්‍රියාවන්හි යෙදෙන මුත්, දයා කරුණා තෙතමනයක් හෝ මිත්‍රශීලි ගුණයක් හෝ දක්වන්නේ ටික දෙනෙකි. ඒ ටික දෙනා අනාගත සාමකාමී ශ්‍රී ලංකාවට ආශිර්වාදයකි.**

සිදු වූ හානි, ප්‍රචණ්ඩ ක්‍රියාවන්ගේ ප්‍රතිඵල, විනාශකාරී සිදුවීම්, එම සිදුවීම් පිටුපස ඇති ජාතිවාදී දේශපාලන ප්‍රචණ්ඩ ක්‍රියා මෙන් ම තනිකර යුදමය කටයුතු වෙන්කොට ගත යුතු ය. යුද්ධ නීති අනුව සිදු කළ යුද ක්‍රියා ගැන කිසිම පාර්ශ්වයක් වග කිව යුතු නැත. එහෙත් එම නීති ඉක්මවා විනාශකාරී ක්‍රියා කිරීම් ගැන සත්‍ය සෙවීම අවශ්‍ය වන්නේ ඊට සෑම පාර්ශ්වයක් ම වගකිව යුතු නිසා ය. එසේ ම සත්‍ය දැන ගැනීමේ අයිතිවාසිකමට ගරු කළ යුතු නිසා ය.

## සංක්‍රාන්ති අවස්ථාව

යුද්ධයෙන් සියලු පාර්ශ්වයන් උගතයුතු පාඩම වන්නේ යළිත් එවැනි අවස්ථාවක් ඇති නොවීමට වග බලා ගැනීම ය. එම වග වීම ආරම්භ වන්නේ විපතට පත් වූ ජනතාවන් කෙරෙහි විවිධාකරාවලින් මැදිහත් වීමෙනි. ද්‍රව්‍යමය උපකාර, සංකේතාත්මක වාසි, යාථා තත්වයට පත්කිරීම, මුදලින් වන්දි ගෙවීම, පුනරුත්ථාපනය, වෛද්‍ය හා මනෝ විද්‍යා සේවාවන් ලාබාදීම, සෞඛ්‍ය ආධ්‍යාපන ආධාර, දේපළ ආපසු පවරාදීම, හානි පූරණය, නිල වශයෙන් සමාව අයැදීම, කෞතුකාගාර තැනීම, සිහි කිරීමේ අවස්ථා ඇති කිරීම ආදීය ඊට අයත් වේ. දැනටමත් ආණ්ඩුව මෙයින් සමහර ක්‍රියා පටන්ගෙන පවත්වාගෙන යෑම යළි යුද්ධයක් ඇති නොවීම සඳහා අවශ්‍ය ක්‍රියාවකි. එහෙත් එය සම්පූර්ණ හා කඩිනම් විය යුතු ය. මේ සියලු ක්‍රියාවන්හිදී විපතට පත් මිනිසුන්ගේ සහභාගිත්වය මූලික වේ. එහිදී ස්ත්‍රීන්ගේ හා ළමයින්ගේ සහභාගිත්වය අත්‍යවශ්‍යය.

උග්‍රතම උල්ලංඝනයන් කළ අයට එරෙහිව අන්තර්ජාතික මානුෂවාදී හිතවාදී නීති සහ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය අනුව ඔප්පු වන්නේ නම් ඔවුන්ට වර්ගය හෝ තරාතිර ම නොබලා දඬුවම් කිරීම ද සංක්‍රාන්තික යුක්තියේ කොටසකි. එහිදී සාධාරණ නඩු ක්‍රියා පටිපාටියකට අවශ්‍ය අන්තර්ජාතික ප්‍රමිති පිළිපැදිය යුතු ය. නඩු තීන්දු අනුගමනය කළ යුතු ය.

දේශීය වශයෙන් එම ක්‍රියාමාර්ග වැඩි දියුණු කිරීම අවශ්‍ය වන්නේ අප රටේ කලින් ඒ පිළිබඳ අත්දැකීම් නැති නිසාය. ජාතික පරීක්ෂණ කිරීමේ හැකියාව නඩු දැමීමේ කාර්යක්ෂමතාව ඒ සඳහා අවශ්‍ය ය. ස්වාධීන අපක්ෂපාත විනිසුරු මඩුල්ලක් මෙන් ම ප්‍රමාණවත් සාක්ෂ්‍ය තිබීම, නඩු ගොනු කිරීම, විපතට පත් වූවන් ආරක්ෂා කිරීම ආදිය අවශ්‍යය. මෙබඳු කරුණුවලදී අන්තර් ජාතික සහාය අවශ්‍ය වනු ඇත. දෙමුහුන් අපරාධ අධිකරණය අවශ්‍ය වන්නේද එවැනි අවස්ථාවකදී ය.

මේ ක්‍රියාපටිපාටිය සාර්ථක කිරීමට නම් ආණ්ඩුවේ සියලු ආයතන ප්‍රතිසංස්කරණය කළ යුතු ය. හේතු දෙකක් ඇත. එකක් නම් මේ ක්‍රියා පටිපාටියට අවශ්‍ය සහාය දීමට මෙතෙක් පුරුද්දක් නැති නිසා අලුත් පුරුද්දක් ලබාගත යුතු වීම ය. අනික, අනාගත සාමය, මානව හිමිකම් ආරක්ෂා කළ යුතු අතර මානව අයිතිවාසිකම් සංස්කෘතියක් ගොඩ නැගීමට හුරු පුරුදු විය යුතුය. විශේෂයෙන් අනාගතයේ මානව අයිතිවාසිකම් කඩ නොකරන ආයතන බවට පත් වියයුතු ය. වරදින් නිදොස් කිරීමේ ප්‍රතිපත්තියක් කිසිම ආයතනයක නොතිබිය යුතු ය. ඒ සම්බන්ධ අන්තර් ජාතික ප්‍රතිපත්ති පිළිපැදීම ගැන සියලු ආණ්ඩුවේ ආයතන දැනුවත් විය යුතු ය. ආණ්ඩුවේ නිලධරයින්, අධිකරණයේ නිලධරයින්, ආරක්ෂක අංශ විශේෂයෙන්

මෙම පරිවර්තනය පහසු කරන තත්වයට පැමිණිය යුතු ය.

එක්සත් ජාතීන්ගේ සංවිධානය මේ කටයුතු රටවල් 25 ක පමණ කිරීමෙන් අති විශාල පළ පුරුද්දක් ලබාගෙන ඇත. එහිදී අසවල් රටට අසාධාරණයක් කළ බවට තවම චෝදනාවක් නැත.  ඒ හෙයින් ඒ සම්බන්ධයෙන් නීති උපදෙස්, පර්යේෂණ සහාය, කාර්ය සැලසුම් හා විවිධ ක්‍රියා පටිපාටි ගැන අත්දැකීම් බහුලව ඇත්තේ ද එ.ජා. මානව අයිතිවාසිකම් කොමිසමට ය. මෙහිදී අපට සියල්ල කරගත හැකි යැයි හිත උදුම්මා ගැනීම මෝඩකම ප්‍රදර්ශනය කිරීමකි. සාම ක්‍රියාමාර්ග උදෙසා මානව අයිතිවාසිකම් විශේෂඥ උපදෙස් ලබා ගැනීම එම කාර්යය නිවැරදිව කිරීමට අවශ්‍යය.

සත්‍ය කොමිසම් මාර්ගයෙන් සැගවී ගිය තොරතුරු විශාල ප්‍රමාණයක් සොයා ගැනිණ. ගෝතමාලා, දකුණු අප්‍රිකාව, පේරු, කෙන්යා, ලයිබීරියා, මොරොක්කෝ, සියරා ලියෝන්, ටිමෝර් යන රටවල සත්‍ය කොමිසම් වලින් අවශ්‍ය නිවැරදි තොරතුරු සොයා ගැනිණ. එම කොමිසම්වල ස්ත්‍රී සාමාජිකයෝ සිටියහ. ස්ත්‍රී දූෂණ, ළමා හිංසා පිළිබඳ තොරතුරු ලබා ගැනීමෙන් අදාළ නිලධරයන්ට සාධාරණ දඬුවම් නියම කළ හැකි විය. එවැනි දේ යළිත් සිදු නොවීමටත් , යුක්තියේ කොටසක් වශයෙනුත් උග්‍ර උල්ලංඝනයන්ට දඬුවම් කිරීම අත්‍යවශ්‍යය.


මේ අතරම අමතක කිරීමේ සංකල්පයට ද තැනක් තිබිය යුතුය. අමතක කළ හැකි සමහර වැරදි අමතක කිරීමද කළ හැක්කේ උග්‍ර වැරදිවලට දඬුවම් කිරීමෙනි. එහෙත් එසේ කිරීමට නම් සමාජය සංස්කෘතික වශයෙන් යම් දියුණුවක් ලබා තිබිය යුතු ය. ''අපේ මිනිසුන්'' නිසා වරදින් නිදොස් විය යුතු ය යන ආකල්පය තිබෙන තුරු අප එම මානව ශිෂ්ටාචාරයෙන් ඈතය.

ප්‍රතිසන්ධානය - සංහිඳියාව යනු යුක්තියට වඩා ඉහළින් තිබෙන මානව ගුණාංගයකි. සියලු ආගම්වල ප්‍රකාශිත පදනම එයයි. එහෙත් භාවිත පදනමේ ගැටලු පවතින්නේ ද යුක්තියට - මානව යුක්තියට අවශ්‍ය චර්යාව දුර්ලභ නිසා ය. යුක්තිය නැතිව සංහිඳියාවක් ඇති විය නොහැකි ය.

සමහරු සිංහල ජාතියට, බුද්ධාගමට සාධාරණය ඉටු කිරීමට පෙනී සිටින බව කියති. එහෙත් මිනිසා වෙනුවෙන් යුක්තිය ඉටු නොකරන්නාට දහමක් තිබිය නොහැකි ය. ආගමක් තිබිය හැකි ය. එවිට ඉස්මතු කෙරෙන්නේ ජාතිවාදය නැතිනම් ආගම්වාදය යි. එමගින් සිදු වන්නේ එම ජාතියේ හෝ ආගමේය කියමින් එහි එල්බ සිටින අයගේ සහය ලබාගැනීමේ දේශපාලනයයි. සිංහල ජාතිය යනු යුක්තිය පිටුදැකිය යුතු ජාතියක් නම් එය ඉක්මනින් වඳ වී යයි. බුද්ධාගම යනු අන්‍යයන් හෙළා තළා නැගී සිටින දහමක් ද? එසේ අදහස් කිරීම ම දහමට පටහැනි ය.

මේ අවස්ථාව වන විට ලෝකයා අප කෙරෙහි යම් ප්‍රසාදයක් පළ කොට ඇත. ඒ යම් යුක්තිමය භාවිතයක් අප මතු පිටින් පෙන් වූ නිසා ය. එහෙත් අප රට තුළ - එනම් අභ්‍යන්තරයේ එය අපට තිබේ ද? මනුෂ්‍ය සන්තානය ඒ තත්වයට වෙනස්වීමට පටන්ගෙන ඇත් ද? ඒ සඳහා යම් දේශපාලන වටා පිටාවක් ගොඩනැගී ඇතත්, සංස්කෘතික ආවේශයක් තිබේ ද?

මේ අතරම අමතක කිරීමේ සංකල්පයට ද තැනක් තිබිය යුතුය. අමතක කළ හැකි සමහර වැරදි අමතක කිරීමද කළ හැක්කේ උග්‍ර වැරදි වලට දඬුවම් කිරීමෙනි. එහෙත් එසේ කිරීමට නම් සමාජය සංස්කෘතික වශයෙන් යම් දියුණුවක් ලබා තිබිය යුතු ය. ''අපේ මිනිසුන්'' නිසා වරදින් නිදොස් විය යුතු ය යන ආකල්පය තිබෙන තුරු අප එම මානව ශිෂ්ටාචාරයෙන් ඈතය.



මම මගේ චිත්‍රය 'සැඟවීම' ලෙස නම් කරමි. අප ජීවත් වන සමාජය අන්තගාමී ආගමික වියරුවකින් වෙලී ඇති බව මට දැනෙයි. එම ආගම් සියල්ලම සුදු වර්ණයෙන් වැසී ඇත. එහෙත් එම සුදු වර්ණය තුළම සැඟව ගිය ශාන්ත බවේ පිහි තුඩු අපට බිහිසුණු අනාගතයක පෙරනිමිති පෙන්වා දෙයි.

චිත්‍රය : **කලනි මේනකා විල්සන්**

# බෙදුණු අතීතයකින් හවුල්කාර අනාගතයකට



මහාචාර්ය
**ජයන්ත සෙනෙවිරත්න**

ප්‍රතිසංවිධානය යන්නෙහි සරල අරුත ගතහොත් එය යළි සමඟවීම නැත්නම් යළි මිත්‍රවීම යන තේරුම ගනී. නමුත් එය ඊට වඩා බරපතල කාරණාවකි. මක් නිසාද යත් දීර්ඝ කාලයක් තිස්සේ පැවැති විනාශකාරී යුද්ධයකින් පසු සැමට ගරුත්වය (Diginity for all) යටතේ සමාජය යළි ඒකාබද්ධ කිරීම සරල දෙයක් නොවේ. තුවාල වූ සිත් සුවපත් කිරීම සහ සතුරු බවින් සහ වෛරී බවින් ජනතාව මුදාගැනීම සඳහා ක්‍රමික වැඩ පිළිවෙලක් අවශ්‍යය. ප්‍රතිසංවිධානයේ ගැඹුරු අර්ථය වනාහි අන්‍යෝන්‍ය වශයෙන් සහකම්පිත සමාජයක් කරා යන ගමනට මුල පිරීමකි. එසේම දේශපාලන වශයෙන් හවුල්කාර අනාගතයකට පදනම සකස් කිරීමකි.

ගැටුම විපර්වර්තනය නැමති සන්දර්භයේ ප්‍රතිසන්ධානය සාකච්ඡාවට ගැනෙන්නේ සංක්‍රාන්තීය යුක්තිය නැමති මූලධර්මය යටතේ දී ය. එහි තේරුම වනාහි යුද භීෂණය අවසන්වීමත් සමඟ සමාජය යහපත් අතට මාරුවෙමින් තිබෙන අවස්ථාවක ඉටුකළ යුතු යුක්තියයි. අතීතයේ සිදුවූ මානව විරෝධී ක්‍රියාකාරකම්, නැතහොත්



www.bbc.co.uk

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන තමා ඝාතනයට තැත් කළ එල්ටීටීඊ සාමාජිකයාට සමාව දුන් අවස්ථාව

උල්ලංඝනයන් ඇතොත් ඒවා විභාග කිරීම සඳහා ගන්නා අධිකරණ සහ අධිකරණ නොවන ක්‍රියාමාර්ග මගින් වින්දිතයන්ට සහන ලබාදීම එහි ප්‍රධාන කටයුත්තයි. ඒ අනුව සංක්‍රාන්තික යුක්තිය සමයේ ක්‍රියාකාරකම් රාශියක් දැකිය හැකිය. ඒවා නම් අධිකරණ නඩු විභාග, සත්‍ය සෙවීමේ කොමිෂන් සභාවල ක්‍රියාකාරිත්වය, වරද නිවැරදි කරගැනීම, සමාව ගැනීම, සමාව දීම, ආයතනික සහ දේශපාලන ප්‍රතිසංස්කරණ, ප්‍රසිද්ධ ස්මාරක පිහිටුවීම යනාදිය වේ. ඒ අනුව ගත් විට සංක්‍රාන්තික යුක්තිය ප්‍රධාන අවදි 3ක් කෙරෙහි අවධානය යොමුකරන බව පෙනේ.

අතීතයට අදාළව ගතහොත් අතීතයේ කුමක් සිදුවුණා ද? සහ එහි සත්‍ය හෙළිදරව් කරගැනීම එහි පළමු වැන්නයි. දෙවැන්න වර්තමානයට අදාළ වන යුක්තිය ඉටුකරවීමට දැන් කුමක් කළ යුත්තේ ද? යන්න වන අතර යළි එවන් ප්‍රචණ්ඩ ගැටුමක් හෝ යුද්ධයක් ඇති නොවන තැනට වගබලා ගන්නේ කෙසේ ද? යන්නට අදාළවන සමාජ විපරිවර්තන ක්‍රියාවලිය තුන්වැන්න වේ.

සාමාන්‍යයෙන් සංක්‍රාන්තික යුක්තියේ ප්‍රවේශ දෙකක් පවතී. එහි පළමු වැන්න ලිබරල් දේශපාලන ප්‍රවේශයයි. දෙවැන්න වනාහි ආගමික ප්‍රවේශය යි. දේශපාලන ප්‍රවේශය ගත් කල ලිබරල් මානව අයිතිවාසිකම් ප්‍රවේශය ලෙස එය අර්ථ ගැන්වේ. එහිද කොටස් දෙකක් දැකිය හැක. එනම්

1 මානව අයිතිවාසිකම් උල්ලංඝනය කළ චූදිතයන් හට දඬුවම් පැමිණවීම මගින් වින්දිතයින්ගේ පලිගැනීමේ සිතට සහනය ලබාදීමයි. මනුෂ්‍යත්වයට එරෙහිව සිදුකළ අපරාධ, යුද අපරාධ හා වෙනත් මානව අයිතිවාසිකම් උල්ලංඝනයන් විභාග කිරීම සඳහා පහත දැක්වෙන අධිකරණ ක්‍රියාමාර්ග එම ප්‍රවේශය මගින් ලබාගැනීමට බලාපොරොත්තු වේ.

**1.1 ජාත්‍යන්තර අධිකරණ නඩු විභාග**

**1.2 ජාත්‍යන්තර අපරාධ අධිකරණ**

යුගෝස්ලාවියාව. රුවන්ඩා, කොංගෝ සියරාලියෝන්, උගන්ඩා වැනි රටවල සිද්ධීන් විභාග කිරීම වැනි ක්‍රියා මාර්ග මෙයට උදාහරණ ය.

**1.3 වින්දිතයින් හට වන්දි ලබාදීමේ ක්‍රියාමාර්ගය**

2 සත්‍ය සෙවීමේ කොමිෂන් සභා පිහිටුවීම මගින් සත්‍යය හෙළදරව් කරගැනීම. ක්‍රමික හෝ අක්‍රමික ලෙස සිදුකරන ලද අපරාධ විභාගකොට වර්තාවක් සැපයීම.

එසේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය විමට හේතු වූ කරුණු තේරුම් ගැනීමට

ඒ මගින් අවස්ථාව උදාකර ගැනීම හා ආයතනික සහ රාජ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතුවලට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම ආදි වශයෙන් එය පැහැදිළි කළ හැක.

ශ්‍රී ලංකාව ගත් විට යුද්ධයේ වින්දිත පාර්ශ්වය සහ ජාත්‍යාන්තර ප්‍රජාව උත්සාහ ගන්නේ මෙම ලිබරල් මානව අයිතිවාසිකම් ප්‍රවේශය මත දේශීය වශයෙන් හෝ ජාත්‍යන්තර වශයෙන් හෝ විශ්වාසනීය විභාග කිරීමකට එකඟකරවා ගැනිම ය. මෙවැනි ක්‍රියාමාර්ගයක් උදෙසා එල්. එල්. ආර්. සී. වාර්තාවේ ද දේශීය වශයෙන් එවැනි සොයා බැලීමක් කළ යුතු බව සඳහන් වේ.

අතීතයේ සිදුවූ මානව විරෝධී ක්‍රියාකාරකම්, නැතහොත් උල්ලංඝනයන් ඇතොත් ඒවා විභාග කිරීම සඳහා ගන්නා අධිකරණ සහ අධිකරණ නොවන ක්‍රියාමාර්ග මගින් වින්දිතයන්ට සහන ලබදීම එහි ප්‍රධාන කටයුත්තයි. ඒ අනුව සංක්‍රාන්තික යුක්තිය සමයේ ක්‍රියාකාරකම් රාශියක් දැකිය හැකිය.

## වින්දිතයා හා චූදිතයා

සංක්‍රාන්තීය යුක්තියේ දෙවැනි ප්‍රවේශය වන්නේ ආගමික ප්‍රවේශයයි. මෙය තනිකරම ප්‍රතිසන්ධානය මත රඳාපවතින්නකි. එහි දී චූදිතයා තමන් කළ වරද ගැන පාපොච්චාරණයක් කොට පසුතැවිල්ලට බඳුන්වීම සඳහා අවශ්‍ය මානසික පසුබිම සකස්කර ගන්නේ ය. අධිකරණ ක්‍රියාවලියක් මගින් දඬුවම් පැමිණවීමේ හෝ පලිගැනීමේ ක්‍රියාවලියක් මෙහි අඩංගු නොවේ. වින්දිතයා විසින් චූදිතයාට සමාව දීම දක්වා ම මෙම ක්‍රියාවලිය දිග හැරේ. අනිකාගේ දුක සහ වේදනාව සහානුභූතික අන්දමින්, නැතහොත් තමන්ට සිදුවූ දෙයක් ලෙස දැන්වීම ඒ මගින් සිදු කෙරෙන්නේ ය. මේ ප්‍රවේශයන් දෙක වඩාත් තේරුම් ගැනීම සඳහා සංසන්දනයක් අපි අවධානය යොමු කරමු.

දේශපාලන ප්‍රවේශය නැතහොත් ලිබරල් මානව අයිතිවාසිකම් ප්‍රවේශය මගින් මානව අයිතිවාසිකම් රැකීම සඳහා ඒවා උල්ලංඝනය කළවුනට දැඩි දඬුවම් පැමිණ වියයුතු යැයි කියා සිටින අතර ආගමික ප්‍රවේශය මානව අයිතිවාසිකම් යන්න අවසාන නිෂ්ටාව ලෙස සහතික කරනමුත් චූදිතයින්ට දඬුවම් පැමිණ වියයුතු ය යන්න ප්‍රධාන නිෂ්ටාව ලෙස නොගනී. දේශපාලන ප්‍රවේශය නීති තර්කය මත රඳාපවතින අතර ආගමික ප්‍රවේශය ප්‍රතිසන්ධානය පිළිබඳ ආගමික මතවාද මත රඳාපවතී. දේශපාලන ප්‍රවේශයේ ප්‍රධාන මෙවලම වන්නේ අපරාධ අධිකරණ පද්ධතිය වේ. ආගමික ප්‍රවේශයේ ප්‍රධාන මෙවලම වන්නේ සත්‍ය සෙවීමේ කොමිෂන් සභාව ය. සාමාන්‍යයෙන් ආගම දේශපාලනයෙන් බැහැරව තිබිය යුතුයැයි පිළිගන්නා දේශපාලන ප්‍රවේශය සුවපත් කිරීම සහ සමාව දීම දේශපාලන ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ. මානව අයිතිවාසිකම් උල්ලංඝනය කළවුනට සමාව ප්‍රධානය කිරීමට බෙහෙවින් උනන්දුවීම සාධාරණය කරන සාධකය වන්නේ ප්‍රජාතන්ත්‍රවාදි පරිවර්තනය සඳහා එය අත්‍යවශ්‍ය බව දේශපාලන ප්‍රවේශය මගින් විශ්වාස කෙරේ. ආගමික ප්‍රවේශයට අනුව දඬුවම් අත්හිටුවීමට හෝ සමාවදීම හෝ අවශ්‍ය වන්නේ සත්‍ය හෙළිදරව් කිරීමට හා සමගි සන්ධානය ඇති කිරීමට ය. දේශපාලන ප්‍රවේශයට අනුව යුක්තිය සලකුණු කරන්නේ චෝදනා සහ වැරදිවලට දඬුවම්දීම මගින් ය. ආගමික ප්‍රවේශයට අනුව යුක්තිය ඉටුකිරීම සමාවදීම මගින් කළ හැකි ය. වරද පිළිගැනීම සහ සමාවදීම, ප්‍රකෘතිමත් යුක්තිය යටතේ සිදුකෙරේ. තමන්ගේ අතීත සතුරා හා සම්බන්ධතාවයක් ගොඩනගා ගනියි. මිට අමතරව සතුරා මානුෂිකරණය කරයි. සම්බන්ධතා ගොඩනැගීම නිෂ්ටාව ලෙස දේශපාලන ප්‍රවේශය නොසළකන අතර ආගමික ප්‍රවේශය පුද්ගලිකත්වය අවධාරණය කරයි. සබඳතා ගොඩනගයි. මනස විපර්වර්තනය කරයි. සම්බන්ධතා චේන්ද්‍රිය අවයව ලෙස දකිනවා පමණක් නොව හදවත් තුළ තෙතමනය ඇතිකරයි.

මෙම ප්‍රවේශ දෙක අනුව බැලූවිට ශ්‍රී ලංකාව සංක්‍රාන්තික යුක්තිය ඉටුකිරීමෙහිලා විශාල වැඩ කොටසක් කළ යුතුව තිබේ. මානව අයිතීන් උල්ලංඝනයන් සිදුවී නම් ඒ ගැන අපක්ෂපාතී සහ විශ්වාසනීය විභාගයක් පවත්වා සත්‍යය හෙලිදරව් කිරීමට සමත්වන්නේ නම් සංක්‍රාන්තික යුක්තිය ඉටු කිරීම හඳහා පසුබිම සකස්කරගත හැකිය. අනික් අතට සත්‍යය සෙවීම සඳහා පත්කළ එල්.එල්.ආර්.සී කොමිෂන් වාර්තාවේ නිර්දේශය ද විශ්වාසය දනවන ආකාරයට ක්‍රියාවට නැංවීම පමා වී තිබේ. එහෙත් දකුණු අප්‍රිකානු සංක්‍රාන්තික යුක්ති සමය අතිශයින් කාර්ය බහුල වූ බව අපි දනිමු. ඒ මොහොතේ ආමන්ත්‍රනය කළ යුතුව තිබූ සියලු දේට ඔවුහු ආමන්ත්‍රණය කළහ. එරට ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය ලිබරල් මානව අයිතිවාසිකම් ප්‍රවේශයේත්, ආගමික ප්‍රවේශයේත් යන දෙකේම සම්මිශ්‍රණයක් විය. එහෙත් ඔවුහු දඬුවම් අත්හැර දැමූහ. වැඩි බරක් දුන්නේ ආගමික ප්‍රවේශයට ය.

ඔවුන්ගේ සත්‍යය සෙවීමේ කොමිෂන් සභාවේ සභාපති වූයේ කීර්තිමත් ආගමික නායකයෙකි. ඒ බිෂොප් ඩෙස්මන්ඩ් ටුටු පියතුමා ය. ක්‍රිස්තියානි ධර්මයේ සත්ගුණ කොමිසමේ ජීවය බවට පත්කිරීමට හෙතෙම සමත් විය. ආදරය, දයාව, කරුණාව, සමාවදීම සමගි සන්ධානය යන සද්ගුණ ඉතා ප්‍රවේශමෙන් එහෙත් උනන්දුවෙන් මේ ක්‍රියාවලියේ දී ජනතා සිත් සතන් තුළ සැළපදියම් කිරීමට නැතහොත් සමාජගත කරන්නට ඔවුනට හැකියාව ලැබුණි. ඒ නිසා ඔවුන්ගේ ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය සාර්ථක විය.





ජනාධිපති අල්වාරෝ

## ගෝතමාලාව හා දකුණු අප්‍රිකාව

ප්‍රතිසන්ධානය පිළිබඳ සාකච්ඡා කරන විට අපට ජාත්‍යන්තර අත්දැකීම් දෙකක් සැළකිල්ලට ගතහැක. ගෝතමාලාව ලතින් ඇමරිකානු රාජ්‍යයකි. එම රාජ්‍යය වසර 36ක සිවිල් යුද්ධයකට උරුමකම් කීවේය. එම සිවිල් යුද්ධය පැවතියේ එරට පැවති හමුදා පාලනයට එරෙහිව විප්ලවකාරී වාමාංශික කැරලිකරුවන් විසින් ගෙනයනු ලැබූ ගරිල්ලා යුද්ධය නිසාවෙනි. එරට ආදිවාසී මායන්වරුන් දැක්වූ සහයෝගය නිසාම ගරිල්ලාවරුන් පරාජය කිරීමට හමුදාවට නොහැකිවිය. 1960 සිට 1996 දක්වා පැවති එම සටන් වලදී 200,000 කට අධික පිරිසක් මියගොස් ලක්ෂයක් පමණ වූ ස්ත්‍රීන් ප්‍රමාණයක් වැන්දඹුවන් බවට පත්වූහ. එසේම දරුවන් 50,000ක් පමණ අනාථ වූහ. කෙසේ නමුත් හමුදා කුමන්ත්‍රණ කිහිපයක්ම සිදුවීමෙන් පසු 1996 දී මහජන ඡන්දයෙන් බලයට පත් ජනාධිපති අල්වාරෝ අර්සු විසින් ගරිල්ලාවරුන් සමඟ සාම සාකච්ඡා ආරම්භ කිරීමෙන් අනතුරුව ගෝතමාලාවට සාමය උදාකර ගැනීමට සමත්විය.

ප්‍රතිසංවිධාන ක්‍රියාවලියක් වූ එය තුළ ප්‍රථමයෙන් සිදුකළේ සත්‍ය සෙවීමේ කොමිෂන් සභාව පිහිටුවීම ය. 1997 පෙබරවාරි මස මෙය පිහිටුවූයේ වසර දෙකක් උදෙසාය. මෙම කොමිෂන් සභාව තිදෙනෙකුගෙන් සමන්විත වූවකි. ඉන් එක් අයෙක් වූයේ ජර්මනියේ හුම්බෝල්ඩ් විශ්වවිද්‍යාලයේ නීතිය පිළිබඳ මහාචාර්ය වරයෙකි. ජර්මන් ජාතිකයෙකි. තවත් කෙනෙක් වූයේ මායන් ගෝත්‍රික කාන්තාවකි. මෙම කොමිෂන් සභාව පත්කරන ලද්දේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ එවකට සිටි මහලේකම් වරයා විසිනි. 7200ක් පමණ වූ වේදනා දුක්ගැනවිලිවලට සවන්දීම සිදුකෙරිණ. නමුත් ඒවා ප්‍රසිද්ධියේ සිදුකෙරුණු ඒවා නොවේ. ඒවා අතුරින් දරුණු ගණයේ අපරාධ නැතහොත් ජන ඝාතන 100ක් විභාග කෙරිණ. ඝාතනයට ලක්වූවන්ගෙන් 83%ක් මායාවරුන් බවත් 17%ක් ලැටිනෝවරුන් බවත් සොයා ගැනිණ. අපරාධවලට වරදකරුවන් වූවන් නම් නොකෙරිණ. නමුදු ඒ අපරාධවලින් 39%ක් හමුදාව සහ ඔවුන්ගේ අතුරු හමුදා කණ්ඩායම් විසින් සිදුකරනු ලැබූ ඒවා බවට සොයා ගැනීමට හැකි විය. වරදකරුවන්ට සමාව දීමේ බලය කොමිසමට නොතිබුණි. එසේම වරදකරුවන්ට දඬුවම් දීම සඳහාද තිබුණේ සීමිත බලයකි. කොමිසමේ කටයුතු ජනමාධ්‍යවලට විවෘත කෙරුණේ සීමා සහිතවය. සත්‍ය සෙවීමේ කොමිසම සාම ගිවිසුමේ ම කොටසක් වූයේ ය.

## ස්මාරක තැනීම

කොමිෂන් සභාව විසින් කරන ලද යෝජනා එවකට පැවති ආණ්ඩුව විසින් ක්‍රියාවට නංවන ලද්දේය. ජනාධිපති අල්වාරෝ සිදුවූ අපරාධ පිළිබඳව ප්‍රසිද්ධියේ ජනතාවගෙන් සමාව ගත්තේය. ඔහු ප්‍රසිද්ධයේ පැවසූ කාරණාවක් ලෝක ප්‍රසිද්ධියට පත් විය. එනම් අපට අතීතය අමතක කළ නොහැක. අමතක කළ යුතුත් නැත. එහෙත් අප සමාව දීම සිදුකරමු යනුවෙන් ඔහු ප්‍රකාශ කළේ ය. හානිපූරණ ක්‍රියාවලිය දිගටම සිදුකෙරිණ. ඒ යටතේ වින්දිතයන් හට වන්දි ලබාදීම, සමූහ ඝාතන සිදුවූ ස්ථාන ගොඩදැමීම සහ මරණයට ලක්වූවන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සිදුවිය. ප්‍රසිද්ධ ස්ථානයන්හි සිහිවටන ඉදිකිරීම හා හමුදාව සහ අධිකරණයේ ව්‍යුහාත්මක වෙනස්කම් සිදු විය. අන්‍යෝන්‍ය ගරුත්වය ගොඩනැගෙන සංස්කෘතියක් රට පුරා ප්‍රචලිත කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම හා අධ්‍යාපන ක්ෂේත්‍ර තුළ ඒ ගැන විශාල වැඩපිළිවෙලක් තිබුණි. ගෝතමාලාවේ සත්‍ය සෙවීමේ කොමිෂන් සභා වාර්තාව හැඳින්වූයේ නිශ්ශබ්දතාවයේ ස්මරණය යනුවෙනි.

දකුණු අප්‍රිකාවේ ප්‍රතිසංවිධාන ක්‍රියාවලිය ද සිත් ගන්නාසුලු ය. ලෝකයේ මෙතෙක් පැවති විවිධ නම්වලින් පැවති සත්‍ය සෙවීමේ කොමිෂන් සභා 32 අතුරින්ද, රාජ්‍යයන් මගින් මූලික කොටගෙන

දියත්කරන ලද ප්‍රතිසංවිධාන ක්‍රියාවලි අතුරින්ද වඩාත් ප්‍රබල මෙන්ම සාර්ථක ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය ලෙස සැලකෙන්නේ දකුණු අප්‍රිකානු ක්‍රියාවලියයි.

දකුණු අප්‍රිකාවේ ගැටුමේ පසුබිම මෙසේ ය. දකුණු අප්‍රිකානු සමස්ත ජනගහණය මිලියන 51කි. ඉන් 75%ක් කළු ජාතිකයන් වන අතර 13%ක් සුදු ජාතිකයන් 3%ක් මෙන්ම ඉන්දියානු සහ 9%ක් මිශ්‍ර වර්ණ ජනයා වෙති. එසේ නමුදු රට පාලනය කළේ 13%ක්වූ සුදු පාලකයන්ය. දකුණු අප්‍රිකානු වර්ණභේදවාදය පටන් ගැනුණේ 1948 දී බලයට පත් සුදු ජාතික අප්‍රිකානු ජාතික පක්ෂය බලයට පැමිණීමත් සමග ඔවුන් විසින් කාණ්ඩ වශයෙන් පළාත් බෙදන පනතක් මගින් සුදු කළු ප්‍රදේශ බෙදා වර්ග කිරීමෙනි. අනතුරුව එවකට කළු ජාතිකයින් අතර ප්‍රබලව තිබූ කොමියුනිස්ට් පක්ෂය ද තහනම් කරන ලද්දේය. එයට ප්‍රතිවිරෝධය දැක්වීමක් වශයෙන් මුලින් නෙල්සන් මැන්ඩෙලාගේ නායකත්වයෙන් යුතුව සිවිල් නීති කඩකිරීමේ ව්‍යාපාරයක් ගෙන ගියේය. අනතුරුව දරුණු පනත් කීපයක් ගෙනෙමින් මිශ්‍ර විවාහ තහනම් කිරීම, වෙනත් ජාතිකයෙකු සමග ලිංගික සම්බන්ධතා පැවැත්වීම සාපරාධී ක්‍රියාවක් ලෙස සැලකීම, කළු ජාතික ස්ත්‍රීන්ට දේපල උරුමය අහිමි කිරීම, ඔවුනට අධ්‍යාපනය තහනම් කිරීම, බන්ටු කළු ජාතිකයන්ගේ පුරවැසිභාවය තහනම් කිරීම, නගර අලංකරණය නම්වූ ක්‍රමවේදය මගින් කළු ජාතිකයින් නගර කේන්ද්‍රවලින් පළවා හැරීම. ටවුන් ෂිප් නමින් තෝරාගත් කුඩා ප්‍රදේශ කීපයක දසදහස් ගණනින් කළු ජාතිකයින් ගාල් කිරීම. වෘත්තීය සමිති තහනම් කිරීම ආදී නොයෙක් අණපනත් හා ක්‍රියාමාර්ග මගින් දැඩි මර්දනයක් සුදු ජාතික පාලකයන් විසින් දියත්කරන ලදි. මේවාට විරෝධය දැක්වූ 20000 කට අධික පිරිසක් ඝාතනයට ලක්වූ අතර නෙල්සන් මැන්ඩෙලා නායකත්වය දුන් අප්‍රිකානු ජාතික කොංග්‍රසයේ සන්නද්ධ අංශය විසින් රාජ්‍යයට විරුද්ධව සන්නද්ධ කැරැල්ලක් ආරම්භ කරන ලදි. ඒ හේතුවෙන් අවසානයේදී ඔහුට ජීවිතාන්තය දක්වා සිරදඬුවම් විඳින්නට සිදු විණ.

## දකුණු අප්‍රිකානු ආදර්ශය

1990දී නෙල්සන් මැන්ඩෙලා නිදහස් කරන්නේ සුදු ජාතික පාලනයට විරුද්ධව පැන නැගුණු ලෝක ජන මතය හා එරට ජනතාව විසින් වසර 300ක් තිස්සේ යටත්විජිත පාලනයට විරුද්ධව ගෙන ගිය නොනවතින අරගලයේ ප්‍රතිඵලයක් ලෙසට ය. නෙල්සන් මැන්ඩෙලා නිදහස් කිරීමේ සටනේදී මිකුසේලී ජැක් නම් වූ 27 හැවිරිදි තරුණයෙකු විසින් මිලදී ගැනීමේ බලය නම් වූ අහිංසාවාදී ඍජු සටන් ක්‍රියාමාර්ග යක් මගින් සියලූ නගරවල කළු ජනතාව සජීවිකරණය කොට එරට ආර්ථිකය ඇණහිටුවීම සඳහා ගත් ක්‍රියාමාර්ගය සාර්ථක එකක් විය. එහිදී සුදු ජාතිකයන්ට අයත් වෙළඳ සංකීරණ සියල්ල වර්ජනය කෙරිණ. මැන්ඩෙලා නිදහස් කිරීමේ සම්මුති සාකච්ඡා කඩිනම් වූයේ ඒ අයුරිනි. මැන්ඩෙලා නිදහස් කිරීමෙන් අනතුරුව ප්‍රජාත්‍රාන්තික දකුණු අප්‍රිකාවක් නිර්මාණය කරගැනීම සඳහා වූ මහා සම්මේලනය නම් වූ සභාව විසින් වසර 2ක් සංවාද, සාකච්ඡා, සම්මන්ත්‍රණ රට පුරා පවත්වමින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සඳහා මත විමසුමක් කරන ලදි. 1994 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඔවුන් සාදාගන්නේ ඒ අයුරිනි.

දකුණු අප්‍රිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පූර්විකාව ආරම්භ වන්නේ මෙසේ ය. "අපි දකුණු අප්‍රිකානුවන් වෙමු. අතීතයේ සිදුවූ අසාධාරණකම් හඳුනාගත්තෝද වෙමු. අප භූමිය තුළ යුක්තිය සහ නිදහස වෙනුවෙන් දුක්විඳි ජනතාවට ප්‍රණාමය පුදකර සිටිමු. එසේම අපගේ රට සංවර්ධනය කිරීමට හා ගොඩනැගීමට උරදුන් සැමට ගෞරවය පුදකරමු. විශ්වාස කරන්න දකුණු අප්‍රිකාව, විවිධත්වය තුළ එක්සත්ව ජීවත්වන, අප සියල්ලන් ගේම ය."

එම ව්‍යවස්ථාව සම්මතවීමෙන් අනතුරුව 1995දී පාර්ලිමේන්තුව විසින් ජාතික

**අතීතයේ සිදුවූ මානව විරෝධී ක්‍රියාකාරකම්, නැතහොත් උල්ලංඝනයන් ඇතොත් ඒවා විභාග කිරීම සඳහා ගන්නා අධිකරණ සහ අධිකරණ නොවන ක්‍රියාමාර්ග මගින් වින්දිතයන්ට සහන ලබදීම එහි ප්‍රධාන කටයුත්තයි. ඒ අනුව  සංක්‍රාන්තික යුක්තිය සමයේ ක්‍රියාකාරකම් රාශියක් දැකිය හැකිය.**

එක්සත් භාවය සහ ප්‍රතිසන්ධානය පිළිබඳ පනත සම්මතකර ගන්නා ලදුව ඒ මගින් සත්‍ය සෙවීමේ කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදි. ටී.ආර්.සී සභාවේ සභාපති වූයේ ඩෙස්මන්ඩ් ටුටු අගරදගුරුතුමාය. කොමිසමේ සාමාජික සමාජිකාවන් 17 දෙනෙක් වූහ. පිරිමි 9 (සභාපතිද ඇතුළුව) දෙනෙක් සහ ස්ත්‍රීන් 8 දෙනෙක් ඊට අයත් වූහ. ඒ සියලු දෙනාම දකුණු අප්‍රිකානුවන් වූහ. ලෝකයේ එවැනි සත්‍ය සෙවීමේ කොමිෂන් සභාවක සිටි වැඩිම කොමසාරිස්වරුන් පිරිසක් අයත් වූයේ දකුණු අප්‍රිකානු කොමිෂන් සභාවටය. පාර්ලිමේන්තු පනතක් මගින් ගෙනෙන ලද්දක් වීම නිසා එය අධිකරණයක් හා සමාන පූර්ණ බලතල වලින් සමන්විත වූවකි. අත්අඩංගුවට ගැනීම, සෝදිසි කිරීම, ප්‍රශ්න කිරීම, පාපොච්චාරණ ලබාගැනීම, සමාව යැදීම, සමාව දීම, නිර්දේශ ලබාදීම යනාදී සියලු දේ කොමිසමට කළ හැකි විය. එහි කාර්ය මණ්ඩලය 319 ක් වූහ. මෙම කොමිසම කොටස් 3කට බෙදා තිබුණි.

මානව අයිතිවාසකම් උල්ලංඝනයන් විභාග කිරීම. සමාව ප්‍රදානය කිරීම. වැරදි නිවැරදි කිරීම හානිපූර්ණය සහ පුනරුත්ථාපනය යනු ඒ කොටස් තුන වේ. කොමිසම විසින් සාක්ෂි විභාග 21000ක් කරන ලදි. සමාව ඉල්ලුම් පත් 7500 ක් කොමිසමට ලැබී තිබුණ නමුදු සමාව ප්‍රදානය කළේ ඉන් 849 දෙනෙකුට පමණි. ඩෙස්මන්ඩ් ටුටු පියතුමා විසින් සුදු ජාතිකයන් හට සමාව දිය යුතුයැයි කරන ලද ඉල්ලීමට කළු ජාතිකයෝ අවනත වූහ. ඒ තරමට ශක්තිමත් සජීවීකරණ වැඩසටහනක් එතුමා විසින් මෙහෙයවන ලදි. ඔහු ලියූ සමාව දීමෙන් තොර අනාගතයක් නැත. නම් වූ ග්‍රන්ථය එකී ක්‍රියාවලිය සඳහා මනා පිටුවහලක් විය. එකී ග්‍රන්ථයේ මෙවැන්නක් සඳහන් වේ.

"අනාගතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය සැබෑ සමාව අතීතය සමග බැඳී පවතී. තවදුරටත් සිත්වල කෝන්තර තබාගෙන කටයුතු කළ නොහැක. අද අප කරන කියන දේ අතීත වර්තමාන සහ තවමත් නූපන් දරු පරම්පරාවක් හට අපෙන් වියයුතු යුතුකම් ලෙස සැළකීමට පුරුදුවිය යුතු ය." - ඩෙස්මන්ඩ් ටුටු

එක සත්‍ය සෙවීමේ කොමිසන් සභාවෙන් අපි ඉගෙනගත යුතු දේ මෙසේ පෙළගැස්විය හැක.

1 දකුණු අප්‍රිකාවේ වර්ණභේදවාදය පවත්වාගෙන ගිය පුළුල් ව්‍යුහය හඳුනාගැනීමට අවකාශය ලැබුණේ වින්දිතයින්ගේ වේදනාකාරී හඬට විවෘතව සවන්දීම තුළිනි.

2 සමාජ විපර්වර්තනයට යොදාගතහැකි බලගතු ශක්තිය වන්නේ අතීතයේ සිදුකළ මානව අයිතිවාසිකම් උල්ලංඝනයන් සැබෑලෙස හෙළිකරගැනීම හරහා ය.

3 දේශපාලනික හා ආයතනික වෙනස්කම් ඇතිකිරීමෙන් ගැටුමේ මුල හේතු ආමන්ත්‍රණය කිරීම සිදුවන අතරම යළිත් එවැනි තත්ත්වයක් ඇතිවීම ද වළක්වාගත හැකි බව එයින් සනාථ වූවා යැයි කිවහැක.

4 ටී. ආර්. සී මගින් නිර්දේශිත වින්දිතයින් හට වන්දි ගෙවීම රජය මගින් සිදුකෙරිණ.

5 සමාව ලද චූදිතයින් යළි නීතිය හමුවට ගෙනඒම නොකෙරිණ.

6 වින්දිතයින්ගේ දරුවන් හට පළමු වසරේ සිට තෘතීය අධ්‍යාපනය නිමවෙන තෙක් මූල්‍යාධාර ලබාදීමට නිර්දේශ විය. ඒ සඳහා අධිකරණ හා ව්‍යවස්ථාදායක දෙපාර්තමේන්තුව විසින් ගැසට් පත්‍රයක් නිකුත්කරන ලදි. එකී සියලු මුදල් ජනාධිපති අරමුදලින් ලබාදුන්නේ ය. චූදිතයින්ටත්, වින්දිතයින්ටත් ප්‍රතිසන්ධාන ගත විය හැකි ක්‍රියාවලියක් මනෝ විද්‍යානුකූලව සකස්කර තිබුණි. චූදිතයින් තමන් කළ වරද පිළිගැනීම, වරදට පසුතැවිලි වීම. වරද නිවැරදි කිරීම සහ සමාව යැදීම තෙක් ඒ ක්‍රියාවලිය සිදු කෙරිණ.

**"අපි දකුණු අප්‍රිකානුවන් වෙමු. අතීතයේ සිදුවූ අසාධාරණකම් හඳුනාගත්තෝද වෙමු. අප භූමිය තුළ යුක්තිය සහ නිදහස වෙනුවෙන් දුක්විඳි ජනතාවට ප්‍රණාමය පුදකර සිටිමු. එසේම අපගේ රට සංවර්ධනය කිරීමට හා ගොඩනැගීමට උරදුන් සැමට ගෞරවය පුදකරමු. විශ්වාස කරන්න දකුණු අප්‍රිකාව, විවිධත්වය තුළ එක්සත්ව ජීවත්වන, අප සියල්ලන් ගේම ය."**



මෙම සිතුවමෙන් කොටි සාමාජිකයෙකු විසින් බස් රථයක් තුළ සිදු කරන ලද මරාගෙන මැරෙන ප්‍රහාරයක් ආශ්‍රිත සිදුවීම සිතුවම් කළෙමි. ඔහු විසින් බෝම්බය මිනිසුන් පිරුණු බස් රථය තුළ තබද්දී පිටුපස ආසනයෙහි සිය අලුත උපන් බිළිඳාට කිරි පොවමින් සිටි මව පිළිබඳව බෝම්බය පුපුරවා හැරීමෙන් අනතුරුව දැකගැනීමේ ආශාවක් ඔහු තුළ පහළ වී තිබේ. පුපුරවන ලද බස් රථය වෙත ගිය ඔහුට සුන්බුන් අතර තිබූ බිළිඳු මල සිරුරේ මුව තුළ ගැලවී සිර වූ මවගේ පියයුර තමන් දුටු බවත් ඔහු ප්‍රකාශ කර තිබුණි.

චිත්‍රය : **මාලිකා සංජීවනී**



**භවානි ෆොන්සේකා**

# ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති යුක්තිය: වත්මන් අවස්ථා අත්පත් කර ගැනීම

සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ වාදවිවාද ශ්‍රී ලංකාවට අලුත් දෙයක් නොවේ. 2015 දී අත්දුටු දේශපාලන වෙනස්කම් හා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 30 වෙනි සැසියේ එකඟතා යෝජනාව පිළිගැනීම සමග ඒවා මෑත දී නැවත දැල්වී තිබේ. යෝජනාව සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසමක්, විශේෂ අධිකරණයක්, අතුරුදහන් පුද්ගලයින් පිළිබඳ කාර්යාලයක්, හානිපූර්ණ සම්බන්ධ කාර්යාලයක්, ආරක්ෂක අංශ ප්‍රතිසංස්කරණ හා සිදුවෙමින් පවතින මානව හිමිකම් උල්ලංඝනයන්ට ආමන්ත්‍රණය කිරීමේ පියවර ඇතුළු ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තික යුක්තියට ආමන්ත්‍රණය කිරීමේ ක්‍රියාවලීන් හා යාන්ත්‍රණයන් ගණනාවක් සඳහා ඉඩ සලසයි. යෝජනාවට සම අනුග්‍රාහකත්වය ලබා දීම මගින් ශ්‍රී ලංකා ආණ්ඩුව යෝජනාවේ අඩංගු පොරොන්දු ක්‍රියාත්මක කිරීමට එකඟ වී තිබේ. කලින් ආණ්ඩුවේ ආස්ථානයන්ගෙන් නික්මීමක් වන අතීත අපයෝජනයන්ට ආමන්ත්‍රණය කිරීමේ ඕනෑම විශ්වසනීය හා ස්වාධීන යාන්ත්‍රණයකට විරුද්ධ වූ හා සිදුවන උල්ලංඝන ප්‍රතික්ෂේප කළ ශ්‍රී ලංකා ආණ්ඩුවේ ප්‍රතිපත්තියෙහි සිදුව ඇති මෙම සුසමාදර්ශීය හැරවුම සැලකිල්ලට ගත යුතු ය.

## සංක්‍රාන්ති යුක්තියෙහි වැදගත්කම

ශ්‍රී ලංකාව මානව හිමිකම් නීතිය හා ජාත්‍යන්තර මානුෂවාදී නීතිය උල්ලංඝනය කළ බව දැක්වෙන ස්වාධීන වාර්තා සහිතව

**අනුයාත ආණ්ඩු විසින් පත් කරන ලද අතීත විමර්ශන කොමිෂන් සභා ගණනාවක් ද අතුරුදහන් වූවන් පිළිබඳ වත්මන් කොමිෂන් සභාව ද තිබේ. 2013 පත්කරන ලද පරණගම විමර්ශන කොමිෂන් සභාවට ශ්‍රී ලංකාව මුළුල්ලෙන් පැමිණිලි 24,000 ක් ලැබී තිබෙන අතර විමර්ශන ආරම්භකර ඇත්තේ ස්වල්පයක් සම්බන්ධයෙන් බව ප්‍රසිද්ධියේ ප්‍රකාශකර තිබේ.**

දශක තුනකට ආසන්න යුද්ධයක් අත්දැක තිබේ. දේශීය කණ්ඩායම් හා එක්සත් ජාතීන් යන දෙපාර්ශ්වයෙන්ම කෙරුණු ස්වාධීන වාර්තාකරණය පැති කීපයකින් - ආරක්ෂක හමුදා, එල්ටීටීඊය හා අර්ධ හමුදා කණ්ඩායම් මගින් සිදු කෙරුණු උල්ලංඝන තහවුරු කර තිබේ. අනෙක්වා අතර මේවාට නීතියෙන් බැහැර ඝාතන, බලහත්කාර හා අනිච්ඡානුග අතුරුදහන් වීම්, ළමුන් බඳවා ගැනීම, ලිංගික හිංසනය, වධ හිංසනය, අවතැන් වීම යන ඒවා ඇතුළත් වේ. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ විමර්ශනය (*OISL*) මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය (*OHCHR*) විසින් මෑත දී කරන ලද මුලපිරුමකි. එය යුද්ධයට සම්බන්ධ සියලු පාර්ශ්ව විසින් කරන ලද ක්‍රමානුකූල උල්ලංඝන ලේඛනගත කරමින් අතීතයෙහි කරන ලද යෝධ උල්ලංඝන සම්බන්ධයෙන් දේශීය කණ්ඩායම් හා අනෙක් අය විසින් සකස් කරන ලද වාර්තා තහවුරු කරමින් 2002-09 කාල පරිච්ඡේදය සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වනු ලැබීය. මෙම කාල පරිච්ඡේදය තෝරා ගන්නා ලද්දේ එය උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම (*LLRC*) විසින් ආවරණය කරන ලද කාල පරිච්ඡේදය සමග සමගාමී වීම නිසා ය. ශ්‍රී ලංකාව සම්බන්ධ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ විමර්ශන වාර්තාව සිදුවෙමින් පවත්නා උල්ලංඝන හා දණ්ඩන මුක්ති සංස්කෘතිය අවසන් කිරීමට කඩිනම් පියවර ගැනීමේ අවශ්‍යතාව නැවතත් මතු කරන ශ්‍රී ලංකාවේ උල්ලංඝනයන් ලේඛනගත කිරීමේ වාර්තා ගොන්නෙහි අලුත්ම එක විය.

යුද්ධය 2009 දී අවසන් වුව ද ගැටුම නොනිමව පවතී. අනුයාත ආණ්ඩු විවිධ ප්‍රජාවන්ගේ දුක් ගැනවිලිවලට, වෙනස්කොට සැලකීමේ ප්‍රතිපත්තිවලට හා භාවිතයන්ට සහ උල්ලංඝනයන්ට ආමන්ත්‍රණය කරන බවට දෙන ලද පොරොන්දු තිබියදීත් බිමෙහි යථාර්ථයන්හි සැබෑ වෙනසක් ඇතිවී නොමැත. 2006 දී හඳුන්වා දෙන ලද ජාතික මානව හිමිකම් ක්‍රියා සැලස්ම වැනි හඳුන්වා දෙන ලද ඇතැම් වෙනස්කම් සමග නීති, ප්‍රතිපත්ති හා සැලසුම් පොරොන්දු වී තිබුණ ද ගැටුමේ මූල හේතූන්ට ආමන්ත්‍රණය කිරීමේ හා සැබෑ ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමේ දේශපාලන අධිෂ්ඨානයේ අඩුවක් හා උනන්දුව නැතිකමක් පැවතියේ ය. යුද්ධය අවසන් වීම නොතකා ශ්‍රී ලංකාව පුරාම කෙරුණු උල්ලංඝන අඩුවක් නැතිව අඛණ්ඩවම සිදු විය. ස්වාධීන යයි අදහස් කරන ලද අධිකරණය හා මානව හිමිකම් කොමිසම ඇතුළු ආයතන දේශපාලනීකරණය කර හා ඇඟිලි ගැසීම්වලට භාජනය කර තිබුණි. 2013 ජනවාරියේ දී පළමු ස්ත්‍රී අගවිනිසුරුවරියට එරෙහි දෝෂාභියෝගය පහත් තැනක් සලකුණු කළ නිසි ක්‍රියාවලියකින් තොර ක්‍රියාවලියක් විය. සාක්ෂිකරුවන්ට හා වින්දිතයින්ට පොරොන්දු වූ ආරක්ෂාව විහිළුවක් බවට පත් කරමින් උල්ලංඝන සම්බන්ධයෙන් සාක්ෂි දීමට පෙරට පැමිණි සාක්ෂිකරුවන්ට තර්ජනය කෙරිණ, හිරිහැර කෙරිණ, ඝාතනය කෙරිණ. මේ සියල්ල දණ්ඩන මුක්ති සංස්කෘතියට හා ඒ කාලයෙහි පැවති දුබල ප්‍රජාතන්ත්‍රවාදය තර්ජනයට ලක් කිරීමට දායකත්වය සැපයීය.



www.ft.lk

පරණගම කොමිෂන් සභාව අතුරුදහන්වූවන් පිළිබඳ සාක්ෂි විමසන අවස්ථාවක්

2015 ජනවාරි 8 වෙනි දින ශ්‍රී ලංකාවෙහි වෙනසක් සිදු විය. 80% ක ඡන්ද පාවිච්චි කිරීමක් සහිතව දශ ලක්ෂ ගණනක් ශ්‍රී ලාංකිකයෝ තමන්ගේ ඊ ළඟ ජනාධිපතිවරයා ලෙස ඔවුන්ට වුවමනා කවරෙකු ද යන්න ප්‍රකාශ කිරීම සඳහා සර්වජන ඡන්දය පිළිබඳ මූලික අයිතියක් භාවිතා කිරීමට ඡන්ද පොළවල් කරා ගියහ. ජනවාරි 9 වෙනි දින මුල් පැය කිහිපය තුළ ශ්‍රී ලාංකිකයෝ 6 වෙනි විධායක ජනාධිපතිවරයා ලෙස මෛත්‍රීපාල සිරිසේනගේ තේරී පත්වීමත් සමග සාමකාමී පරිවර්තනයක් සිදුව තිබූ බව දැන ගත්හ. දිවුරුම් දීමේ පටන් ජනාධිපති සිරිසේන හා ඔහුගේ ආණ්ඩුව ක්ෂේත්‍ර සමූහයක් අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා, මැතිවරණ, ආර්ථික, මානව හිමිකම්, ප්‍රතිසන්ධානය ආදිය හරහා ප්‍රතිසංස්කරණ පොරොන්දුවී තිබේ.

සංක්‍රාන්තික යුක්තිය පොරොන්දු වූ බොහෝ ක්ෂේත්‍රවලින් එකක් වන අතර යෝජනාව සඳහා දැන් රාමුවක් ඉදිරිපත් කරනු ලැබ තිබේ.

## ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තික යුක්තිය සඳහා ප්‍රධාන අංග

එක්සත් ජාතීන්ගේ යෝජනාව ශ්‍රී ලංකාවෙහි බෙහෙවින් අවශ්‍ය කෙරුණු ප්‍රතිසංස්කරණ සඳහා අවකාශ සලසයි. මේ ප්‍රශ්නය සම්බන්ධ තොරතුරු සටහන් ආණ්ඩුව විසින් කරනු ලැබ තිබෙන ප්‍රධාන කැපවීම් විස්තර කරන අතර සංක්‍රාන්ති යුක්තියේ කුළුණු හතර වන දැන ගැනීමට ඇති අයිතිය, යුක්තියට ඇති අයිතිය, හානිපූර්ණයට ඇති අයිතිය හා නැවත සිදු නොවීමේ සහතිකවීම යන ඒවා තහවුරු කරයි. මෙම පොරොන්දු වූ ක්‍රියාවලීන් හා යාන්ත්‍රණ ඒවා ජාත්‍යන්තර

අනුයාත ආණ්ඩු විසින් පත් කරන ලද අතීත විමර්ශන කොමිෂන් සභා ගණනාවක් ද අතුරුදහන් වූවන් පිළිබඳ වත්මන් කොමිෂන් සභාව ද තිබේ. 2013 පත්කරන ලද පරණගම විමර්ශන කොමිෂන් සභාවට ශ්‍රී ලංකාව මුළුල්ලෙන් පැමිණිලි 24,000 ක් ලැබී තිබෙන අතර විමර්ශන ආරම්භකර ඇත්තේ ස්වල්පයක් සම්බන්ධයෙන් බව ප්‍රසිද්ධියේ ප්‍රකාශකර තිබේ.

**ආණ්ඩුව එය දී තිබෙන පොරොන්දු පිළිබඳව පැහැදිලි ආස්ථානයක් ගත යුතු ය, ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන් සඳහා හා තිරසර ප්‍රතිසන්ධානයක් සඳහා ඒවා වැදගත් වන්නේ මන් ද යන්න පැහැදිලි කළ යුතු ය. එසේම මේ හා සම්බන්ධව ආණ්ඩුවෙන් ක්‍රියාවලියට නායකත්වය දෙන්නේ කවරෙක් ද යන්න පැහැදිලි කළ යුතු ය. ප්‍රතිසන්ධානය ද අදාළ ප්‍රශ්න සම්බන්ධයෙන් ද බහුවිධ අමාත්‍යාංශ හා කාර්යාල පිහිටුවා තිබෙන්නේ මන් ද යන්න පැහැදිලි කළ යුතු ය.**

ප්‍රමිතීන් සපුරාලන බවට, වින්දිතයින්ගේ අයිතිවාසිකම්වලට ආමන්ත්‍රණය කරන බවට හා පාරදෘශ්‍ය හා සියල්ල ඇතුළත්කර ගන්නා ආකාරයකින් සැලසුම්කරනු ලබන හා ක්‍රියාත්මක කරනු ලබන බවට සහතික වෙමින් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් එළඹෙන මාස කිහිපය තීරණාත්මක වනවා ඇත.

ආණ්ඩුව මෑතක දී පොරොන්දු වූ විවිධ යාන්ත්‍රණ හා ක්‍රියාවලීන් පිළිබඳව ශ්‍රී ලංකාව මුළුල්ලෙහි පංගු පාර්ශ්වකරුවන් පරාසයකගෙන් අදහස් එක් රැස්කර ගැනීම සඳහා සිවිල් සමාජ පුද්ගලයින් 11 දෙනෙකුගෙන් සමන්විත ප්‍රතිසන්ධානය පිළිබඳ උපදෙස් ලබා ගැනීම සම්බන්ධ කාර්ය සාධක බලකායක් පත් කර තිබේ. මෙය සැලසුම් පිළිබඳව ඔවුන්ගේ අදහස්, විවේචන හා විවරණ හුවමාරු කර ගැනීමට හා ප්‍රතිසන්ධානය සඳහා වැදගත්වන ප්‍රශ්න පිළිබඳව සාධනීය සංවාදයක නියුතු වීමට හැකියාව ලබා දීමේ අවස්ථාවක් පංගු පාර්ශ්වකරුවන්ට සහතික කරන වැදගත් පියවරකි.

අදහස් හුවමාරුකර ගැනීම් ශ්‍රී ලංකාවට වඩාත්ම ගැලපෙන ක්‍රියාවලීන් හා යාන්ත්‍රණ සම්බන්ධව පැහැදිලිතාවකට මග පාදනු ඇතැයි අපේක්ෂා කෙරේ. එහෙත් අදහස් හුවමාරුකර ගැනීම්වලට පමණක්ම සර්ව නිවාරණයක් වන්නට නොහැකි ය. ආණ්ඩුව ප්‍රධාන යාන්ත්‍රණ පිහිටුවීම පිළිබඳව වින්දිතයන් හා සිවිල් සමාජය ඇතුළු පංගු පාර්ශ්වකරුවන් සමග හොඳම අන්දමින් කටයුතුවල නියැලෙන්නේ කෙසේ දැයි ගවේෂණය කළ යුතුම ය. නිදසුන් ලෙස අතුරුදහන්වීම් පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් ගත් කල මේ වන විටත් එක් රැස්කර තිබෙන තොරතුරු ප්‍රතිසංස්කරණය හා සහය සඳහා උපයෝගීකර ගත හැක්කේ කෙසේ ද යන්න සොයා ගැනීමට අතීත හා වත්මන් ක්‍රියාවලීන් පරීක්ෂා කිරීම වටනේ ය. අනුයාත ආණ්ඩු විසින් පත් කරන ලද අතීත විමර්ශන කොමිෂන් සභා ගණනාවක් ද අතුරුදහන් වූවන් පිළිබඳ වත්මන් කොමිෂන් සභාව ද තිබේ. 2013 පත්කරන ලද පරණගම විමර්ශන කොමිෂන් සභාවට ශ්‍රී ලංකාව මුළුල්ලෙන් පැමිණිලි 24,000 ක් ලැබී තිබෙන අතර විමර්ශන ආරම්භකර ඇත්තේ ස්වල්පයක් සම්බන්ධයෙන් බව ප්‍රසිද්ධියේ ප්‍රකාශකර තිබේ. අනාගත අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාලයකට (*OMP*) විමර්ශන කොමිෂන් සභා ඇතුළු රාජ්‍ය මුල පිරුම් පිළිබඳ සියලු තොරතුරු පරිපූර්ණ වශයෙන් ලැබිය යුතු අතර සත්‍ය සොයා ගැනීම සඳහා ස්වාධීනව සත්‍යෙක්ෂණය කිරීමට හා විමර්ශනය කිරීමට හැකි විය යුතු ය. පොරොන්දු වූ යාන්ත්‍රණයන්ට අදාළ වැදගත් ප්‍රශ්න දෙකක් වන්නේ ආරක්ෂාව හා මනෝ සමාජීය ප්‍රශ්න ය. පූර්වයෙහි වූ මුලපිරුම් මෙම ක්ෂේත්‍රවල අවශ්‍යතාව ඔප්පුකර තිබෙන අතර ඒවාට කඩිනම්ව ආමන්ත්‍රණය කරනු ලබන බවට සහතික වීම ඉතා වැදගත් ය.

එසේම ආණ්ඩුව මෙම පොරොන්දු වූ ක්‍රියාවලීන්



හා යාන්ත්‍රණ සමග නීතිමය හා ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ කෙටුම්පත් කිරීම හා මුලපිරීම අවශ්‍ය ය. මේවා පරිස්සමින් කරගෙන යා යුත්තේ ක්‍රියාවලිය පාරදෘශ්‍යව කරගෙන යාම සහතික කරන අතරම හා ප්‍රතිසංස්කරණයේ අංග පිළිබඳව පංගු පාර්ශ්වකරුවන්ව දැනුවත් කරන අතරම ය. එසේම ජාත්‍යන්තර අපරාධ ආකාරව නීති ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම ඇතුළුව ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට බැඳී සිටීම ද ඉතා වැදගත් වේ. නීති කෙටුම්පත් කිරීමේ දී විශේෂ අධිකරණයක්, සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසමක් (*TRC*), අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාලයක් (*OMP*) හා හානි පූර්ණ කාර්යාලයක් වැනි නව ආයතන පිහිටුවීම මෙන්ම බලහත්කාර අතුරුදහන් කිරීම් ඇතුළු විශේෂ අපරාධ හඳුන්වාදීම සම්බන්ධයෙන් ද ආමන්ත්‍රණය කිරීම අවශ්‍ය වනු ඇත.

සංක්‍රාන්ති යුක්තිය සමග ඉදිරියට ගමන් කරන මූලික ප්‍රශ්නයක් වන්නේ සංගත හා පැහැදිලි තොරතුරු ක්‍රමෝපායක් සහතික කිරීම ය. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිල යෝජනාව සම්මත වීමේ සිට මාස ගණනාවක් ගත වී තිබුණේ වුව ද ආණ්ඩුවේ කැපවීම් මොනවා ද හා පුරවැසියන් කෙරෙහි ඒවායේ බලපෑම් මොනවා ද යන්න පිළිබඳව ශ්‍රී ලංකාව පුරාම සිදුවන්නේ සීමිත කතිකාවකි. පුරවැසියන් සමග කටයුතු කිරීමට මෙන්ම යම් මිථ්‍යාවක් හෝ වැරදි සංකල්පනයක් පහකරලීමට ද මෙය ඉතා වැදගත් වේ. එසේම එය ආණ්ඩුවේ ආස්ථානයන් පැහැදිලිව ප්‍රකාශ කිරීමට ද රටේ ස්වෛරීභාවයට තර්ජනය කරන බටහිර කුමන්ත්‍රණයක් පිළිබඳ යම් ප්‍රහාරයකට පිළිතුරු දීමට ද වැදගත් වේ. ආණ්ඩුව එය දී තිබෙන පොරොන්දු පිළිබඳව පැහැදිලි ආස්ථානයක් ගත යුතු ය, ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන් සඳහා හා තිරසර ප්‍රතිසන්ධානයක් සඳහා ඒවා වැදගත් වන්නේ මන් ද යන්න පැහැදිලි කළ යුතු ය. එසේම මේ හා සම්බන්ධව ආණ්ඩුවෙන් ක්‍රියාවලියට නායකත්වය දෙන්නේ කවරෙක් ද යන්න පැහැදිලි කළ යුතු ය. ප්‍රතිසන්ධානය ද අදාළ ප්‍රශ්න සම්බන්ධයෙන් ද බහුවිධ අමාත්‍යාංශ හා කාර්යාල පිහිටුවා තිබෙන්නේ මන් ද යන්න පැහැදිලි කළ යුතු ය.

## ක්‍රියාකිරීමට කාලයයි

ශ්‍රී ලංකාවේ ප්‍රචණ්ඩ අතීතය හා ප්‍රතිසන්ධානයෙහිලා අසාර්ථක ප්‍රයත්න අතීත සිදුවීම් නැවත ඇති නොවීම සහතික කිරීම සඳහා හා අතීත අසාධාරණයන්ට ආමන්ත්‍රණය කිරීම හා දණ්ඩන මුක්ති සංස්කෘතිය අවසන් කිරීම සඳහා බොහෝ පියවර ගත යුතුව තිබෙන බව සනාථ කරයි. මීට කෙටි මාවත් නොමැත. එක් රාත්‍රියකින් කිසිවෙකුට එය කරන්නට ද නොහැකි ය. මෙම තීරණාත්මක සන්ධිස්ථානයේ දී අප නව ශ්‍රී ලංකාවක් සැලසුම් කරන විට ශ්‍රී ලාංකිකයන් එකට එක්ව ඊට මැදිහත් විය යුතු ය. සංක්‍රාන්ති යුක්තිය සියලු ශ්‍රී ලාංකිකයන් විසින් ඉදිරියට ගනු ලැබිය යුතුව තිබෙන බෙහෙවින් අවශ්‍ය කරන ප්‍රතිසංස්කරණවල එක් ක්ෂේත්‍රයකි. ඉදිරියට යන විට කඩාකප්පල්කරුවන් හා බාධක මුණ ගැසෙනු ඇත. මේවා භීතීන් හා ආතතීන් උග්‍ර කිරීම මග හැරීමේ පියවර ගනිමින් හා විවිධ ප්‍රජාවන්ගේ දුක් ගැනවිලි සැලකිල්ලට ගනිමින් පරිස්සමින් ආමන්ත්‍රණය කළ යුතු ඒවා ය. මේ ක්‍රියාවලියේ දී දිගු කාලීන සාමයක් හා ප්‍රතිසන්ධානයක් පිළිබඳ මේ විශිෂ්ට මොහොත අප නාස්තිකර නොගැනීම සහතික කර ගැනීම පිණිස ආණ්ඩුව, වින්දිතයින් සමග හවුල්කාරිත්වයෙන් යුතුව වැඩ කිරීම, සිවිල් සමාජය, මාධ්‍යය, ආගමික කණ්ඩායම්, වෘත්තීය සමිති හා අනෙකුත් අය ඇතුළු විවිධ ක්ෂේත්‍රවලින් නායකත්වය ලැබීම අවශ්‍ය වනු ඇත.


arhiva.portalnovosti.com


# ආණ්ඩුව වගවීමෙන් තබා ගැනීමේ වගකීම සිවිල් සමාජය සතුයි

සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ දකුණු අප්‍රිකාව ඇතුළු රටවල් ගණනාවක විශේෂඥතාවක් දක්වන විද්වතකු ලෙස **නීතිඥ හොවාර්ඩ් වාර්නි** අන්තර්ජාතික පිළිගැනීමට ලක්ව ඇත. ඔහු සමග කළ සාකච්ඡාවකි.

**සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ වැදගත්කම කුමක් ද, පශ්චාත්-යුද තත්ත්වයක් තුළ සංක්‍රාන්ති යුක්ති ප්‍රතිපත්ති ක්‍රියාත්මක නොකිරීමේ/නොසලකා හැරීමේ විය හැකි ප්‍රතිවිපාක මොනවා ද?**

සංක්‍රාන්ති යුක්තිය පැන නැගුණේ පශ්චාත්-ගැටුම් යුක්ති ප්‍රවේශයක් ලෙස මානව හිමිකම් උල්ලංඝනයන් නැවත ඇතිවීම වැළැක්වීම අරමුණුකර ගෙන ය. අතීතය සම්බන්ධයෙන් කටයුතුවල නියුතු නොවන හා ගැටුමෙහි ගැබ්වන හේතුවලට බරපතල ලෙස ආමන්ත්‍රණය නොකරන රටවල් එම වැරදිම කිරීමේ හා ඉතිහාසය නැවත සිදු කිරීමේ අවදානමට බඳුන් වෙයි.

**සංක්‍රාන්ති යුක්ති වැඩ සටහන් හා ප්‍රතිපත්ති සහ අතීත අපයෝජන පිළිබඳව වින්දිතයින් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ දී කාල සාධකය ප්‍රතිවිපාක ඇති කරන්නේ ද?**




www.britannica.com

සාමාන්‍යයෙන් ප්‍රායෝගිකව කළ හැකි තරම් කඩිනම්ව සංක්‍රාන්ති යුක්ති වැඩසටහන් ආරම්භ කිරීම ඉතාමත් හොඳ ය. මෙය එවැනි මුලපිරුම් සඳහා ඉහළ උනන්දුවක් හා සහායක් තිබෙන අතරතුර හා වින්දිතයින්ගේ හා සාක්ෂිකරුවන්ගේ මතකයන් තවමත් නැවුම්ව තිබෙන අතරතුර වැඩසටහන් ආරම්භ කිරීමට ඉඩ සලසයි.

කෙසේ වුව ද සංක්‍රාන්ති යුක්ති වැඩසටහන් ආරම්භ කිරීමට පෙර එවැනි වැඩසටහන් පවත්වා ගෙන යාමට වගකිව යුතු ආයතන සූදානම් ද යන්න තක්සේරු කිරීම වැදගත් ය. ඒවා ප්‍රමාණවත් ලෙස ස්වාධීන ද? ඒවාට අවශ්‍ය ධාරිතාව තිබෙනවා ද? ඒවාට එසේ නොමැත්තේ නම් එවැනි ආයතන ප්‍රමාණවත් ලෙස ප්‍රතිසංස්කරණය කරනු ලබන තෙක් පමා වීම වඩා හොඳ විය හැකි ය. විකල්ප වශයෙන් කෙටිකාලීනව එවැනි වැඩසටහන් කරගෙන යාම සඳහා තත් කාර්යය හෝ තාවකාලික ආයතන නිර්මාණය කරන්නට පුළුවන.

**අනෙක් රටවල අත්දැකීම් ප්‍රකාරව ශ්‍රී ලංකාවට එහි අතීතය සමග ඵලදායී ලෙස කටයුතු කිරීම පිණිස විශ්වසනීය සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලියක තිබිය යුතු මූලිකාංග මොනවා ද?**

අනෙකුත් රටවල භාවිතයන් තවත් රටකට බද්ධ කිරීම ප්‍රඥාගෝචර නොවේ. එසේ වුව ද මෙම අත්දැකීම්වලින් ඉගෙන ගත හැකි බොහොමයක් දේ තිබේ. අනෙකුත් අත්දැකීම්වලින් නෙලාගත යුතු ප්‍රධාන පාඩම වන්නේ සංක්‍රාන්ති යුක්තියේ අරමුණු ශක්තිමත් කිරීමට යොදා ගත් යාන්ත්‍රණ හා පටිපාටි සාධාරණ හා අපක්ෂපාතී මෙන්ම ස්වාධීන, ස්වායත්ත හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව සංවේදී විය යුතුය යන්න ය. ඒවාට ඒවායේ වැඩ කටයුතු ඵලදායී ලෙස කර ගෙන යාමට අවශ්‍ය සහය හා බලතල තිබිය යුතු ය.

**සංක්‍රාන්තික යුක්තියට කුලුණු හතරක් තිබේ. එනම් සත්‍යය, යුක්තිය, හානි පූර්ණ හා නැවත ඇති නොවීමේ සහතිකයන් ය. මෙම ක්ෂේත්‍ර හතරටම ආමන්ත්‍රණය කිරීම කොතරම් වැදගත් ද?**

සංක්‍රාන්ති යුක්තියේ කුලුණු යයි කියනු ලබන සියල්ලට ආමන්ත්‍රණය කිරීම වැදගත් ය. සත්තකින්ම බොහොමයක් රටවල් ඒවායේ ජාත්‍යන්තර බැඳීම් ප්‍රකාරව එවැනි පියවර ගැනීමට බැඳී සිටී. සංක්‍රාන්ති යුක්තිය සාමාන්‍යයෙන් ක්ෂේත්‍ර හතරම සම්බන්ධකර ගන්නා ඒකාබද්ධ ප්‍රවේශයක් ක්‍රියාවට නගනු ලබන විට වඩාත් සාර්ථක වේ. මෙය කළ හැකි වුව ද අනිවාර්යෙන්ම ඒවා සියල්ලම එකවර හැසිරවීම අවශ්‍ය නොවේ. මේ වැඩසටහන්වලින් සමහර ඒවා අනාගත පරම්පරාවන් විසින් පමණක් බුක්ති විඳිය හැකි ප්‍රතිලාභ ගෙන දෙන දිගු කාලීන ව්‍යාපෘති විය හැකි ය.

**පශ්චාත්-යුද තත්ත්වයක් තුළ සත්‍යයේ හා දැන ගැනීමට ඇති අයිතියේ ඇති වැදගත්කම කුමක් ද?**

සත්‍යය දැන ගැනීමට ඇති අයිතිය ජාත්‍යන්තර නීතිය ප්‍රකාරව නැගී වර්ධනය වෙමින් පවතින හා

> වින්දිතයින්ට හා පුළුල් ජනතාවට අතීත ගැටුම් පිටුපස සත්‍යය මෙන්ම මානව හිමිකම් සම්බන්ධ විශේෂ උල්ලංඝනයන් දැන ගැනීමේ අයිතිය තිබේ. මෙම අයිතිය සංතෘප්ත කිරීමෙන් තොරව වින්දිතයින්ට ඵලදායී පිළියමක් සපයනු ලැබීම විය නොහැකි ය.

බොහෝ රටවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්හි දී විවිධ මූලික අයිතිවාසිකම්වලට අයත් යයි සාමාන්‍යයෙන් පිළිගනු ලබන වැදගත් අයිතියකි. වින්දිතයින්ට හා පුළුල් ජනතාවට අතීත ගැටුම් පිටුපස සත්‍යය මෙන්ම මානව හිමිකම් සම්බන්ධ විශේෂ උල්ලංඝනයන් දැන ගැනීමේ අයිතිය තිබේ. මෙම අයිතිය සංතෘප්ත කිරීමෙන් තොරව වින්දිතයින්ට ඵලදායී පිළියමක් සපයනු ලැබීම විය නොහැකි ය.

**සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිසමක් වැනි සත්‍යය පැවසීමේ යාන්ත්‍රණයක අවශ්‍යතාවය/වැදගත්කම කුමක් ද? සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභා පැවති තිබෙන අනෙක් සන්දර්භයන්ගෙන් ඉගෙන ගත හැකි පාඩම් මොනවා ද? සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිසමක් තුළ අඩංගු කළ යුතු ප්‍රධාන මූලිකාංග මොනවා ද?**

සත්‍ය කොමිසමක් අවංකබවෙන්, ගරුත්වයෙන් හා ප්‍රාණවත්බවෙන් යුතුව අතීතයට මුහුණ දිය යුතු ය. පෙනී යා හැකි සත්‍යය මොන තරම් වේදනාකාරී හා බෙදීම්කාරී වුව ද එය නොසලකා එය එසේ කළ යුතු ය. එය උපාමාරුවලට භාජනය වන්නේ නම්, අපහසු කරුණු සැලකිල්ලට නොගන්නේ නම් හෝ කෙටි කාලීන පරමාර්ථ සඳහා සත්‍යය පිළිබඳ කදිමට සකස්කරගත් සංස්කරණයක් නිර්මාණය කරන්නේ නම් සත්‍ය කොමිසමක උසස් අරමුණු මුදුන්පත් කැර ගැනීමට නොහැකි වනු ඇත. ඔවුන් රවටනු ලැබ තිබේ නම් හෝ ඔවුන්ට සම්පූර්ණ කතාව කියා නොතිබේ නම් රටක ජනතාව ඉක්මනින්ම එය දැනගනු ඇත.

**යුක්තියට ඇති අයිතිය වැදගත් වන්නේ මන් ද?**

ඉතාමත්ම බරපතල මානව හිමිකම් උල්ලංඝනයන්ගේ වරදකරුවන් යුක්තිය හමුවට පමුණුවනු නොලබන්නේ නම් එවිට නීතියේ ආධිපත්‍යයට ගරු කිරීම මකා දමනු ලබනවා ඇත. නීතියේ ආධිපත්‍යය එතරම් බරපතල ලෙස පරදුවට තබන විට දණ්ඩන මුක්ති සංස්කෘතියක් පවතිනවා ඇත. දණ්ඩන මුක්තිය පිළිබඳ එවැනි සංස්කෘතියක් අනාගත සමහරවිට මහා පරිමාණයක් මත සිදු කරනු ලබන උල්ලංඝනයන්ගේ බීජ රෝපණය කරනවා ඇත.

**ශ්‍රී ලංකා ආණ්ඩුව "ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය හා ජාත්‍යන්තර මානුෂවාදී නීතිය උල්ලංඝනය කිරීම් පිළිබඳ චෝදනා විමර්ශනය කිරීමට විශේෂ නීති උපදේශකයෙකු සහිතව අධිකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට" 2015 දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ දී එකඟතා යෝජනාවට එකඟ විය. මීට අදාළව විශේෂ අධිකරණයක් ස්ථාපිත කිරීමේ දී සලකා බැලිය යුතු මූලිකාංග මොනවා ද?**

මෙහි දී ලේඛනගත කරන්නට බොහෝ මූලිකාංග තිබේ. එහෙත් සලකා බැලිය වැදගත් මූලිකාංග සමහරක් වන්නේ විෂය කාරණය, තාවකාලික භූමි ප්‍රාදේශීය අධිකරණ බලය ඇතුළු අධිකරණ බලය පිළිබඳ ප්‍රශ්න ය. අනෙක් වැදගත් මූලිකාංගවලට පටිපාටි පිළිබඳ රීති, චූදිත පුද්ගලයින්ගේ හා වින්දිතයින්ගේ අයිතිවාසිකම් සහ වින්දිතයින් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම ය. විශ්වසනීය හා ස්වාධීන විමර්ශන කර ගෙන යාමේ අවශ්‍යතාව කිව යුතු නොවේ. විනිශ්චය මණ්ඩලවල සංයුතිය හා විනිශ්චයකාරවරුන්, අභිචෝදකයින් හා ප්‍රධාන කාර්ය පිරිස් පත් කිරීම

ආණ්ඩුව වගවීමෙන් බඳවා ගැනීමේ වගකීම සිවිල් සමාජය ගත යුතු ය. ඒවාට සිදු කෙරෙමින් පවතින නියාමනය, මහජන අධ්‍යාපනය, සමාජ බලමුළු ගැන්වීම හා උපදේශනය ද අවශ්‍ය තැන්වලදී මහජන යහපත සඳහා නඩු කීම ද ඇතුළු ක්‍රමෝපායන් ගණනාවක් අනුගමනය කරන්නට පුළුවන.

(හා ඉවත් කිරීම) ප්‍රධාන වනු ඇත. වරදකරුවන් කරන ලද පුද්ගලයින්ට දෙන දඬුවම් වර්ග හා අනෙකුත් සංක්‍රාන්ති යුක්ති මණ්ඩල සම්බන්ධතාව සැලකිල්ලට ගත යුතුව තිබේ.

**ශ්‍රී ලංකාවේ මෙම ක්‍රියාවලියට අදාළව මිශ්‍ර අධිකරණයක හෝ විනිශ්චය මණ්ඩලයක හෝ ජාත්‍යන්තර විශේෂඥයින්ගේ තිබෙන වාසි/වැදගත්කම කවරේ ද?**

ඉකුත් භාවිතයන්, නොහැකියාව හෝ කූට මෑනවීම් පිළිබඳ හීතීන් පැවතීම හේතු කොට ගෙන අපරාධ යුක්ති ක්‍රමය කෙරෙහි විශ්වාසයේ අඩුවක් පවතින රටවල මිශ්‍ර අධිකරණ මණ්ඩලයක් ප්‍රඥාගෝචර විය හැකි ය. නිපුණ හා ගෞරවනීය විදේශ නීති මීමංශකයින්, අභිචෝදකයින් හා විමර්ශකයින් ඔවුන්ගේ දේශීය ප්‍රතිරූපකයින් සමග අතිනත ගෙන වැඩ කරන විට විශ්වාසය හා විශ්වසනීයත්වය කෙටි කාලයක දී ගොඩ නගන්නට පුළුවන.

**හානි පූර්ණවලට ආමන්ත්‍රණය කරන විට සැලකිල්ලට ගත යුත්තේ කුමන ප්‍රශ්න ද?**

වින්දිතයින්ට හා නොනැසී ජීවත්වන්නවුන් හට කරන ලද හානිය පිළිසකර කිරීම සඳහා හානි පූර්ණවල ප්‍රාථමික පරමාර්ථ විය යුත්තේ වින්දිතයින්ගේ මූලික මානව හිමිකම් උල්ලංඝනයන් නිසා විඳින පීඩාව පිළිගැනීම, හා රාජ්‍යය හා සමාජය යළි ගොඩ නැගීමේ දී වින්දිතයින් ඇතුළත් කර ගැනීම ය. හානි පූර්ණ වැඩසටහනේ විෂය පථය, රාජ්‍යයේ ධාරිතාව හා ප්‍රතිලාභීන් කවරහු ද යන කාරණා පරිස්සමින් සලකා බැලිය යුතු ය. එසේම වැඩසටහනේ ආකෘතීන් ද සැලකිල්ලට ගත යුතු ය. එය ප්‍රතිෂ්ඨාපනයේ, වන්දි ගෙවීමේ, පුනරුත්ථාපනයේ හා/හෝ වෙනත් ආකාර ගත යුත්තේ ද? එයට හානිපූර්ණයේ සංකේතාත්මක ආකාර අඩංගුකර ගත යුත්තේ ද? එය පුද්ගලයින් හා ප්‍රජාවන් යන දෙකොටසටම එල්ල කළ යුතු ද? යන ඒවා සැලකිල්ලට ගත යුතු ය.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සඳහා සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලීන් විසින් දැනුවත් කරනු ලැබිය යුතු අවශ්‍යතාවක් තිබෙන්නේ ද? අනෙකුත් සන්දර්භයන්ගෙන් ඉගෙන ගත හැකි පාඩම් මොනවා ද? අනෙකුත් සන්දර්භයන් තුළ ඒවායේ සංක්‍රාන්ති යුක්තිය අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ආරක්ෂණයන් ප්‍රතිඵලදායී වී ඇත්තේ කෙසේ ද?**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාකරණයට හා සංක්‍රාන්ති යුක්තියට අදාළව පෙන්වා දීමට විස්තීරණ නිදර්ශන නැත. කෙසේ වුව ද ගැටුමකින් පසු නැගී එන රටක සිදුවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක් වින්දිතයින්ගේ අයිතිවාසිකම් හා අවශ්‍යතා නොසලකා නොහැරිය යුතු ය. අයිතිවාසිකම් පනතකින් හෝ සංක්‍රාන්තික යුක්තිය සම්බන්ධයෙන් තනිව ක්‍රියාත්මක කළ හැකි වගන්තියකින් වින්දිතයින්ගේ අයිතිවාසිකම් විස්තීරණ ලෙස ආරක්ෂා කරනු ලබන බව සහතික කිරීමේ උත්සාහයන් ගත යුතු ය. එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ජාතික නීතිකරණය එවැනි අයිතිවාසිකම් බලාත්මක කළ යුතු බවට පැනවිය යුතු අතර එය ඇතැම් අවම කොන්දේසි හා ප්‍රමිතීන්ට අනුකූලව සංක්‍රාන්ති යුක්තිය ශක්තිමත් කිරීමේ ආයතන නිර්මාණය කරනු ලැබිය යුතු බවට නියම කළ යුතු ය.

**2015 දී දෙන ලද පොරොන්දු ඉටු කරවා ගැනීම සඳහා ආණ්ඩුව වගවීමෙන් බඳවාලීමට වින්දිත කණ්ඩායම් හා සිවිල් සමාජය කළ යුතුව තිබෙන්නේ මොනවා ද?**

ආණ්ඩුව වගවීමෙන් බඳවා ගැනීමේ වගකීම සිවිල් සමාජය ගත යුතු ය. ඒවාට සිදු කෙරෙමින් පවතින නියාමනය, මහජන අධ්‍යාපනය, සමාජ බලමුළු ගැන්වීම හා උපදේශනය ද අවශ්‍ය තැන්වලදී මහජන යහපත සඳහා නඩු කීම ද ඇතුළු ක්‍රමෝපායන් ගණනාවක් අනුගමනය කරන්නට පුළුවන.









අපේ දේශයේ ආදායම උපයා ගැනීමට තේ කම්කරු කාන්තාවෝ ඉතා මහත් වූ සේවයක් කරති. ඔවුන් අතර ගැබිණි කාන්තාවන් ද සිටී. එම නිසා තේ බෑග් වලින් අඳින ලද මෙම චිත්‍ර තුළින් එම කාන්තාවන්ගේ හැඟීම් සහ වේදනාවන් තේරුම්ගන්න පුළුවන්. ගෙදරටත් රටටත් සම්පතක් වන මොවුන්ගේ පිටේ පමණක් නොව උදරයේ තිබෙන්නේද අපේ දේශයේ සම්පත්ය.

චිත්‍රය : **හනූෂා සෝමසුන්දරම්**

# ආර්ථික සාධාරණත්වය, සංක්‍රාන්තික යුක්තියට අදාළ නැද්ද?

**විජායි කේ. නාගරාජා**

සත්‍යයට ඇති අයිතිය සඳහා වන ගරුත්වය පිළිගැනීම පශ්චාත්-යුද්ධ සාධාරණය ඉටු කිරීමෙහිලා කේන්ද්‍රීය වන බව පිළි ගැනේ. බොහෝ ඛේදනීය හානි හා මානව හිමිකම් අපයෝජනයන්ට සම්බන්ධ වින්දිත-පැවත එන්නන් හා ඔවුන්ගේ පවුල් සඳහා වන යුක්තිය හා සත්‍යය පිළිබඳ යුක්ති සහගත ඉල්ලීම් ශ්‍රී ලංකාවෙහි මතුවෙමින් පවත්නා සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලියෙහි හදවතෙහිම පවත්නා ඒවා වෙයි.

එහෙත් ආර්ථික හානි හා අසාධාරණයන් පිළිබඳ කාරණය කෙබඳු ද? ඒවා බොහොමයක් අතුරුදහන් වීම, ඝාතන, වධහිංසනය, අවතැන්වීම, යුදකරණය සමග සම්බන්ධිත හානි සමග පොරබදමින් තිබෙන්නේ වුව ද එපරිද්දෙන්ම දුප්පත්කම, අඩු ආදායම්, ණය ගැතිබව හෝ ජීවිකා වෘත්තීන්ගේ හා සේවා නියුක්තියේ අනාරක්ෂිතබව සමග ද පොරබදමින් තිබේ. වර්තමානයේ ඒවා ක්‍රියාත්මකවන පරිදි  සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලීන් හා න්‍යාය පත්‍ර තුළ ආර්ථික ප්‍රතිව්‍යාප්තිය හා යුක්තිය පිළිබඳ ඉල්ලීම්වට තිබෙන ස්ථානය කුමක් ද?

දකුණු අප්‍රිකාවේ ක්‍රියාවලිය දෙස ආපසු හැරී බලන විට එය අධි අපේක්ෂා සහිත සත්‍ය හා ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක් සමග අතිනත ගෙන වර්ණ භේදවාදයේ ආර්ථික ව්‍යුහයන්ගෙන් පරිවර්තනය වීමට අසමත් වූ නව ලිබරල් දේශපාලන ආර්ථික ගමන් පථයක් ද වෙලීගත් බව පෙන්වා දීම වටනේ ය. නිදසුන් ලෙස 2000 මැද වන විට දකුණු අප්‍රිකාවේ ආදායම් අසමානතාව සමස්තයක් වශයෙන් මෙන්ම වර්ග



උතුරේ ධීවරයන් පිරිසක්

www.colombopost.net

අතර ද පොදුවේ වැටුප් අසමානතා ඇති කළ පරිද්දෙන්ම සැලකිය යුතු තරමින් වැඩිවූ බව සමීක්ෂණය පෙන්වා දෙයි.

රාජ්‍ය යටිතල පහසුකම් හා සේවාවන් ව්‍යාප්තවීම හේතු කොට ගෙන ආදායම් නොවන අසමානතාවයේ වූ අඩුවීම නොසලකා කළු දකුණු අප්‍රිකානුවන්ගෙන් විශාල සංඛ්‍යාවක් දුප්පත් බවේ හෝ අස්ථිර සමාජ-ආර්ථික තත්ත්වයන් තුළ රැඳී සිටියහ. සමාජ හා ආර්ථික අයිතිවාසිකම් පිළිබඳ ලෝකයේ ඉතාමත්ම ප්‍රගතිශීලී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහතිකයන් පවා අවධාරණය කරන තරම් දුර දිග යන දේශපාලන ආර්ථික වෙනස්කම් සහතික කිරීමට අසමත්ව තිබෙන අතර සැබවින්ම දකුණු අප්‍රිකාවෙහි ඇති කිරීමට සමත්ව ඇත්තේ සුළු සංක්‍රාන්ති යුක්ති විපර්වර්තනයක් පමණක් බව පෙන්නුම් කරයි.

## දේශපාලන ආර්ථික හානි පිළි නොගැනීම

ප්‍රධාන ප්‍රශ්නයක් වනුයේ ශ්‍රී ලංකාවේ පශ්චාත් යුද යුක්ති න්‍යාය පත්‍රයෙහි සැබවින්ම දේශපාලන ආර්ථික හානි අඩංගු නොවීම යි. නිදසුන් ලෙස ලබා ගත හැකි තොරතුරු ඉදිරිපත් කරනුයේ පශ්චාත්-යුද උතුරේ හා නැගෙනහිර ආදායම් පහළ මට්ටමක පවතින බව හා උතුර හා නැගෙනහිර බොහෝ ප්‍රදේශවල දිවයිනේ අන් හැම ප්‍රදේශයකටම වඩා දරිද්‍රතා අනුපාත ඉහළ මට්ටමක් ගන්නා බව ය. තව ද ශ්‍රී ලංකාවේ සෙසු ප්‍රදේශ සමග සසඳන කල උතුර හා නැගෙනහිර අවිධිමත් සේවා නියුක්ති අංශයේ අඩු ශ්‍රම බලකා සහභාගිත්වය පමණක් නොව ඊට අමතරව මූලික නොවන වෘත්තීන්ගේ වැටුප් ද සැලකිය යුතු මට්ටමකින් අඩු ය. එසේම ඊට අමතරව පළාත් දෙකෙහිම ශ්‍රම බලකා සහභාගිත්වයේ හා වැටුප්වල බරපතල ස්ත්‍රී පුරුෂ අසමානතා ද ඇත්තේය.

පශ්චාත්-යුද යුක්තිය ආශ්‍රිතව කෙරෙන කතාබහේ දී යම් අවධානයක් ලැබී තිබෙන එක ක්ෂේත්‍රයක් වන්නේ ඉඩම් පිළිබඳ ක්ෂේත්‍රය යි. ඒ එය දිගු කාලයක් පුරා විවේචනයට බඳුන්ව තිබෙන්නක් වශයෙන් දේශපාලනයේ යම් භූමි ප්‍රදේශීයකරණයක් මූර්තිමත් කරන නිසා ය. එහෙත් සැබවින්ම සමස්ත අවධානය උතුර හා නැගෙනහිර ඉඩම් හා සම්බන්ධ බොහෝ ප්‍රශ්න විසඳීම කරාවන පරිවර්තනයක් සඳහා යොමු කර නැත.

එලෙස වැඩෙන ණය ගැති භාවය මෙන්ම සැබවින්ම පශ්චාත්-යුද සංවර්ධන මැදිහත්වීම් මගින් ඇති කරන ලද ප්‍රමාණවත් නොවන අන්දමින් මුදල් යොදවන ලද නිවාස ව්‍යාපෘති හා හතු පිපෙන්නාක් මෙන් වැඩි වූ සාර්ව මූල්‍ය හා ණය දීමේ මුලපිරුම් වැනි ඒවා විමතිය දැනවීමක් නොවේ. සැබවින්ම පශ්චාත්-යුද හා සංක්‍රාන්ති යුක්තිය පිළිබඳව කරන කථා සමග අතිනත ගෙන විවිධ අමාත්‍යාංශ හා නියෝජිතායතන මගින් බහුවිධ නිවාස ව්‍යාපෘති දියත් කරනු ලබමින් තිබේ. උතුර හා නැගෙනහිර විවිධ ප්‍රජාවන් බලසතු කිරීමවත් ඔවුන්ට සමානත්වයවත් ඔවුන්ගේ පරමාර්ථ අතර ඇත්තේ නැත. ඒවා ප්‍රජාවන් බලසතු කරනවාට වඩා ශීඝ්‍රයෙන් ගොඩනැගිලි ව්‍යුහ ඉදි කිරීමට සීමාවී තිබේ.

පශ්චාත්-යුද යුක්තිය ආශ්‍රිතව කෙරෙන කතාබහේ දී යම් අවධානයක් ලැබී තිබෙන එක ක්ෂේත්‍රයක් වන්නේ ඉඩම් පිළිබඳ ක්ෂේත්‍රය යි. ඒ එය දිගු කාලයක් පුරා විවේචනයට බඳුන්ව තිබෙන්නක් වශයෙන් දේශපාලනයේ යම් භූමි ප්‍රදේශීයකරණයක් මූර්තිමත් කරන නිසා ය. එහෙත් සැබවින්ම සමස්ත අවධානය උතුර හා නැගෙනහිර ඉඩම් හා සම්බන්ධ බොහෝ ප්‍රශ්න විසඳීම කරාවන පරිවර්තනයක් සඳහා යොමු කර නැත.

ඉඩම් අයිතිවාසිකම් හා ඒවා ප්‍රතිෂ්ඨාපනය කිරීම පෞද්ගලික දේපළ හා වත්කම් පදනමක් මත වන කොන්දේසිවලට අනුව ඉතාමත්ම පටු අන්දමින් අර්ථ නිරූපණය කරනු ලැබේ. ඉඩම් පුළුල් කෘෂි-පරිසරාත්මක සංවර්ධනයෙන් හුදකලාව ගැනීමක් සිදු කෙරෙන අතර ඉන් වැදගත් නිෂ්පාදනීය සම්පතක් ලෙස හා පොදු භූමියක් ලෙස දැකීමෙන් ඒවා පසෙකට දමනු ලබයි. එසේම ඉඩම් සමාජ ව්‍යුහයට ඇති සම්බන්ධයට විශේෂයෙන් කුල හා ස්ත්‍රී පුරුෂ සම්බන්ධතාවන්ට අනුව දකින්නේ කලාතුරකිනි. මේ සියල්ල මග පාදනු ඇත්තේ වෙළෙඳභාණ්ඩකරණයට, අයෝග්‍ය පරිහරණයට හා අවසානයේ අහිමිකරනු ලැබීමට ය.

**හානිපූර්ණ සඳහා යා හැක්කේ කොපමණ දුරකට ද?**

හානිපූර්ණ ලබා දීම පිළිබඳ සාකච්ඡාවට වත්කම් හෝ සම්පත් විනාශය හා ජීවිකා වෘත්ති බිඳ වැටීම ඇතුළු ආර්ථික අහිමි වීම් පිළිබඳ ප්‍රශ්නය ඉදිරියට ගෙන ආ හැකි ය. අහිමි වූ වත්කම් හා සම්පත් ගවයින්, වී, උපකරණ, වාහන ආදී කුමක් වුව ද ඒවා වෙනුවට හානිපූර්ණ ලබා දීමට හෝ වර්ධනය කිරීමට දරන උත්සාහයන් ටික ටික කරන හා තත් කාර්ය ඒවා බවට පත්ව තිබේ. එහෙත් ආධාර ප්‍රදානක හා රාජ්‍ය

රාජ්‍ය යටිතල පහසුකම් හා සේවාවන් ව්‍යාප්තවීම හේතු කොට ගෙන ආදායම් නොවන අසමානතාවයේ වූ අඩුවීම නොසලකා කළු දකුණු අප්‍රිකානුවන්ගෙන් විශාල සංඛ්‍යාවක් දුප්පත් බවේ හෝ අස්ථිර සමාජ-ආර්ථික තත්ත්වයන් තුළ රැඳී සිටියහ.

නොවන සංවිධානවල ප්‍රමුඛතා හා දුර්වල රාජ්‍ය ප්‍රතිපත්තිය මගින් හැඩගස්වනු ලබන බහු විධ කැබලිවලට කඩන ලද ව්‍යාපෘති මගින් හුදෙක් එවැනි වත්කම් ලබා දීම හෝ වෘත්තීය පුහුණුව ලබා දීම එසේ නැති නම් ණය ලබා දීම පවා ඵලදායී නොවනු ඇත.

අභියෝගය වනුයේ ක්‍රමෝපායික රාජ්‍ය ආයෝජන හා මාර්ගෝපදේශකත්වය දෙනු ලබන පෞද්ගලික මුලපිරීම මගින් ප්‍රායෝගික ආර්ථික ජාල හා ආයතන ගොඩ නැගීම හා ශක්තිමත් කිරීම ය. මෙය වත්කම් හා ඒකාබද්ධ ජීවන වෘත්ති ක්‍රමෝපායන් අර්ථාන්විත ලෙස ඵලදායී හා තිරසර කිරීමට ඉතා වැදගත් වේ. නිදසුන් ලෙස ප්‍රාදේශීය වශයෙන් ශ්‍රමය, විශේෂඥතාවය හා ද්‍රව්‍ය සපයනු ලබන මහා පරිමාණ නිවාස වැඩ සටහනකට ජීවිකා වෘත්ති ජනනය කළ හැකි ය, ප්‍රාදේශීය ධාරිතාවන් හා කර්මාන්තය ව්‍යාප්ත කළ හැකි ය. එහෙත් වර්තමානයේ ක්‍රියාවට නගන්නට යන ප්‍රතිපත්තියෙහි මෙය පෙනෙන්නට නැත.

හානිපූර්ණ පිළිබඳ සාකච්ඡාවම දේශපාලන ආර්ථිකය, ආර්ථික යුක්තිය හා ප්‍රතිව්‍යාප්තිය පිළිබඳ පුළුල් ප්‍රශ්නවලින් වියෝ වී තිබේ. හානිපූර්ණ පිළිබඳව මේ ආකාරයෙන් සිතීම ප්‍රාදේශීය, කලාපීය හා ජාතික දේශපාලන ආර්ථික යථාර්ථයන් මගින් දැනුවත්වන හා ඒවාට ආමන්ත්‍රණය කරන ප්‍රවේශයක් ඉල්ලා සිටී. එසේ නොකිරීම මගින් සිදුව ඇත්තේ අවදානම් යළි යළිත් ඇති කරන මැදිහත් වීම් අසාර්ථකවීම පමණක් නොවේ, සැබවින්ම යුද්ධයෙන් විපතට පත් ප්‍රජාවන්ගේ අස්ථිරභාවය නරක තත්ත්වයට පත් කරනු ලැබීම ය.

### ආර්ථික යුක්තිය පිළිබඳ ප්‍රශ්න අතුරුදහන්ව තිබෙන්නේ මන් ද?

අතුරුදහන් වීම් හෝ අනෙකුත් බරපතල අපයෝජනයන් හෝ හානි මගින් ඇති කරන පරිද්දෙන්ම ආර්ථික අසාධාරණකම් ද ජනතාවගේ හා ප්‍රජාවන්ගේ මානව හිමිකම් මත කැපී පෙනෙන ප්‍රතිවිපාක ඇති කරයි. එසේ නම් ඒවා පිළිබඳව පශ්චාත්-යුද හා සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ විවාදයන් තුළ ඉතා සුළු අවධානයක් යොමුකර ඇත්තේ හෝ කොහෙත්ම යොමුකර නොමැත්තේ මන් ද? සැබවින්ම ඒ හා සමානවම ආර්ථික යුක්තිය, ප්‍රතිව්‍යාප්තිය හා සමාජ සාධාරණය පිළිබඳ ප්‍රශ්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සාකච්ඡාවන් තුළ පවා දක්නට ලැබෙන්නේ නැත

එක් හේතුවක් වන්නේ රාජ්‍යයවත් ජාත්‍යන්තර ආධාර ප්‍රදානකයින්වත් ඒවා පිළිබඳ උනන්දුවක් දක්වනු නොලැබීම ය. මානව හිමිකම් සංවිධාන හා ක්‍රියාකාරීන්ට මෙන්ම පශ්චාත්-යුද යුක්ති ක්‍රියාවලීන්ගේ කේන්ද්‍රයෙහි වන විශේෂඥයින්ට හා අන්‍යයන්ට ද ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳව කියන්නට තිබුණේ ස්වල්පයක් බව නැතහොත් කිසිවක් නොමැති බව ය යන්න ඒ හා සමානවම වැදගත් ය. නිදසුන් ලෙස ආර්ථික ප්‍රතිපත්ති ප්‍රකාශනය පිළිබඳව හෝ අයවැය පිළිබඳව ඔවුන්ගේ නිහඬතාව සැලකිල්ලට ගන්න. ඒ අතරම සංවර්ධනය හා දිළිඳුකම පිළිබඳ වෘත්තිකයෝ යුක්තිය ගැන කතා කිරීමේ දී උතුරේ හා නැගෙනහිර හෝ සැබවින්ම රටේ

**හානිපූර්ණ පිළිබඳ සාකච්ඡාවම දේශපාලන ආර්ථිකය, ආර්ථික යුක්තිය හා ප්‍රතිව්‍යාප්තිය පිළිබඳ පුළුල් ප්‍රශ්නවලින් වියෝ වී තිබේ. හානිපූර්ණ පිළිබඳව මේ ආකාරයෙන් සිතීම ප්‍රාදේශීය, කලාපීය හා ජාතික දේශපාලන ආර්ථික යථාර්ථයන් මගින් දැනුවත්වන හා ඒවාට ආමන්ත්‍රණය කරන ප්‍රවේශයක් ඉල්ලා සිටී.**

අන්තැන්වල ආර්ථික අර්බුද පිළිබඳව කතා නොකරති.

තවත් කාරණයක් වන්නේ වින්දිතභාවය, වගවීම, ප්‍රතිසන්ධානය හා සුවපත් කිරීම බොහෝ විට විශාල වශයෙන් සැලකිල්ලට ගනු ලබන්නේ ජන වාර්ගික හෝ ජාතිමය කොන්දේසිවලට අනුවය යන්න ය. සත්තකින්ම ජනවාර්ගිකත්වය වැදගත් නමුත් එය ස්ථානගත කළ යුත්තේ කෙලෙසක ද? ගැටුමට රුකුල් දුන්නා වූ පංති, කුල, ස්ත්‍රී පුරුෂභාව හා දේශපාලන ආර්ථික සම්බන්ධතා හා ව්‍යුහයන් සම්බන්ධයෙන් ජන වාර්ගික-ජාතික අනන්‍යතාවන්ගේ පටිපාටිය හා ප්‍රශ්න නොකෙරෙන වරප්‍රසාදිත බව වටහා ගන්නේ කෙසේ ද? මේ සියල්ල පශ්චාත්-යුද ප්‍රතිසන්ධානය හා සංක්‍රාන්ති යුක්තිය වටා සිදුවන අධිපති කතිකාවන්ගේ අහුමුළුවලට පවරනු ලැබ තිබේ.

### ආර්ථික යුක්තිය පැත්තකින් තැබීමේ අන්තරායෝ

ආර්ථික යුක්තිය හා ප්‍රතිව්‍යාප්තිය බරපතල ලෙස ගැනීම ආර්ථික සංවර්ධනය හා වර්ධනය වන්දනාමාන කිරීම පිළිබඳ කාරණයක් නොවේ. නීතියේ ආධිපත්‍යය, අතුරුදහන් කිරීම හෝ වධ හිංසනය වැනි අපරාධ සම්බන්ධ වගවීම, බහුත්වවාදය හා ඉවසීම යන ඒවා සැබැවින්ම උපයෝජනීය ආර්ථික වර්ධනය හා සංවර්ධනයට අපට අනුව නව ලිබරල් ආර්ථික ක්‍රමයට පරිපූර්ණ ලෙස ගැලපේ. මෙම පරිවර්තනයන් ආයතනගත කිරීම මත පමණක් රඳා පවතින කිසිදු ක්‍රියාවලියක් තුළ යුක්තිය දැකීම දුෂ්කර ය.

ආර්ථික යුක්ති න්‍යාය පත්‍රයක් නොමැතිකම සැබවින්ම පවතින දේශපාලන ආර්ථික තත්ත්වය කෙරෙහිවන පක්ෂපාතිත්වය පිළිබිඹු කරයි. එය මූල්‍යකරණය, ශ්‍රම බාහුල්‍යතාව හා ප්‍රාග්ධනයට අවනත බව, සමාජ සුබ සාධනය හා මහජන ප්‍රතිපාදන දුර්වලවීම හා කීයට නමුත් ගෝලීය සැපයුම් දාමයට එකාබද්ධවීම මගින් සලකුණු වූවකි.

ආර්ථික යුක්තිය හා ප්‍රතිව්‍යාප්තිය නොසලකා හරින ලද්දා වූ පරිවර්තනයක අන්තරායන් දැකීමට අයෙකු කළ යුත්තේ අද දකුණු අප්‍රිකාව දෙස බැලීම පමණි. අසල්වැසි රට, ඉන්දියාව ව්‍යවස්ථාදායක ජනරජයක් බවට විධිමත්ව පරිවර්තනය වීමේ එළිපත්තේ දී එහි ප්‍රධාන නිර්මාපකයා වන ආචාර්ය බිම්රාඕ අම්බෙඩ්කාර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හඳුනාගත යුතුව තිබුණු දේශපාලන සමානත්වය හා සමාජ හා ආර්ථික අසමානත්වය අතර ප්‍රතිවිරෝධතාවය පෙන්වා දුන්නේ ය. ''අපි මෙම ප්‍රතිවිරෝධය හැකි මුල්ම අවස්ථාවේදීම ඉවත් කළ යුත්තෙමු.'' නැතහොත් ''අසමානතාවයෙන්

පෙළෙන්නවුන් දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදයේ ව්‍යුහය පුපුරුවා දමනු ඇත.''යි ඔහු අනතුරු හැඟවීය.

අනතුරු හැඟවීම නොසලකා හරිමින් ඉන්දියාව ගත් මග අනුගමනය නොකිරීමට ශ්‍රී ලංකාව මැනවින් ක්‍රියා කළ යුතුව ඇත. ඉන්දියාව හෝ දකුණු අප්‍රිකාව මෙන් ශ්‍රී ලංකාවේ විශාල පරිමාණයන්ගෙන් වන අහිමි කිරීම් නොමැත්තේය යන පදනම් මත මෙය නිෂ්ප්‍රභා කිරීම වැරද්දක් වනු ඇත. එවැනි දේශපාලන හා ආචාර ධාර්මික දුර නොදක්නා බවක් ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සැලකිය යුතු කොටසකගේ ආර්ථික යථාර්ථයන් හා පහසු ගොදුරුවීමේ තත්ත්වයන් නොසලකා හැරීමක් වෙයි. එසේම එය ජවිපෙ කැරලිකාරිත්වයට හා දශක තුනක් දිගු ජනවාර්ගික ගැටුමට රුකුල් දුන් ආර්ථික ආන්තිකරණය හා ප්‍රචණ්ඩ රැඩිකල්කරණය අතර සම්බන්ධය අමතක කරයි.

**අවසානය**

ආර්ථික යුක්තිය හා ප්‍රතිව්‍යාප්තිය පිළිබඳ න්‍යාය පත්‍රයක් සංවර්ධනය කිරීම හා එවැන්නකට කැපවීම අනිවාර්යයකි. එසේම මෙය වචනයේ නියම අර්ථයෙන් ගත් කල උතුර හා නැගෙනහිරෙන් ඔබ්බට සිතීම ද අදහස් කරන බව කීම අනවශ්‍ය ය. මේ අර්ථයෙන් ගත් කල වඩා අන්තර්ග්‍රහනීය හා සාධාරණ පශ්චාත්-යුද දේශපාලන සමාජයක් ගොඩනැගීමේ ක්‍රියාවලියක් එහි සමාජ, දේශපාලන හා නෛතික ස්වභාවය පමණක් නොව එලෙසම එහි ආර්ථික හා ප්‍රතිව්‍යාප්ති ස්වභාවය ද පිළිබඳව නැවත සිතීමේ අවස්ථාවක් ලබා දෙයි. එවැනි ප්‍රවේශයක් සැබවින්ම විපර්වර්තනීය පශ්චාත්-යුද යුක්ති න්‍යාය පත්‍රයක් සඳහා වඩා පුළුල් සහයෝගයක් හා සුජාතභාවයක් ගොඩනැගීමට ආධාර විය හැකි ය.

ආර්ථික ප්‍රතිව්‍යාප්තිය හා යුක්තිය සාක්ෂාත්කර ගැනීම කරනවාට වඩා කියනු ලැබීම බෙහෙවින් පහසු නමුත් එය එක හා සමානවම සත්‍යය හා ප්‍රතිසන්ධානය සම්බන්ධයෙන් හෝ ඝාතන, අතුරුදහන්වීම් හෝ වධ හිංසනය වැනි අපරාධ සම්බන්ධව වගවීම සම්බන්ධයෙන් ද යොදා ගත හැකි ය. ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලිය ආර්ථික යුක්තිය නොසලකා හැර සත්‍යයේ ප්‍රතිව්‍යාප්තිය මතම මිස අන් කිසිවක් මත බලාපොරොත්තු නොතබන්නැයි කියා සිටී. එය කොතරම් සාධාරණ ද?

(ලේඛකයා ආර්ථික ප්‍රජාතන්ත්‍රීයකරණය සඳහා වන සාමූහිකයේ සාමාජිකයෙකු වන අතර දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය සමග වැඩ කරයි. *vijayknagaraj@gmail.com* මගින් ඔහු හා සම්බන්ධ විය හැකි ය.)



# තිලකේ ලෙයින්
## තියා ගනින් අම්මේ

කටුක අව්වේ - වියලුණු පොළවේ
මැලවුණු තල් ගස් අතරින්
මිය ගිය දරුවා බලා හඬමින්
මළානික වෙසින් ළතෝනි දෙන අම්මේ

කිසාගෝතමියකි නුඹ අම්මේ
පටාචාරාවකි නුඹ අම්මේ
බුදුන්ගේ නෙත් ගැටුණේ නැත නුඹ අම්මේ
බුදුන් කෙසේ වඩින්නද නුඹ රටට අම්මේ
තිලකේ ලෙයින් තියා ගනින් අම්මේ

අඬන්නට කඳුළක්වත් නැත
රිදෙන්නට සිතක්වත් නැත
උරුමයක් ඇතත් උරුමයක් නැත
නුඹේ දුක් ගීය කාටවත් ඇසෙන්නේ නැත
අසරණ උඹට උන් පිහිට වන්නේ නැත
තිලකේ ලෙයින් තියා ගනින් අම්මේ

වන්නියේ කඳුළෙහි උණුසම
තවම නොමැකී ඇත දෙමළ දුක් ගිනිවලට
''අනේ අප්පෝ - අනේ කරුමේ''
මේ දුකට සම්මාදං වෙත් ද?
කොහොම කියන්නද අම්මේ
මං නුඹට....

**ළහිරු මධුසංඛ**
**ලියනආරච්චි**



දහස් ගණනකගේ ජීවිත අහිමි කළ යුද්ධය......................
උතුරේදී දහස් ගණනකගේ ජීවිත බිලි වෙද්දී දකුණේදී බෝම්බ වලට දහස් ගණන් ජීවිත බිලිවී ඇත. ජාතිය කුමක්දැයි ආගම කුමක්දැයි බෝම්බය පුපුරායාමට පෙර විමසුවේද නැත. උතුරේද දකුණේද අහිමිවූ සියල්ල මනුසත් ජීවිතයන් ය. වර්ණ කුල භේද ඊට අදාළ වූයේ නැත. එහෙත් දැන් කාලය ගෙවී ගොසිනි. නැවත අප කිසිවෙකුට යුධ ගිනි අවශ්‍ය වන්නේ නැත. කෝ එහෙත් තැන තැන පුපුරාගිය බෝම්බ වලට මියගිය ආබාධිත වූ දහස් ගණන් සිංහල දෙමල මුස්ලිම් මිනිසුන්, ඔවුන්ගෙන් රැකුන උන්, කොහෙද දැන් ඔවුන්ගේ ජීවිත, කෙසේද දැන්, කිසිවෙකුත් බැලුවාද ඒ ගැන ඔවුන් තවමත් කටු කොහොල් මත මනුෂ්‍යත්වය සොයනවා විය හැක.

චිත්‍රය : **අසංක මංජුල**



www.youtube.com

# ගැටුමෙන් හානියට පත් නොවූ කෙනෙක් සොයාගන්නට බෑ

කථිකාචාර්ය
**ගල්කන්දේ ධම්මානන්ද හිමි**

අවුරුදු තිහක පමණ කාලයක් පුරා අවි ආයුද සහිතව ගැටුම පැවතිණ. ඒ ගැටුමේදී හානියට පත් පාර්ශ්ව විශාල ප්‍රමාණයක් සිටිති. ඒ ගැටුම් ඇතුළේ තම පාර්ශ්වය අතින්ම හානියට පත් වූ අය දෙමළ සමාජයේ සිටිති. එහි ප්‍රතිඵල හැටියට සිංහල ජන සමාජයේ මායිම් ගම්මානවල ද නගරාසන්න ප්‍රදේශවල ද බෝම්බ පිපිරීමෙන් හානියට පත් පිරිස් සිටිති. හමුදාවේ අය හැටියට ඒ අය අතරත් හානියට පත් පිරිස් සිටිති. ඒ ප්‍රදේශවලට පියවරු නැති දරුවෝ මේ හැම ජනකොටසක් තුළ ම සිටිති. දේපල හානි විශාල වශයෙන් සිදුවිය. මේ කියන වපසරිය නැත්නම් මේ කියන සීමාව ඇතුළේ විපතට පත් පිරිස හැටියට අපට ඒ අය හඳුනා ගත හැක.

මීට වඩා තවත් පිරිස්වලට මේ යුද්ධයෙන් හානි සිදු විය. රූපවාහිනී වැනි විවිධ මාධ්‍ය ඔස්සේ මේ යුද්ධය නැරඹූ අය ද සිටිති. විශේෂයෙන්ම පුංචි දරුවෝ. අපි හිතන විදියට පුංචි දරුවන්ට ක්‍රීඩා හැටියට, කාටූන් විදියට යුද්ධය ඉදිරිපත් කරන විට එයින් ද හානියක් සිදු වී තිබේ. මුලු රටේ ම ජාති, ආගම් භේදයක් නැති ව ප්‍රවෘත්ති බැලීම හරහා යුද්ධය දුටු පරම්පරාවක් සිටිති. මේ අයත් විශාල වශයෙන් මානසික වශයෙන් හානියට පත් වූ පිරිසකි. මෙසේ ගත්කල හානියට නොපත් පිරිස් හිටියේ නැති තරම්. මේ සියලුම දෙනා යුද්ධයෙන් හානියටපත් පිරිස් සේ සැලකිල්ලට ගතයුතුයි.

මෙහි බරපතල හානි වූ අය සිටිනවා. අපි හිතමු කෙනෙකුගේ දරුවෙක් අතුරුදන් වුණා, මොකක්ද වුණේ දන්නේ නැහැ. එහෙම කෙනෙක් සමාජයේ ඉන්නවා කියන එක බරපතල ප්‍රශ්නයක්. ඒක සුවපත් විය යුතු යි. ඒ හා සමානව ඊටත් වඩා භයානකයි යුද්ධය රස වින්ද පරම්පරාවක් සිටීම. ඒ පරම්පරාවට සමහර විට

**මිනිසුන්ට අයිති ඉඩම් ටික ආපහු ඒ මිනිසුන්ට ලබාදීම. එතකොට ඒ කියන්නේ යුද්ධය අවසාන නම් ඒක සිංහල ද, දෙමළ ද, මුස්ලිම් ද, කථාවක් නැහැ ඒ මිනිසුන්ට ආපහු ඉඩම් ටික දෙන්න ඕන. මිනිසුන්ගේ ජීවිත පටන් ගන්නට ඒවා දෙන්නට ඕනේ. එතකොට ඒක ද අත්‍යවශ්‍ය යි. මේවා තමයි මූලික අවශ්‍යතා.**

යුද්ධයක් නැතිකමේ අඩුව දැනෙන්නට පුළුවන්. උදාහරණයක් ලෙස යුද්ධය නැති නිසා ගහන්නට සිටින අනිකා නැතිවීම ගන්නට පුළුවන. මේක බරපතල භයානක තත්ත්වයක් වෙන්නේ මෙයින් නිර්මාණය කරනවා හිඩැසක්. මේ හිඩැසට කාට හරි මැදිහත් වෙන්න පුළුවන්. එතන දි ඇති ප්‍රශ්නය පැත්තක තිබිය දී, වෙනත් විශාල ප්‍රශ්නයක් ඇතිවන්නට පුළුවන. ඒ විදියට තමයි මං මේ යුද්ධයෙන් වූ හානිය දකින්නේ.

මෙතනින් එහාට යන්න වෙන්නෙ කොහොමද කියන දේ ගැන ඉතාම පරිස්සම් සහගතව මැදිහත්වෙන්න ඕන එකක්. මේක පරිස්සම් සහගත වීමට තරම් අපහසු මැදිහත්වීමක් වෙන්නේ, හානියට පත් පිරිස ලෙස බැලුවොත් මනුෂ්‍යයන් නේ පෙනෙන්නේ. එහෙම නැතිව එක ජනකොටසකට වූ හානියක් ලෙස බැලුවොත් ඒක අමාරු කාරණයක් වේ. ඒ නිසා මා දකිනවා පළවෙනි දේ හැටියට මේ දෙපැත්තේ ජනජීවිත එකිනෙකාට පෙනෙන්නේ නැත. උතුරේ ඈත ජනජීවිත පෙන්වන්න එක රූපවාහිනී වැඩ සටහනක් අපිට නෑ. ඒ වගේම දකුණේ ජන ජීවිත, අපි හිතමු හම්බන්තොට. අම්පාර, තලමල්විල පැත්ත. ඒ පැත්තෙ මිනිස්සු ඉන්න ආකාරය කිසිවෙකු දන්නේ නැහැ. යුද්ධය අවසන් වූවාට පසු උතුරෙ ඉඳලා දකුණට එන මිනිස්සු දකින්නෙ කොළඹ මිනිස්සු පමණයි. කොළඹ දැක්කම හිතන්නේ සිංහල මිනිස්සුන්ට ප්‍රශ්නයක් නැති බවයි. ඇත්ත ජන ජීවිතය දෙපැත්තට පෙන්වන හා ගෙනයන වැඩපිළිවෙලවල් අවශ්‍ය යි. හානියට පත් වූ අයට කරන්නට පුළුවන් වැඩේ මොකද්ද කියන එක නොවෙයි පළවෙනි දේ මං හිතන්නේ. දෙපැත්තට දෙපැත්ත විවෘත කළයුතු යි. ඒක අත්‍යවශ්‍ය ය. ඒ නිසා මම යෝජනා කරන්නේ ප්‍රධාන පෙළේ වැඩ කොටසක් මාධ්‍ය තුළින් කළ යුතුයි. විශේෂයෙන් රූපවාහිනිය වැනි මාධ්‍ය අපි දන්න ආකාරයට මැදිරිවලට මිනිස්සු ගෙන්වනවා. මම පවා ඒවාට යනවා. ගිහිල්ලා ඒ ගැන කථා කරනවා. ඒවා ගෙවල්වල සිට මිනිසුන් අසාගෙන සිටිනවා. මැදිරිවලට සීමා වුණ සාකච්ඡා වලින් මිදෙන්නට අවශ්‍ය යි. මේ රූපවාහිනි මැදිරිවලින් මිදී ඒ මිනිසුන් ගාවට ගොස් එයලාගේ ඇත්ත ජීවිත පෙන්වන්නට අවශ්‍ය යි.

### දරුවන් නැති මව්වරු

ඒ විදිහට පීඩා විඳින ජන කොටස් දෙපැත්තටම පෙන්වන විට දෙගොල්ලන්ටම පෙනෙනවා, ජීවිතය කොපමණ අමාරු ද කියන එක. අපි එක හා සමාන පීඩා විඳින ජනකොටසක් ද යන්න ඒ අයට දකින්නට ලැබෙනවා ඒ මගින්. ඊළඟ තැනකට යන්න ඒ තුළින් පදනමක් හැදෙයි. ඒකට මාධ්‍ය කණ්ඩායම් ඒ අය ළඟට යන්නට අවශ්‍ය **යි.** අන්න එහෙම පෙන්වන කොට වෙනම දෙයකුයි ඒ අයට දකින්නට ලැබෙන්නේ. අන්න ඒක අවශ්‍යයයි ඒක පළමුවැනි දේ හැටියට. ඊට පස්සේ අපි කොහොමද යන්නේ සුවපත් කරන තැනට යන්න ඊ ළඟට බැලිය යුතු යි. ඊට පසු අනොන්‍ය සම්බන්ධය ගොඩ නැඟීම ඒක හුවමාරු වැඩසටහන් වෙනිනට පුළුවන්. පාසල් අතර වැඩසටහන් වෙන්නට පුළුවන්. ඒක ඇතුළෙත් යුද්ධයෙන් තමන්ගේ දරුවෙක් අහිමි වෙච්ච අම්මා කෙනෙකුට මුණගැහෙනවා නම්, සමහර විට එල්.ටී. ටී. ඊ. කළු කොටි නැත්නම් මොනවා හරි කියන දරුවෙක් නැති වුණ අම්මා කෙනෙක්ව. ඒ වැනි අය මුණගැස්සවීම අවශ්‍ය යි. ඒක මිනිස්සු මුණ ගස්වන්න දෙවැනි කාරණය ලෙස දකින්නට පුළුවන්. මේ සම්බන්ධතා ගොඩ

උදාහරණයක් ලෙස යුද්ධය නැති නිසා ගහන්නට සිටින අනිකා නැතිවීම ගන්නට පුළුවන. මේක බරපතල භයානක තත්ත්වයක් වෙන්නේ මෙයින් නිර්මාණය කරනවා හිඩැසක්. මේ හිඩැසට කාට හරි මැදිහත් වෙන්න පුළුවන්. එතන දි ඇති ප්‍රශ්නය පැත්තක තිබ්බිය දී, වෙනත් විශාල ප්‍රශ්නයක් ඇතිවන්නට පුළුවන. ඒ විදියට තමයි මං මේ යුද්ධයෙන් වූ හානිය දකින්නේ.

නැගීමට නොයා, කෙලින්ම තුවාලයට බෙහෙත් දාන වැඩේ කරන්න බැහැ. ඒක හරියන්නේ නැහැ. එහෙම නොවන්නේ නම් ප්‍රතිකර්මය නවත්වන තැනට තල්ලු කරන්න පහසු යි. මේවා අමාරු වැඩ නමුත් ඒවා සිදුවිය යුතුව තිබේ. ඊට පස්සේ පුළුවන් අර හානියට පත් කොටස් හඳුනාගන්න. ඒ සඳහා වන පියවර සැලසුම් කරන්න.

මම බෞද්ධ පදනමෙන් මේකට මැදිහත් වෙන්නේ. ඒකෙදි මම හිතන දේ තමයි සමාවදීම කියන එක. කෙනෙක් සුවපත් වෙන්න නම්, මට වරදක් කරපු කෙනා ගැන මම හිතාගෙන සිටිනවා මට වරදක් කළා කියලා. වරද කළ කෙනා කිසිම කථාවක් නැතිව සමාජයේ ජීවත් වෙනවා නම්, පීඩා විඳපු කෙනා විදියට මම සුවපත් වෙන්නෙ නැහැ. එතකොට ඒ සුවපත්වීම සඳහා වන ක්‍රියාවලියක් අවශ්‍යයි. ක්‍රියාවලියකයි සුවපත් වෙන්නේ. එතන දි මම පළවෙනි දේ හැටියට සලකනවා, දැනට මම හිතනවා කිසියම් සංඛ්‍යාවක් එල්ටීටී සැකකරුවන් විදියට බන්ධනාගාරගත කර ඉන්නවා. ඒගොල්ලන්ට නඩු නැහැ, නැත්නම් කල්යනවා වගේ නොයෙක් කරුණා තියෙනවා. මම හිතන්නේ මේක හොඳ අවස්ථාවක්, මේ සියලු දෙනාටම පොදු සමාවක් දෙන්න. මේ අය වැරදි කරන්න ඇති. වැරදි කළේ වෙනස් පරිසරයක් තුළ ඉඳිමින්. ඒ අය සාමාන්‍ය පරිසරයේ ඉඳගෙන වැරදි කළා නෙවෙයි. ඒ පරිසරය තුළ, උතුරේ නැගෙනහිර පළාත්වල කාටවත් මම හිතන්නේ නෑ පුළුවන්කම තිබුණා කියලා ඔය කියන තත්ත්වයට මැදිහත් නොවී ඉන්නට. ඒ පරිසරය ඇතුළෙ ඒ අය ඒවා කරන්නට ඇති. නමුත් දැන් පරිසරය වෙනස්. පරිසරය වෙනස් නම් මම හිතනවා එඩිතර තීරණයක් ගන්නට පුළුවන් නම් පොදු සමාව දෙන්න. මේ පොදු සමාව ලොකු පණිවුඩයක් අරන් යනවා උතුරේ මිනිසුන්ට. පුළුවන්නම් කරන්න. මෙය ඉතා විශාල වැඩක්. පොදු සමාව දුන්නාට පසු ඒකෙන් යම් පොදු පණිවිඩයක්. ඒක අංක එකට තිබ්බාට වරදක් නැත.

දෙවැන්න ඉඩම්. ඒ මිනිසුන්ට අයිති ඉඩම් ටික ආපහු ඒ මිනිසුන්ට ලබාදීම. එතකොට ඒ කියන්නේ යුද්ධය අවසාන නම් ඒක සිංහල ද, දෙමළ ද, මුස්ලිම් ද, කථාවක් නැහැ ඒ මිනිසුන්ට ආපහු ඉඩම් ටික දෙන්න ඕන. මිනිසුන්ගේ ජීවිත පටන් ගන්නට ඒවා දෙන්නට ඕනේ. එතකොට ඒක ද අත්‍යවශ්‍ය යි. මේවා තමයි මූලික අවශ්‍යතා. ඊ ළඟට තමයි තියෙන්නේ අමාරුම කොටස. සිංහල ජනයා අතර ඉන්නවා ඒ අයගේ දරුවන් අතුරුදන් අම්මලා තාත්තලා. හමුදාවල ඉන්න විට අතුරුදහන් වුණ, මොනවද වුණේ දන්නෙ නැති අය ද මේ අතර ඉන්නවා. ඒ වගේම උතුරේ ඉන්නවා ජන පිරිසක්, තමන්ගේ දරුවන්යට මොකක්ද වුණේ දන්නේ නැහැ. එතකොට සමහරවිට යුද්ධය අවසාන කාලයේ භාරවුණ දරුවෝ ඉන්නවා හොයාගන්නට නැතිව. එතකොට මේ අයට මොකක්ද වුණේ කියන එක දැනගෙන ඉන්න අවශ්‍යතාව තියෙනවා. ඉතිං මම හිතනවා මොකුත් වුණේ නැහැ වගේ යන්න පුළුවන් ද, නැත්නම් වුණේ මොකක්ද කියලා දැනගැනීම අවශ්‍ය ද? මම හිතනවා සුවපත් වෙන්න, කිසියම් ක්‍රමයක් අවශ්‍යයි මොකක්ද වුණේ කියන එක දැනගන්න. ඒකට දර්ශනයක්

ඇති කිසියම් වැඩ පිළිවෙලක් අවශ්‍යයයි. එතකොට ඔය කියන තැන දක්වා මම හිතන්නේ වැඩේ අමාරු නැහැ.

**ජීවන අපේක්ෂා**

ඊළඟට තියෙන්නේ අමාරු කොටස. ඒ අමාරු කොටසට යෑමට කලින් ලොකු ගොඩනැංවීමක් අවශ්‍යයයි මනුෂ්‍යයන් අතරේ. ඒ කියන්නේ කව්රුවත් කාටවත් පලිගන්න, දඬුවම් දෙන්න, හිරේ විලංගුවේ දාන්න නොවෙයි. අපි මෙතෙනින් එහාට පටන් ගනිමු ජීවිතේ, විනාශ වුණා ඇති කියන තැනට ගේන්න අවශ්‍යයි. මිනිසුන් ඒක ඇතුළේ වුණේ මොකක්ද කියන එක ඉතාම අවංකව සොයා බලන්න තැනට ගතහැකියි. එතකොට ඒක ඇතුළේ මම පෙර කී ලෙස එල්.ටී.ටී.ඊ. කියන අය එසේ කළේ විශේෂ තත්ත්වයක් යටතේ. එතකොට හමුදාව එසේ ක්‍රියා කළේ යුද්ධයක් ඇතුළේ නම් ඒක විශේෂ තත්ත්වයක්. මිනිස්සුන්ගේ ජීවිත ගැන අපේක්ෂාවක් නැති. ආයේ එන්නට පුළුවන්ද කියන අපේක්ෂාවෙක් නැති මිනිස්සු ඒ අය. එතකොට ඒ මිනිස්සු ඒ විශේෂ පරිසරය ඇතුළේ වැරදි කරලා තියෙනවා නම් ඒක ද අර වගේම විශේෂ තත්ත්වයක්. මම හිතනවා ඔය විදිහේ පදනමක පිහිටලා ඕනේ ගමනක් යන්න. එහෙම වුණොත් අපට පුළුවන්, කා අතිනුත් වැරදිවෙලා තියෙන්නේ, කාවෙනුවෙන්වත් කවුරුවත් බේරා ගැනීමක් සඳහා කරන ව්‍යාපෘතියක් නෙවෙයි මේක කියලා කියන්නට. පොදුවේ



www.defence.lk

අපි කොතනද ඉන්නේ. එතනින් ඕන පටන්ගන්න. පොදු එකඟත්වයන් තියෙන්නේ කොතන ද? පොදුවේ අපි කොහෙද රඳාපවතින්නේ ? ඔය කියන දේවල් තමයි මම විශ්වාස කරන්නේ සිදුවිය යුතුයි කියලා.

මෙහි දී ජනමාධ්‍යට අමතරව අධ්‍යාපනය, කලාව, සාහිත්‍ය යන අංශවලට ද විශාල කාර්ය භාරයක් පැවරෙනවා. අවසාන වශයෙන් මිනිසුන් හිතතන විදිය අනුව ප්‍රශ්ණ විසඳගන්න පුළුවන් වෙන්නේ. හිතතන විදිය වෙනස් කිරීම සඳහා ප්‍රධාන තැනක් ගන්න තැනක් අධ්‍යාපනය. ඊට පස්සෙ සාහිත්‍ය කලාව. එතකොට අධ්‍යාපනය ප්‍රධානයි. ඉතිං මම හිතන්නේ යුද්ධය ඇතුළේ ඇතිවුණ ආකෘතියක්නේ දැන් අපිට තියෙන්නේ. ඒ ආකෘතිය ඇතුළෙ යුද්ධය අවසන් වුණාට පස්සේ ඇති නොවිය යුතු සංවාද ඇතිවුණා නම් එහි බරපතල වෙනස්කම් ඇති වෙන්න ඕන. මම හිතනවා ආපහු සැරයක් අපි අධ්‍යාපන විෂය නිර්දේශය සැලකිල්ලට ගත යුතුයි. යුද්ධයක් තුළ ගොඩනැංවුණු බොහෝ දේ වෙනස් වෙන්ට ඕන. ඒ වගේම ශ්‍රී ලාංකීය කියන සංකල්පය, එවැනි අදහසක් අප තුළ

**මට වරදක් කරපු කෙනා ගැන මම හිතාගෙන සිටිනවා මට වරදක් කළා කියලා. වරද කළ කෙනා කිසිම කථාවක් නැතිව සමාජයේ ජීවත් වෙනවා නම්, පීඩා විඳපු කෙනා විදියට මම සුවපත් වෙන්නෙ නැහැ. එතකොට ඒ සුවපත්වීම සඳහා වන ක්‍රියාවලියක් අවශ්‍යයි.**

නෑ. ඒ අදහස තුළ ජාති හැටියට, ආගම් හැටියට නොසිත තත්ත්වයකට යා යුතුයි. ඉතිං එතන දි අධ්‍යාපනයට විශාල කාර්ය භාරයක් තියෙනවා. අධ්‍යාපනඥයින්ට ලොකු මැදිහත්වීමක් කරන්නට තියෙනවා. ඒවගේම සාහිත්‍ය කලා සිනමා වගේ දෙවල්වලත්. ඒවා ඉතාමත් ප්‍රබලව මිනිසුන්ට දැනුම ලබාදෙන්නට පුළුවන. දෙමළ මාධ්‍යයෙන් යන මොනවා හරි කලා කෘති තියෙනවා නම්, ඒවා ඔස්සේ දෙන්න පුළුවන් සිංහල සමාජයේ තියෙන ප්‍රශ්න. දැන් ඇත්තටම ප්‍රධානම දෙයක්නේ දෙපැත්තට දෙපැත්තේ ප්‍රශ්ණ තේරෙන්නේ නැතිකම. එතකොට කලා කෘති වලින් ඒලි දක්වන්න පුළුවන් මේවා. ඒ නිසා මම හිතනවා ලොකු වගකීමක් තියෙනවා කියලා කලාවෙන්.

බෞද්ධ පැත්තෙන් කතා කළහොත්, භික්ෂූන් වශයෙන් අප අතර බරපතල විදියට කම්පනයක් ඇතිවෙන්න ඕන. මේ සා මිනිස් සංහාරයක් සිදුවුණා ලංකාවේ. 71 දී පමණක් නොව ඊට පස්සේ 87-89 ඊට පස්සෙ 81 මේ කාලයේ මිය ගිය ප්‍රමාණය. දැන් 71 කැරැල්ලේ 20000ක් කියලා කියනවා. 87-89 කාලයේ 60000 කියනවා. මේවා සංඛ්‍යා වශයෙන් කොච්චර හරිද මම මම දන්නේ නෑ. නමුත් විශාල විශයෙන් හානි සිදුවෙලා තියෙනවා. දැන් අරන්තලා භික්ෂු ඝාතනය ගතහොත් 31 නමක් කියලා අපි කථා කළාට, අරන්තලා ඝාතනයෙන් මාස කිහිපයකට පස්සේ 87 පටන් ගන්නේ. 90 වෙනකොට මම හිතනවා 1000ක් විතර වෙන්න පුළුවන් හාමුදුරුවරු ඝාතනය වෙලා තිබෙනවා. අපේ මතකයේ ඒක නෑ. අපි හිතමු 700ක් නැත්නම් 600ක් එසේත් නැත්නම් 500ක් කියලා. ටයර් සෑයවල්වල කොච්චර මැරුණා ද? ඊට පස්සෙ මේ කැරැල්ල පටන්ගත්තා. දැන් මේක ඇතුළේ අපට භූමිකාවක් නැද්ද? අපි මේකේ වින්දිතයා නැත්නම් කේන්ද්‍රයට ගිහිල්ලා මේක වෙනස් කිරීමට ද අපි අයිති වෙන්නේ, නැතිනම් වෙන දෙයක් වෙන්න ඇරලා ඒකෙ ප්‍රතිඵල භුක්ති විඳින තැන ද අපි ඉන්නෙ. මම හිතන්නේ අපි කේන්ද්‍රයට සම්බන්ධ වී අපි හිතන විදිය වෙනස් කළ යුතුයි. එය වෙනස් කිරීමට අපේ මැදිහත්වීමක් තියෙනවා. ඉතිං මම හිතනවා අතීතයේ බුදුදහම රැකගැනීම කියලා ප්‍රශ්නයක් තිබුණා. කියන්නේ ඒකට මම හිතනවා ථේරවාදි බුදුදහමට තරඟකාරීව මහායාන බුදුදහම මතුවෙනවා. තව ද ආගමික සහනශීලිතාවයන් නැති තත්ත්වයන් තුළ ආගම රැකගැනීම කියලා. ඒ වගේම පොතපත රැකගැනීම. නමුත් අද වෙනවිට එහෙම ප්‍රශ්නයක් නෑ. ත්‍රිපිටකය කාටවත් විනාශ කරන්නට බෑ, ඒක අන්තර් ජාලයේ තිබෙනවා. සී ඩී හැටියට තියෙනවා. ලෝකයේ උගත් මිනිසුන් අතර මේ දැනුම තිබෙනවා. තවදුරටත් මේකට හානියක් කරන්න කාටවත් පුළුවන් කමක් නෑ. තවදුරටත් ඒක රැකගන්න වැඩේ නොවෙයි අපිට තියෙන්නේ ඇත්තටම. අපිට තියෙන්නේ මේ දැනුම පදනම් කරගෙන පිළිතුරු ගොඩනගන වැඩේ. එතකොට භික්ෂූන් වන අපිට ලොකු යුතුකමක් තිබෙනවා, ජාතිය කියන එක අතහැරලා මනුෂ්‍ය වර්ගයා කියන තැනට එන්නට. ඒක ඇතුළේ ඇත්තට ම සිංහල ජාතිය රැකෙනවා. මනුෂ්‍ය වර්ගයාගේ සුභ සිද්ධිය කියන තැනට හාමුදුරුවෝ පැමිණියාම සිංහල ජාතිය අසරණ වෙන්නේ නෑ. ඇත්තට ම අපි සිංහල ජාතිය රකින්න යන තැනමයි සිංහල ජාතිය අසරණ වෙන්නේ.

ඒ නිසා පොදුවේ සියලු ආගම්වල විශාල කාර්යභාරයක් තිබෙනවා ආගමික පැති වලින් මෙයට මැදිහත් වෙන්නට. උදාහරණයකට ගතහොත් බෞද්ධයින් හැටියට කිසියම් පිංකමක් කරලා බෞද්ධ ආයතනවල අපි පිං අනුමෝදන් කරනවා. එතන දි මෛත්‍රී භාවනාවේ තියෙනවා හතුරන්ටත් මෛත්‍රී කරන්න කියලා. අපිට පුළුවන් නම් පිංකමක් කරලා පිං අනුමෝදන් කරන විට, පසුගිය කාලය පුරා මියගිය සියලු මනුෂ්‍යයින්ට කියලා පිං අනුමෝදන් කරන්න ඒක ලොකු දෙයක්. ඒ

මෙහි දී ජනමාධ්‍යට අමතරව අධ්‍යාපනය කලාව සාහිත්‍ය යන අංශවලට ද විශාල කාර්ය භාරයක් පැවරෙනවා. අවසාන වශයෙන් මිනිසුන් හිතතන විදිය අනුව ප්‍රශ්න විසඳගන්න පුළුවන් වෙන්නේ. හිතතන විදිය වෙනස් කිරීම සඳහා ප්‍රධාන තැනක් ගන්න තැනක් අධ්‍යාපනය. ඊට පස්සෙ සාහිත්‍ය කලාව. එතකොට අධ්‍යාපනය ප්‍රධානයි.

අය දෙමළ වෙන්නට පුළුවන්. සිංහල වෙන්නට පුළුවන්, කොටි කියන්න පුළුවන්, හමුදා සෙබලු කියන්න පුළුවන්, මේවා නම් පමණයි. මෙතන මැරුණේ මනුෂ්‍යයෝ ය. මේ සියලු මනුෂ්‍යයන්ට සුගතිය අත්වේවා කියලා පිං අනුමෝදන් කළහොත්, අර වාඩි වී සිටින මනුෂ්‍යයාගේ සිත බරපතල වෙනසකට යොමුවේ. ඒක අපිට කරන්නට පුළුවන. එයට ශත පහක්වත් වියදමක් යන්නේ නෑ. ඒ තුළින් මනුෂ්‍යයා සිටින තැනින් උඩට ගෙනෙන්නට පුළුවන. නමුත් අපි මුල් ඉතිහාස කථා ගෙනල්ලා, අපේ රණවිරුවෝ මෙහෙම මෙහෙම කළා යනාදි ලෙස අපි කරන්නේ මිනිස්සු බෙදන එක. එයින් අපි මිනිසා මෛත්‍රිකරන තැනට නොවෙයි ගෙනියන්නේ. අපි ඒ තුළින් සීමා කරගන්නවා. මම හිතන්නේ ආකල්ප වෙනසක් අවශ්‍ය ය. මිනිසුන් සිතන ආකාරය වෙනස් විය යුතු ය. මේක රජයක් විසින් කළයුතු හා කරන වැඩක් නොවේ. මේක මේ රටේ මිනිසුන් තුළ ඇතිවිය යුතු දෙයකි.

**බලය සඳහා උපක්‍රම**

අවසාන වශයෙන් මේ සියල්ලටම වඩා දේශපාලකයින්ට ද විශාල කාර්යයක් පැවරී ඇතත්, මම ඒක කථා කරන්න කැමති නැහැ. මොකද වගකීම් සහිත දේශපාලකයෝ නැහැ. මේක හරි නරක තත්ත්වයක්. අපේ රටේ එහෙම දේශපාලකයින් අඩුයි. මේ එක පක්ෂයක් ගැන නොවෙයි මං කථා කරන්නේ. හරියට ආත්මාර්ථකාමීයි, අදූරදර්ශීයි, ව්‍යාපාරික ඔලුවකින් සහිත, ඒ කියන්නේ හම්බකිරීම කියන එක පදනම් කරගත්ත දේශපාලකයින් අපට ඉන්නේ. හැකි තරම් තැබෑරුම්, හැකි තරම් මුදල්හොයන මාර්ග ඇති. එහෙම නැතිව රටක් ඉදිරියට ගෙනයන්නේ කොහොම ද යන ඒ වගේ ලොකු දේවල් තියෙන මිනිසුන් නෙවෙයි. ගම් මට්ටමේ ගණන්කාරයෝ එහෙමනෙ ඉන්නෙ. ඉතිං ඒ අයට මේ කියන ලොකු දෙයක් කරන්න දැක්මක් තියෙනවා ද කියන ප්‍රශ්නය තියෙනවා. මේ කියන එක තේරෙයි ද කියලා. එහෙම කටයුතු කරයිද කියලා. නමුත් ඉතිං හැසිරෙනවා නම් ඉතාම වගකීම් සහගතව හැසිරිය යුතු අවස්ථාවක්. මේ වන විට ආණ්ඩුව පැත්තෙන් යම් යම් ක්‍රියාමාර්ග ගනිමින් ඇති බවක් පෙනෙන්නට තිබෙන නමුත් මම දකින දේ තමයි රටක් හැටියට බලය ලබා ගැනීම සඳහා දිගින් දිගටම මේ ප්‍රශ්න පාවිච්චි කරන්න වුණා මුළු ඉතිහාසය පුරාම. ඉතිං ඒවගේ ප්‍රතිඵලයක් හැටියට තමයි අපට මේ සා වන්දියක් ගෙවන්න සිද්ධ වුණේ. වන්දි ගෙවීම මතුවන්න පුළුවන් කොච්චර බරපතල ද කියලා රටක් හැටියට ලෝකයේ අනෙකුත් ජාතීන් ඉදිරියට යනකොට අපි පල්ලම් බැහැල කාණුවකට වැටෙන තත්ත්වයකට ඇවිදින් තියෙන්නෙ. අපි දූරදර්ශී විදියට වැඩ නොකරපු නිසා. මොකද, බලය ලබාගැනීම අරමුණු කරගෙන මේක අවුස්සනවා. එතකොට එක පිරිසක් ගමන් කරන්න හදනකොට අනෙක් පිරිස අවුල් කරනවා. ඕක තමයි හැමදාම සිදුවුණේ. බලය තියෙන පක්ෂය මොකක් හරි කරන්න යන විට බලය නැති අය ඒක අවුස්සනවා. එතකොට මේ වෙලාවේත් ඒක ඒ විදියටම තියෙනවා. මේකෙනුත් කිසි ප්‍රතිඵලයක් වෙයි කියලා මම හිතන්නේ නෑ. මක්නිසා ද යත් බලය නැතිකෙනා කෑදරකමෙන් බලාගෙන ඉන්නෙ ආයෙත් ගන්නෙ කොහොමද කියලා. ඉතින් ඒ හින්දා ඇත්තටම මේ අවස්ථාව කලින් අවස්ථාවන් වලට වඩා මම හිතනවා අවශ්‍ය වෙනවා බුද්ධිමත්ව වැඩ කරන්න පුලුවන් වෙලාවක්. වගේම කළ යුතු වෙලාවක්. මොකද ඒ තරමට බරපතලයි ගෙවපු ගෙවීම. ඒ නිසාම මීට වඩා බුද්ධිමත් ව මේ මොහොතේ එකඟත්වයකට එන්නට පුළුවන් නම් ජාතිවාදය අවුස්සන්නේ නෑ කියලා. ඊ ළඟට බලය ලබාගැනීම ඉලක්ක කරගෙන ආපහු අවුල් ඇති කරන්නේ නැතිව ඉන්න පුළුවන් නම් ලොකු දෙයක්. ඉතින් ඒ වගකීම තියෙනවා. ඒ වගේම මම හිතනවා උතුරේ දේශපාලන පක්ෂවල කිසියම් නම්‍යශීලී බවක් පේනවා. ඒක ලොකු දෙයක්.



යුද්ධයේ අවසන් භාගයේදී සිදු වූ සිදුවීම් විමසීම මහ දවාලේ ටෝච් එලියක් ගසමින් යම් භාණ්ඩයක් සෙවීම හා සමානයි. යුද්ධය පටන් ගන්න කලිනුත් යුද්ධය ඉවර උනාට පස්සෙත් ජාත්‍යන්තර බලවේග වැදගත් දේවල් කරනු ලබයි. මගේ නිර්මාණයට 'ආගන්තුකයා' යන නම තබන්නේ එබැවිනි.

චිත්‍රය : **නලයියා සවේසන්**

# ජන විඥානය දියුණු කළ නොහැකි නම් අසාර්ථකයි



මහාචාර්ය
**කුමාර් ඩේවිඩ්**

දිගුකාලීන විසඳුමක් ලෙස යුද්ධයක් ඇතිවීමට තුඩුදුන් හේතු සාධකයන් ආමන්ත්‍රණය කිරීම සිත්හි දරාගෙන, යුද ගැටුම තුළ ඇති වූ බරපතල සිදුවීම් සම්බන්ධයෙන් පියවර ගතයුතු ව ඇත. මේ පිළිබඳව කටයුතු කිරීමට දේශීයව මෙන්ම ජාත්‍යන්තරව ද නොයෙකුත් යෝජනා ඉදිරිපත් වී තිබේ. එල්. එල්. ආර් සී. යෝජනා හා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ යෝජනා උදාහරණයට ගත හැක. කෙසේ නමුත් මේ කිසිදු යෝජනාවක් ක්‍රියාවට නැගෙන බවක් පෙනෙන්නට නැත.

වෙනස්කම් ඇති ව හෝ දෙපාර්ශ්වයම එකග වූ පරිදි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම යෝජනා කළ කිසිදෙයක් ක්‍රියාවට නැගෙන බවක් නොපෙනේ. ඒ නිසා එම යෝජනාවලින් වත්මන් ආණ්ඩුව කෙසේ හෝ ගැලවී යනු ඇත. වැඩිම උනොත් සංහිඳියාවක් සඳහා අපි ඒක කළා ය යනුවෙන් පවසා කිසියම් පාපොච්චාරණයක් කර සංහිඳියාවකට යෑමේ ඉඩක් තිබෙන්නට පුළුවන. ඒ අනුව යුද අපරාධ හෝ බරපතල ගනයේ මානව හිමිකම් උල්ලංඝනය වූවා යැයි කියමින් හමුදාවේ කාටවත් දඬුවම් දෙන තැනකට යන්නේ නැත. රටේ දැනට තිබෙන දේශපාලන බලතුලනයට අනුව එය කිසිසේත්ම කළ නොහැක. එකට එකතු වී කථාකරගෙන නැතත් ජනාධිපති සිරිසේන හා මහින්ද රාජපක්ෂ යන දෙදෙනාම අනියම් අන්දමෙන් මේ සම්බන්ධවෙන් සිටින්නේ කිසියම් එකගතාවයක ය. එය දෙමළ පාර්ශ්වය ද තේරුම්ගෙන තිබේ.

> දෙමළ නායකයින් සමග යම්කිසි ගනුදෙනුවක් ආකාරයට මෙය කෙරෙන්නට පුළුවන. ඒ ගනුදෙනුවට අනුව යුද අපරාධ කළවුන් හිරේ යවන්නැයි නොඉල්ලන ලෙස දකුණේ පාලකයින් දෙමළ නායකයින්ගෙන් ඉල්ලනු ඇත. ඒ වෙනුවට යෝජිත ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයේ දී දෙමළ ජනතාවට වැඩියමක් දෙන්නට දකුණේ පාලකයින් පොරොන්දු වන්නට බොහෝදුරට ඉඩ තිබේ.

## සිංහල ජනයා කුපිත කරවීම

දෙමළ නායකයින් සමග යම්කිසි ගනුදෙනුවක් ආකාරයට මෙය කෙරෙන්නට පුළුවන. ඒ ගනුදෙනුවට අනුව යුද අපරාධ කළවුන් හිරේ යවන්නැයි නොඉල්ලන ලෙස දකුණේ පාලකයින් දෙමළ නායකයින්ගෙන් ඉල්ලනු ඇත. ඒ වෙනුවට යෝජිත ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයේ දී දෙමළ ජනතාවට වැඩියමක් දෙන්නට දකුණේ පාලකයින් පොරොන්දු වන්නට බොහෝදුරට ඉඩ තිබේ. මගේ කල්පනාවේ හැටියට දී තිබෙන සන්දර්භය තුළ ඒක තමයි ගන්නට පුළුවන් උපරිම දේ වන්නේ. පවතින තත්ත්වය තුළ එයිට වැඩිය දෙයක් බලාපොරොත්තු විය නොහැක. එහෙනම් අර ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පුළුවන් තරම් හොඳට කරගැනීම තමයි දෙමළ ජනතාවයේ අරගලය විය යුත්තේ. මේක තමයි අද උපරිම බලාපොරොත්ත්ව විය හැක්කේ. නමුත් මහින්ද රාජපක්ෂ ඇතුළු ඒකාබද්ධ විපක්ෂයේ ජාතිවාදී මැදිහත්වීම තුළ ඒකත් හරියටම සාර්ථක වේදැයි යන්න හරියටම කිව නොහැක. උදාහරණයකට මම නම් කියන්නේ ඒකිය යන වචනය අනිවාර්යයෙන්ම ව්‍යවස්ථාවේ තිබෙනු ඇත. ඒ අනුව එය නව ව්‍යවස්ථාවට ද ඇතුළත් කරන්නට සිදුවේ. ඒක කිසිසේත්ම මේ මොහොතේ ඉවත් කළ නොහැක. ඒක අයින් කළොත් දකුණේ සිංහල ජනයා අවුස්සා කලබලයක් ඇත් කිරීමට මහින්ද රාජපක්ෂගේ පාර්ශ්වයට ඉඩකඩ ලැබෙනු ඇත. අනික් එක බුද්ධාගම ආරක්ෂාකර පෝෂණය කරන බවට පවතින ව්‍යවස්ථාවේ ඇති වගන්තිය, එනම් ව්‍යවස්ථාවේ ඇති ආගමික ස්වරූපයද එසේම පවතිනු ඇත. ඒවා නව ව්‍යවස්ථාවෙන් ද ගැළවීමට හැකි වන්නේ නැත. ඒවා ගැළවුවොත් රටේ කළබල ඇතිවීමට ඉඩ තිබේ. වචන හැටියට ඒවා ව්‍යස්ථාවේ තිබීම ගැන මගේ කල්පනාවේ හැටියට දෙමළ ජනතාව පිළිගැනීමට ඉඩ තිබේ. ඒ අතරම බලය බෙදීම කියන වචනය ඇතුළත් කරන්නට ඉඩ තිබේ. එය සැබවින්ම පරස්පරයක් නිර්මාණය කරනු ඇති නමුත් ඒ ඒ පළාත්වලට සුළුජාතින්ට දෙන අයිතිවාසිකම් ලබාදෙමු කියන තැනට සිංහල ජනතාව ගෙනෙන්නට පුළුවන්නම් ඒක තමයි යම් ප්‍රගතිශීලි පියවරක් වෙන්නට ඉඩ තිබෙන්නේ. මෙය මා කැමති හෝ අකැමැති දේ නොව ඇත්තටම වෙන්නට ඉඩතිබෙන දේ ය.

## ජාතිවාදීන් පාලනය කිරීම

න්‍යායාත්මක විග්‍රහයට අමතරව ප්‍රායෝගික පැත්තට නැඹුරුවන විට උතුර ඇතුළු ව බලය බෙදීම අසාර්ථකත්වයට පත්කර තිබේ. එය හුදෙක් බලය බෙදීමේ සංකල්පයේ වරදක් නිසා සිදුවූවක් නොවේ. දකුණේ පාලකයින් ඒක සුදු අලියෙකු බවට පත්කළ පමණක් නොව සුළු ජාතීන්, විශේෂයෙන්ම උතුරේ නායකයින් එයින් ප්‍රයෝජනය නොගෙත් නිසා ඇති වූ තත්ත්වයකි ඒ. සියලුම දේවල් ඕනෑවට වඩා




යාපනේ දෙමළ ජාතික සභාවේ සාමාජිකයන් පිරිසක්

බරපතල ලෙස දේශපාලනීකරණය වීම මෙයට හේතු වී ඇත. උතුරු පළාත් සභාවට වෙන්කර ඇති මුදලින් 80%ක් ම වියදම් නොකර නැවත භාණ්ඩාගාරයට පැමිණ ඇති බවට වාර්තා පළවිය. එම පළාත් සභාවේ ප්‍රඥප්ති අනුමතකරගෙන තිබෙන්නේ දෙක තුනක් පමණි. මේ මගින් බලය බෙදීම අසාර්ථක බව කියන්නට දකුණේ පමණක් නොව උතුරේ ද ජාතිවාදීන්ට ඉඩලබා දී තිබෙන බව අකැමැත්තෙන් හෝ කියන්නට සිදු වේ. නමුත් ඉන්දියාවේ ප්‍රාදේශීය ආණ්ඩු ඉතා සාර්ථක ය. ලංකාවේ ඒ ආකාරයට පැහැදිලි බල බෙදීමක් ඇත්නම් ඉන්දියාවේ මෙන් සාර්ථකවීමට ඉඩ නැතිවා නොවේ. එහෙත් දැනට ලබාදී තිබෙන බලතලවලින් උපරිම ලෙස ප්‍රයෝජන ගතයුතු ව තිබේ. ඒ අනුව බැලුවොත් බලය බෙදීමෙන් උතුරට වඩා නැගෙනහිර පළාත් සභාව ප්‍රයෝජනයට ගෙන ඇත. දකුණේ මෙන්ම උතුරේ සමස්ත ජනතාව ජාතිවාදී නොවන නමුත් දකුණේ ජාතිවාදී ප්‍රවනතාවයක් තිබෙන ආකාරයටම උතුරේ ද ජාතිවාදී ප්‍රවනතාවයන් තිබේ. මේ ප්‍රවනතා දෙකම සංහිඳියාවක් ඇතිකර ගැනීමට බාධාවක් වී ඇති බව තේරුම් ගතයුතු ය.

ව්‍යවස්ථා නිර්මාණය, බලය බෙදම, මූල්‍ය පහසුකම් ලබාදීම යනාදී සියල්ල සිදු කළත්, ජනතාවගේ විඥානයේම ප්‍රශ්නයක් තිබෙන විට එය සාර්ථක වේ යැයි කිව නොහැක. ඒ නිසා ඉතා වැඩි බරක් ජනතාවගේ විඥාන මට්ටම වැඩි දියුණු කිරීම උදෙසා කළ යුතුව ඇත. ඒ සඳහා මනෝ ගනේෂන් ඇමතිවරයාට අයත් රාජ්‍ය භාෂා හා ජාතික සංවාද පිළිබඳ අමාත්‍යාංශයට විශාල වැඩ කොටසක් කළ හැක. මේ ගැන මම බොහෝ දේ ලියා ඇත. එහි දී වාසුදේව නානායක්කාර ඇමතිවරයාගේ කාලයේ මෙන් අසාර්ථක අමාත්‍යාංශයක් නොකරන ලෙස අවධාරණය කර

පළාත් සභාවේ ප්‍රඥප්ති අනුමතකරගෙන තිබෙන්නේ දෙක තුනක් පමණි. මේ මගින් බලය බෙදීම අසාර්ථක බව කියන්නට දකුණේ පමණක් නොව උතුරේ ද ජාතිවාදීන්ට ඉඩලබා දී තිබෙන බව අකැමැත්තෙන් හෝ කියන්නට සිදු වේ.



www.adaderana.lk



www.youtube.com

න්‍යායාත්මක විග්‍රහයට අමතරව ප්‍රායෝගික පැත්තට නැඹුරුවන විට උතුර ඇතුළුව බලය බෙදීම අසාර්ථකත්වයට පත්කර තිබේ. එය හුදෙක් බලය බෙදීමේ සංකල්පයේ වරදක් නිසා සිදුවූවක් නොවේ. දකුණේ පාලකයින් ඒක සුදු අලියෙකු බවට පත්කළ පමණක් නොව සුළු ජාතීන්, විශේෂයෙන්ම උතුරේ නායකයින් එයින් ප්‍රයෝජනය නොගෙත් නිසා ඇති වූ තත්ත්වයකි ඒ.

තිබේ. වාසුදේව නානායක්කාරට ඇමති කෙනෙක් වෙන්නට හැකිවීම හැර එයින් බලාපොරොත්තු වු දෙය ඉටුවූයේ නැත. මනෝ ගනේෂන් ඇමතිවරයාට ජනතාවගේ විඥාන මට්ටම දියුණු කිරිම සඳහා විශාල වැඩ කොටසක් කරන්නට පුළුවන.

පාසල්වල ඉහළ පංතිවල සිටින ළමුන් සහ ගුරුවරුන් මේ වැඩසටහනට ඇතුළත් කරගත හැක. මෙහිදි ජාතික ප්‍රශ්නය, බලය බෙදීමේ ඇති වැදගත්කම, මානවහිමිකම් යනාදිය සාකච්ඡාවට ගතහැක. මෙයට අමතරව ජනාධිපතිවරයාගේ අවසරය ඇතිව හමුදාව සහ පොලීසි තුළ ද මෙම දැනුවත් කිරීම සඳහා වැඩ පිළිවෙලක් දියත් කිරීමට බැරිකමක් නැත. මේ සඳහා ජනාධිපතිවරයාගේ අනුමැතිය ලබාගැනීමට හැකි බවයි මාගේ මැනීම.

**ආණ්ඩුවේ මැදිහත්වීම**

හමුදාව ව්‍යවස්ථාවට ගරුකළ යුතු බව ජනාධිපතිවරයාට පැවසිය හැක. වෙනත් රටවල හමුදාවට මේ සම්බන්ධයෙන් අවබෝධයක් ලබාදෙන බව සඳහන් කළයුතුව ඇත. හමුදාව යනු ජනතාවගේ සේවකයෙකු මිස ස්වාමියා නොවන බව හමුදාවට ඒත්තු ගැන්විය යුතුව තිබේ. හමුදාව සිවිල් ආණ්ඩුව යටතේ වැඩකළ යුතු ය. මේ සම්බන්ධව හමුදාව දැනුවත් කළ යුතුව ඇත. මේ ආකාරයට ව්‍යවස්ථාමය මූලධර්ම පිළිබඳව හමුදා දැනුවත් කළ යුතුව තිබේ. අනික් අතට වෘත්තිය සමිති ඇතුළුව සිවිල් සංවිධාන හා බිම් මට්ටමේ ජනතාව දැනුවත් කිරීමට ජාතික සංවාද අමාත්‍යාංශය පමණක් නොව රාජ්‍ය නොවන සංවිධානවලට පුළුවන. ආගමික නායකයින්ට ද විශාල වැඩ කොටසක් කළ හැක.  ජනතාව තුළ සවිඥානකත්වය ඇති කිරීම සඳහා එවැනි වැඩ පිළිවෙළක් දියත් කළයුතුව තිබේ. සියලුම දෙනා එකතු වී නායකත්වය දෙන්නේ නම් එය සම්බන්ධීකරණය කර ගැනීමට ද පහසුවක් වනු ඇත. ආණ්ඩුව මේ සඳහා මැදිහත් නොවන්නේ නම් රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සංවිධාන එසේ ක්‍රියාත්මක වන විට ආණ්ඩුවට ද රාජ්‍ය යාන්ත්‍රණය තුළ එවැනි වැඩ පිළිවෙලක් ක්‍රියාවට නැගීමට පෙළඹෙනු ඇත. ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සාකච්ඡාව දැනටමත් ආරම්භ වී තිබේ. එතන තිබෙන සීමාවන් නිසා පහළ මට්ටමේ

> අනික් පැත්තෙන් යුද්ධයෙන් අවතැන් වී සිටින අයට ඒ අයගේ ඉඩම් යළි ලබාදීම පමණක් නොව නිවාස හදාදීම මෙන්ම ඔවුන්ගේ ජීවිත නැවත ආරම්භ කිරීමට උදව් කිරීම යනාදිය අඛන්ඩව කරගෙන යායුතු ය. මේවා තුළ නොයෙකුත් අකටයුතුකම් සිදු වන බවට වාර්තා වේ.

විශාල වැඩපිළිවෙලක් ගෙනයන්නට අවශ්‍යව තිබේ.

අනික් පැත්තෙන් යුද්ධයෙන් අවතැන් වී සිටින අයට ඒ අයගේ ඉඩම් යළි ලබාදීම පමණක් නොව නිවාස හදාදීම මෙන්ම ඔවුන්ගේ ජීවිත නැවත ආරම්භ කිරීමට උදව් කිරීම යනාදිය අඛන්ඩව කරගෙන යායුතු ය. මේවා තුළ නොයෙකුත් අකටයුතුකම් සිදු වන බවට වාර්තා වේ. කොතෙක් දුරට ඒවා සත්‍ය ද යන්න මා දන්නේ නැත. කෙසේ නමුත් වත්මන් ආණ්ඩුව වංචා හා දුෂණ වලට එරෙහිව පිහිටුවූ පාලනයක් වන බැවින් ඒවා වැළැක්වීමට පාලකයින් වගබලාගතයුතු ය.

මට පෙනෙන්නේ හමුදාව අල්ලාගෙන ඉන්න ඉඩම් ඇත්තටම අල්ලාගෙන ඉන්නේ සිංහල ජාතිවාදීන්ගේ උවමනාවකට හෝ දෙමළ අය ගැන ඇති බලවත් සැකයක් නිසාවත් නොව ආර්ථික ප්‍රයෝජනය මත ය. ඒ අය ගොඩනගා තිබෙන ගෙස්ට් හවුස් යනාදිය තරු පහේ හෝටල් වැනිය. ත්‍රිකුණාමලයට අයත් මාබල් බීච් එක මෙන් ම කන්කසන්තුරේ ගියහොත් ඒ ගැන කාටත් දැකගත හැක. හමුදාවේ ඉහළ නිලධාරීන්ට සහ පොලීසියේ ඉහළ නිලධාරීන්ට සැපවිඳින්නට හැකි ආකාරයට ඒවා තනා ඇත. එම නිළධාරීන්ට නිවාඩු ගත කිරීමට සහ විවේක කාලය ගතකිරීමට මේවා යොදාගෙන ඇති බව පැහැදිළිව පෙනෙන්නට තිබේ.

මෙයට අමතරව මධ්‍යම තරමේ ආදායම් ලබා ගැනීමේ මාර්ග ද එම නිළධාරීන්ට පෑදී ඇත. පහළ මට්ටමේ සොල්දාදුවන්ටත් මේවායින් නොයෙකුත් වාසි තිබේ. එහෙයින් මම නම් දකින්නේ දෙමළ ජනයා ගැන ඇති සැකය රාජපක්ෂලා නිතරම අවුස්සන අතර හා ආරක්ෂක අංශවල ඉහළ නිලධාරීන්ට හොඳට හම්බ කරන්නට සහ සැප පහසු ජීවිතයක් ගතකරන්නට තිබෙන අවස්ථාව යන දෙක එකට ගැලපී යමින් තිබේ.

මේ ඉඩම් ලබාගෙන ඒවායේ අයිතිකාරයින්ට ලබාදීම සදාචාරමය වශයෙන් අත්‍යවශ්‍ය ය. එය ඉටු කිරීම ඉහත පෙන්වා දුන් කරුණු නිසා තරමක් අමාරු වී තිබේ. ජනවාරි 8 වෙනිදා ජනතාව කිසියම් ජයග්‍රහණයක් අත්කර ගත්තේ වී නමුත් තවම හමුදාව තම දේශපාලන අරමුණට ගැලපෙන ආකාරයට කළමනාකරණය කරගැනීමට රජය අපොහොසත් වී ඇති බව පෙනේ. එය ප්‍රතිවිප්ලවයක් දක්වා ආපසු ගමන් කිරීමට ඇති ඉඩ කඩ තවමත් බැහැරව ගොස් නැත. එය වඩාත් නරක තත්ත්වයකට මෝරන්නේ ජාතිවාදි කෝලහලයක් තුළ ය. එවැනි අවස්ථාවක් රාජපක්ෂ පාර්ශ්වය නිර්මාණය කළහොත්, හමුදාව පාරට දාන්නට නොහැකි ය. මක් නිසා ද යත් ඔවුන් මේක කොයි පැත්තට හරවයි ද යන්න පිළිබඳ ඇත්තේ සැකයකි. තවමත් ගෝඨාභයගේ බලපෑම හමුදාව තුළ ඇති බව පැහැදිළි

මා ඔහුට අකැමැති වුවත් සරත් ෆොන්සේකාව ආණ්ඩුව තුළට ගැනීම ගැන මම එකඟ ය. ගොඨාභයගේ තර්ජනයට අභියෝග කරන්නට අද ඉන්නේ ඔහු පමණි. මගේ කල්පනාවේ හැටියට හමුදාව තුළ ඒ දේ කරන්නට වෙනත් කවුරුවත් නැත. ෆොන්සේකාට නියෝජ්‍ය ආරක්ෂක ඇමතිකම භාරදෙන්නට තවමත් නොහැකි නමුත් ප්‍රතිවිප්ලවයක් දියත් කිරීමේ තත්ත්වයකට ආවොත් අනිවාර්යයෙන් ඔහුට චරිතයක් නිරූපනය කරන්නට හැකිවේ.

ය. එසේ වුවහොත් තුවක්කුවේ බලය රාජපක්ෂලාගේ අතට පත්වන්නට ඉඩ තිබේ. ඒ නිසා තමයි ව්‍යවස්ථාවට ගරුකරන තැනට හමුදාව පත්කළ යුතු බව මා පැවසුවේ.

මා ඔහුට අකැමැති වුවත් සරත් ෆොන්සේකාව ආණ්ඩුව තුළට ගැනීම ගැන මම එකඟ ය. ගෝඨාභයගේ තර්ජනයට අභියෝග කරන්නට අද ඉන්නේ ඔහු පමණි. මගේ කල්පනාවේ හැටියට හමුදාව තුළ ඒ දේ කරන්නට වෙනත් කවුරුවත් නැත. ෆොන්සේකාට නියෝජ්‍ය ආරක්ෂක ඇමතිකම භාරදෙන්නට තවමත් නොහැකි නමුත් ප්‍රතිවිප්ලවයක් දියත් කිරීමේ තත්ත්වයකට ආවොත් අනිවාර්යයෙන් ඔහුට චරිතයක් නිරූපනය කරන්නට හැකිවේ. රනිල් ඔහුව ගෙනාවේ ඒ අවදානමට මුහුණදීමේ අවශ්‍යතාවය දැනගෙන විය යුතු ය. ඒ වගේ උපායන් තුළින් හමුදාව ආණ්ඩුවට අවශ්‍ය ආකාරයට මෙහෙයවා ගතයුතුවා පමණක් නොව එසේ මෙහෙයවා ගන්නා ලෙස බලකළ යුතු ය. හමුදාව දේශපාලන වැඩවලට බාධා නොකරන තැනකට පත්කර ගැනීම ප්‍රමාණවත් ය. එසේ වුවහොත් ජාතිවාදීන් පාරට බහින විට ප්‍රජාතන්ත්‍රවාදී බලවේග මගින් එම ජාතිවාදී බලවේග පරාජය කළ හැක. නමුත් ඒකට ජනතාව සංවිධානය කරගත යුතු ය. එසේ කරන්නට පුළුවන් දේශපාලනඥයින් ආණ්ඩුවට කොපමණ සිටින්නේ දැයි මා දන්නේ නැත. ප්‍රේමදාස ජනාධිපති මෙන්ම ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කළ ආකාරයට මේ ආණ්ඩුව ජනතාව සංවිධානය කරගතයුතු තිබේ.

අනික් අතට සිවිල් සංවිධානවල එවැන්නක් ගැන ඔලුවේ ඇති බවක් ද පෙනෙන්නට නැත. ප්‍රති විප්ලවයක් පරාජය කළ හැක්කේ ඒ ආකාරයට ජනතාව සංවිධානය කර පාරට ගන්නේ නම් පමණි. අවාසනාවකට මෙන් වගකිව යුතු ප්‍රජාතන්ත්‍රවාදී නායකයින් ගේ ඔලුවට එවැනි දෙයක් තවම පැමිණ නැත. දැන් සිද්ධීන් දිගහැරෙන ආකාරය දෙස බැලීමේ දී එවැන්නක් අවශ්‍යව තිබේ. පසුගිය දවසක අර ආගමන විගමන කාර්යාලයට ගොස් පහර දීම වගේ දේවල් නොව දැන් කළ යුත්තේ පෙර කියූ ආකාරයට ජාතිවාදයට එරෙහිව ජනතාව සංවිධානය කිරීම ය.

කෝලහල තත්ත්වයක් නැතිව කුමන්ත්‍රණ කළ නොහැක. ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අවස්ථාවේ දි නැත්නම්, යුද අපරාධ විභාග කිරීම වැනි අවස්ථාවක දි නැත්නම් රාජපක්ෂ හිරේට ගතහොත්, ඒ වැනි තත්ත්වයක් යටතේ යම් කෝලහල තත්ත්වයන් ඇති කළ හැක. ඒක ඇති වුවහොත් කෙලින්ම ජාතිවාදී පැත්තට හැරෙන්නට ඉඩ තිබේ. මේ ගැනද කල්පනාවට ගෙන ජනතාව අතර පෙර සූදානමක් ඇති කිරීම ඉතාමත් වැදගත් ය.



මෙම සිතුවමින් ද්‍රවිඩ මිතුරා ලද අත්දැකීම සිතුවම් කළෙමි. සටන් පැවති වකවානුවේ වෙඩි වර්ෂාවකට මැදි වූ තැන මවකට අත් වූ ඉරණම ඉන් ප්‍රකාශ වේ. වෙඩි උණ්ඩයට ගොදුරුව මියගිය මවගෙන් කිරිබොමින් සිටි ළදරුවා පිළිබඳ සිදුවීම මා සිතුවම් කළෙමි. මේ අසීමිත සමාන සිදුවීම් දෙක මා දුටුවේ අපරාධයෙහි අමානුෂිකත්වයයි. උත්තරීතර මාතෘත්වයට එල්ලවූ ප්‍රහාරයයි. මාතෘත්වයට ප්‍රහාරයක් එල්ල වන්නේ නම් එය මනුෂ්‍යත්වය අභිමිවීමේ අන්තිම රේඛාව හා ප්‍රචණ්ඩත්වයේ උපරිමය පිළිබඳ සංකේතයය.

චිත්‍රය : **මාලිකා සංජීවනී**

# තීරණාත්මක පියවරයන් කීපයක් ගත්තත් රජයේ කටයුතු මන්දගාමියි

දෙමළ ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී එම්. ඒ. සුමන්දිරන් මහතා සමග පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව

**ප්‍රතිසන්ධානය සඳහා දමිළ ජාතික සන්ධානයේ ප්‍රමුඛතා මොනවා ද?**

දමිළ ජාතික සන්ධානය දෙමළ ජාතික ප්‍රශ්නය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විසඳුම ප්‍රතිසන්ධානය සඳහා අති ප්‍රමුඛ ලෙස සලකනවා. නිවැරදි කිරීමේ පියවරක් අවශ්‍ය කරන විසම්බන්ධයක් තිබෙන බවට හැම කෙනෙක්ම පිළිගන්නා කාරණයම ප්‍රමාදයකින් තොරව මේ අති මූලික ප්‍රශ්නය සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතුව තිබෙන බව පෙන්නුම් කරනවා. මෙය දමිළ ජනයාට එරෙහිව කෙරුණු උල්ලංඝනයන් සඳහා සත්‍යය, යුක්තිය හා හානිපූර්ණය වැදගත් නොවේ යයි කියනවා නොවෙයි. ඒවා ද එලෙසම වැදගත්. කෙසේ වුව ද කාල රාමුවක් තුළ 'අයෙකුගේ අනාගතය' සුරක්ෂිත කිරීම 'අතීතය දෙස බලනවාට' පෙර සිදු විය යුතු යි. අයෙකුට අතීතය සම්බන්ධයෙන් ඉතාමත් ඵලදායී ලෙස ක්‍රියා කළ හැක්කේ එවිට පමණයි.



dailymirror.lk

**වර්තමාන ආණ්ඩුව සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ ප්‍රශ්නවලට ආමන්ත්‍රණය කිරීම වෙනුවෙන් සතුටුදායක පියවර ගෙන තිබෙනවා යයි ඔබ සිතනවා ද? ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වයෙහි ප්‍රගතියක් ඇතිව තිබෙනවා ද? කරුණාකර නිදසුන් දෙන්න.**

වර්තමාන ආණ්ඩුව උතුර හා නැගෙනහිර කොටස්වල ඉඩම් මුදා හැරීම ඇතුළු විශේෂිත ක්ෂේත්‍රවලට අදාළව ඇතැම් තීරණාත්මක පියවර ගෙන තිබෙනවා. නමුත් එම සුළු කරුණුවලට පවා අදාළ ප්‍රගතිය ගතහොත් කණගාටුදායක අන්දමින් මන්දගාමීයි. සත්‍යය නිර්ණය කර ගැනීම සම්බන්ධයෙන් ගතහොත් කිසිදු ධනාත්මක පියවරක් ගෙන ඇත්තේ නැහැ. පරණගම කොමිසම දිගටම කටයුතු කිරීම මගින් කර ඇත්තේ තත්ත්වය වඩාත් නරක අතට හැරවීම පමණයි.

**ජිනීවා යෝජනාව සම්මත කිරීම සම්බන්ධයෙන් දමිළ ජාතික සන්ධානය ප්‍රධාන භූමිකාවක් රඟ පෑවා. ප්‍රතිඵලය සම්බන්ධයෙන් ඔබ සතුටු වෙනවා ද? යෝජනාවේ වූ පොරොන්දු ඉටු කරනු ඇතැයි ඔබ විශ්වාස කරනවා ද? ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ප්‍රතිෂ්ඨාවන් මොනවා ද?**

ශ්‍රී ලංකා ආණ්ඩුවේ සම අනුග්‍රහයෙන් යුතුව සම්මත කරන ලද ආනුෂංගික යෝජනාව සම්බන්ධයෙන් අප ඉතාමත් සතුටු වෙනවා. මෙයින් ශ්‍රී ලංකාව යෝජනාව අයත් කර ගෙන එහි සෑම කොටසක්ම සම්පූර්ණ වශයෙන් ක්‍රියාවට නැගීමේ වගකීම භාර ගැනීම සහතික කළා. එය සිදු වුණේ නැති නම් යෝජනාව මොන තරම් ශක්තිමත් වුවත් එය එතෙකුත් ආණ්ඩුව පැත්තෙන් ක්‍රියාත්මක කිරීමේ පොරොන්දුවක් නැති බැඳීමක් නැති එකක් වෙන්න තිබුණා.

> ආරක්ෂක අංශ ප්‍රතිසංස්කරණය ඕනෑම සංක්‍රාන්තික තත්ත්වයක දුෂ්කරම කටයුත්ත යයි කියනු ලබනවා. කෙසේ වුවත් දමිළ ජනතාවට හුදෙක් විශ්වාසය ලබා දීමට පමණක් නොව අතීතය නැවත ඇති නොවීම දමිළ ජනතාවට සහතික කිරීම සඳහා එය ඉතා වැදගත් වෙනවා.

විවිධ හේතූන් නිසා කිරීම අපහසු යයි ආණ්ඩුව කියා සිටිය හැකි ඇතැම් අංග තිබිය හැකි වුවත් යෝජනාවේ පොරොන්දුවලින් බොහොමයක් ඉටු කරනු ඇතැයි අපි සිතනවා. එක් බරපතල කාරණයක් වන්නේ නීති කෘත්‍යමය යාන්ත්‍රණය තුළ විදේශ සහභාගිත්වය පිළිබඳ කාරණය යි.

**යෝජනාව "පොදු රාජ්‍ය මණ්ඩල හා වෙනත් විදේශ විනිශ්චයකාරවරුන්, විත්ති නීතීඥයින් හා බලයලත් අභිචෝදකයින් හා විමර්ශකයින්"ගේ සහභාගිත්වයෙන් යුත් විශේෂ නීති උපදේශකයෙක් සහිත විශේෂ අධිකරණයක් සඳහා ඉඩ සලසනවා. ශ්‍රී ලංකාවේ මිශ්‍ර අධිකරණයක් පිහිටුවිය හැකි යයි ඔබ සිතනවා ද? ශ්‍රී ලංකාවේ එවැනි යාන්ත්‍රණයක විදේශ පුද්ගලයින්ට වැඩ කළ හැකි ද? ක්‍රියාත්මක වෙමින් පවත්නා අධිකරණයක් හා නීතිමය සහෝදරත්වයක් තිබෙන විට එය අවශ්‍යය ද?**

මිශ්‍ර අධිකරණයක් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කළ හැකිවා පමණක් නොවයි, ඒකාන්ත අවශ්‍යතාවක් ද වෙනවා. අපේ නීතිමය යාන්ත්‍රණය තුළ විදේශ කාර්ය පිරිස් වැඩකර තිබෙනවා. විදේශ බේරුම්කරුවන් ඉතා ඵලදායී භූමිකාවක් රඟපානවා වගේම ඔවුන්ට එවැනි භූමිකාවක් රඟපෑ හැකියි. කලින් තනිකරම වූ දේශීය යාන්ත්‍රණයන් දිගු කාලයක් පුරා යුක්තිය අහිමිකර තිබෙන වින්දිත ප්‍රජාවේ විශ්වාසය ටිකෙන් ටික දිනා ගැනීමට මෙය අවශ්‍ය යි.

**එමෙන්ම සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසමකට හා අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාලයකට ඉඩ සලසා තිබෙනවා. මේ දෙකම සංක්‍රාන්ති යුක්තිය ඇතුළත දැන ගැනීමේ අයිතිය පිළිබඳ කුළුණ තුළට අයත්වනු ඇති ඒවායි. අතීතයේ දී ශ්‍රී ලංකාවට බොහෝ කොමිෂන් සභා තිබිලා තිබෙනවා. එහෙත් ඒවා සත්‍යය සොයා ගැනීමට වින්දිතයින් මෙහෙයවා නැහැ. මේවායේ යම් වෙනසක් තිබෙන්නේ ඇයි? ඔබ හිතනවා ද ශ්‍රී ලංකාවට මේවා අවශ්‍ය යයි කියලා? ඒවා ස්වාධීනව ක්‍රියා කරන්නට හා වින්දිතයින්ට පිළිතුරු සැපයීමට සමත් වෙයි ද?**

අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාලයට ද එහි වැඩ කටයුතු ඵලදායී ලෙස කර ගෙන යාමට හා සැබෑ ලෙසම සත්‍යය සොයා ගැනීමට මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයෙන් (*OHCHR*) හා අනෙක් ඒවායින් ඉතා බලගතු තාක්ෂණික සහාය ලැබිය යුතු යි. පාර්ශ්ව දෙකම පරිමාණය නොතකා අපරාධ පිළිබඳ වරදකාරීබව පැහැදිලි වූ විට එවිට ස්වාධීනව ක්‍රියා කරන්නට හා වින්දිතයින්ට පිළිතුරු සපයන්නට හැකි වනවා යයි කියන් පුළුවන්.

**ශ්‍රී ලංකාවෙහි අතුරුදහන්වූවන් හා නැතිවූ පුද්ගලයින් සැලකිය යුතු සංඛ්‍යාවක් සිටිනවා. ශ්‍රී ලංකාව බලහත්කාර හෝ අතුරුදහන්වීම් පිළිබඳ වැඩ කණ්ඩායම හමුවේ පවතින දෙවන විශාලතම අතුරුදහන් වූවන්ගේ සංඛ්‍යාව සිටින රට වන අතරම ආණ්ඩුව විසින් 2016 පෙබරවාරි දක්වා තව දුරටත් දීර්ඝ කරන ලද පරණගම කොමිසමට ඉදිරිපත් කරන ලද පැමිණි 24,000 කට වැඩි ගණනක් තිබෙනවා. නැති වූවන්/අතුරුදහන් වූවන් පිළිබඳ සිද්ධි සම්බන්ධයෙන් දමිළ ජාතික සන්ධානය කරන්නේ මොනවා ද?**

මේ සම්බන්ධයෙන් ඵලදායී ලෙස හා කඩිනම්ව ක්‍රියා කරන්නැයි දමිළ ජාතික සන්ධානය ආණ්ඩුවෙන් අනවරතවම ඉල්ලා තිබෙනවා. ආණ්ඩුව නැවතත් මේ කාරණා පිළිබඳව පොරොන්දු දුන් විට අපි පසුගිය




ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන සහ විපක්ෂ නායක ආර්. සම්බන්ධන් උත්සව අවස්ථාවක

මාසයේ දී මේ පිළිබඳව හා දේශපාලන සිරකරුවන් පිළිබඳව පාර්ලිමේන්තුවේ දී කල් තැබීමේ යෝජනාවක් ඉල්ලා බල කර සිටියා. ඉදිරියේ එන දිනවල දී ආණ්ඩුව ගෙන එන විවිධ යාන්ත්‍රණයන් දෙස බලා ඒවා ක්‍රියාත්මක කිරීමට අපි දායකත්වයක් ලබා දෙනවා.

**හානි පූර්ණ සඳහා කාර්යාලයක් පිහිටුවීම ඇතුළුව හානි පූර්ණය පිළිබඳ ප්‍රශ්නයට ආමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් ද පිළිගැනීමක් තිබෙනවා. හානි පූර්ණයන් සම්බන්ධයෙන් කළ යුතුව තිබේ යයි ඔබ සිතන්නේ මොනවා ද? ආණ්ඩුවට මෙම ප්‍රශ්නවලට ඵලදායී ලෙස ආමන්ත්‍රණය කළ හැකි යයි ඔබ සිතනවා ද?**

විවිධ කාරණාවලට අදාළව සත්‍යය තහවුරුකර ගත් විට පීඩාවට පත්ව තිබෙන ජනයා ආණ්ඩුව විසින්ම ඍජුව වගකිව යුතු වූ හා ඔවුන්ගේ අභිමිකරීම්වලට කෙලින්ම ආණ්ඩුව මත වරද පැටවිය නොහැකි වූ යනුවෙන් ප්‍රභේද දෙකකට අයත්වන බව දකින්න පුළුවන්. පළමුවන ප්‍රභේදයට ආණ්ඩුවේ සදෝෂත්වය පිළිගන්නා ආකාරයකින් වන්දි ගෙවිය යුතුව තිබෙන අතර දෙවන කණ්ඩායමට කෙසේ වෙතත් ඔවුන්ගේ තත්ත්වය සම්බන්ධයෙන් ආණ්ඩුව වගකීම ගන්නා පදනමක් මත වන්දියක් ගෙවීම අවශ්‍යයි.

**දමිළ ජාතික සන්ධානය නීත්‍යානුකූල හිමිකරුවන්ට ඉඩම් ලබා දෙන ලෙස ඉල්ලා තිබෙනවා. උතුර හා නැගෙනහිර සමහර ඉඩම් ආපසු ලබා දී තිබෙනවා, නමුත් තවමත් දහස් ගණන් දිගටම අවතැන්ව සිටිනවා. ඉඩම් ආපසු ලබා දීමේ ප්‍රමාදය කුමක් ද? සියලුම ඉඩම් නීත්‍යානුකූල ඉඩම් හිමියන්ට දිය යුතු යයි ඔබ සිතනවා ද?**

2015 හා 2016 සාම්පූර්වල හා යාපනයේ සමහර කොටස්වල ඉඩම් නීත්‍යානුකූල හිමිකරුවන්ට ලබා දීම ජනතාව සඳහා විශ්වාසය ගොඩ නැගීමේ වැදගත් පියවරක් වශයෙන් අපි සාදරයෙන් පිළිගන්නවා. නමුත් නීත්‍යානුකූල හිමිකරුවන්ට අනෙකුත් පෞද්ගලික ඉඩම් ආපසු ලබා දීම සඳහා තවත් බොහෝ දේ කළ යුතුව තිබෙනවා. ඉඩම් ආපසු ලබා දීමේ ප්‍රමාදය දේශපාලන හේතූන්ට වඩා හමුදාවේ පසුබට වීම හේතු කොට ගෙන වන්නක් විය හැකියි. මෙය ඉක්මනින් ආමන්ත්‍රණය කළ යුතු අතර ආණ්ඩුව ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනගේ මැතිවරණ පොරොන්දුවක් වූ ඉඩම් නීත්‍යානුකූල හිමිකරුවන්ට ආපසු ලබා දීම මගින් එය ඉටු කරන්න ඕන.

**ආණ්ඩුව ත්‍රස්තවාදය වැළක්වීමේ පනත හා අනෙකුත් ආරක්ෂක නීති විමර්ශනය කිරීමට හා අහෝසි කිරීමට පොරොන්දු වී තිබෙනවා. දමිළ ජාතික සන්ධානය ප්‍රතිසංස්කරණවලට මැදිහත් වෙනවා ද? මෙම පියවර කෙතරම් වැදගත් ද?**

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම ඉතාම වැදගත්. එම නීතිය වසර 30 කට අධික කාලයක් පුරා ඉමහත් හානියක් කර තිබෙනවා. එම නිසා එය වෙනත් එකකින් ආදේශ කරන්නට අපේක්ෂා කරන විට නව නීතිය තුළ එවැනි ඉතා දරුණු විධිවිධාන කිසිවක් ඇතුළත් නොවීම සහතික වීමට අපි සහතිකවම අපගේ උකුසු ඇස් යොමු කරනු ලබනවා.

**ඒ වගේම යෝජනාව ආරක්ෂක අංශ**

> ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකම එකට එක්ව තිබෙන හා ජාතික ආණ්ඩුවක් පිහිටුවා තිබෙන වත්මන් දේශපාලන සන්දර්භය ඇතුළත ආයතන ප්‍රතිසංස්කරණ කිරීමේ හැකියාව තිබෙනවා. මෙම අවස්ථාව අහිමිකර නොගත යුතු යි. විධායක හා ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ හැරුණු විට අධිකරණයෙහි ද බරපතල ප්‍රතිසංස්කරණයක් අවශ්‍ය කෙරෙනවා.

**ප්‍රතිසංස්කරණ ද යෝජනා කරනවා. මේ සම්බන්ධයෙන් ඔබේ අදහස් මොනවා ද? මෙය අවශ්‍ය ද? මෙය දමිළ ජනතාවට විශ්වාසයක් ගෙන දෙනු ඇද්ද?**

ආරක්ෂක අංශ ප්‍රතිසංස්කරණය ඕනෑම සංක්‍රාන්තික තත්ත්වයක දුෂ්කරම කටයුත්ත යයි කියනු ලබනවා. කෙසේ වුවත් දමිළ ජනතාවට හුදෙක් විශ්වාසය ලබා දීමට පමණක් නොව අතීතය නැවත ඇති නොවීම දමිළ ජනතාවට සහතික කිරීම සඳහා එය ඉතා වැදගත් වෙනවා.

**සත්‍යය සොයා ගැනීම හා වැරදිකරුවන් වගකීමට අසුකර ගැනීම ප්‍රතිසන්ධානයට ආධාර වේ යයි නැතහොත් බාධා කරන්නේ යයි ඔබ සිතනවා ද? එය ප්‍රජාවන් වඩාත් අවුස්සන්නේ/ධ්‍රැවීකරණය කරන්නේ නැතිද?**

එය සැබවින්ම සියලු ප්‍රජාවන්ට ඉතා වේදනාකාරී වුවත් සත්‍යය සොයා ගැනීම හා වැරදිකරුවන් වගකීමට අසුකර ගැනීම යන්න කිසිදාක ප්‍රතිසන්ධානයට බාධා කරන්නේ නැහැ. අප එකිනෙකාට බිහිසුණු දේවල් කර තිබෙනවාය යන සත්‍යයට මුහුණ දීමට සමත් නොවෙතොත් ප්‍රතිසන්ධානය සඳහා අවස්ථාවක් සැලසෙන්නේ නැහැ. හුදෙක් විශේෂිත අපරාධ පිළිබඳ 'වරදකරුවන්' නොව පමණක් නොව සත්තකින්ම අපි සියලු දෙනාම වගකීම භාරගත යුතු වෙනවා. එහෙයින් 'දඬුවම්' එය පිළිබිඹු කළ යුතු අතර අපි ඒවා සැලසුම් කරන ආකාරයෙහි පරිකල්පනීය විය යුතු යි.

**විමර්ශනවලට සහය වීමට ඉදිරිපත්වන වින්දිතයින් හා සාක්ෂිකරුවන් සඳහා වන අරාක්ෂක රාමුව ප්‍රමාණවත් යයි ඔබ සිතනවා ද? අතීතයේ දී වින්දිතයින්ට හා සාක්ෂිකරුවන්ට තර්ජනයකර හා හිරිහැරකර තිබෙනවා. මේ තත්ත්වය සතුටුදායක මට්ටමකට ගෙන ඒමට පුළුවන් ද? වින්දිතයින්ට හා සාක්ෂිකරුවන්ට ආරක්ෂාව නොමැති නම් දේශීය යාන්ත්‍රණයන්ට දමිළ ජාතික සන්ධානය සහාය දෙනවා ද?**

ආරක්ෂණ රාමුව වැඩ කරනු ඇත්තේ එම කටයුතු පැවරී තිබෙන නිලධාරීන් ඒකාන්ත වශයෙන් අපක්ෂපාතීවන හා කාර්යය සහ කැපවීම පිළිබඳව හැඟීමක් තිබෙන තාක් දුරට පමණයි. වත්මන් තත්ත්වය තුළ බොහෝ දේ ඇසිය යුතුව තිබෙන බව පෙනෙනවා! අප කටයුතු කර ගෙන යන විට තත්ත්වය ඇගයීමකට ලක්කරනවා. ඒ වගේම විශේෂ ප්‍රශ්න පැන නගින විට ඒවාට ආමන්ත්‍රණය කරනවා.

**ප්‍රතිසන්ධානය සඳහා අවශ්‍ය කරන ආයතනික ප්‍රතිසංස්කරණ මොනවා ද? වත්මන් දේශපාලන සන්දර්භය තුළ මේවා කළ හැකි යයි ඔබ සිතනවා ද?**

ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකම එකට එක්ව තිබෙන හා ජාතික ආණ්ඩුවක් පිහිටුවා තිබෙන වත්මන් දේශපාලන සන්දර්භය ඇතුළත ආයතන ප්‍රතිසංස්කරණ කිරීමේ හැකියාව තිබෙනවා. මෙම අවස්ථාව අහිමිකර නොගත යුතු යි. විධායක හා ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ හැරුණු විට අධිකරණයෙහි ද බරපතල ප්‍රතිසංස්කරණයක් අවශ්‍ය කෙරෙනවා.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණවලට දමිළ ජනයාට ක්‍රමානුකූල වෙනස්කොට සැලකීම සම්බන්ධයෙන් නිශ්චිත විසඳුමක් ගෙන ඒමට හැකි යයි ඔබ විශ්වාස කරනවා ද? එසේ නම් එසේ විශ්වාස කරන්නේ මන් ද? කෙසේ ද?**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කියන්නේ රටක පුරවැසියන් අතර ඇතිකර ගන්නා සමාජ ගිවිසුමක්. එය පාලනය කරන්නේ එක අස්තිත්වයක් ලෙස ජීවත් වන්නට අප එකඟ වීම මගිනුයි. අපේ රටේ 'ජනරජ' ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා දෙකම දමිළ ජනතාව සම්පූර්ණයෙන්ම හැර දමනු ලැබුවා. දැන් අප එය නිවැරදි කරන්නේ නම් හා එකී නීති යළි අර්ථ නිරූපණය කර අන්‍යොන්‍ය වශයෙන් එකඟ විය හැකි සමාජ ගිවිසුමකට එළඹෙන්නේ නම් ක්‍රමානුකූල වෙනස්කොට සැලකීම අවසානයකට ගෙන ඒමට අපට හැකිවන හැම අවස්ථාවක්ම තිබෙන බව කිව යුතු යි.

**ආර්ජන්ටිනාව, කාම්බෝජය, රුවන්ඩාව, සියරාලියෝන් ආදී රටවල් වැනි යුද්ධය හා හිංසනය අත් දුටු බොහෝ රටවල් සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ ප්‍රශ්නවලට ආමන්ත්‍රණය කිරීමට දශක ගණනාවක් ගෙන තිබෙනවා. ඇතැම් ඒවා තවමත් මේ ක්‍රියාවලින් ඔස්සේ ගමන් කරමින් සිටිනවා. ශ්‍රී ලංකාවට ආසන්න අනාගතයේ දී සැබෑ පරිවර්තනයක් හා විශ්වසනීය හා ස්වාධීන යාන්ත්‍රණයන් තිබෙනවා දකින්නට ලැබේ යයි ඔබ විශ්වාස කරනවා ද? ශ්‍රී ලංකාව හා ශ්‍රී ලාංකිකයන් සත්‍යය, යුක්තිය ආදිය මුදුන්පත්කර ගැනීමේ ක්‍රියාවලිය තුළ රැඳී සිටීම සහතික කිරීම සඳහා අවශ්‍ය වන්නේ මොනවා ද?**

සිදුවන්නේ කුමක් ද කියලා දිවැස් කියන්න මට බැහැ! මට කිව හැකි දේ වන්නේ දැන් අපට සැබෑ පරිවර්තනයක් ඇතිකර හැකි ය යන්නයි. අවසාන සාර්ථකත්වයට දායකවන බොහෝ සාධක තිබෙනවා කියල යි.



අප රටේ නීතිය දැන් ක්‍රියාත්මක වෙන්න ඕන කම නිසා වූ නීතියක් බවට පත්ව තිබේ. වැරදි කරන්නා වැරදිකරු බවට හඳුනාගත්තත්, අපි ඔහුව සැක කරන්නේ සැකකරුවෙක් ලෙසයි. මේ විදියට කාලය නිකම්ම ගතවෙනවා. මේ හේතුව නිසා නීතිය ගැන අවිශ්වාසය ඇතිවෙනවා. වැරදි කරුවෙක් නීතිය ඉදිරියට ගෙනගියොත් සාකච්ඡා කරන්නේ ඔහු වැරදිකරුවෙක්ද නැත්ද යන්න තීරණය කිරීමටයි. එබැවින් නීතිය කියන්නේ ඇස්පිහදාන වැඩපිළිවෙලක් මිස වැරදිකරුවන්ට දඩුවම් දෙන ක්‍රියාදාමයක් නොවේ.

චිත්‍රය : ක්‍රිෂ්ණප්‍රිය තර්මක්‍රිෂ්ණර්


# සංක්‍රාන්ති යුක්තිය හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම



**යෝගේස්වරන් පියතුමා**

ශ්‍රී ලංකාව අද සත්‍යය හා යුක්තිය පිළිබඳ බලාපොරොත්තුව සමග අතිනත ගත් පරිවර්තනයක් අත්දකිමින් සිටී. මීට පෙර අපි හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග තෝරාපත් කරනු ලැබීමෙන් පසු කාලය තුළ ඒකාධිපති ආණ්ඩුවක සිට ප්‍රජාතන්ත්‍රීය සාරධර්මවලට බැඳී සිටීමේ කැමත්තෙන් යුත් ආණ්ඩුවක් කරා පරිවර්තනය වීමේ දී මෙවන් ප්‍රයත්නයක් අත් දුටුවෙමු. ඇය ද විවිධ විමර්ශන කොමිෂන් සභා පත් කිරීම මගින් හා රටට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හරහා අසාධාරණයන්ට ආමන්ත්‍රණය කිරීමේ සමාන උත්සාහයන් දැරුවා ය. ඒ කාලයෙහි එක්සත් ජාතීන් හා ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරි පෙරමුණේ නොසිටි අතර දැන් ඉදිරියට පැමිණ සිටී. කලින් ප්‍රයත්නයන් අසාර්ථක වූයේ අනෙකුත් දේශපාලන පක්ෂ හිටපු ජනාධිපති කුමාරතුංගගේ ආණ්ඩුව සමග සහයෝගී නොවීම හේතු කොට ගෙන ය.

අද දවසේ සන්දර්භීය තත්ත්වය බොහෝ වෙනස් ය. ශ්‍රී ලංකාව සිවිල් යුද්ධය නිමකර තිබේ. එක්සත්




www.onlanka.com

**විධායක ජනාධිපති ධූරය අහෝසි කරන බවට හා යහ පාලනය ක්‍රියාත්මක කරන බවට පොරොන්දු වූ පුද්ගලයෙකු ජනාධිපති වශයෙන් පත් කර ගැනීමට ඡන්දය පාවිච්චි කළේ මෙම සන්දර්භය තුළ ය. තව ද ශ්‍රී ලංකා ආණ්ඩුව වගවීම හා ප්‍රතිසන්ධානයට ආමන්ත්‍රණය කිරීමට අර්ථවත් උත්සාහයන් ගන්නා බවට සහතික වෙමින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ දී එකඟතා යෝජනාවකට ද ඇතුළු විය.**

ජාතීන් හා ජාත්‍යන්තර ප්‍රජාව යුද්ධය හා සුළුතර ජනයාගේ පීඩාවන් පිළිබඳ සිය අවධානය ප්‍රකාශයට පත්කර තිබේ. එමෙන්ම පශ්චාත්-යුද තත්ත්වය තුළ රටේ අනෙකුත් සුළුතර ජනතාවන් කරා වන ආණ්ඩුවේ ක්‍රියාවන් පිළිබඳව ද අවධානය යොමුකර තිබේ. මේ සන්දර්භය තුළ ශ්‍රී ලංකා ආණ්ඩුව මානව හිමිකම් සමග බෙහෙවින් සම්බන්ධිත ප්‍රශ්න පිළිබඳ එහි වාර්තා සම්බන්ධව එක්සත් ජාතීන් විසින් කරනු ලබන පරීක්ෂාවන්ට පාත්‍රව තිබේ. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ දී යෝජනා ගණනාවක් සම්මත කිරීමෙන් හා උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ අසමත් භාවය නිරීක්ෂණය කිරීමෙන් පසු එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය ශ්‍රී ලංකා ආණ්ඩුවේ ක්‍රියාවන් පිළිබඳව බෙහෙවින් බලාපොරොත්තු කඩවීමකට පත්ව තිබුණි.

2015 ජනවාරිවල ශ්‍රී ලංකාවේ ජනතාව තමන් විධායක ජනාධිපති ධූරය අහෝසි කරන බවට හා යහ පාලනය ක්‍රියාත්මක කරන බවට පොරොන්දු වූ පුද්ගලයෙකු ජනාධිපති වශයෙන් පත් කර ගැනීමට ඡන්දය පාවිච්චි කළේ මෙම සන්දර්භය තුළ ය. තව ද ශ්‍රී ලංකා ආණ්ඩුව වගවීම හා ප්‍රතිසන්ධානයට ආමන්ත්‍රණය කිරීමට අර්ථවත් උත්සාහයන් ගන්නා බවට සහතික වෙමින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ දී එකඟතා යෝජනාවකට ද ඇතුළු විය.

ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් දෙන ලද එක් පොරොන්දුවක් වන්නේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීම ය. අද පාර්ලිමේන්තුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක සභාවක් බවට පරිවර්තනය වී තිබේ. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ වී තිබේ. එසේම ශ්‍රී ලංකා ආණ්ඩුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සඳහා කමිටුවක් ද පත් කළේ ය. එය නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව ජනතා අදහස් ලබා ගැනීමට දිවයින පුරා ජනතාව මුණ ගැසීමට ගියේ ය. ඉන් සිය අදහස් ප්‍රකාශ කිරීමට මේ රටේ පුරවැසියන්ට වේදිකාවක් විවෘත විය. එය කලින් ජනරජ ව්‍යවස්ථා දෙක සම්පාදනය කිරීමේ දී දක්නට නොලැබුණු අත්දැකීමකි. විවිධ අදහස් ප්‍රකාශකර තිබුණ අතර කමිටුව එහි වාර්තාව අප්‍රේල් මස අවසානය වන විට ඉදිරිපත් කරනු ඇත. මෙම වාර්තාව

කේන්ද්‍රයෙහි බලය බෙදා හදා ගැනීම පවත්වා ගැනීමේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය අලුතෙන් පිහිටුවනු ලබන පරිපාලන ඒකකයට දීමට අවශ්‍ය කරන බලතල මොනවා ද හා කොතෙක් දුරට ද යන්න හඳුනා ගැනීම අවශ්‍ය ය.

ලැබෙන තෙක් හා පාර්ලිමේන්තු විවාදය ආරම්භ වන තෙක් බලා සිටින අතරම එළඹෙමින් තිබෙන ක්‍රියාවලිය පිළිබඳව ද නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කිරීමේ දී ද සැලකිල්ලට ගත යුතු ආවර්ජන ස්වල්පයක් මෙහි ඉදිරිපත් කෙරේ.

## පූර්විකාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පූර්විකාවක් යනු අපට උවමනා කරන දෙය හා ඒවා අපට අවශ්‍ය කරන්නේ මන් ද යන දෙය ප්‍රකාශ කරන්නා වූ පදනම ඉදිරිපත් කරන්නකි. සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ ක්‍රියාවලිය තුළ මෙම පූර්විකාව සියලුම පුරවැසියන්ගේ ප්‍රතිෂ්ඨාවන් ප්‍රකාශ කිරීම අවශ්‍ය ය. සිවිල් යුද්ධයට මග පෑදූ හේතු, බෙදීම්වලට සම්බන්ධ හේතු, දූෂණයට, ඥාති සංග්‍රහයට, ආඥාදායකත්වයට මග පෑදූ වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දෝෂ, යහ පාලනය අසාර්ථක වීමට හේතු ආදිය හඳුනා ගැනීම අවශ්‍ය වන අතර නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඔස්සේ 'නැවත ඇති නොවීමේ' පදනම ශක්තිමත් කිරීම අවශ්‍ය ය.

## ක්‍රියාත්මක වෙමින් පවතින පාරදෘශ්‍ය ක්‍රියාවලිය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කමිටුව එහි වාර්තාව අප්‍රේල්වල දී පාර්ලිමේන්තුවට (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක සභාවට) ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අප බලා සිටින අතර යෝජනා ඉදිරිපත් කරන ලද බොහෝ දෙනා ජනතාවගෙන් අදහස් විමසීමේ ක්‍රියාවලිය ඔවුන් අගය කරන බව ප්‍රකාශකර තිබේ. එසේම ඔවුහු මෙම පාරදෘශ්‍යභාවය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක සභා ක්‍රියාවලිය තුළමත් ප්‍රකාශයට පත්විය යුතු බව ප්‍රකාශ කරති. විවාද කරනු ලබන ක්ෂේත්‍ර, තවමත් ගැටුම් ප්‍රකාශවන ක්ෂේත්‍ර හා එකඟත්වයට එනු ලබන ක්ෂේත්‍ර ද එසේම සිය අදහස් ප්‍රකාශ කරමින් ක්‍රියාවලිය තුළ අඛණ්ඩව නියැලිය හැකි තැන් ද ජනතාවට දැන ගැනීමට සැලැස්වීම අවශ්‍ය ය.

## ඒකීය එරෙහිව සන්ධීය (ෆෙඩරල්)

මේ වන විටත් ඉහත සඳහන් වචන දෙක සම්බන්ධයෙන් බෙහෙවින් විවාද වෙමින් තිබෙන අතර ඒවායේ අර්ථ බොහෝ වෙනස් ආකාරයන්ගෙන් තේරුම් ගෙන ඇත. කාරණයේ වැදගත්ම දෙය වන්නේ බලය බෙදා හදා ගැනීම හා දිවයින සඳහා පරිපාලන ඒකක සකස් කර ගැනීම ය.

ප්‍රශ්නය වන්නේ රට පරිපාලන කටයුතු සඳහා වත්මන් පළාත් සභා සීමා මායිම් පවත්වා ගන්නේ ද නැතහොත් සීමා මායිම් වෙනස් ආකාරයකට ඇඳිය යුතු ද යන්න ය.

බෙදන ලද බලතලවලට අදාළව වත්මන් පළාත් සභා ක්‍රමයට ලැයිස්තු තුනක් තිබේ. එකක් පළාත් සභාවට අදාළ කරුණු ය. තවත් එකක් මධ්‍යම ආණ්ඩුවට අදාළ කරුණු ය. තුන්වැන්න සමගාමී ලැයිස්තුව ය. මෙය කේන්ද්‍රය පළාත් කටයුතුවලට මැදිහත් වීමේ ආකාරයක් වශයෙන් මහත් ව්‍යාකූලතාවක් ඇති කර තිබේ.

තව ද වත්මන් පළාත් සභා පරිපාලනය විධායක බලතල බොහොමයක් ආණ්ඩුකාරවරයාට ප්‍රදානය කරයි. එය ද පළාත් සභා පරිපාලනය තුළ බෙහෙවින් ගැටුම් ඇති කරයි.

කේන්ද්‍රයෙහි බලය බෙදා හදා ගැනීම පවත්වා ගැනීමේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය අලුතෙන් පිහිටුවනු ලබන පරිපාලන ඒකකයට දීමට අවශ්‍ය කරන බලතල මොනවා ද හා කොතෙක් දුරට ද යන්න හඳුනා ගැනීම අවශ්‍ය ය.

කේන්ද්‍රයෙහි බලය බෙදා හදා ගැනීම පවත්වා ගැනීමේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය අලුතෙන් පිහිටුවනු ලබන පරිපාලන ඒකකයට දීමට අවශ්‍ය කරන බලතල මොනවා ද හා කොතෙක් දුරට ද යන්න හඳුනා ගැනීම අවශ්‍ය ය.

යළිදු මාර්ගෝපදේශක මිනුම් දණ්ඩ සොයා ගනු ලැබිය හැකි වනුයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පූර්විකාව තුළ ය. එය මෙම රටේ සුළුතර ජනයාගේ අපේක්ෂාවන් ඉටු කරන්නේ ද හා මෙම බලය බෙදා හදා ගැනීම හා අතීතය නැවත සිදු නොවීමට අවශ්‍ය කරන ව්‍යුහය සපයන්නේ ද යන්නෙහි ය.

## විධායක ජනාධිපති ක්‍රමය එරෙහිව පාර්ලිමේන්තු මාදිලිය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනසක් සඳහා යෝජනා ඉදිරිපත් කරන පුද්ගලයින් සැලකිය යුතු සංඛ්‍යාවක් විසින් ප්‍රකාශ කරනු ලැබ ඇති අවධානය යෙදිය යුතු තවත් ක්ෂේත්‍රයක් වන්නේ විධායක ජනාධිපති ක්‍රමය රට බෙදා තිබෙනවා සේම ඥාති සංග්‍රහය, දූෂණය හා ඒකාධිපතිත්වය ආදියට මග පාදා තිබෙනවාය යන්න ය.

අයෙකු කමිටුව හමුවේ පෙනී සිටි පොදු ජනයා විසින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනාව පිළිබඳව හොඳින් සිතා බැලිය යුතු ය. පාර්ලිමේන්තු මාදිලිය කරා ආපසු යාම දීර්ඝව සාකච්ඡා කිරීම අවශ්‍ය ය.

සියලු ජනවාර්ගික කණ්ඩායම්වලින් පිළිවෙලින් තෝරා ගැනෙන චාරිත්‍රානුගත ජාතික ඒකාබද්ධ ජනාධිපතිවරයෙකු පිළිබඳ යෝජනාව සැලකිල්ලට ගත යුතු තවත් එකකි.

පාර්ලිමේන්තුව ඇතුළු රාජ්‍යයේ අනෙක් සෑම අවයවයකටම ඉහළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උත්තරීය විය යුතුය යන යෝජනාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ දී විවාදයට ලක් වේ යයි අපේක්ෂා කළ හැකි තවත් ක්ෂේත්‍රයකි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා රාමුව හා බලය බෙදා හදා ගැනීමේ මාදිලිය ඇතුළත මේ රටේ සුළුතර ප්‍රජාවන් සඳහා ආරක්ෂණයන් සැලසීම ද අවධානයට ගැනීම අවශ්‍ය ය.


එසේම පාර්ලිමේන්තුවේ සදාචාරය හා ගරුත්වය ද ආමන්ත්‍රණය කළ යුතුව තිබූ කාරණයක් විය. මෙය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වීමට අවශ්‍ය කරන ගුණාංග හා සුදුසුකම් පිළිබඳ සාකච්ඡාවකට මග පාදයි.

## වැදගත් රාජ්‍ය සංවිධානවල ස්වාධීනත්වය

එසේම රාජ්‍ය සංවිධාන ස්වාධීන වීම අවශ්‍ය ය යන්න ජනතාව විසින් තදින්ම ඉල්ලා සිටිනු ලැබ තිබිණ. අනෙක් ඒවා අතර ව්‍යවස්ථාදායක සභාව, මානව හිමිකම් කොමිසම, මැතිවරණ කොමිසම, පොලිස් කොමිසම වැනි පවතින කොමිෂන් සභා ශක්තිමත් කිරීම අවශ්‍ය ය. එසේම අධිකරණයේ ස්වාධීනත්වය ද ආමන්ත්‍රණය කළ යුතුම වැදගත් ක්ෂේත්‍රයකි.

## අවසානය

සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලියක් තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම ප්‍රජාතන්ත්‍රවාදය හා එහි සාරධර්ම ස්ථාපිත කිරීමේ ගමනක් වේ. අතීතය තේරුම් ගැනීම හා විවෘත මනසකින් යුතුව අතීතය දෙස යථාවාදී බැල්මක් හෙළීම වැදගත් සාධකයකි. අවසානයේ දී මේ ලක්ෂ්‍යය වෙත ගෙන එන ලද අප සියලු දෙනාම පුද්ගලයින් ලෙස, ජන වාර්ගික ප්‍රජාවන් ලෙස, මේ රටේ පුරවැසියන් ලෙස අතීතය දෙස ස්වයං ගවේෂණයක යෙදීම අනිවාර්ය වේ. අභියෝගය ජය ගනිමින් අප සියලු දෙනාම ආඩම්බරයට පත්වන, අප සියලු දෙනාම ඇතුළත් කරගත් බව හැඟෙන, අප සියලු දෙනාටම හිමිකම තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මේ රටේ පුරවැසියන්ට ලබා දීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයට ඉඩ සලසමු.



යුද්ධ කාලයේ දී අවතැන් වීම තාවකාලික දෙයකි. එම කාලයේදී අපේ ජීවිත බේරගත්තේ ගස් කොළ සහ ගොඩනැගිලිය. එම නිසා අපි අවතැන් වූ සෑම මොහොතකදීම අපි බංකර් සාදා ගත්තෙමු. බොහෝ වෙලාවට අපේ පවුලේ ඥාතීන්ගේ සාරිය පවා අපට බංකරයක් වූවාය. මෙම බංකර් තුළ මිය ගියේ ඥාතීන් පමණක් නොවෙයි, අපේ බලාපොරොත්තුද වේ. කාලය අවසන්ය. යුද්ධය ද අවසන්ය. දැන් අපේ දේශය ඉදිරියට ගමන් කරයි. එවැනි යුද්ධයක් මින් පසු අපට එපා.

චිත්‍රය : **මරියදේවදාස් විජිදරන්**

සංක්‍රාන්තික යුක්තිය හා සහජීවනය පිළිබඳව ආණ්ඩුවේ වැඩපිළිවෙල සම්බන්ධයෙන් රාජ්‍ය භාෂා, ජාතික සංවාද හා සහජීවනය පිළිබඳ අමාත්‍ය මනෝ ගනේෂන් මහතා සමග කළ සාකච්ඡාවකි මේ.



රාජ්‍ය භාෂා හා
ජාතික සහජීවනය පිළිබඳ අමාත්‍ය
**මනෝ ගනේෂන්**

# යුක්තිය ඉටුකිරීමෙන් සහජීවනය ගොඩනැගිය හැකියි

**ජාතික ප්‍රශ්නයට කල්පවත්නා විසඳුමක් ඇතුළුව රාජ්‍ය ප්‍රජාතන්ත්‍රිකරණයට ලක් කිරීම සඳහා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් ආරම්භකර ඇති බව අපි දනිමු. මෙම ක්‍රියාවලිය පහසුකිරීම පිණිස යුද්ධයෙන් අගතියටපත් පාර්ශ්වයන් වෙනුවෙන් සංක්‍රාන්තික යුක්තිය ඉටුකිරීමට ආණ්ඩුව ආරම්භ කර ඇති වැඩපිළිවෙල කුමක් ද?**

ආණ්ඩුව ඒ සම්බන්ධයෙන් පදනම් හතරක් මත පිහිටමින් කටයුතු කිරීමට තීරණය කර තියෙනවා. සත්‍ය සෙවීමේ කොමිසමක් පිහිටුවීම එයින් පළමු වැන්න ය. දෙවැන්න හානියට පත් වූවන්ට වන්දි ලබාදීම ය. අධිකරණ ක්‍රියාවලිය තුන්වැන්න ය. සිව්වැන්න, සිදු වූ විනාශය නැවත ඇති නොවන්නට වග බලාගැනීම. මේ පදනම මත පිහිටමින් තමයි අගතියට පත් පාර්ශ්වයන්ට

යුක්තිය ඉටුකිරීමට ආණ්ඩුව බලාපොරොත්තු වන්නේ. ජිනීවා තීරණය සම්බන්ධයෙන් ගියවර නම් කියන්නට තිබුණා කිසියම් පාර්ශ්වයක් අපිට විරුද්ධව ක්‍රියා කළා ය යන්න. නමුත් මෙවර එය අපේම තීන්දුවක් බව මතක් කළ යුතු ය. අපි ඒ එකඟතාවයේ කොටස්කරුවන් නිසා එයින් අයින් වීමට හැකියාවක් නෑ. අපි දුන් ඒ පොරොන්දුව අනිවාර්යෙන්ම ඉෂ්ට කරන්නට ඕනේ.

**මේ සම්බන්ධයෙන් දෙමුහුම් අධිකරණයක් පිළිබඳව ජාත්‍යාන්තර මානව හිමිකම් කොමිසමෙන් යෝජනා වූ බව අපි දන්නවා. මේ සම්බන්ධයෙන් ආණ්ඩුවේ ස්ථාවරය කුමක් ද?**

මේ සම්බන්ධයෙන් ආණ්ඩුවේ විවිධ මත තියෙනවා. ඒක හංගන්නට අවශ්‍ය නෑ. එක පාර්ශ්වයක් ජාත්‍යන්තර සම්බන්ධතාවක් මේ සඳහා තිබිය යුතු බව කියන අතර ජාත්‍යන්තර සම්බන්ධතාවයක් අවශ්‍යම නෑ කියන තවත් පාර්ශ්වයක් ඉන්නවා. ඒ අය කියන්නේ ජාත්‍යාන්තර සම්බන්ධතාවක් නැතිව දේශීය යාන්ත්‍රණයක් තුළින් අගතියටපත් පාර්ශ්වයන්ට යුක්තිය ඉටුකරන්ට පුළුවන් බවයි. මම නම් හිතනවා ජාත්‍යන්තර සබඳතාවය අවශ්‍යයි. මක් නිසාද යත් අපේ රටේ ජාතික අධිකරණ පද්ධතිය හදලා වැඩිදියුණුකර තිබෙනවා උනාට අපේ විශ්වාසනීයත්වය රට තුළත් ජාත්‍යන්තරය තුළත් තබාගන්නට අවශ්‍ය නම් ජාත්‍යන්තර සබඳතාවයන් තියා ගන්නට අවශ්‍යයි. අනික් එක පීඩාවට පත් වූ ජනතාව, විශේෂයෙන් දෙමළ ජනතාව ගේ විශ්වාසය තබාගන්නට අවශ්‍ය නම් අපි ජාත්‍යන්තර සබඳතාව තබාගත යුතු යි.

**මේ වන විට ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ සාධනීය වර්ධනයක් පෙන්නුම් කළාට සමහර සිදුවීම් සම්බන්ධයෙන්, විශේෂයෙන්ම දූෂණ වංචා හා සමහර මිනීමැරීම් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ සැක සාංකා මතුවී තියෙනවා. දෙමළ ජනතාවට එවැනි අධිකරණයකින් යුක්තිය ඉටුවීම පිළිබඳ සැකයක් ඇති බව ද කියන්නේ.**

දූෂණ හා ඔබ කියු සංසිද්ධීන් සම්බන්ධයෙන් සාක්ෂි සොයමින් සිටිනවා. මට දන්න හැටියට නඩු කිහිපයක් එනම් නඩු 20කට පමණ අදාළ කටයුතු දැනට අවසන් වෙලා තියෙනවා. ඒ ලිපි ගොනු සියල්ල දැන් නීතිපති දෙපාර්තමේන්තුවට භාරදී තිබෙනවා. එතනත්, වැඩකටයුතු කෙරිගෙන යන බවයි ආරංචිය. ඒ නිසා අපිට ජූනි මාසය වනවිට දූෂණ සම්බන්ධ නඩු තීරණාත්මක තැනකට එන්න පුලුවන් කියලා මම හිතනවා. දැන් පසුගිය ආණ්ඩුවේ ඉඳලා දූෂණවලට සම්බන්ධ වූ අයට විරුද්ධව නීතිය පාවිච්චි කරලා කටයුතු කෙරන බව මම හිතනවා. මේක ඉතාමත් වගකීමකින් මම කියන්නේ. මේක දැනගෙන තමයි රටේ ජාතිවාදය අවුස්සලා, අන්තවාදය අවුස්සලා, බොරුවට යුද බිල්ලෙක් මවා පෙන්නලා ඔවුන්ට විරුද්ධව තිබෙන මෙම ක්‍රියාමාර්ග නවත්වා ගන්නට විපක්ෂයේ ඉන්න සමහර අය බලන්නේ. නමුත් මේ දූෂණ විමර්ශන පිළිබඳව අවසන් තැනකට ඇවිල්ලා තියෙන බව කියන්නට පුළුවන්.

**දැන් උතුරු නැගෙනහිර ජනතාවගේ ඉඩම් පිළිබඳ ප්‍රශ්නය තවමත් සම්පූර්ණයෙන්ම විසඳුණු බවක් පෙනෙන්නට නෑ. ආරක්ෂක හේතූන් දක්වමින් හමුදාව තව දුරටත් ඒ ඉඩම් තබාගෙන ඉන්නට වැඩි කැමැත්තක් දක්වන බවයි පෙනෙන්නේ.**

ඇත්තටම දැන් යුද්ධය අවසානයි. යුද්ධය අවසන්වෙලා දැනට වසර 6ක් 7ක් වෙනවා. එතකොට දැන් එල්. ටී. ටී. ඊ. සංවිධානය නෑ. එල්. ටී. ටී. ඊ කාලතුවක්තුත් නෑ. අධි ආරක්ෂක කලාප දැන් අවශ්‍ය නෑ. කාලතුවක්කුවලට මුහුණ දෙන්නනේ අධි ආරක්ෂක කලාප හැදුවේ. ඒ කාලයේ එල්. ටී. ටී. ඊ. ය තිබුණ නිසා මේ ඉඩම් අත්පත් කරගත්තා කියන පලියට දැන් ඒ ඉඩම් අත්පත් කරගෙන සිටීම වැරදි යි. අනික් එක දැන් ඔය අත්පත්කරගෙන තිබෙන ඉඩම් හමුදාමය උවමනාව වෙනුවෙන් පාවිච්චි කරනවා නම් කමක් නෑ. එසේ කරන්නේ නම් යම්කිසි තර්කයක් හරි ඉදිරිපත් කරන්නට පුළුවන්. එහෙම නෑ, මේවාගේ හෝටල් හදලා, අනිකුත් සුඛෝපභෝගී දේවලට පාවිච්චි කරලා, ගොල්ෆ් කෝඩ් හදලා, ස්විමින් පූල් හදාගෙන ඉන්නවා. හමුදාවට සම්බන්ධවෙලා ඉන්න අය ධීවර කර්මාන්තයේ යොදවලා ඉන්නවා. වගා කරනවා. එතකොට පේනවා හමුදාව ආරක්ෂක කටයුතුවලට සම්බන්ධයක් නැති දේවල්වලට මේ දේවල් යොදාගෙන ඉන්නවා තියලා. මේවා නවතින්නට ඕනේ. මේ ආණ්ඩුව විවිධ පක්ෂවල සම්මුතියකින් ඇතිවුන ආණ්ඩුවක්. ඒ නිසා අපි එක පාර්ශ්වයක් කියන දේ අනික් පාර්ශ්වය අහන්නේ නෑ. ඒ නිසා අපිට ගැටලු තියෙනවා. අනික් එක හමුදාව යුද මානසිකත්වයෙන් තවම ඉන්නේ. හෙමින් තමයි එතන සිට වෙනස් කරගන්නට වෙන්නේ. හිතන්න එපා ආණ්ඩු වෙනස්වුණා




කියලා හමුදා මනස වෙනස් උනා කියලා. අනික් එක යුද්ධය නිසා වැඩියෙන් බඳවාගත් හමුදා සෙබලු අඩු කරනවා නම් නිකම්ම අඩු කරලා ඒ අය ගෙදර යවන්නට බෑ. ඒකට වෙනම වැඩපිළිවෙලක් අපි හදලා දෙන්නට ඕනේ. ඒකට තව කාලයක් යයි. නමුත් ඒ අතරම අපි සෑහෙන්නට ඉඩම් නැවත ලබාදීලා තියෙනවා.

**ඒ කියන්නේ හමුදාව තවමත් ව්‍යවස්ථාවට පිටින් වැඩ කරන බව ද ඔබ කියන්නේ.** ?

ඔව් තවම සමහර කාරණාවලදි හමුදාව වැඩ කරන්නේ එහෙමයි.

**දැනට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රති සංස්කරණ වැඩ පිළිවෙල ආරම්භ වෙලා තියෙනවා. දෙමළ ජනතාවගේ පැත්තෙන් ඔබලා ඉදිරිපත් කරන යෝජනා ගැන සඳහන් කළහොත් ?**

ආණ්ඩුක්‍රමය ප්‍රතිසංස්කරණය කරන්නට මුලු පාර්ලිමේන්තුවම ව්‍යවස්ථා මණ්ඩලයක් හැටියට රැස්වෙනවා. පසුගියදා අගමැතිවරයාගේ සභාපතිත්වයෙන් යුතුව සභාපති මණ්ඩලයක් මෙන්ම 21ක් දෙනෙකුගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක් ද පත්කරගෙන තියෙනවා. මමත් එහි සාමාජිකයෙක්. එදාම හවස තමයි පළවෙනි වතාවට පාර්ලිමේන්තුවම ව්‍යවස්ථාදායක මණ්ඩලයක් හැටියට රැස්වුණේ. නැවත අපි 28 වෙනිදා රැස්වෙනවා. ඉදිරියේ දි අනු කමිටු පත්කරන්නට නියමිතව තිබෙනවා. කමිටු කීයක් පත්කරනවා ද යන්න තවමත් තීරණය කර නෑ. ඒ වගේම ඒ ඒ කමිටුවලට පැවරෙන විෂයන් මොනවා ද යන්න ගැන ද තවම තීරණයක් අරගෙන නෑ. අධිනීතිඥ ලාල් විජේනායක මහත්තයාගේ සභාපතිත්වයෙන් යුතුව, ව්‍යවස්ථාව සඳහා මහජන අදහස් ලබාගැනීමේ කොමිසමේ වාර්තාව ලැබෙන තුරු අපි බලාගෙන ඉන්නවා. ඒ වාර්තාව මේ මාසය අන්තිම වෙන්නට පෙර ලැබෙන්නට නියමිතයි. ඒ වාර්තාව පදනම් කරගෙන මෙහෙයුම් කමිටුවේ සාකච්ඡා කරන්නට තමයි අදහස. ලබන මස 03වෙනිදා පාර්ලිමේන්තුව රැස්වෙන විට මේ ගැන ඉදිරි කටයුතු ගැන සාකච්ඡා කරනවා. කෙසේ නමුත් නව ව්‍යවස්ථාව නිර්මාණය කරන්නට අපි කරුණු 03ක් පදනම්කරගෙන තියෙනවා.

අනික් එක යුද්ධ නිසා වැඩියෙන් බඳවාගත් හමුදා සෙබලු අඩු කරනවා නම් නිකම්ම අඩු කරලා ඒ අය ගෙදර යවන්නට බෑ. ඒකට වෙනම වැඩපිළිවෙළක් අපි හදලා දෙන්නට ඕනේ. ඒකට තව කාලයක් යයි. නමුත් ඒ අතරම අපි සෑහෙන්නට ඉඩම් නැවත ලබාදීලා තියෙනවා.

එකක් ඇවිල්ලා ආණ්ඩු ක්‍රමය වෙනස් කිරීම. දෙවැනි එක නව ඡන්ද ක්‍රමයක් හඳුන්වා දී ම. දෙමළ ජනතාවගේ දේශපාලන ප්‍රශ්නයට විසඳුමක් ලෙස බලය බෙදීම තුන්වැන්න.

**බලය බෙදීම සම්බන්ධයෙන් දැනුත් යාන්ත්‍රණයක් තියෙනවා. දැන් චෝදනාවක් තියෙනවා උතුරු පළාත් සභාව බෙදපු බලයෙන්වත් හරියට ප්‍රයෝජනයක් නොගන්න බවට. ජනමාධ්‍ය තුළින් මෑතක මං දැක්කා උතුරු පළාත් සභාවට වෙන්කර ඇති මුදල්වත් ප්‍රයෝජනයට නොගැනීම හේතුවෙන් ඒවා නැවතත් භාණ්ඩාගාරයට ඇවිත් තිබෙන බවට. තව ද ඒ අය තවමත් ප්‍රඥප්ති දෙකකට වඩා හදා නැති බවටත් චෝදනාවක් තියෙනවා නේ ද?**

නෑ, මධ්‍යම ආණ්ඩුවට උතුරු පළාත් සභාවේ මුදල් ඔය කියනවා වගේ නැවත ආවේ නෑ. ඒ මුදල් වලින් 90%ක් විතර අපි පාවිච්චි කරලා තියෙන බවයි උතුරේ මහ ඇමතිතුමා දීලා තියෙන වාර්තාවෙන් කියන්නේ. සමහර වෙලාවට පළාත් සභාවක් හැටියට වියදම් කරලා ඒවාට ගණන් හදලා තිබෙනවා. ඒ වියදම් අඩුවිය යුතුව ඇති.

කෙසේ නමුත් ඒක වෙන ප්‍රශ්නයක්. බලය බෙදීම කියනකොට බලය බෙදීමේ අවස්ථාව රටේ පළාත් සභා 9ට ම තියෙනවා. උතුරු පළාතේ මුදල් භාවිතාවෙලා නෑ කියනවා නම් කරුණු දෙකක් තියෙනවා. එයින් එකක් වන්නේ ඒ උතුරු පළාත් සභාවේ පාලකයින්ගේ දුර්වල කමක් වෙන්නට පුළුවන්. එහෙම නැත්නම් මධ්‍යම ආණ්ඩුව ඒ බලය හරි හැටි ලබා නොදීම වෙන්නට පුළුවන්. ඒක හොයලා බලන්නට ඕනේ. කෙසේ නමුත් උතුරු පළාත් සභාවේ පාලකයන් හරි ආකාරයට තම බලය පාවිච්චිකරලා නෑ කියනවා නම් ඒක උතුරු පළාතේ ජනතාවගේ ප්‍රශ්නයක්. ඒ ජනතාව එහෙම නම් දුර්වල පාලකයින් පිරිසක් පත්කරගෙන තියෙන්නේ. ඒක වෙනස් කරන්නට ඕනේ. එසේ නැත්නම් ඒ පාලකයින් බොරු ප්‍රචාරයන්ට පිළිතුරු දිය යුතුයි. අනික් පැත්තෙන් මධ්‍යම ආණ්ඩුව පළාත් සභාවට දිය යුතු බලය සහ සහයෝගය දීලා නැති නම්, විශේෂයෙන්ම උතුරු පළාත් සභාව පමණක් චිල්ල කරලා එහෙම කරනවා නම් බරපතල ප්‍රශ්නයක් ඒක. ඒකට විරුද්ධව අපි පෙනී සිටිනවා.

**එහෙම නොවෙයි, නැගෙනහිර පළාතට ඒ චෝදනාව නෑ. නැගෙනහිර පළාත උතුරු පළාතට වඩා නව ප්‍රඥප්ති අනුමත කරගෙන තිබෙනවා පමණක් නොව උතුරු පළාත් සභාවට සාපේක්ෂව සාර්ථකව ක්‍රියාත්මකවන බවයි පෙනෙන්නේ.**

උතුරු පළාත අනිකුත් පළාත් සභා සමග සන්සන්දනය කරන විට දරුවෙක් කියලා කියන්නට පුළුවන්. අනික් පළාත්වල පළාත් සභාව, 88 සිට තියෙනවා. නැගෙනහිර පළාත උතුරු පළාතට වඩා කලින් පිහිටු වූ පළාත් සභාවක්. ඒ නිසාම ප්‍රශ්න තියෙන්නට පුළුවන්. මධ්‍යම ආණ්ඩුවට වගකීමක් තිබෙනවා විශේෂඥයින් උතුරු පළාත් සභාවට ලබාදීලා ප්‍රඥප්ති සකස්කරගෙන වැඩකළ යුතු ආකාරය පිළිබඳ දැනුවත් කරන්නට. උතුරු පළාත් සභාවටත් වගකීමක් තිබෙනවා අනික් පළාත්



නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මහජන අදහස් ලබාගැනීමේ කමිටුවේ සභාපතිවරයා ඇතුළු කමිටු සාමාජිකයන් මාධ්‍ය සාකච්ඡාවක www.news.lk

සභාවල මැති ඇමතිවරුන් සමඟ සාකච්ඡා කරලා අඩුපාඩු හදාගන්න. ඒක දැනට තියෙන පළාත් සභා ක්‍රමය යටතේ සිදුවිය යුතු දෙයක්.

**නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විෂයේ දී දකුණේ පාලකයින් දැනටමත් කරුණු දෙකක් සම්බන්ධයෙන් ඉන්නේ පූර්ව නිගමනයක. එනම් නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවත් ඒකීය වියයුතු අතරම බෞද්ධාගමට විශේෂත්වයක් දැක්වීම එසේම තිබිය යුතු බව ඔවුන් කියනවා නේ ද?**

මම හිතන්නේ මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඒකීය හෝ සන්ධීය, නැත්නම් ෆෙඩරල් කියන වචන භාවිතාව අපි වළක්වන්නට ඕනේ. වචන දෙකම මට අවශ්‍ය නෑ. ඉන්දියාවේ ව්‍යාවස්ථාව ගතහොත් ඒ වචන දෙකම නෑ. ඒකීය කියලා බලන අයට ඒක ඒකීය කියලා කියන්නට පුළුවන්. ෆෙඩරල් කියලා බලන අයට ඒක ෆෙඩරල් වගේ පෙනෙන්නට පුළුවන්. ඒ උනාට ඒ ආණ්ඩු ක්‍රමය හොඳින් ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා අප වචන වල හිරවෙලා ඉන්නට අවශ්‍ය නෑ. දෙවැන්න තමයි රාජ්‍ය අනාගමිකවීම. මමත් ඉන්නේ එතන. කිසිම ආගමකට විශේෂත්වයක් දෙන්නට ඕනේ නෑ. ආගම කියන්නේ පෞද්ගලික දෙයක්. මේ රටේ ආගම අදහන්නේ නැති අයත් ඉන්නවා. මමත් ආගමක් අදහන්නේ නෑ. මම අනාගමිකවාදියෙක්. ඒක කියන්නට මම පසුබට වෙන්නේ නෑ. අනික් අය ආගමට ඇති විශ්වාසයට මම ගරුකරනවා. මට ආරාධනා කළොත් මම කෝවිල්වලට යනවා, පල්ලිවලට යනවා. පන්සල්වලට යනවා. ආගම විශ්වාස කරන ජනයාට ගරු කිරීමක් ලෙස එසේ ගියාට මට ආගමක් නෑ. ඒ නිසා ඔක්කොටෝම පොදු වෙන්න නම් රාජ්‍යයෙන් ආගම නිදහස් කරන්නට ඕනේ. එතනදීත් ඉන්දියාව දෙස බලන්න. ඉන්දියාවේ බහුතරයක් හින්දු ආගම කියලා තමයි කවුරුත් පිළිග න්නේ. නමුත් ඒ රටේ රාජ්‍ය අනාගාමික යි. බලය බෙදීම ගැනත් අපි ඉන්දියාව දෙස බලන්නට ඕනේ. මේකට උදාහරණය ගන්නට ලෝකේ වටේ යන්නට අවශ්‍ය නෑ. අල්ලපු රටට ගිහින් බැලුවා නම් හොඳටම ඇති. අනික් හැමදේටම අපි අල්ලපු රට දිහා බලනවා. අපේ සංගීතය, භාෂාවට, සංස්කෘතිය. අපේ කෑමබීම, හැමදේම ඉන්දියාවෙන් ලබාගත්තේ. අපිට අත්‍යවශ්‍යම වන දේ සම්බන්ධව අපි ඉන්දියාව දෙස බලන්නේ නෑ. ඒක කුහක කමක්.

**අපි මහින්ද රාජපක්ෂ ජනාධිපතිගේ පාලනය ඉවත් කිරීම සඳහා විශාල සිවිල් සමාජ ක්‍රියාවක් ආරම්භ වුණා. මේ ක්‍රියාලිය ඉදිරියට ගෙන යෑම සඳහා ඔවුන්ට දෙන්නට තිබෙන පණිවිඩය කුමක් ද?**

ආණ්ඩු කරන සන්ධානය හැටියට, මේ ආණ්ඩුව බාරගන්න කොටත් අපිට තිබුණු වැඩපිළිවෙල අංග

ලාල් විජේනායක මහත්මයාගේ නායකත්වයෙන් ක්‍රියාත්මක වන එම කොමිසම රටපුරාම යනවා නේ. එතනදී රටේ පුරවැසියන්ට, සංවිධානවලට, සෑජුවත්, වක්‍රවත් තමන්ගේ යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව තිබුණා.

දෙකකට වෙන්කර පෙන්නන්නට පුලුවන්. එකක් තමයි උපදේශනාත්මක කාර්යයන්. උදාහරණයකට ගතහොත් ප්‍රජාතන්ත්‍රවාදය, යහපාලනය, නීතියේ ආධිපත්‍ය, මාධ්‍ය නිදහස, මානව හිමිකම්, තොරතුරු දැනගැනීමට ජනතාවට ඇති අයිතිය, කොමිසන් සභා. නව ව්‍යවස්ථාවක් නිර්මානය කිරීම වැනි දේවල්. ඒ සඳහා ජාතික මට්ටමේ මැදිහත්වීම් තිබෙනවා. දැන් බලන්න මුලු පාර්ලිමේන්තුවම ව්‍යවස්ථා සභාවක් විදියට පරිවර්තනය වීම තුළ මුලු රටේ ජනතාව සහභාගිවෙන පොදු දෙයක් දැනටමත් වෙලා තියෙන්නේනේ. ලාල් විජේනායක මහත්මයාගේ නායකත්වයෙන් ක්‍රියාත්මක වන එම කොමිසම රටපුරාම යනවා නේ. එතනදී රටේ පුරවැසියන්ට, සංවිධානවලට, සෑජුවත්, වක්‍රවත් තමන්ගේ යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව තිබුණා. පිටරට සිටින අපේ රටේ පුරවැසියන්ටත් ඒ අවස්ථාව ලබාදුන්නා. මුළු ශ්‍රී ලංකීය සමාජයම ඒකට යොමුවෙලා තිබුණා. අධිකරණයේ ස්වාධිනත්වය, පොලීසිය දේශපාලනීකරණයෙන් නිදහස් කරගැනීම මෙන්ම මාධ්‍ය නිදහසවගේ දේවල් මහින්ද රාජපක්ෂගේ පාලනය සමග සන්සන්දනය කර බලන විට විශාල දියුණුවක් තිබෙනවා. අඩුපාඩු නැතිවාම නොවේ. සමහර ඇමතිවරු පිස්සු වැඩ කරන නිසා අපිට ඔළුව පල්ලෙහාට දාලා ඉන්නට වෙලා තියෙනවා. නමුත් සංසන්දනය කර බලන විට අපිට සතුටු වෙන්නට පුළුවන් තැනක රට තියෙන්නේ. ඇත්තටම අපි කාටත් එහෙම හිත්නට පුළුවන්. අපේ ආණ්ඩුවට විරුද්ධ පැත්තේ ඉන්න අයටත් අවංකව කල්පනා කරනවා නම් එහෙම පෙනෙන්නට ඕනේ. එහෙම නැත්නම් ඒ අය මෝඩයෝ වෙන්නට ඕනේ. නැත්නම් හිතාමතා දේශපාලන උවමනාවට ඒක පිළිනොගෙන ඉන්නට පුළුවන්.

**නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ එක්මතිකත්වයක් තිබෙන නමුත් නව ව්‍යවස්ථාවේ අන්තර්ගතය ගැන සාකච්ඡා කරන විට, විශේෂයෙන් ම අපි කථා කළ බලය බෙදීම සම්බන්ධ විෂය උදාහරණයකට ගතහැක. මෙහිදී ඒකාබද්ධ විපක්ෂය යැයි කියන අයගේ හැසිරීම බැලුවාම මේක කඩාකප්පල් කරන්නට ඉඩ තියෙනවා නේ ද?**

ආණ්ඩුක්‍රමය පිළිබඳවත්, මැත්වරණ ක්‍රමය




www.rightsnow.net

අතුරුදහන්වූවන් පිළිබඳ පැවති උද්ඝෝෂණයක්



පිළිබඳවත්, විශාල අභියෝගයකට මුහුණ දෙන්නට වෙයි කියලා මම හිතන්නේ නෑ. මේකට ජාතික එකඟතාවයක් හදාගන්නට පුළුවන්. බලය බෙදීම සම්බන්ධයෙන් තමයි ප්‍රශ්නය තියෙන්නේ. බලය බෙදීමට, දැන් අපිට කිසියම් පදනමක් තියෙනවා. 13වෙනි සංශෝධනය ඉන් එකක්. මහින්ද රාජපක්ෂ මහත්මයාත් එකඟවෙලා තමයි හිටියේ එයින් එහාට යන්න. ඉතින් ඒකට පස්සේ එයාට ඒකට විරුද්ධ වන්නට බෑ. එතුමා බැංකි මූන් මහත්තයත් එක්ක ඒකාබද්ධ ප්‍රකාශනයේ කියලා තියෙනවා. මේ අන්තවාදී පිරිසක් තමයි කඩා කප්පල් කරන්නට උත්සාහ ගන්නේ. අන්තවාදී පිරිසක් උතුරේත් ඉන්නවා. මේ දෙගොල්ලම එකට දැම්මත් කුඩා පිරිසක්. නමුත් ඒ අයගේ ශබ්දය වැඩියි. ශබ්දවලට මේ රටේ මාධ්‍ය ඕනෑවට වඩා ඉඩ දෙනවා. මාධ්‍ය අතර තරඟයක් තිබෙනවා. ඒ නිසා මාධ්‍යවල හැසිරීම තීරණය වෙන්නේ කර්තෘ මණ්ඩලවලින් නොවෙයි. පත්‍රයේ අලෙවි අංශය මගින්. ඒක තමයි මේ රටට සිදු වී තිබෙන විපත. ඒ නිසා ඒක තේරුම්ගෙන වගකීමෙන් මාධ්‍ය වැඩකළ යුතුව තිබේ. දේශපාලකයින්, රාජ්‍ය සේවකයින්, ගුරුවරුන් සහ මාධ්‍යවේදීන් යන හතර ගොල්ල කරන රැකියාවලට වැටුප් ලබාගන්නවා. ඒ අයට ජීවත් වෙන්නට වැටුප් ලබා ගන්නට ඕනේ. ජීවිතය පවත්වාගෙන යෑමට එය ලබාගතයුතුයි. නමුත් රක්ෂාවක් වගේම සමාජයට සේවයක් ඒ තුළින් සිදුවිය යුතුයි. ඒ අයට සමාජමය වගකීමක් තියෙන බව අමතක නොකළ යුතු යි. ප්‍රධාන කර්තෘ සිට සාමාන්‍යයෙන් වාර්තා කරුවෙකු දක්වා ගතහොත් ඒ අයට විශාල වගකීමක් තියෙනවා. ඒ නිසා මාධ්‍යවේදීන් දේශපාලනඥයින් දෙසට ඇඟිල්ල දික්කරන විටම සමාජය යහමගට ගැනීමට තමන්ටත් වගකීමක් තියෙන බව කල්පනා කරන්නේ නම් මේ වගේ විපතක් මේ රටට සිදුවෙන්නේ නෑ.

මේ රටේ සිංහල අන්තවාදී පිරිසක් සිටිනවා මෙන්ම දෙමළ අන්තවාදී පිරිසක් ද සිටිනවා. ඒ වගේම මුස්ලිම් අන්තවාදි පිරිසක් ද සිටිනවා. ජාතිය හා ආගම පදනම් කරගෙන බෙදෙනවා නම් කවුරු උනත් ඒ අය තමයි බෙදුම්වාදීන්. එක රටක් තුළ බලය බෙදීමට විරුද්ධ වන්නේ ඒ අයයි. සාධාරණ බලය බෙදීමක් ලබාදීමට විරුද්ධ වන්නේ නම් මේ බෙදුම්වාදීන්ගේ පැත්තට මිනිස්සු තල්ලුවෙලා යනවා. එසේ තල්ලු කරන හා එයට උදවුවන අය තමයි බෙදුන්වාදීන් වන්නේ. ඒ නිසා බෙදුම්වාදින් කොටි පමණක් නොව දකුණේ ද ඉන්නවා. ඒ අය පරාජය කළ යුතුයි. ඒ බුද්ධිය අපේ රටේ ජනතාවට තියෙන බව මා හිතනවා. එය වැඩිදියුණු වෙන්නට ඕනේ කියලා මා ප්‍රාර්ථනා කරනවා.




**කෙසේ නමුත් නව ව්‍යවස්ථාව නිර්මාණය කරන්නට අපි කරුණු 03ක් පදනම්කරගෙන තියෙනවා. එකක් ආණ්ඩු ක්‍රමය වෙනස් කිරීම. දෙවැනි එක නව ඡන්ද ක්‍රමයක් හඳුන්වා දීම. දෙමළ ජනතාවගේ දේශපාලන ප්‍රශ්නයට විසඳුමක් ලෙස බලය බෙදීම තුන්වැන්න.**

**බලය බෙදා රට සංහිඳියාවක් කරා ගෙන යෑමට ඔබගේ අමාත්‍යාංශය දැනට ගෙන ඇති පියවරන් මොනවා ද?**

මගේ අමාත්‍යාංශයට වගකීම් දෙකක් තිබෙනවා. එකක් ජාතික සහජීවන වගකීම. අනික් එක රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම. මීට පෙර හිටපු ඇමති වරුන්ට මේක කරන්නට දේශපාලන අධිෂ්ඨානයක් තිබුණේ නෑ. ඒකට දොස් කියනවා නොව එදා ඒකට අවකාශයක් තිබුණේ නෑ. නමුත් ඒකට දැන් අවකාශයක් තිබෙනවා. දේශපාලන කැමැත්තත් තියෙනවා. ඒ නිසා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සහ සහජීවනයට මෙන්ම ජාතික ප්‍රශ්නය විසඳීමට මේ අමාත්‍යාංශයේ වැඩ සටහන පෙරවදනක් කියලා මම හිතනවා. ජාතික ප්‍රශ්නයට විසඳුම බලය බෙදීම කියලා අපි කියනකොට අපි බලය බෙදීම ගැන කථාකරනවා. බලය බෙදීම ගැන සාකච්ඡාව දැන් අපි පටන්ගෙන තියෙන්නේ. 13 වෙනි සංශෝධනය දැනට කියාත්මක වෙනවා. ඒකාබද්ධ විපක්ෂයේ ඉන්න අයත් මේ සම්බන්ධයෙන් විරුද්ධත්වයක් තවම මට පෙන්නලා නෑ. මේ අමාත්‍යාංශයේ පෙර හිටිය ඇමති තමයි වාසුදේව නානායක්කාර. එයත් මෙකට එකගවෙලා තියෙනවා. මෙතන ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රශ්නයකට වඩා තියෙන්නේ ක්‍රියාත්මක වීම පිළිබඳ ප්‍රශ්නයක්. මම අමාත්‍යාංශය බාරගෙන තවම මාස හයයි. රට පුරා සහජීවන මධ්‍යස්ථාන හදන්නට සැළසුම්කර තිබෙනවා. සිවිල් සමාජ, රාජ්‍ය නොවන සංවිධාන, සමාජයේ ආන්තීකරණයට භාජනය වෙලා සිටින කණ්ඩායම්, ආගමික මෙන්ම තරුණ හා කාන්තාවන් එකතු කරගෙන සංවාද පවත්වා, සංස්කෘතික හා ක්‍රීඩා ඇතුළු අනිකුත් ක්‍රමවේද පාවිච්චි කරලා මේ සාකච්ඡාව පහත මාලයට ගෙන යන්නට කටයුතු කරනවා. පසුගිය කාලයේ මේ පහළ මට්ටමේ ජනතාව දැනුවත් නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස ජාතිවාදීන් ඒ අයගේ නොදැනුවත්කම ප්‍රයෝජනයට ගත්තා. මේ අකාරයටම එල්. ටී. ටී. ඊ යත් උතුරේ ඒ ජනතාවගේ නොදැනුවත්කමෙන් ප්‍රයෝජන ගත්තා. මේ සැරේ එහෙම වෙන්නට ඉඩදෙන්නට බෑ. අලුත් අවුරුද්දෙන් පසුව ඒ සම්බන්ධව වැඩ පිළිවෙලක් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. ඒකට අවශ්‍ය මුදල් අඩුයි. මේක වැදගත් කාර්ය භාරයක් වුණාට අයවැයෙන් මේකට මුදල් වෙන්කරලා නෑ. නමුත් මම ඒකෙන් සැලෙන්නේ නෑ. ජාත්‍යන්තර ප්‍රජාව සමග සාකච්ඡා කරලා, මුදල් ප්‍රතිපාදන ලබාගෙන ඉදිරියේ දී කටයුතු කරනවා.

# සම්බන්ධතාව

මගේ සීතල ගම
දැන්,
ගිනි ගෙන දැවෙන්නේ යැයි
ගිනි සැර විඳින්නේ යැයි
ආරංචි ගලා එයි

ඒ ගින්නෙන්
මගේ පවුලේ සියල්ලන්
ඥාති හිත මිතුරන්
අඟුරු වී ගියේ යැයි
ආරංචි වුව ද
පුදුම වන්නේ නොමැත මා.
මක් නිසාද යත්,
ඊයේ ම මම
එම ආරංචිය
බලාපොරොත්තුව සිටියෙමි.

නවසිය පනස් අට,
හැත්තෑ හත,
අසූ එක,
අසූ තුන
මතද ද?
මතක් කර බැලුවාද මිතුරනි?
පරතරය අඩුවෙලා නොවෙද
අවුරුදු ගණන් වල?
ඒත්....
වැඩි වෙලා නොවේද
අප අතර පරතරය...

මේ, මා උපන් රට තුළ
මේ දේශ සීමා අතර
ගෙවී ගිය
ලක්ෂ ගණන් දවස් අතරින්,
විනාශ වී ගිය
මේ සුළු දින ගණන ගැන
රිදවා නොගන්නෙමි සිත මම.

කුණු වූ මේ තුවාලයට
තවදුරටත් පැලැස්තර අලවා කුමට ද?

දිනෙක,
භාෂාව නම් පොරවනය වීසි කර
ජාතිය නම් ඇඳුම් ගලවා
නිර්වස්ත්‍ර වූ ගැහැනු මිනිසුන් ගේ
එක්වීමෙන්
මේ පොළවේ දරුවන්
උපදිනතුරු
බලා සිටිමු

**එස්. මුරලිදරන්**
(සීතා රංජනීගේ 'දෝංකාරය' කෘතියෙනි)



ජාතීන් දෙකක් ලෙස වසර ගණනාවක් පුරා මුහුණ දුන් දරුණු යුධ වාතාවරණය තුල මිනිසුන් ලෙස ලද අතිශයෙන් අමිහිරි අත්දැකීම් ප්‍රමාණය ගණනය කළ නොහැක. කෙසේ වුවත් මියගියේද අතුරුදහන් වූයේද ආබාධිත වූයේද මිනිසුන්මය. ඒ වෙනුවෙන් කඳුළු සැලුවේද මිනිසුන්මය. මේ අය වෙනුවෙන් වගකිවයුත්තේ කවුරුන්ද? යන්න මාගේ සිතුවමින් ප්‍රශ්ණ කෙරේ. පොළවට දිරාපත් වන මස්ටාබා සහ වල් වැදී ඇති නීතියට ඒ වෙනුවෙන් කළහැකි සාධාරණත්වයක් තිබේද යන්න ප්‍රශ්න කරන අතර සිතුවමේ ඉරිතැලෙන පොළවෙන් මතුවන පැලෑටි වලට ජීවත්වන්නට අවැසි සමාජයක් උරුම කළ යුතු ය.

චිත්‍රය : **නිරෝෂා වනිගසූරිය**

# ජාතික සංහිඳියාවක් ඇති කිරීමේ බලය මට ලබාදුන්නේ මැතිවරණයෙන්



**ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන**

අද අප සියලුදෙනා එක්වී නිදහස් දින සමරු උළෙල ඉතාමත් අභිමානවත් සහ උත්කර්ෂවත් ලෙස පවත්වනු ලබන අවස්ථාවක්. වසර 68 කට පෙර බ්‍රිතාන්‍ය පාලනයෙන්, යටත් විජිතවාදයෙන් අප නිදහස ලබා ගැනීමෙන් පසුව වසරක් පාසා පවත්වන රටේ ස්වාධීනත්වය ලබාගත්තා වූ ජාතික නිදහස් සමරු උළෙලේ අද 68 වන අවස්ථාව.

1948 ත් 2016 අද දවසත් ගත් විට නිදහස පිළිබඳ කථා කිරීමේදී ආර්ථික දේශපාලන, සමාජයීය, සංස්කෘතික වශයෙන් අපේ රට වගේම මුළු ලෝකය පුළුල් වෙනස්වීම් සහ පරිවර්තනයක් රාශියකට බඳුන් වී තිබෙනවා.

1948 ලබාගත්තා වූ නිදහස අර්ථකථනය කළහොත්, එය නිර්වචනය කළහොත් 48 අපේ රටේ ජනතාව බලාපොරොත්තු වූ නිදහසත් 68 වසරකට පසුව අද අපි බලාපොරොත්තු වන නිදහසත් යන මේ දෙක අතරේ පුළුල් වෙනස්කම් තිබෙනවා.

1948 එහෙම නැත්නම් 50 දශකයේ උපන් දරුවෙක් මම හඳුන්වන්නේ සංස්කෘතික දරුවෙක් විදිහටයි. 2016 වැනි මේ කාල සීමාව ගත් විට 21 වන ශත වර්ෂයේ මුල් අවස්ථාව ගත් විට අද උපදින දරුවන් අපි දකින්නේ තාක්ෂණික දරුවන් ලෙසයි. එසේනම් 50 දශකයේ ඉපදුන සංස්කෘතික දරුවාත් මේ 21

වන සියවසේ මුල් භාගය තුළ නැත්නම් අද දවසේ උපදින තාක්ෂණික දරුවාත් එක් කරමින් ජාතිය ගොඩනැගීමේ කාර්යය රට ගොඩනැගීමේ කාර්යය අප විසින් සාමූහික ප්‍රයත්නයකින් කළ යුතුයි.

ආදරණීය දරුවනි, දෙමාපියනි, මිත්‍රවරුනි, යටත් විජිතවාදයෙන් නිදහස ලබා ගැනීම සඳහා එදා සටන් කළ ජාතික වීරවරයන් පිළිබඳ කතා කරන විට ඒ ජාතික වීරවරයන් අතරේ සිංහල, දෙමළ, මුස්ලිම් කියන නිදහස් අරගලයේ සමකාලීන නායකයින් රාශියක් සහෝදරත්වයෙන් එකමුතුවෙන්, මිත්‍රශිලීව එක මතයකින් රටට නිදහස ළඟා කර ගැනීම සඳහා සටන් කර නිදහස ලබාගත් බව අපි සෑම කෙනෙක්ම ඉතාම පැහැදිළිව දන්නවා.

අපි ඉන් එහාට ගියොත් 1505 සිට විදේශීය ආක්‍රමණිකයින් අපේ රට ආක්‍රමණය කළ අවස්ථාවේ සිට එහෙම නැත්නම් 1505 දිට 1948 දක්වා කාල සීමාවක ඒ අවුරුදු හාරසීය ගණනක් අපි විදේශීය ආක්‍රමණිකයින්ට යටත්වී සිටි යුගයේදී අපේ බොහෝ දේ විනාශ වුණා. අපේ කියන අපේකම බිඳී ගියා. අපේ සංස්කෘතික සෝදාපාළුවක් ඇති වුණා. බරපතළ ආර්ථික විනාශයන් ඇතිවුණා. පෙර රජ දවස ගොඩනඟා තිබූ මහා වැව් අමුණු සමඟ සශ්‍රීකත්වය සහ සමෘද්ධියෙන් පිරී තිබූ අපේ උතුම් ශ්‍රී ලංකාව වසර හාරසිය ගාණක් යටත් විජිතයක්ව තිබියදී අපට තිබූ බොහෝ දේ විනාශ වුණා.

ඒ විනාශ වීම වසර හාරසීය ගාණක් තුළ සිදුවුණ 1505 සිට සටන් කළ අපේ වීරවරයින් සිය සුසුම, දහදිය, කදුළු ලේ පරිත්‍යාග කරමින් අවුරුදු ගනණක සටනකින් පසුව 1948 නිදහස ලබා ගත්තා. අප යටත් විජිතවාදයෙන් නිදහස් වුවත් අවුරුදු හාරසීයක් ගාණක් අපේ රට ආක්‍රමණය කළ, පාලනය කළ විදේශිකයින් මේ රටේ හැදූ ප්‍රශ්න, නිර්මාණය කළ ප්‍රශ්න අපට භාරදී තමයි ආපසු ගියේ.

**නිදහස කියන වචනය පුළුල් ලෙස විහිදී ගිය වචනයක් බවට පත්වී තිබෙනවා. නිදහස කියන වචනය පුළුල් අර්ථකතන රාශියක් දෙනු ලබනවා. නිදහස කියන වචනය නව අධි තාක්ෂණයත් සමග බොහෝ විහිදී ගොස් තිබෙනවා.**

විශේෂයෙන්ම 30, 40 දශකයේ ඒ වීරවරයින් ගෙන ගිය සටනේදී ආගම්, ජාති, කුලවාදයෙන් තොරව සියලූ දෙනා එක්ව එකට කළ සටනින් ලැබූ ජයග්‍රහණයෙන් පසුව අපේ රට ගොඩනැගීමේ කාර්යයේදී අද වන විට වසර 68 ක් ගෙවී ගොස් තිබෙන අවස්ථාවක අපේ රට ආක්‍රමණය කළ පිරිස් අපට භාරදී තිබූ ප්‍රශ්න අප විසඳුවාද කියන කාරණය අප සෑම කෙනෙකුම අපේ හෘද්ධ සාක්ෂියෙන් විමසිය යුතු වෙනවා.

බොහෝ වෙලාවට බලයට පත් වූ සෑම ආණ්ඩුවක්ම භෞතික සම්පත් සංවර්ධනය සඳහා ප්‍රමුඛත්වයක් දී තිබෙනවා. ආර්ථිකය ගොඩනැගීම සදහා ප්‍රමුඛත්වය දුන්නා. එහෙත් ජාතීන් අතර එකමුතුව, සංහිඳියාව, සහෝදරත්වය, මිත්‍රශීලීභාවය ඇති කිරීම සඳහා කළයුතු කාර්යයන් අප විසින් කළානම් 80 දශකයේ මුල් භාගයේ ආරම්භ වී 26 වසරක් ගෙවුණු ම්ලේච්ඡ ත්‍රස්තවාදී යුද්ධයට අපට මුහුණදීමට සිදුනොවනු ඇතැයි මම විශ්වාස කරනවා.

ඒ නිසා රටක සංවර්ධනය තුළ ආර්ථික සංවර්ධනය, භෞතික සම්පත් සංවර්ධනය ඉතා ප්‍රමුඛ කාර්යයක් මෙන්ම රට තුළ ජීවත්වන ජනතාවගේ සංස්කෘතික ලක්ෂණයන්, ආගමික ලක්ෂණයන්, භාෂාමය ලක්ෂණයන් සියල්ල පාලකයන් විසින් තේරුම් ගැනීම ඉතාමත්ම අත්‍යාවශ්‍ය දෙයක්.

අද අපේ රටේ පමණක් නොවේ මුළු මහත් ලෝකයම ගත් විට ලෝකයේ ඉහළම සංවර්ධනයක් තිබෙන රටවල රාජ්‍ය පාලකයකයින් මුහුණ දෙන අභියෝගයක් සහ ප්‍රශ්නයක් මා දකිනවා. ඒ තමයි අධි තාක්ෂණික යුගයේ අන්තර් ජාලයත් සමග සිටින නව පරපුර මුළු මහත් පොදු ජනතාව සැමවිටම සිය සිතුම් පැතුම්, සිය ආකල්ප, සිය අධිෂ්ඨානයන් සහ සිය පරමාර්ථ සඳහා පාලකයන්ට වඩා සෑම විටම ඉදිරියෙන් සිටිනවා. එය තාක්ෂණික ලෝකයේ මම පෙර කී පරිදි 30 දශකයේ 40, 50 දශකයේ සංස්කෘතික දරුවාගේ සහ අද 21 වන සියවසේ මේ 2016 අද දවසේ උපදින තාක්ෂණික දරුවා අතරේ තිබෙන ප්‍රධානම වෙනස්කම් තුළ අපි විසින් පැහැදිළිව තේරුම්ගත යුතු දෙයක්.

ඒ නිසා අධි තාක්ෂණික ලෝකයේ ජීවත් වන ජනතාව, නව පරපුර නව ආකල්ප, නව සිතුම් පැතුම් සමග ගමන් කරද්දී බොහෝ විට සියලූ අංශවලින් පරිවර්තනයන්ට ලක්වෙනවා. ඒ පර්වර්තනයන්ට ලක්වීමේදී සියලූ විෂය ක්ෂේත්‍රවල විප්ලවීය වෙනස්කම් දකිනවා, විප්ලවීය සංකල්ප ඇති වෙනවා, නව සිතුම් පැතුම් ඇති වෙනවා. ඒ තුළ අප විසින් තේරුම්ගත යුතු බොහෝ දේ තිබෙනවා. ඒ පරිවර්තනයන්ට ඔරොත්තු දෙන ආකාරයට අපි සෑම කෙනෙක්ම



සාමුහිකත්වයෙන් අපේ රාජ්‍ය පාලනය ගෙන යාම ඉතාම අත්‍යාවශ්‍ය වෙනවා. අපේ රට වශයෙන් ගත් විට ඒ තිබෙන තත්ත්වයන් සියල්ල සැළකිල්ලට ගනිමින් මා පෙර කී පරිදි නිදහසේ අර්ථය පිළිබඳ නව මානයකින්, නව අර්ථයකින් බැලීම ඉතා අත්‍යාවශ්‍යයි කියා මම විශ්වාස කරනවා. අද ලෝකය තුළ නිර්වචනයන් විදිහට විග්‍රහ කිරීමේදී නිදහස කියන වචනය තමයි විග්‍රහ කිරීමට තිබෙන අසීරුම, සංකීර්ණතම වචනය.

නිදහස කියන වචනය පුළුල් ලෙස විහිදී ගිය වචනයක් බවට පත්වී තිබෙනවා. නිදහස කියන වචනය පුළුල් අර්ථකතන රාශියක් දෙනු ලබනවා. නිදහස කියන වචනය නව අධි තාක්ෂණයත් සමග බොහෝ විහිදී ගොස් තිබෙනවා. අපේ හර පද්ධතීන්, අපේ ශිෂ්ටාචාරයේ උරුමකම් සමඟ නව ලෝකය සහ නව සංකල්ප දෙස බැලීමේදී නිදහස කියන ඉතාම පුළුල් වූ සංකීර්ණ වූ වචනය පාලකයන් සහ සියලුදෙනා බරපතල අභියෝග යක් ලෙස දකින කාර්යක් වශයෙන් හඳුන්වන්නට පුළුවන්.

අද අපි ජීවත්වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වූ යුගයකයි. එහිදී අපි පැහැදිලි ලෙසම තේරුම්ගත යුතු කරුණු කාරණා කිහිපයක් තිබෙනවා. අද අප සිටින්නේ රජවරු රජකම් කරන පාලනයක නොවේ.

මේ නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කිරීමේදී නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමේ කාර්යය සැම විටම රජයත්, ජනතාවත් විසින් ඉටු කරනවා වගේම රටක ත්‍රිවිධ හමුදාව ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා සැමවිටම ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව තුළ කැපවී සිටිනවා.

අවුරුදු 26 කට වැඩි කාලයක් පැවති ම්ලේච්ඡ එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදී යුද්ධය පරාජය කරලා රටේ නිදහස සහ සාමය, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කළ අපේ ගෞරවණීය ශ්‍රේෂ්ඨ රණවිරුවන්, ජීවිත පරිත්‍යාග කළ, ආබාධිත වූ, අත පය අහිමි වූ, අද සිය වගකීම් නිසි අයුරින් ඉටු කරන්නා වූ ඒ සෑම

අද අපි ජීවත්වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වූ යුගයකයි. එහිදී අපි පැහැදිලි ලෙසම තේරුම්ගත යුතු කරුණු කාරණා කිහිපයක් තිබෙනවා. අද අප සිටින්නේ රජවරු රජකම් කරන පාලනයක නොවේ.



ජනාධිපති උතුරේ සංචාරයේ දී මෑතක දී ඝාතනයට ලක් වූ විද්‍යා දැරියගේ පවුලේ සාමාජිකයන් හමු වූ අවස්ථාව... www.ft.lk

කෙනෙකුටම මුළු මහත් ජාතියේ ගෞරවය හිමිවිය යුතුයි.

ජීවිත පරිත්‍යාගයෙන් ඒ මිලේච්ඡ ත්‍රස්තවාදය, බෙදුම්වාදය පරාජය කරලා රටට නිදහස සහ සාමය ලබා ගැනීමට අපේ ත්‍රිවිධ හමුදාව, පොලීසිය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ඇතුළු ආරක්ෂක අංශ සියල්ල, රාජ්‍ය සේවය මුළු මහත් පොදු ජනතාව, දේශපාලන නායකත්වයන් ඒ සෑම කෙනෙක්ම කළා වූ කැපවීම, පරිත්‍යාග ශිලි භාවය සහ ජයග්‍රහණය පිළිබඳ තිබූ ආත්ම ධෛර්යය, ආත්ම විශ්වාසය සහ අධිෂ්ඨානය ගෞරවයෙන් සිහිපත් කිරීම ඉතාම අවශ්‍යයි.

ඒ වගේම මේ අවස්ථාව වන විට අද දවසේ අපි මුහුණ දෙන ප්‍රශ්නවලදී දේශපාලන ප්‍රතිසංස්කරණ, සමාජ, ආර්ථික ප්‍රතිසංස්කරණ මේ කියන කරුණුවලට අපි මූලිකත්වය ලබාදී තිබෙනවා. බොහෝ විට මා මීට පෙර බොහෝ අවස්ථාවල ප්‍රකාශ කර ඇති පරිදි 26 වසරකට වැඩි කාලයක මිලේච්ඡ ත්‍රස්තවාදී යුද්ධය අවසන් වීමෙන් පසුව පශ්චාත් යුධමය ශ්‍රී ලංකාව ගත් විට එහෙම නැත්නම් යුද්ධය අවසන්වීමෙන් පසු කාලසීමාව තුළ මුල් අවස්ථාව අපි සිහිපත් කළහොත් 2009 මැයි මාසයේ 19, 20 වැනි දිනයන් සහ ඉන් පසුව පශ්චාත් යුද සමයක කළයුතු කාර්යයන්, ඒ වගේම පශ්චාත් ගැටුම්කාරී යුගය තුළ තිබූ කාර්යයන් අප විසින් ඉටු නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජාතින්ගේ මානව හිමිකම් කොමිසන් සභාව හරහා අපට යෝජනා මාලාවක් ඉදිරිපත් වුණා ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්.

2009 මැයි 19, 20 දිනවලින් පසුව පශ්චාත් යුද සමයක කළ යුතු කාර්යයන් අප විසින් ඉටු කර තිබුණා නම් විශේෂයෙන්ම පසුගිය වසරේ සැප්තැම්බර් මාසයේ එක්සත් ජාතින්ගේ මානව හිමිකම් කොමිසන් සභාව හරහා අපට ඉදිරිපත් වූ යෝජනා එවන් ආකාරයෙන් ඉදිරිපත් නොවනු ඇතැයි මම විශ්වාස කරනවා. ඒ නිසා අපි අද වර්තමාන තත්ත්වය සැළකිල්ලට ගත් විට 2009 මැයි 19,20 න් පසු කාලය තුළ කළ යුතු කාර්යයන් වන ජාතින්ගේ සමගිය, සංහිඳීයාව සඳහා සිංහල, දමිළ, මුස්ලිම්, බර්ගර්, මැලේ සියලුදෙනාගේ සමගිය සඳහා අපට කළ නොහැකි වූ කාර්යයන් ඉටු කිරීම සඳහා මේ රටේ ජනතාව 2015 ජනවාරි 08 වෙනිදා පැවති මැතිවරණයෙන් මා වෙත සහ අපේ ආණ්ඩුව සඳහා බලයක් ලබා දුන්නා මේ ප්‍රශ්න විසඳීම සඳහා.

2015 ජනවාරි 08 වෙනිදා ජනාධිපතිවරණයට ඉදිරිපත් කළ මැතිවරණ ප්‍රකාශනයේ තිබූ කරුණු ක්‍රියාත්මක කිරීම සඳහා මෙන්ම 1948 යටත් විජිත පාලනයෙන් නිදහස ලැබීමෙන් පසුව අපට ඔවුන් භාරදී ගිය ප්‍රශ්න වසර 68 කට පසුව විසඳීම සඳහා අපට ඉතිරිවී ඇති බව සැළකිල්ලට ගැනීම අත්‍යාවශ්‍යයි. එසේ නම් 2009 මැයි 19, 20 න් පසුව කළයුතු කාර්යයන් මේ රටේ ජනතාව 2015 ජනවාරි 09 වනදායින් පසුව අපේ රජයට භාරදීමෙන් පසුව ඒ ප්‍රශ්න අප විසින් විසඳීම අත්‍යාවශ්‍යයි කියන එක ඔබ අප සෑම කෙනෙක්ම අවිවාදයෙන් පිළිගන්නවා.

අපිට පසුව නිදහස ලබාගත් ලෝකයේ බොහෝ රටවල් සිය රට තුළ ජාතීන්ගේ සමගිය සංහිඳියාව, ආගමික සමගිය, භාෂාමය සමගිය ඒ සියල්ල තුළ පුළුල් සංහිඳියා පිළිවෙත ශක්තිමත් කරමින් දේශපාලන සහ සමාජ ප්‍රතිසංස්කරණ කළ නිසා ඔවුන් අද ප්‍රබල ජාතීන් ලෙස දියුණුවෙමින් ඉදිරියට ගොස් තිබෙනවා.

ඒ නිසා අපි අපට මේ ලැබී ඇති අවස්ථාව සුවිශේෂ එකක්. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසන් සභාව හරහා අපට ඇවිත්

ඇති යෝජනා සම්බන්ධයෙන් වැරදි අර්ථකථනයන් දෙනවා. මා ඉතා පැහැදිලිව කියනවා එම යෝජනා සඳහා අපි මුහුණ දෙන්නේ අපේ රාජ්‍යයේ ගෞරවය ආරක්ෂා කිරීම සඳහා, අපේ රටේ ජනතාවගේ ගෞරවය ආරක්ෂා කිරීම සඳහා. අපේ ආරක්ෂක හමුදාවල ගෞරවය ආරක්ෂා කිරීම සඳහා සහ ලෝකයේ පිළිගත් හමුදාවක් බවට අපේ ත්‍රිවිධ හමුදාව පත් කර ගැනීම සඳහා බව. එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රමුඛ සියලු ජාත්‍යන්තර සංවිධාන සහ සියලු රාජ්‍යයන් අපේ රට ගෞරවයෙන් පිළිගැනීම සඳහා ඒ යෝජනාවලට අපි මුහුණදීලා ඉතාම ඉවසීමෙන්, සංයමයෙන්, හික්මීමෙන් අපි ඒ සඳහා ක්‍රියා කරනවා.

මෙහිදී ඇතැම් දේශපාලන ප්‍රතිවාදීන්, බලය පිළිබඳ ක්ෂණික බලාපොරොත්තු තිබෙන අය මේ යෝජනා ක්‍රියාත්මක කිරීමේදී රජය අනුගමනය කරන ක්‍රියා පිළිවෙත් සම්බන්ධයෙන් ජනතාව නොමග යවන බොහෝ අර්ථකථනයන් දෙනු ලබනවා.

ඒ යෝජනා ක්‍රියාත්මක කිරීම තුළ මේ රට තුළ තහවුරු වන්නේ නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය, සංහිඳියාව.

ආරක්ෂක හමුදා සාමාජිකයින්ගේ සිත් නොසන්සුන් කරන ආකාරයට නොයෙකුත් ආකාරයේ වැරදි මත, අදහස් මේ සම්බන්ධයෙන් දේශපාලන ප්‍රතිවාදීන් සහ නොයෙක් අන්තවාදී අදහස් දරන අය ක්‍රියාත්මක කරන බව පෙනී යනවා.

රටේ ස්වාධීනත්වය ආරක්ෂා කරමින්, භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කරමින් රට තුළ ජාතික සංහිඳියා පිළිවෙත ශක්තිමත් කරන්නේ රජයේ ගෞරවය, ත්‍රිවිධ හමුදාවේ ගෞරවය ආරක්ෂක අංශවල ගෞරව සහ මුළු මහත් ජනතාවගේ ගෞරව ආරක්ෂා කරගෙන එම ප්‍රශ්න විසඳීමට අපි රජයක් විදිහට සාමුහිකත්වයෙන් මුහුණ දෙන බව අද 68 වන නිදහස් දිනයේදී, ඔබේ ආදරණීය ප්‍රධාන මහජන සේවකයා විදිහට, සේනාධිනායකයා විදිහට, ජනාධිපතිවරයා විදිහට මා මුළු මහත් ජාතියට ප්‍රතිඥා දෙනවා.

ඒ නිසා අද වන් දිනයක අපේ සිත්හි අපි ධාරණය කරගත යුතු වෙනවා අපි අභිමානවත් ජාතියක් ලෙස, අභිමානවත් රාජ්‍යයක් ලෙස ලෝක සිතියමේ සටහන් කරන්නට අපි සෑම කෙනෙක්ම ක්‍රියාකිරීමේ අවශ්‍යතාවය. මා විශ්වාස කරනවා මුළු මහත් ජනතාවම ඒ සඳහා සැදි පැහැදි, අධිෂ්ඨානශීලිව කටයුතු කරනු ඇති බව.

පසුගිය වසර තුළ අපේ නව රජය විදිහට ලබාගත් ජයග්‍රහණවලදී මේ රටේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදය සහ නිදහස ආරක්ෂා කරමින් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සිදු කිරීම මේ රටේ පොදු මහජනතාව මේ යුගය තුළ ලබාගත් විශිෂ්ට ජයග්‍රහණයක් කියන එක මා ඉතා පැහැදිලිව සඳහන් කරනවා. ස්වාධීන කොමිසන් සභා පිහිටුවීම ඔස්සේ වසර 40 කට වැඩි කාලයක් මේ රටේ ජනතාව ඉල්ලා සිටි මැතිවරණ කොමිසන් සභා පිහිටුවනු ලැබුවා. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් මැතිවරණ, රාජ්‍ය සේවය, පොලීසිය, මානව හිමිකම්, විගණන කටයුතු මෙවැනි ආයතන රාශියක් සඳහා ස්වාධීන කොමිසන් සභා පිහිටුවලා මේ රටේ ජනතාවගේ අභිමානවත් අයිතිය සුරක්ෂිත කිරීමට කටයුතු කළා.

ඒ වගේම ගෙවී ගිය වසරක කාල සීමාව තුළ දූෂණය, වංචාව, නාස්තිය අවම කිරීම සඳහා අපි රජයක් විදිහට ගත් ක්‍රියාමාර්ගවල සාර්ථක ප්‍රතිඵල තිබෙන බව මම පැහැදිලිව කියන්න ඕන. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අපි පාර්ලිමේන්තුව ශක්තිමත් කළ බව ඔබ කවුරුත් පිළිගන්නා දෙයක්. රාජ්‍ය සේවය දේශපාලනීකරණයෙන් නිදහස් කර ගැනීම සඳහා 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඇති කළ ස්වාධීන කොමිසන් සභා පැහැදිලිව ඉදිරියේදී ක්‍රියා කරනවා.

මේ සියලු නිදහස ලබාදීමේදී විශේෂයෙන් නිදහස් මාධ්‍ය සම්බන්ධයෙන් අපි අනුගමනය කළ ප්‍රතිපත්තියේදී මේ රටේ නිදහස් මාධ්‍යයට

**ලෝකයේ ප්‍රබුද්ධ වූ විශිෂ්ට රාජ්‍යයක් ලෙස මගේ උතුම් දේශය පත් කරන්නට, එළැඹෙන දශකයන් සඳහා අපේ හෙට දවස සූදානම් කරන්නට ඔබ අප සෑම කෙනෙක්ම, සාමුහිකත්වයෙන් බැඳී, මිත්‍රත්වයෙන් එක්වී සහෝදරත්වයෙන් යුතුව කටයුතු කරමු.**



ජනාධිපති උතුරේ සංචාරයේ දී ආගමික උත්සවයකට සහභාගී වෙමින්... www.omlanka.net

පුළුල් නිදහසක් අපි ලබා දී තිබෙනවා. ඒ නිදහස අද උච්චතම අවස්ථාවට පැමිණ තිබෙනවා. අපි මේ නිදහස ලබා දුන්නේ මාධ්‍ය ක්ෂේත්‍රයේ කටයුතු කරන උගතුන්ට, බුද්ධිමතුන්ට, ප්‍රඥාවන්තයින්ට, මානවවාදින්ට විනයක්, හික්මීමක් ඇතිව සිය මාධ්‍ය හැසිරවීම සඳහා.

ඒ ලබාදුන්නා වූ නිදහස ඒ පරමාර්ථයන්ගෙන් තොරව භාවිතා කරන්නේ නම් නම් ඒ ලබාදී ඇති නිදහස අනාගතයේදී අපෙන් පසුව එන අය විසින් යම්කිසි දවසක අහිමි කරන්නට ඉඩ තිබෙනවා. ඒ නිසා ඒ නිදහස ආරක්ෂා කර ගැනීමේ වගකීම සියලූ මාධ්‍ය ආයතන සහ මාධ්‍යවේදින් සතුව තිබෙනවා.

ආර්ථික වශයෙන් සමෘද්ධිමත් වූ රටක් ගොඩනඟන්නට, ඒ වගේම ශාස්ත්‍රීය දියුණුව ඇති කරන්නට, නිදහස් අධ්‍යාපනය ශක්තිමත් කරන්නට, නිදහස් සෞඛ්‍ය සේවාව ශක්තිමත් කරන්නට, මන්ද පෝෂණයෙන් තොර රටක් ගොඩනඟන්නට නව අධි තාක්ෂණය සමඟ නව පරපුර බද්ධ කරමින් මේ තරඟකාරී ලෝකයේ ජාත්‍යන්තරය තුළ ඉදිරියට යන්නට, ඒ වගේම දේශීය කර්මාන්ත, දේශීය ආහාර නිෂ්පාදන මේ සියල්ල වැඩිදියුණු කරමින් විදේශීය වෙළඳපොළ සඳහා අපේ දේශීය නිෂ්පාදන යොමු කිරීමේ වැඩපිළිවෙළ ශක්තිමත් කිරීමේ ප්‍රතිපත්තිය අපි දැඩි ලෙස ක්‍රියාත්මක කරනවා.

නිදහසින් පසුව වසර 68 කාල සීමාව තුළ අපේ සාගර සම්පත රටේ ආර්ථිකය ගොඩනැගීම සඳහා කොතෙක් දුරට ප්‍රයෝජනයට ගෙන ඇත්ද කියන ප්‍රශ්නය අප හමුවේ තිබෙනවා. ලෝකයේ සංවර්ධනය වූ රටවල සාගර සම්පත ප්‍රයෝජනයට ගැනීමේදී අප අපි රට දියුණු කිරීම සඳහා සියයට එකක ප්‍රමාණයක්වත් සාගර සම්පත ප්‍රයෝජනයට නොගෙන ඇති බවයි පෙනී යන්නේ.

ඒ නිසා අධිතාක්ෂණික ලෝකයේ දූපත් රාජ්‍යයක් ලෙස අපට තිබෙන මේ මහා සාගර සම්පත තුළින් අපේ ආර්ථිකය දියුණු කරන්නට, ශිල්පීය ඥානය තුළින් සාර්ථක ප්‍රතිඵල නෙළන්නට අපට හැකියාව තිබෙනවා.

අද වැනි භාග්‍යවන්ත වූ දවසක 1948 නිදහස ලබාගැනීම සඳහා සටන් කළ දේශප්‍රේමී ශ්‍රේෂ්ඨ උතුම් නායකයින් ගෞරවයෙන් සිහිපත් කරමින් 26 වසරක ම්ලේච්ඡ ත්‍රස්තවාදය අවසන් කර ජීවිත පරිත්‍යාගයෙන් රටට සාමය ලබාදුන් අපේ ශ්‍රේෂ්ට රණවිරුවන්ට ගෞරවය පුද කරමින් අද දවසේ අපේ කාර්යය, හෙට දවස වෙනුවෙන් කැපවීමෙන් සාමුහිකත්වයෙන් ඉටු කරමින් පටු දේශපාලන බේදවලින් තොරව, පටු අදහස්වලින් තොරව, බලය ලබා ගැනීම සඳහා ක්ෂණික ක්‍රියාමාර්ගවලට අවතීර්ණවීම වැනි අමනෝඥ කාර්යයන්ගෙන් මිදී සාමුහිකත්වයෙන් කටයුතු කරමින් නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදය රැක ගනිමු.

නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදය තුළින් ලබාදී ඇති සියලූ අයිතීන් භුක්ති විඳීමේදී බුද්ධිමත්ව, ප්‍රඥාවන්තව, ඉවසීමෙන් සහ තම ඥානයෙන් ඒ කාර්යයන් සඳහා කැපවන ලෙස විශේෂයෙන්ම දේශපාලන ප්‍රතිවාදින්ට කිව යුතුයි.

ලෝකයේ ප්‍රබුද්ධ වූ විශිෂ්ට රාජ්‍යයක් ලෙස මගේ උතුම් දේශය පත් කරන්නට, එළැඹෙන දශකයන් සඳහා අපේ හෙට දවස සූදානම් කරන්නට ඔබ අප සෑම කෙනෙක්ම, සාමුහිකත්වයෙන් බැඳී, මිත්‍රත්වයෙන් එක්වී සහෝදරත්වයෙන් යුතුව කටයුතු කරමු.

**(68 වැනි නිදහස් සැමරුම් උළෙලේ දෙසුම)**



අද අප අතර ඇත්තේ ශ්‍රී ලංකාවේ මනුෂ්‍යත්වය ගැන සියලු දෙනාටම අමතක නොවන සිද්ධින්ය. මෙයට හේතුව ලෙස පැහැරගැනීම් සහ ඝාතනය කිරීම් ඇතුලු සිද්ධීන් සඳහන් කරන්න පුළුවන්. එමෙන්ම යුද්ධයද තවත් හේතුවකි. පීඩාවට පත් නොවූ අයෙකුට මෙය සාමාන්‍ය පුවතක් පමණි. නමුත් මේ තුළින් පීඩාවට පත් වූ කෙනෙකුට එය ජීවිතාන්තය දක්වා හිතේ තියෙන වේදනාවකි. මමත් එවැනි අයෙක්මි. මාගේ මෙම නිර්මාණය එයට සමාන දෙයකි. ජීවිතයක් කියන්නේ පරම්පරා කීපයක ආරම්භයක්ය. ජීවිතයක් යනු පරම්පරාවක් විනාශ කිරීමට සමානය. පැහැරගැනීමට ලක්වූ කෙනෙක් පවා එවැනිම පුද්ගලයෙක්ය. මෙයට වගකිව යුත්තේ බලයේ සිටින්නෝය. එම නිසා මාගේ චිත්‍රයේ කලලයක් උඩ සපත්තු අඩියක් මා සඳහන් කර තිබෙන්නේ එබැවිනි. කලලය වටේටම පැහැර ගැනීම සම්බන්ධයෙන් පුවත් මා අලවා ඇත. මේ පිළිබඳව අද වෙනතුරුත් කතා කරන්නේ මාධ්‍යය පමණක්ය.

චිත්‍රය : **මරක්කන්දු මනෝකර්**

# පියවරෙන් පියවර අපි ඉදිරියට යන්නෙමු



විදේශ අමාත්‍ය
**මංගල සමරවීර**

අද වන විට ජිනීවා හි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 30 වන සැසිවාරයේ දී අප විශිෂ්ට ජයග්‍රහණයක් ලබාගෙන ඇත්තෙමු.

පසුගිය වසර කිහිපය පුරා අප රටට එරෙහිව සම්මත වූ යෝජනා හේතුවෙන් අප රට ජාත්‍යන්තරය තුළ විශාල වශයෙන් අපකීර්තියට පත්විය. බෙදුම්වාදීවූත් කර්කශ වූත් ඡන්දය භාවිතා කිරීම හමුවේ 2012 වසරේ සිට නොකඩවා සම්මත වූ යෝජනා වලින් ජාත්‍යන්තරය ඉදිරියේ ශ්‍රී ලංකාව දිගින් දිගටම පරාජයට හා හුදෙකලාවට පත් විය.

පසුගිය රජය විසින් 2009 වසරේ මානව හිමිකම් කවුන්සිල යෝජනාවක් ජයගත් බවට උදම් ඇනුවත් එම උත්සාහය කවුන්සිලය තුළ සම්මුතියක් ඇති කිරීමේලා අපොහොසත් වූ බැවින් එය ශ්‍රී ලංකාව ලබාගත් සැබෑ ජයග්‍රහණයක් වශයෙන් සැලකිය නොහැක. ඡන්දයකින් අනතුරුව ක්‍රියාවට නැංවුණු මෙම යෝජනාව හරහා කවුන්සිලයේ සාමාජිකයින් බොහොමයක් විරසක වූ අතර ඒ තුළින් ශ්‍රී ලංකාවට තවදුරටත් අපකීර්තියට පත් කරමින් 2012, 2013 හා 2014 වසරවල දී නොකඩවා ශ්‍රී ලංකාවට එරෙහි යෝජනා සම්මත වීමට මග පාදන ලදි.

එම කාල වකවානුව සැබැවින් ම සාමයට ලැදි, ප්‍රජාතන්ත්‍රවාදයට ඇළුම් කළ, එමෙන් ම




දශක ගණනාවක් තිස්සේ එක්සත් ජාතීන් අතර ගෞරවාදයට පාත්‍ර වූ හා සියලු දෙනා අතර මධ්‍යස්ථ මෙන්ම මිත්‍රශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කළ ශ්‍රී ලංකාව ජාත්‍යන්තරය හමුවේ දැඩි සේ අපහසුතාවයට හා අපකීර්තියට පත් වූ කාල වකවානුවක් විය.

දශක 3ක් පුරා පැවති යුද්ධය 2009 වසරේ අවසන් වූ පසුව, සාමය උරුම වීම වෙනුවට අප රටේ ජනතාවට හිමිවූයේ නිදහස අහිමි වූ, ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සීමා වූ, නීතියකින් තොර වූ රටකි. සාමයෙන් හා සමගියෙන් ජීවත් වීම සඳහා වූ අප රටේ ජනතාවගේ සිහිනය බොඳ වී ගියේ ය. සංහිඳියාව තුළින් ජාතීන් එක්සත් කිරීම සඳහා සහ අප රටේ පවතින විවිධත්වය සමරන රටක් බිහි කිරීම සඳහා ලැබුණු අවස්ථාව ජාතීන් අතර පරතරය වැඩි කරන හා ජාත්‍යන්තර වශයෙන් අප රට හුදෙකලා කරන ක්‍රියාවක් හමුවේ අහිමි වී ගියේ ය.

මානව හිමිකම් කඩවීම පිළිබඳ චෝදනා සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගැනීමක් සිදු නොවූ අතර එපමණක් නොව 2009 වසරෙන් පසු මානව හිමිකම් කඩවීම් පිළිබඳ සිද්ධීන්වල වර්ධනයක් ද දක්නට ලැබුණි.

ශ්‍රී ලංකාව ජාත්‍යන්තරයේ විවේචනයට ලක් වූ අතර ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් අන්තර්ජාතික පරීක්ෂණයක් සිදු කිරීම සඳහා ද ඔවුන්ගේ අවධානය යොමු විය. එමගින් ජාත්‍යන්තර වෙළඳපොළට ප්‍රවිශ්ඨ වීම හා ආර්ථික දියුණුව තුළින් ආයෝජනය හා ප්‍රතිලාභ ආකර්ශනය කර ගැනීම සඳහා තිබූ අවස්ථාව අප රටේ ජනතාවට අහිමි විය.

නමුත්, 2015 ජනවාරි මස පටන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ හා අගමැති රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් මෙහෙයවනු ලබන නව රටේ අධිෂ්ඨානය හා උත්සාහය හමුවේ නිදහස, සාමානාත්මතාවය හා යුක්තිය යන විශ්වීය අගයයන් ගරු කරන වගකිවයුතු, විශ්වාසනීය, සාමකාමී ජාතියක් වශයෙන් නැවත වරක් ජාත්‍යන්තර අවධානය දිනා ගැනීමට ශ්‍රී ලංකාවට හැකි විය.

ඒ අනුව සත්‍යය, යුක්තිය වන්දි ලබාදීම හා නැවත ඇති නොවන බව තහවුරු කරමින්, සියලු ජනතාව සඳහා සාමය හා සෞභාග්‍යය ළඟාකරලීම සඳහා අර්ථවත් ප්‍රතිසන්ධානයක් කරා යන ගමනේ දී කලෙක බෙදී තිබූ එක්සත් ජාතීන්ගේ මානව

සංහිඳියාව තුළින් ජාතීන් එක්සත් කිරීම සඳහා සහ අප රටේ පවතින විවිධත්වය සමරන රටක් බිහි කිරීම සඳහා ලැබුණු අවස්ථාව ජාතීන් අතර තරතරය වැඩි කරන හා ජාත්‍යන්තර වශයෙන් අප රට හුදෙකලා කරන ක්‍රියාවක් හමුවේ අහිමි වී ගියේ ය.

හිමිකම් කවුන්සිලයේ සහාය යළි ශ්‍රී ලංකාවට ලබාගැනීම සඳහා එකඟ කරවා ගැනීමට හැකි විය.

ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ප්‍රතිපත්ති ප්‍රකාශන හා දින 100 වැඩ පිළිවෙළ අනුව යමින් අප විසින් මෙම වසර තුළ දී දෙවරක් ම වගවීම සඳහා ශ්‍රී ලාංකික ජනතාව තුළ ඇති කැමැත්ත පිළිබිඹු කරයි. මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ චෝදනා විභාග කිරීම සඳහා විශ්වාසනීය පරීක්ෂණ පැවැත්වීම ද මෙම යාන්ත්‍රණයට ඇතුළත් වන අතර එමගින් නැවත ඇති නොවීම තහවුරු කෙරෙන අතර ජාත්‍යන්තර ප්‍රජාවගේ හා ශ්‍රී ලංකාවේ හා ඉන් පිට ජීවත් වන සියලු පාර්ශ්වකරුවන්ගේ සහාය ලබාගනිමින් සංහිඳියාව, සාමය හා ස්ථාවරත්වය ළඟාකර ගැනීම සඳහා ශ්‍රී ලංකාවට ඉදිරියට ම පිය නැගීමට හැකිවනු ඇත.

මවිසින් මීට පෙර ද අවධාරණය කළ පරිදි ත්‍රස්තවාදය පැරදවීම අත්‍යවශ්‍ය විය. එබැවින් අද වන විට ත්‍රස්තවාදයට හේතු සෙවීමෙහි ලා සහ ජාතිය හා සාමය ගොඩනැගීමේ ලා කටයුතු කිරීමට අවශ්‍ය නිදහස ශ්‍රී ලංකාවට හිමිව ඇත. ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාව සිය විනය හා වෘත්තීය නිපුණතාවය සම්බන්ධයෙන් ජාත්‍යන්තර ඇගයීමට ලක් වූ කාලයක් තිබුණි. නමුත් මෑත අතීතයේ බලයේ සිට ඇතැමුන් විසින් නිර්මාණය කරන්නට යෙදුණු පද්ධතිය හා සංස්කෘතිය හේතුවෙන් සන්නද්ධ හමුදාවන්ගේ කීර්ති නාමය පළුදු විය. මෙම තත්ත්වය ජාත්‍යන්තරය විසින් වටහාගෙන ඇත.

මෙම යෝජනාව එක් අතකින් ජාත්‍යන්තර ප්‍රජාව අතර ඇති මෙම දැක්ම තහවුරු කිරීමක් වන අතර විශ්වාසනීය වගවීමේ ක්‍රියාවලියක් මගින් වෘත්තීය නිපුණතාවයෙන් යුතුව නිසි පරිදි ක්‍රියාකළ අයගේ කීර්තිය හා ගෞරවය ආරක්ෂා කෙරෙනු ඇත. එක්සත් ජාතීන්ගේ සාමය සාධක දෙපාර්තමේන්තුව විසින් ගෝලීය සාම සාධක ක්‍රියාවන්හි වැඩි වශයෙන් නිරත වන ලෙස කරන ලද ආරාධනය හා සැප්තැම්බර් මස 28 වන දින නිව්යෝක් හි පැවැත්වෙන ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා විසින් සම සභාපතිත්වය දරන සාම සාධක මෙහෙයුම් පිළිබඳ ජාත්‍යන්තර නායක සමුළුවට සහභාගී වීම සඳහා මෛත්‍රීපාල සිරිසේන මහතාහට ලැබුණු ආරාධනය මෙම තත්ත්වය වඩාත් හොඳින් පිළිබිඹු කරයි.

කාලයක් තිස්සේ, පියවරෙන් පියවර, අප රටේ ජනතාව අතර සාමය තහවුරු කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග ගන්නා තඅර ජාත්‍යන්තරය තුළ අප රටට හිමි තැන ලබාගැනීම සඳහා කටයුතු කරමින් යෝජනාවේ පවතින විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ධාරිතාව, විශේෂඥ දැනුම හා කැපවීම ශ්‍රී ලංකාව සතුව ඇති බව අපගේ විශ්වාසයයි. ඒ අනුව, පිළිවෙළින් සියලු දෙනාට ප්‍රතිලාභ හිමිවන ආර්ථික හා සමාජ සංවර්ධනයක් ළඟාකර ගැනීම අපගේ අපේක්ෂාවයි.

## ලංකාවේ උතුරු දෙසට ගලන ගංගා ඇත්තේ එකක් පමණි.

(පොතකින්)



නදියක් දුටු තැන නවතා
චාටු කතාවෙන් අමතා
දකුණට හරවන්න හදන
රජුන්, ඇමතියන් නොතකා
උතුරටම ගලා යයි
කනගරායන් ආරු

මහවැලි කැලණි වලවේ කළු යන ගංගා
මිණි කැට තියන් සිටියදි දිය යට හංගා
තියෙන දෙයක් දෙන්නට උතුරට රිංගා
ආරු කනගරායන් පාරට බැස්සා

රතු වුණු මල් පිපෙන ලා දුඹුරු බිම් තීරු
නිල් පාට සායමෙන් කරවමින් පින්තාරු
රැළි අතර හොවාගෙන වන්නියෙන් එන සේරු
උතුරටම ගලා යයි කනගරායන් ආරු ...

**රුවන් බන්දුජීව**



# සාදු ජනයිනි
# දකුණෙන්
# උතුරු දෙසට යන

කරටි නැති තල් කඳන්
බිම දැමු තිලීපන්
සමතලා සොහොන් කොත්
දැක ගන්න

මග දෙපස
A9
බිමට වන් විපත් දැක
බුදුන් සිහිකර
සාධු නොකියන්න

කෝපායි... වේතනෙයි
කොඩිකාමම්
සොහොන් බිම් කුඩුකරනු දැක
එළාරගෙ සොහොන් ගැබ
පසුකරන දුටු ගැමුණු
කියා පෑ වදන් සිහියට ගන්න

අයුක්තිය දැක දැකම
සාදු යැයි නොකියන්න

වෙඩි උණ්ඩ සිදුරු කළ
වහල නැති බිත්ති දැක
වෛරයේ කුරුටු ගී
නොලියන්න



තහඩු යට තැම්බීමෙන්
රිදුණු හදවත් රකින
සහෝදර දනන් දැක
නාගදීපේ කොතද පෙනි පෙනී
බුදුන් සිහිකර සාධු නොකියන්න

නල්ලූර් කෝවිලට
ඇතුළු වීමට පෙරත්
ඔබ ඔබේ පුදබිමට
යන ලෙසම
පාවහන් ගලවා යන්න

සඟමිත් තෙරණි සපැමිණි
දඹකොළ පටුන වැල්ලෙහි
සිප්පි කටු අතර ඇති
නාඳුනන ඇට කැබිලි
මිනිසුන්ගේ විය හැකිය
සාදු යැයි නොකියන්න

කදුරුගොඩ වෙහෙර ළඟ
සංකිලිට වෛර කර
දෙමළුන්ට බැන වැදී
බුදුන් සිහිකර සාදු නොකියන්න


නාගදීපේ වෙහෙර
මුදුන ගල් ගැසී ඇති
කඳුළු පළිඟුව දැක
සාදු යැයි කියන්නට හැකිද
නෑසෙන්න
සහෝදර දෙමළ ජනයින්ට


දුම්කොළ වගේ වේලුණු
තල් අකුරු මෙන් ගල් වුණු
බොහෝ විපතින් දැවුණු
මිනිසුන්ය මෙබිම සැරි සරන්නේ


සොයාගෙන ජීවිතේ
සොයාගෙන ආදරේ

තෙත් කරනු මැන 'ඔබේ මුදු මුවින්
තෙත් කරනු මැන ඔබේ හදවතින්
මේ අපේ සහෝදර ජනයින්ය
අපි මෙන් ම දුක ගණින මිනිසුන්ය

**දයා නෙත්තසිංහ**
(අකුරු ඔබ දෙස බලා සිටී කෘතියෙනි)




යමක් සිදුවී අවසාන විය. එය මුළු සමාජයටම නව ප්‍රබෝධයක් වනවා මෙන්ම රටක දියුණුවේ ආරම්භය ලෙස ලිබිතව සටහන් කල හැකිය. දෝංකාර දුන් විශාල ශබ්දයක් නිහැඬියාවක් බවට පත් වූ විටක එහි ප්‍රතිඵලය අත් නොවින්දකුට හඳුනා ගත නොහැකිය. එය සිදු වූ ප්‍රදේශයට හෝ එම රටට අයත් කිසිවෙකුට එහි සුන්දර නිහැඬියාව සුන්දර ලෙස විඳිය නොහැකිය.

නිදහසේ ගමන් ගන්නා දුම්රියක් සිය ගමන් වාරය අවලංගු කර දැමීමට සිදුවන්නාක් මෙන්ම ගමන් ගන්නා දුම්රියට සිය ගමනාන්තය කරා ලඟා වීම අවිනිශ්චිත විය හැකිය. මාගේ කලා කෘතියේ ආරම්භය සහ අවසානය එයයි. දුම්රියේ පීලි දෙක මෙන් දුරස්ව සිටින ජාතීන් දෙකක් එකට එකතු කර එකම මැදිරියක් තුල රැගෙන යාමේ මහඟු කාර්යභාරයක් දුම්රිය තුළින් සිදුවනවා මෙන්ම ඔවුනොවුන් අතර සබඳතා ගොඩනන්වන සොදුරු තෝතැන්නකි. අවලංගු කරනු ලැබූ දුම්රිය වාර සහ ගමනාන්තයට ලඟා වීමට නොහැකි වූ දුම්රිය ගමන් වාර ඉතිහාසයට එකතු වී ඇත. නමුත් එහි දුර්විපාක ඉතිහාසයට එකතු වී නැත. එය භුක්ති විඳින්නන් තවමත් නිහඬව බලා සිටී. මා හා ඔබද එයට අයත්ය. ඔබට හා මට නිහැඬිව බලා සිටින්නට සිදුවන්නේ එය සිදු කල දිනට පමනක් වලංගු වන නිසාය.

සංකල්පනාව : **ගමගේ පැතුම් නිමේෂ්**

# වාර්ගික පදනමට වඩා වැදගත් වන්නේ ශ්‍රී ලාංකික පදනමයි

කලින් මෙරට පැවති තත්වයට වඩා පවතින ආණ්ඩුව සංහිඳියාව සම්බන්ධයෙන් කටයුතු කරන අකාරය ගැන සතුටු විය හැකි ය. නමුත් අප අපේක්ෂා කළ තරම් දෙයක් සිදු නොවේ. යහපාලන ආණ්ඩුව යහපානය හා සංහිඳියාව වැනි කාරණා සඳහා මෙරට සියලු පුරවැසියන් සහභාගී කරගනිමින් ප්‍රගතිශීලී ගමනක් කරා යෑමට තවම අසමත් වී ඇත. මහින්ද පාලන සමයේ සේම මුස්ලිම් ජනතාව කොන් වූ ජන කණ්ඩායමක් හැටියට සළකන අතර තවමත් ඔවුන්ගේ ප්‍රශ්න ප්‍රධාන වේදිකාවට ගෙන ඒමට කිසිවෙකුත් ඉදිරිපත් නොවේ. 1999 සිට මේ දක්වා ම දෙමළ දේශපාලඥයින්, මුස්ලිම් දේශපානඥයින්, සිවිල් සමාජය, රජය හෝ ජාත්‍යන්තරය මුස්ලිම් ජනයා කොන් වූ පුරවැසි කණ්ඩායම් හැටියට සළකයි.

පසුගිය රාජපක්ෂ රෙජීමය සමයේ මෙරට දේශපාලන ඉතිහාසයේ පෙර නොවූ විරූ ආකාරයට මුස්ලම් පුරවැසියාට අගතීන් වලට මුහුණ පැමට සිදු විය. ඒ නිසා ම එම පාලනයට විරුද්ධ වෙමින් වත්මන් ආණ්ඩුව පත් කර ගැනීම සඳහා මුස්ලිම් ජනයා කටයුතු කළහ. රාජපක්ෂ රෙජීමය වෙනස්වීම ඔස්සේ තාවකාලික විසඳුමක් (පෙර පැවති පාලනයෙන් වූ පීඩනයට) ලැබුණ ද මුස්ලිම් පුරවැසියාගේ ප්‍රශ්නයන්ට කිසිදු විසඳුමක් ලැබී නැත. සංහිඳියාව සහ අනෙකුත් දේවල් ඇති වන්නේ පාලකයන් සමඟ ගොඩ නැගෙන විස්වාය ඔස්සේ ය. නමුත් ඒකාබද්ධ ආණ්ඩුකරණය සහ සිදුවන නොයෙක් දේ හමුවේ එවැනි විශ්වාසයක් නොමැති අතර ඇති වන්නේ සැකයක් පමණි.



**හිල්මි අහමඩ්**
උප සභාපති,
ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලය



මුස්ලිම් කොංග්‍රස් නායක අමාත්‍ය රවුෆ් හකීම් මහතා ඇතුලු පිරිසක් මහනුවර දළදා මැදුර අසල.... www.colombotelegraph.com

සංක්‍රාන්තික යුක්තිය වඩාත් සාධනීයව ඉටු විය යුතු දෙයකි. එහිදී අගතියට පත් සියලු පුරවැසියන්ට ඇහුම්කන් දී ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කළ යුතු ය. සිංහල සහ දෙමළ ජනයා සිතන්නේ යුද්ධයට සෘජුව ගොදුරු වූයේ ඔවුන් පමණක් කියා ය. මුස්ලිම් ජනයා එහිදී යුද්ධයෙන් බාහිරව සිටි කණ්ඩායමක් කියා ය. නමුත් යුද්ධයෙන් හානි වූ පිරිස අතර නැගෙනහිර මුස්ලිම් ප්‍රජාව සිටින බව අමතක නොකළ යුතු ය. සංක්‍රාන්තික යුක්තිය ඉටුවීමේ දී එයට මුස්ලිම් ප්‍රජාව ද ඈඳා ගත යුතු අතර මෙය සිංහල සහ දෙමළ ජනයාගේ ප්‍රශ්නයක් ලෙස පමණක් දැකිම වැරදි ය. සංක්‍රාන්තික යුක්තිය ඉටු කිරීමේ දී සිදුවන නැවත පදිංචි කිරීම සහ ඊට අදාළ අනෙකුත් දේවල්වලදී මුස්ලිම් ජනතාව අත්හැරීම යම් දීර්ඝ කාලීන ගැටුම් තත්ත්වයක් නිර්මාණය වීමට හේතු විය හැකි ය. එය සිංහල - මුසලිම් සහ මුස්ලිම් - දෙමළ අතර ප්‍රශ්නයක් බවට නිර්මාණය විය හැකි ය. පැවති යුද සමයේ සිංහල සහ දෙමළ කොට්ඨාස දෙකම ආයුද අතට ගත් අතර ඉන් පීඩාවට පත් වූයේ මුස්ලිම් ප්‍රජාව ය. පැවතී පීඩාවන් වලට ජාතීන් ත්‍රිත්වයම සම ව ගොදුරුව ඇති නිසා යම් යුක්තියක් ඉටු කිරිමේ දී ශ්‍රී ලාංකිකභාවයෙන් කටයුතු කළ යුතු ය. ජාතීන් වෙන් වෙන් ව වර්ග නොකළ යුතු ය.


පවතින ආණ්ඩුව සංක්‍රාන්තික යුක්තිය ඉටුකිරීම සිදු කරන්නේ සැබෑ පුරවැසි අවශ්‍යතාවක් ලෙස සළකා නොව ජාත්‍යන්තරය සතුටු කිරීම සඳහා ය. එසේ ම මුස්ලිම් ජනතාවගේ ප්‍රශ්නයේ දී යුරෝපීය රටවල් කිසිදු සැළකිලිමත් නොවයි. එහිදී මුස්ලිම් ප්‍රජාවට ඇති එක ම විසඳුම වන්නේ මැදපෙරදිග රටවල් වල සහය පැතීම ය. එය කුමනාකාරයකට ද බලපාවිදැයි යන්න ගැටලුවකි. මන් ද එහිදී එම රටවල් තෙල්, ගෘහසේවය වැනි දේ නතර කළ හොත් එය අනවශ්‍ය ප්‍රශ්නයකට හේතු විය හැකි ය. ලංකා ඉතිහාසය පුරා මුස්ලිම් ප්‍රජාව රැඩිකල් දේශපාලනයක් සිදු කොට නැත. ආයුධ අතට ගෙන ප්‍රශ්නවලට විසඳුම් සොයා නැත. ඒ තත්ත්වය ඉදිරියටත් පවත්වා ගැනීම මුස්ලිම් සමාජයේ ද අපේක්ෂාව වේ.

මෙරට ජාතික ප්‍රශ්නයේ දී මුස්ලිම් ජනතාව වෙනම පාලයක් හෝ වෙනම ප්‍රදේශයක් ඉල්ලා නැත. එසේ වුව හොත් එය ගැටුම්කාරී තත්ත්වයක් උත්ගත වීමට හේතුවකි. ඒ නිසා අප අපේක්ෂ කාරන්නේ සියලු දෙනාම ශ්‍රී ලාංකිකයන් ලෙස සළකා සමාන අයිතිවාසිකම් ලැබිය යුතුය යන්න පමණි. දෙමළ ජාතික සන්ධානයට උතුරු නැගෙනහිරට පූර්ණ බලය බෙදීමක් ඉල්ලා කටයුතු කළ ද ඔවුන් එහිදී මුස්ලිම් සමාජය සළකන්නේ සුළුතරයක් ලෙස ය. එහිදී ඔවුන් මුස්ලිම් සමාජය අමතක කොට ඇත. එය කණගාටුදායක කාරණයකි. මුස්ලිම් ප්‍රජාව ද බහුතරයක් සිටින ප්‍රදේශවලට වෙනම බලය බෙදීමක් ඉල්ලා සිටියහොත් එය ගැටලුවකි. ඒ නිසා අප පොදු තේරුම් ගැනීමකින් මේ ප්‍රශ්නවලදී කටයුතු කළ යුතු ය. මෙහිදී උතුරේ මුස්ලිම්, දකුණේ මුස්ලිම්, නැගෙනහිර මුස්ලිම්, යාපනේ දෙමළ, වතුකර දෙමළ, ඉන්දිය දෙමළ, බර්ගර්, මැලේ ආදී වශයෙන් වෙන් වෙන් ව සිතා කටයුතු නොකොට සමස්ත ශ්‍රී ලාංකික පදනමකින් කටයුතු කළ යුතු ය. එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිට සියලු මූලික අයිතිවාසිකම් සමානව බෙදී යා යුතු ය.

අවසානයේ දී සඳහන් කළ හැක්කේ ආණ්ඩුව තවම සංහිඳියාව ගොඩ නැගීම සඳහා ජනතාව අතර විශ්වාසය ඇති කිරීමට සමත් වී නොමැති බවයි. ආණ්ඩු පක්‍ෂය ඇතුළු සියලු දේශපාල පක්‍ෂ මෙහිදී කටයුතු කරන්නේ තම දේශපාලන උවමනාවන්වලට අනුකූලව ය. පසුගිය සමයේ පැවති රෙජීමය වෙනස් වුවද ප්‍රගතිශීලි කිසිවක් සිදුව නොමැත. ඒ ගැන සැළකිලිමත්ව කටයුතු කළ යුතු ය. කෙසේ හෝ පවතින ආණ්ඩුව සමඟ මෙහිදී සහයෝග යෙන් කටයුතු කිරීමට සිදුව ඇත්තේ පරාජිත කණ්ඩායම් නැවතත් බලය ඒම සඳහා කැස කවමින් සිටින නිසා ය.

(සම්මුඛ සාකච්ඡාවක් ඇසුරෙන් ජේ. සුරේෂ් කුමාර් විසින් සකසන ලදි)

සංහිඳියාව ඇති කිරීමේ පසුබිම සකස් කරගැනීම සඳහා යුද්ධයෙන් පීඩාවට පත්වූවන්ට යුක්තිය ඉටුකිරීම සඳහා කළ යුතු දේ පිළිබඳව ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම් **ඩියු ගුණසේකර** මහතා කියන්නේ මෙවැනි කථාවකි.


www.thesundayleader.lk

# යුක්තිය ඉටුකිරීමට අවශ්‍ය නිර්දේශ එල්.එල්.ආර්.සී. වාර්තාවේ තියෙනවා

**යුද්ධය අවසන් වී වසර පහක් පමණ පසු වී ඇති නමුත් ජාතික ප්‍රශ්නයට තුඩුදුන් කාරණාවලට විසඳුම් සොයා ගැනීමට පෙර සංහිඳියාවක් ඇතිකර ගැනීමට පසුබිම සකස්කර ගැනීම පිණිස යුද්ධයේ දී විපතට පත්වූවන් වෙනුවෙන් යුක්තිය ඉටුකරීම සඳහා ඔබ කරන යෝජනා මොනවා ද?**

පළමුවෙන් ම කියන්න කැමතියි අපි ඇමති මණ්ඩලයේ සිටියදීත්, එල්. එල්. ආර්. සී. නිර්දේශ ක්‍රියාත්මක කළයුතුය යන  දැඩි ස්ථාවරයක හිටියේ. ගැටුමේ දී විපතට පත්වූවන්ට යුක්තිය ඉටුකිරීමට අදාළ සියලු නිර්දේශ ඒකේ තියෙනවා. ඉතාමත්ම බුද්ධිමත් විද්වත් මණ්ඩලයක් තමයි එම වාර්තාව හැදුවේ. හැම පැතිකඩක් ම එහි ඇතුළත් කරලා තියෙනවා. මම හිතන්නේ ඒක හරියට ක්‍රියාත්මත කළා නම් මේ වනවිට යුක්තිය ඉටු වී අවසන්. එහෙත් එම අවස්ථාවේ නොයෙකුත් බලපෑම් නිසා කොමිෂන් සභා වාර්තාව පවා ප්‍රකාශයට පත් කිරීම ප්‍රමාදයට පත්වෙනවා. ඒක ප්‍රකාශයට පත් කළාට පස්සෙ කෑලි කෑලි තමයි ක්‍රියාත්මක කිරීම පටන් ගත්තේ. ඉතිං ඒ නිසාම තමයි ජිනීවා ප්‍රශ්නයත් ඇති වුනේ. ඒ නිර්දේශ ක්‍රියාත්මක කළානම් ජිනීවා ප්‍රශ්නය ද මතු වෙන්නේ නෑ.

ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම් **ඩියු ගුණසේකර**

නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා මතවාදයක් රට තුළ ඇති කිරීම ආණ්ඩුවේ වගකීමක් වී තිබුණා. එසේ කළා නම් එම වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට තිබුණා. අනික් එක ඒ ගත්ත ප්‍රවේශය නිවැරදියි. කොමිෂන් සභා රිපෝට් එකකින් තමයි එවැනි දෙයක් කරන්න ඕන. නැත්නම් ඒක දේශපාලනීකරණය වෙනවා. දේශපාලන පක්ෂයක වැඩක් හැටියට එය ක්‍රියාත්මකවීම සුදුසු නෑ. මේක අපක්ෂපාත විද්වතුන් පිරිසක් එක්වෙලා මෙහෙම නිමිත්තක් තියෙන බව පවසා ක්‍රියාත්මක කිරීම තමයි නිවැරදි වෙන්නේ. ඉතිං එසේ නොකර සිටීම තමයි බරපතල ප්‍රශ්නයක් වුණේ.

**එවකට පුණරුත්ථාපන ඇමති හැටියට ඒ වෙනුවෙන් ඔබ යමක් කළා ද?**

ඔව්, යුද්ධය අහවර වුනාට පස්සේ පුනරුත්ථාපන ඇමතිවෙලා හිටියේ මම. මම 12000ක් පුණරුත්ථාපනය කරලා එළියට දැම්මා. ඔය ඊයේ පෙරේදා උස්සන් ගිහිල්ලා මරන්න හැදුවා කියන මිනිහත් මමයි පුණරුත්ථාපනය කරලා එළියට දැම්මේ. ලෝකයේ කිසිම රටක් මේ ආකාරයේ පුණරුත්ථාපනයක් කරලා නෑ කියලා මට කියන්න පුළුවන්. හැබැයි ඒ ආණ්ඩුවට ඒක මාර්කට් කරගන්නට තරම් දැණුමක් තිබුනේ නෑ. ජාතිවාදි පැත්තෙන් බැලුවාම ඒවා මාර්කට් කිරීම පාඩුයි. ඒකයි එසේ නොකළේ. ඒ නිදහස් කළ අයගෙන් අද සමහර දොස්තරවරු ඉන්නවා. සමහර ඉංජිනේරුවන් ඉන්නවා. විශ්ව විද්‍යාලයට 300ක් පමණ ගියා. සංහිඳියාවේ දි එවැනි ප්‍රවේශක් අවශ්‍ය ය. එසේ නැතිව දේශන පැවැත්වීමෙන් පමණක් වැඩක් වෙන්නේ නෑ.

**ඊළඟට අද ප්‍රශ්නයක් තියෙනවා උතුරු ජනතාවගේ ඉඩම් පිළිබඳව. ඒ අය කියන්නේ හමුදාව ඒ අයගේ ඉඩම් අත්පත්කරගෙන ඉන්න බවයි. මේ ගැන ඔබතුමාගේ මතය කුමක් ද?**

ඒකත් ඔය එල්. එල්. ආර්. සී. වාර්තාවේ තියෙනවා ඒ මිනිස්සුන්ගේ ඉඩම් ඔක්කොම ඒ අයට දෙන්න ඕනේ. ආණ්ඩුවේ ඉඩම් තියෙනවා නම් ඒක ප්‍රමාද කළාට ප්‍රශ්නයක් නෑ. මේ ප්‍රශ්න විසඳන්න බැරි ප්‍රශ්න නෙවෙයි. මම කැබිනට් එකේ ඉන්නකොටත් මතුකරපු එකක් තමයි මේක, ඒකට ප්‍රතිපත්තියක් හදාගන්නට අවශ්‍යයි. මේක දකුණෙත් තිබ්බ ප්‍රශ්නයක්. හම්බන්තොට මිනිස්සු කැමති නෑ මාතර මිනිස්සුන්ට හම්බන්තොට ඉඩම් දෙනවාට. ඩඩ්ලි සේනානායක මේකට හොඳ ප්‍රතිපත්තියක් හැදුවා. පළවෙනි ප්‍රමුඛතාවය ලැබෙන්නේ ඒ ප්‍රදේශයේ ඉඩම් නැති මිනිස්සුන්ට. දෙක අල්ලපු දිස්ත්‍රික්කයේ මිනිසුන්ට. තුන ඊළඟ අල්ලපු දිස්ත්‍රික්කයේ අය. මේක මම ජනාධිපතිතුමාටත් කිව්වා. චන්ද්‍රිකා නම් මෙක දන්නවා. කිළිනොච්චියේ ඉඩම් නම් කිළිනොච්චියේ මිනිසුන්ට දෙන්න ඕනේ. ඒක සාධාරණයි. මේක විසඳගන්න බැරි දෙයක් නෙවේ. ජේ . ආර්. ජයවර්ධන සර්ව පාක්ෂික සමුළුවක් තිබ්බා නේ. ඒකේ ඉඩම් කොමිටියක් හැදුවා. මම ඒකේ හිටියා. ගාමිණි දිසානායක සභාපති වුනේ. ඒ කොමිටියේ තමයි ඔය ප්‍රතිපත්තිය අපි හැදුවේ.

**එතකොට ඔය පොලිස් බලතල දීම ගැන සමහරු විරුද්ධයි නේ ද?**

ඒක වහාම විසඳන්න බෑ. නමුත් ඒ අයට ඉස්සෙල්ලා රථවාහන පොලිසියේ බලතල දෙන්න පුළුවන් නේ. එතකොට කවුරුත් තේරුම් ගන්නවා මේ බලතල දුන්නාට ප්‍රශ්නයක් වෙන්නේ නැති බව. එහෙම ක්‍රමාණුකූලව මිනිස්සු සමග ඉඳගෙනම තමයි ක්‍රියාත්මක කරන්නට වෙන්නේ.

## අපි ඇමති මණ්ඩලයේ සිටියදීත්, එල්. එල්. ආර්. සී. නිර්දේශ ක්‍රියාත්මක කළයුතුය යන දැඩි ස්ථාවරයක හිටියේ. ගැටුමේ දී විපතට පත්වූවන්ට යුක්තිය ඉටුකිරීමට අදාළ සියලු නිර්දේශ ඒකේ තියෙනවා. ඉතාමත්ම බුද්ධිමත් විද්වත් මණ්ඩලයක් තමයි එම වාර්තාව හැදුවේ. හැම පැතිකඩක් ම එහි ඇතුළත් කරලා තියෙනවා. මම හිතන්නේ ඒක හරියට ක්‍රියාත්මත කළා නම් මේ වනවිට යුක්තිය ඉටු වී අවසන්.

**තවත් කරුණක් තමයි කිසිදු චෝදනාවක් නැතිව දෙමළ තරුණයින් අත් අඩංගුවේ තබාගෙන සිටීම. ඒ ගැන ඔබගේ අදහස මොකද්ද?**

ඒ සියලු දෙනාම නිදහස් කරන්න ඕනේ. ඒක පාර්ලිමේන්තුවේදීත් මම කියලා තියෙනවා. චෝදනා නැත්නම් තියාගෙන ඉන්නේ මොකට ද? එතකොට ඒක ඉබේම මානුෂික ප්‍රශ්නයක් වෙනවා නේ. සමහර විට ත්‍රස්ත වැඩට සම්බන්ධ වෙන්නට ඇතැයි සිතන්නට පුළුවන්. එහෙත් චෝදනා නැත්නම් නිදහස් කරනවා ඇරෙන්නට වෙන කරන්නට දෙයක් නෑ. එහෙම තීරණ ගන්නේ නැති නිසා මතයි මේ ප්‍රශ්න මතුවෙන්නේ. තීරණ ගන්නවා තියා කියන්නත් බයයි.

**කොමිෂන් සභා වාර්තා හා ඒවායේ නිර්දේශ පාලකයින් ක්‍රියාත්මක නොකරන්නේ ඇයි ?**


මේකට හරස් වන්නේ දේශපාලන පක්ෂවල ප්‍රතිපත්ති. ප්‍රශ්න දෙස බලන ආකාරය නිසයි ඒවා ක්‍රියාත්මක නොකරන්නේ. ඕක නෙවෙයි දැන් බලන්න බදු කොමිෂන් වාර්තා හඳලා තියෙනවා. නමුත් එළියට දාන්නේ නෑනේ. ඒකෙ තියෙනවා අද තිබෙන මේ අර්බුද ඔක්කොටම

විසඳුම. පොඩි මිනිසුන්ට බරක් දාන්නේ නැතිව ඒකෙ තියෙනවා තුලනාත්මකව ඒක කරන්න ඕන කොහොමද කියලා. ඉතිං ඒක ඉදිරිපත් කරන්නේ නැහැ. මොකද ඒ යෝජනා ක්‍රියාත්මක කළොත් ධනපති පංතියට වැඩි බරක් යන බව දන්නවා. ඒ නිසා ඒ ඒ දේශපාලන පක්ෂවල ප්‍රතිපත්ති සමග ගැටෙන නිසා ඔය කොමිෂන් සභා යෝජනා ක්‍රියාත්මක කරනවා තබා ප්‍රසිද්ධ කරන්නේවත් නෑ.

ඒක තමයි අපේ රටේ තියෙන දේශපාලන සංස්කෘතිය. මොනවා වුනත් විද්වත් මණ්ඩලයක් විසින් ඉදිරිපත් කරන එකක් ක්‍රියාත්මක කරන්න ඕනේ. ඒකට නේ කොමිසන් සභාවලට ඔවුන්ව පත් කරන්නේ. ඉතිං ඒක හරියට ක්‍රියාත්මක උනානම් ඔය ප්‍රශ්න හුඟක් එන්නෙ නැහැ. ඒ නිසා අපි මුල ඉඳලාම දිගින් දිගටම එල්. එල්. ආර්.සී. රිපෝට් එකේ නිර්දේශ ක්‍රියාත්මක කරන්න කියන ස්ථාවරයේ හිටියේ.

**බලයට පත්වන ආණ්ඩු තමන් පත්කරන කොමිසන්වල වාර්තා ප්‍රසිද්ධ නොකරන විට හා නිර්දේශ ක්‍රියාත්මක නොකරන විට ජනතාවට මොකද්ද කරන්න පුළුවන් ?**

කළ හැක්කේ උද්ඝෝෂණය කරන එක තමයි, වෙන මොනවද කරන්නෙ. දැන් ඉතිං අලුත් ආණ්ඩුවක් ඇවිල්ලානේ තියෙන්නේ. අලුත් ආණ්ඩුව ඇවිල්ලා සංහිඳියාව වගේ ප්‍රශ්න මතු කරලා තියෙනවා නේ. එය සාධනීය තත්ත්වයක්. ඊළඟට ජාතික ප්‍රශ්නයට විසඳුමක් ගේන්න හදන බවකුත් පේනවා. ඉතිං ඒකත් සාධනීයයි. ඒතෙන්දි අපි සම්පූර්ණයෙන්ම සහයෝගය දෙනවා. විපක්ෂයේ හිටියට අපට ඒකට විරුද්ධ වෙන්න බෑ. හැබැයි මගේ පුද්ගලික හැඟීම නම් මම දකින ආකාරයට පාර්ලිමේන්තුවෙන් ජාතික ප්‍රශ්නය විසඳන්න බැහැ. එහෙම කරන්නට ගියොත් වැඩේ තව අවුල් වෙනවා. කළ යුත්තේ ආණ්ඩුවේ ප්‍රධාන පක්ෂ දෙකම යම් ආකාරයෙන් එකට ඉන්නවානේ. දැන් ඉතිං ඒ නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජනාධිපතිතුමායි, එක්සත් ජාතික පක්ෂයේ




අගමැතිතුමායි, ඒ පක්ෂ දෙක සමග සාකච්ඡාවක් කරලා මේ ප්‍රශ්නයට පොදු ප්‍රවේශයක් ගන්න උත්සාහ කළ යුතුයි. මුල ඉඳලාම අපට ඉතිහාසයේ ජාතික ප්‍රශ්න විසඳන්න බැරි උනේ, ශ්‍රී ලාංකීය ජාතියක් ගොඩනැගීමේ කාර්යයේ ඉඳලා සියලු ප්‍රශ්න විසඳන්න බැරි උනේ ප්‍රධාන පක්ෂ දෙක බලයට එන්න හදන්නේ ජාතික ප්‍රශ්නය අල්ලා ගැනීම නිසා. මේ ආකාරයට දෙපැත්ත ගන්නවා බලයට එන්නයි, බලයේ සිටින්නයි, බලය රැක ගැනීමටයි.

දැන් මෛත්‍රීපාල ජනාධිපතිතුමා කියනවානේ මේ නිසාමයි මෙවැනි ආණ්ඩුවකට ගියේ කියලා. ඒ නිසා ඒක දැන් කරන්න ඕනේ. 13 වැනි සංශෝධනය ගෙනෙන වෙලාවේ මම තනි මන්ත්‍රීවරයෙක් විදියට 225න් මම තනිවම විපක්ෂයේ ඡන්දය දුන්නා. ආණ්ඩුව යුඑන්පීයේ ද කියල මම බැලුවේ නෑ. මොකක්ද ගේන්නෙ කියලා මම එතන දී බැලුවේ. මට කමක් නැහැ යුඑන්පිය තියා කවුරු ගෙනාවත් මට එකඟවෙන්න පුළුවන් නම් මම සහය දෙනවා. ඉතිං විපක්ෂයේ තනි මන්ත්‍රීවරයෙක් විදියට ඒක එදා මම කළා. ඒකේ ප්‍රතිඵලය උඩ මගේ පක්ෂයේ පාක්ෂිකයින් හා නායකයින් 50ක් ජනතා විමුක්ති පෙරමුණ එදා මැරුවා. මාව මරා ගන්න බැරි උනා. ඉතිං ඒකයි උනේ. මේ අවස්ථාව ගිලිහී යන්න ඉස්සර වෙලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සාකච්ඡා කරන්න ඕන මේ ගැන. ඉන්පසු ඒ දෙගොල්ල එකතු වෙලා දෙමළ පක්ෂ හා මුස්ලිම් පක්ෂ සමග ද සාකච්ඡා කරන්න ඕන. ඊළඟට වමේ අපිට පිටින් ඉන්න කට්ටියේ ද සහයත් ලැබුණාම ආණ්ඩුවට හයියක් වෙනවා. එතකොට අන්තවාදී පැත්තට යන්න ඉඩනොදී ඒකට ඒ අය නායකත්වය දෙන්න ඕන. එහෙම නොකර හිටියොත් වෙන්නෙ වෙන බලවේගයන් මේවා පාවිච්චි කිරීමයි. උතුරෙන් බෝල ගැහුවාම දකුණෙනුත් ගහනවා. ඉතිහාසේ පුරාවටම එහෙම නේ සිද්ධ උනේ.

මීට අමතරව තමිල්නාඩුවේ මැතිවරණය දිනන්නට ද අපේ ප්‍රශ්නය යොදාගන්නවා. දෙමළ මිනිසුන්ගේ බහුතරය ගන්න කරුණානිධිට ගහන්න ඕන නිසා දෙමළ මිනිසුන්ට ඊලම ලබාදෙන්න ඕන කියලා ජයලලිතා ඊයේ පෙරේදාත් ප්‍රකාශයක් කළා. එහෙම ප්‍රකාශයක් කළාම ඒක ලෙඩක්නේ. ඉතිං ඊළඟට අන්තවාදින්ට මෙහෙන් ප්‍රතික්‍රියාවක් දක්වන්න ඕනැ වෙනවා. ඉතිං මේ කරුණ තේරුම් අරගෙන තමයි වැඩකරන්න ඕනේ. ඔය ඉන්දියාව කොච්චර කෑ ගැහුවත්

දැන් මෛත්‍රීපාල ජනාධිපතිතුමා කියනවානේ මේ නිසාමයි මෙවැනි ආණ්ඩුවකට ගියේ කියලා. ඒ නිසා ඒක දැන් කරන්න ඕනේ. 13 වැනි සංශෝධනය ගෙනෙන වෙලාවේ මම තනි මන්ත්‍රීවරයෙක් විදියට 225න් මම තනිවම විපක්ෂයේ ඡන්දය දුන්නා. ආණ්ඩුව යූඑන්පීයේ ද කියල මම බැලුවේ නෑ. මොකක්ද ගේන්නෙ කියලා මම එතන දී බැලුවේ. මට කමක් නැහැ යූඑන්පිය තියා කවුරු ගෙනාවත් මට එකඟවෙන්න පුළුවන් නම් මම සහය දෙනවා. ඉතිං විපක්ෂයේ තනි මන්ත්‍රීවරයෙක් විදියට ඒක එදා මම කළා. ඒකේ ප්‍රතිඵලය උඩ මගේ පක්ෂයේ පාක්ෂිකයින් හා නායකයින් 50ක් ජනතා විමුක්ති පෙරමුණ එදා මැරුවා.

අපට ප්‍රශ්නයක් නෑ. මෙතන අපි එකට ඉන්නවානම් ප්‍රශ්නය විසඳාගන්න පුළුවන්. මම කියන්නේ ජාතික ප්‍රශ්නයේ දී අපට එකතුවෙන්න බැරි ඇයි? මේක අපේ ප්‍රාථමික ප්‍රශ්නයක්නේ. මෙතෙන්දි 60%ක් හරි එකඟ වෙන්න පුළුවන් නම් එතන ඉඳලා දෙමළ හා මුස්ලිම් පක්ෂ එක්ක කතාකරලා ඉදිරියට යමු. සියලු ප්‍රශ්න විසඳන්න බැරි වෙන්න පුළුවන්. විසඳිය හැකි ප්‍රශ්න විසඳන්න ඕනේ. නැත්නම් සියල්ල දෙස කළු සුදු ආකාරයට බැලුවොත් වැඩේ හරියන්නේ නෑ.

**ඔබ එසේ කිව්වත් ඒකාබද්ධ විපක්ෂය තුළ ඉන්න සමහර කොටස් මේ ප්‍රශ්නය දෙස බලන්නේ ජාතිවාදි ඇසකින් නේ?**

මොන ආණ්ඩුව බලයේ සිටියත් අනිවාර්යයෙන් ජාතික ප්‍රශ්නය විසඳා ගන්න ඕනේ. ඒකට මහින්ද රාජපක්ෂත් සම්බන්ධ කරගන්න ඕන කියලා මම කියන්නේ. වෙන්වෙලා හිටියත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තාමත් එක පක්ෂයක් නේ. ඒකට පිටින් ගියොත් එකේ කොටස් අනිකුත් අන්තවාදී කොටස්වලට බිලිවෙන්න පුළුවන්. කෙසේ නමුත් මේ වගේ ප්‍රශ්නයක් එනකොට නැත්නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ ප්‍රශ්නයක් නම්, ජාතික ප්‍රශ්නයට විසඳුමක් නම්, සංහිඳියාව පිළිබඳ ප්‍රශ්නයක් නම්, අපි ඉන්නේ කෙලින්ම සහයෝගය දෙන පැත්තේ.

මම කියන්නේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක එක ස්ථාවරයකට එනකොටම ප්‍රබල මතයක් ඉබේම ඇතිවෙනවා. ඔය සාමාන්‍ය පොදු ජනතාව, දෙමළ ජනතාව, සිංහල ජනතාව හෝ කම්කරු ජනතාව ජාතිවාදී නැහැ. ජාතිවාදය කියන එක මධ්‍යම පංතියේ ප්‍රපංචයක්. ඒක තියෙන්නෙ වෘත්තිකයින් අතර. ඒක ටිකක් ආත්මාර්ථකාමීයි. අර පැත්තෙ ඉන්න තමන්ගේ මිනිසුන් අභිබවා යන්න ඔවුන් බලන්නේ. ඊළඟට බිස්නස් කාරයෝ. ජාතිවාදය කියන එක ලොවපුරා තියෙන මධ්‍යම පාන්තික ප්‍රපංචයක්. දැන් ඔය භාෂා ප්‍රශ්නය ආපුවෙලාවෙ බලන්නකො බුද්ධිමතුන් හැසිරුනු ආකාරය. ඊළඟට ඔය බණ්ඩාරනායක වෙල්වනායගම් ගිවිසුම එනකොට, ඩඩ්ලි සේනානායක වෙල්වනායගම් ගිවිසුම එනකොට ඔවුන් හැසිරුනු ආකාරය බලන්න. ඊළඟට ජේ.ආර්. ජයවර්ධනගේ ඉන්දු ලංකා ගිවිසුම එනකොටත් ඔවුන් හැසිරුනේ ද ඒ අකාරයටමයි.

මගේ මතය නම් ඔය සුළු අන්තවාදී කොටස්වලට අපි බියවිය යුතු නැ. ඔවුන් ඉන්නේ හැම තිස්සේම මහ පක්ෂත් එක්ක. ඉතිහාසය බලන්න ආපහු, 56 ඉඳලාම එහෙමයි උනේ. මෙත්තානන්ද, රාජරත්න වගේ අය හිටියේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එක්ක, එහෙම නැත්නම් යූඑන්පියත් එක්ක. එහෙම නැත්නම් තනියම ඔවුන්ට මොනවත් කරන්න බෑ. ඔය බොදු බල සේනාවේ ඥානසාර හාමුදුරුවෝ බලන්න. එයා ඉන්නෙම කවුරු හරි අල්ලා ගන්න බලාගෙන. එක්කො ගෝඨාභය පස්සෙ යනවා, මහින්ද රාජපක්ෂ පස්සේ යනවා. තනිව ඔය දඟලන කවුරුවත් නැහැ. දේශපාලන භූමියේ ගත්තත් එහෙමයි. මහ පක්ෂවල අය දැන ගන්න ඕන ඉතිහාසයෙන් පාඩම් ඉගෙන ගන්න. දැන් බණ්ඩාරනායක මහත්තයාට වෙච්ච දේ බලන්න. අන්තිමට ඇති උනේ යුද්ධයක් නේ. යුද්දෙන් මැරනේ දෙමළ මිනිසුන් විතරක් නෙවේ. සිංහල මිනිසුන් මැරුනේ නැද්ද? වෙන්න ඕනේ ඔක්කොම උනානේ. ඉතිං ඒක නිසා දැන්වත් ඒක පාඩමකට ගන්නවා නම් හොඳයි. ඒ නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි, එක්සත් ජාතික පක්ෂයයි යම් එකඟතාවයකට එන්න ඕන. ඒ උනත් අනිත් අය උනත් ඔවුන් එක්ක සාකච්ඡාවකට යන්න ඕන. හැබැයි එතන ඉන්න අති බහුතරයක් ජාතිවාදී නෙවෙයි. නිකන් මහින්ද රාජපක්ෂ කියලා ලේබල් එක ගහලා එහාට තල්ලු කරන්න යන්න නරකයි. එදා දේශපාලන සංස්කෘතියක් තිබුණා. අද දේශපාලන සංස්කෘතියක් නෑ. අද ඉන්න අය දේශපාලනය දන්නේ නෑ. ඒ නිසා එදාට වඩා අද ප්‍රවේසම් විය යුතු යි.



# විග්නේෂ්වරන්ලාත් මහින්ද කල්ලියත් ජාතිවාදය අඩයාලමක් කරගෙන

**බංකොලොත් දේශපාලන නායකයින් තමන්ගේ අසමත්කම් වසා ගැනීමට අඩයාළමක් කර ගන්නේ ජාතිවාදය යි. උතුරේ ජනතාවගේ අප්‍රසාදයට ලක්වෙමින් සිටින විග්නේෂවරන්ලා එයින් ගැලවීමටත් දකුණේ ජනතාවගෙන් ප්‍රතික්ෂේප වූ මහින්ද රාජපක්ෂලා ඇතුළු කල්ලිය නැවත බලයට එන කෙටි පාරක් ලෙසත් යොදා ගන්නා ජාතිවාදය ප්‍රතික්ෂේප කළ යුතුයැයි ද නැවත මෙරට ජාතිවාදය මතුවෙමින් පවතින බව ද ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා මහතා පැවසී ය. ඒ මහතා මේ පිළිබඳ ව සඳහන් කළේ  අප්‍රේල් 28 වන බ්‍රහස්පතින්දා ජනතා විමුක්ති පෙරමුණු ප්‍රධාන කාර්යාලයේ දී පැවති මාධ්‍ය සාකච්ඡාවේ දී ය.**

**එම මාධ්‍ය සාකච්ඡාවේදී ටිල්වින් සිල්වා මහතා පළ කළ අදහස් පහත පිරිදි දැක්විය හැකි ය.**

උතුරු පළාත් සභාවේ මහ ඇමති විග්නේෂ්වරන් මහත්තයලා යෝජනාවක් සම්මත කර ගත්තා ෆෙඩරල් පාලනයක් සඳහා. ඒ වගේ ම දකුණේ  දේශපාලන වශයෙන් බංකොළොත් වී සිටින මහින්ද රාජපක්ෂලාත් ජාතිවාදය අවුස්සමින් සිටිනවා. මේ දෙපැත්තේම ජාතිවාදය නිසා උතුරේ හෝ දකුණේ සාමාන්‍ය ජනතාවට කිසිදු සෙතක් අත් වෙන්නේ නැහැ. මෙයින් සිදු වන්නේ දෙමළ ජනතාවගේ ප්‍රශ්නවලට පවා විසඳුමක් නොලැබෙන තත්ත්වයක් නිර්මාණය වීම පමණයි.

**ටිල්වින් සිල්වා**
ජවිපෙ ප්‍රධාන ලේකම්

www.srilankaguardian.org



ඒකාබද්ධ විපක්ෂ වේදිකාවේ හිටපු ජනාධිපති මහින්ද, උදය ගම්මන්පිල සහ විමල් වීරවංශ

**උතුරු පළාත් සභාව පසුගිය කාලයේ උතුරේ ජනතාව වෙනුවෙන් කිසිවක් කළේ නැහැ. උතුරේ ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් ලබාදීමට ඔවන් අසමත් වුණා. විශේෂයෙන් ම පානීය ජලය ප්‍රශ්නකයට ඔවුන්ට උත්තර තිබුණේ නැහැ.**

ඒ වගේම මේ තත්ත්වය නිසා ජාත්‍යන්තර බලවේගවලට අපේ රටට අත පෙවීමට නැවත ඉඩ කඩ ලැබෙනවා.. ඒ නිසා අපි මෙය පරාජය කළ යුතු ව තිබෙනවා..

ජාතිවාදය ඇවිස්සීම නිසා ඇති වුණ තත්ත්වයෙන් මේ රටේ ජනතාව තිස් අවුරුදු දරුණු යුද්ධයකට මුහුණ දුන්නා.. මේ යුද්ධය නිසා උතුරේ ජනතාවට කිසිදු වාසියක් අත් වුණේ නැහැ. ඒ වෙනුවට ඔවුන්ගේ ජීවිත ආපස්සට යාමක් පමණයි සිදු වුණේ. ඒ වගේම උතුරේත් දකුණේත් ජීවිත දස දහස් ගණනින් අහිමි වුණා. දේපළ විනාශ වුණා. විදේශීය අතපෙවීම්වලට ඉඩ කඩ ඇති වුණා..

උතුරු පළාත් සභාව පහුගිය කාලයේ උතුරේ ජනතාව වෙනුවෙන් කිසිවක් කළේ නැහැ. උතුරේ ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් ලබාදීමට ඔවන් අසමත් වුණා. විශේෂයෙන් ම පානීය ජලය ප්‍රශ්නකයට ඔවුන්ට උත්තර තිබුණේ නැහැ.. එසේ ම ඉන්දීය ධීවරයින් ඇවිත් උතුරේ මුහුදේ මාළු ඇල්ලීම නිසා උතුරේ ධීවරයින්ට මුහුණ දීමට වූ ගැටලුවලට විසඳුම් ලබා දෙන්න ඔවුන් අසමත් වුණා. මේ විදිහට උතුරේ ජනතාවට බලාපොරොත්තු වූ දේවල් ඉටු කරන්නට අසමත් වීම නිසා විග්නේෂ්වරන්ලා ජනතාවගෙන් ප්‍රතික්ෂේප වෙමින් තිබුණා. අප්‍රසාදයට ලක් වෙමින් තිබුණා.. ඒ නිසා උතුරේ ධීවර ජනතාව තමන්ගේ ප්‍රශ්න කියන්න දකුණට ඇවිත් අපිව මුණ ගැසෙන තත්ත්වයක් නිර්මාණය වුණා. ඒ වගේ ම මධ්‍යයම රජයෙන් උතුරේ වැඩ කිරීමට ලබා දුන් මුදල් සියල්ල සංවර්ධන කටයුතු සඳහා යෙදවීමට විගනේෂ්වරන් මහත්තයලා අසමත් වුණා.. ඒ වගේම උතුරු පළාත් සභාවේ සමහර ඇමතිවරුන්ගේ මුදල් වංචාවන් පිළිබඳවත් ඒ ජනතාව අතර විවිධ කතා පැතිරෙමින් තිබෙනවා.. එසේ ඔවුන් බංකොළතේ වන විට ඇත්ත ප්‍රශ්න මගහැර ජනතා අවධානය වෙනත් පැත්තකට යොමු කිරීම සඳහා තමයි බල බෙදීම පිළිබඳ යෝජනාවක් ගෙන එන්නේ..

සියලු ජාතිකත්වයන් අතර සමඟිය ගොඩ නැගීමට නම් ජාතික සංහිඳියාව ඇති කිරීමට නම්, පාලකයින්ට ඔවුන්ගේ විශ්වාසය දිනා ගැනීමට සිදු වෙනවා.. ඒ සඳහා ඔවුන්ගේ ප්‍රශ්නවලට විසඳුම් ලබා දිය යුතු වෙනවා.. අතුරේ ජනතාවට තිබෙන නිවාස, ඉඩම් පිළිබඳ ප්‍රශ්න වගේ ම ආර්ථික ප්‍රශ්නවලට විසඳුම් ලබා දිය යුතු වෙනවා.. ඒ වගේ ම යුද්ධය පැවති කාලයේ බැංකුවල තැන්පත් කළ රත්තරන් බඩු රජයට පවරා ගත්තා. මහින්ද රාජපක්ෂ මහතා නැවත ඒවා ලබා දුන්නත්, ඉතිරි කොටස තවමත් ලාබ දී නැහැ.

යුද්ධය ජයග්‍රහණය කළ වහාම මේ විස්වාසය දිනා ගත හැකි පරිදි කටයුතු කළ යුතුව තිබුණා. නමුත් එදා පැවති ආණ්ඩුව එය කළේ නෑ වගේ ම යුද්ධය ජයගත් වහාම උතුරේ ජනතාව මත දැවැන්ත පීඩනයක් මුදාහැරියා. ඊට පසුවත් පැවති ආණ්ඩුව වගේම පවතින ආණ්ඩුවත් උතුරේ දෙමළ

අපි පෙනී සිටින්නේ ජාතික සමගිය වෙනුවෙන්. ජනතාව බෙදන ජනතාව අසමගි කරන ඕනෑම යෝජනාවකට අපි විරුද්ධයි. ඒ වගේම උතුරේ ධනපති දේශපාලන නායකයින් ගෙන එන ජාතිවාදී යෝජනා පදනම් කරගෙන උතුරේ දෙමළ ජනතාවට එරෙහිව දකුණේ ජනතාව උසිගැන්වීමටත් අපි විරුද්ධයි.


www.tamilnewsnetwork.com

උතුරු පළාත් මහ ඇමති විග්නේෂ්වරන් ඇතුළු පළාත් සභා මන්ත්‍රීවරු

ජනතාවගේ විශ්වාසය දිනාගත හැකි කිසිවක් කළේ හැනැ.

ඒ වගේ ම වර්තමාන ආණ්ඩුව පොදුවේ ජනතා ප්‍රශ්න විසඳන්නේ නැහැ. ඒ වෙනුවෙන් ජනතාව මත අලුත් අලුත් බදු පනවමින් සිටිනවා. රජයේ සේවකයින්ගේ විශ්‍රාම වැටුප කප්පාදු කරමින් සිටිනවා. රාජ්‍ය දේපළ විකුණමින් සිටිනවා. එක පැත්තකින් ජනතාවගේ වැටුප් වැඩි කර තවත් පැත්තකින් ඒවා නැවත අය කර ගැනීම සඳහා බදු පනවා තිබෙනවා. වැටුප් වැඩි වුණේ රාජ්‍ය සේවකයින්ට පමණයි. නමුත් බදු වැඩිවීම පෞද්ගලික අංශ සේවකයින්ටත් භාරගන්න සිදුව තිබෙනවා. මේ නිසා වත්මන් ආණ්ඩුවත් ජනතා ප්‍රසාදය අහිමි කරගත් පාලනයක් බවට පත් වෙමින් තිබෙනවා. ඒ නිසා ඔවුන්ටත් ජාතිවාදය ඇවිස්සීම වාසිසහගත වෙලා තිබෙනවා.. ඒ නිසා ඒවා වැළැක්වීමට කටයුතු නොකර බලා ඉන්නවා.

අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දෙකඩ වෙලා මැයි දින දෙකක් පවත්වන තැනට පත් වෙලා. ඒ වගේ ම ජනතාවගෙන් ප්‍රතික්ෂේප වෙලා ඉන්න මහින්ද රාපක්ෂටත් නැවත දේශපාලන වශයෙන් ඉදිරියට පැමිණීමට සිංහල ජාතිවාදය ඇවිස්සීමේ අවශ්‍යතාවක් තිබෙනවා. මහින්ද රාජපක්ෂ වටා සිටින බලවේග පහුගිය කාලයේ ජනතාවට බලපාන කිසිදු ප්‍රශ්නයක් ගැන අරගල කළේ නැහැ. බදු බර වැඩිවීම්, තෙල් මිල අඩුකිරීම, වැනි ප්‍රශ්න ගැන අරගල කළේ නැහැ. ඔවුන් කෑ ගැහුවේ තමන්ට එරෙහිව තිබෙන දූෂණ චෝදනා පිළිබඳ පරීක්ෂණ කරන්න එපා කියලා. නැත්නම් මූලය අපරාධ කොට්ඨාසය අහෝසි කරන්න කියලා. ඒ නිසා ඔවුන් සාමාන්‍ය ජනතාව අතරට ගියේ නැහැ. ඔවුන් ඔප්පු කර තිබෙනවා පොදු ජනතා ප්‍රශ්න සඳහා අරගල කිරීමට හැකියාවක් නැති බව. ඒ නිසා ඔවුන්ට බලයට එන්න තියෙන කෙටිමාර්ග හැටියට මේ ජාතිවාදය අවුස්සනවා හැර කළ හැකි කිසිවක් නෑ..

ඒ නිසා උතුරේ විග්නේෂ්වරන්ලාගේ ජාතිවාදය දකුණේ මහින්දලාගේ ජාතිවාදය පෝෂණය කරනවා වගේම මහින්දලාගේ ජාතිවාදය පෝෂණය කරනවා. මෙයින් සාමාන්‍ය ජනතාව කිසිවෙකුටත් වාසි අත්පත්වන්නේ නෑ. මෙයින් සිංහල දෙමළ මුස්ලිම් ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් ලැබෙනවා වෙනුවට අලුත් ප්‍රශ්න ඇති කරනවා. ඒ නිසා මෙලෙස ජාතිවාදය අවුස්සන, ජාතිවාදය පුබුදු වන දකුණේ හෝ උතුරේ හෝ ඕනෑම දේශපාලකයෙකුට හෝ ආණ්ඩුවකට හෝ එරෙහිව අරගල කිරීමට අප සූදානම්. අපි පෙනී සිටින්නේ ජාතික සමගිය වෙනුවෙන්. ජනතාව බෙදන ජනතාව අසමගි කරන ඕනෑම යෝජනාවකට අපි විරුද්ධයි. ඒ වගේම උතුරේ ධනපති දේශපාලන නායකයින් ගෙන එන ජාතිවාදී යෝජනා පදනම් කරගෙන උතුරේ දෙමළ ජනතාවට එරෙහිව දකුණේ ජනතාව උසිගැන්වීමටත් අපි විරුද්ධයි.

අපි ජනතාවගෙන් ඉල්ලා සිටිනවා ඔබේ ජීවිත හා දේපළ හානි කරමින් මතුවෙන

ඕනෑම ආකාරයක ජාතිවාදයකට ගොදුරු නොවී ඊට එරෙහිව පෙළගැසෙන ලෙස. තිස් අවුරුදු යුද්ධයකට මැදිවූ ජනතාව දැන් කල්පනා කළ යුතුව තිබෙන්නේ ජාතික සමගිය ගොඩගාගෙන මේ රට ඉදිරියට ගෙන යා හැක්කේ කෙසේද කියයි. ලෝකයේම වැඩකරන ජනතාව ජාති ආගම් බේදයකින් තොරව එකට එක්ව සිටිය යුතු මොහොතක ඔවුන් නැවත ජාති ආගම් ලෙස බෙදීමට ඉඩ නොදිය යුතුයි.

මේ රටේ අවුරුදු හැට අටක් තිස්සේ එක්සත් ජාතික පක්ෂයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් වෙන වෙනම පාලනය කරලා රටේ ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් ලබාදීමට තමන් අසමත් බව පෙන්වා තිබෙනවා. දැන් ඒ දෙගොල්ලෝම එකතුවෙලා පාලනය කරලත් තමන් අසමත් බව පෙන්වා තිබෙනවා. ඒ නිසා මේ වැරදි සමාජ ආර්ථික ප්‍රතිපත්ති පැත්තකට දාලා නව ආර්ථික ප්‍රතිපත්තියක් සහිත නව පාලනයක් ඇති කිරීමට ජනතා බලවේග යක් ගොඩනැගිය යුතුව තිබෙනවා. ඒ සඳහා සිංහල දෙමළ මුස්ලිම් ජනතාව එකට එක්කර ගත යුතුව තිබෙනවා. ඒ සඳහා ජනතාව සූදානම්ව සිටින අවස්ථාවක තමයි මේ සමගිය බිඳීමට ජාතිවාදය අවුසමින් සිටින්නේ. ජාතිවාදය කියන්නේ ධනපති පාලකයින්ගේ අසමත්කම පෙන්වන කාරණයක්.

(අප්‍රේල් 28 බ්‍රහස්පතින්දා ජනතා විමුක්ති පෙරමුණු ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය සාකච්ඡාව ඇසුරිණි.)

# තෛපොංගල් සහ මගේ ගම

වළා කෙඳි පාවෙන
නිල්වන් අහස් කුස...
රෑ කල මුදුන් වීගෙන
ගමට ඉහළින් පායන
කලා පිරි රන් සඳ....
පෙන්න - පෙන්නා දිවා රෑ
පිඩුකොට අනාගත්
උණු බත් මිටෙන් මිට කැවූ
මගේ දුප්පත් අම්මා...

ඇකයේ හොවාගෙන
නුවණින් දැනුම් පහදා
මිනිසෙක් වන්ට මග කී
මගේ පෙම්බර අප්පා....

"නිල්වන් සාර කෙත්වල
රන්වන් පැහැව දිදුලන
රන්වන් කරල් ගෙන'වුත්
අපේ ගේ දොර පුරවමු....
මුළු ගමම කැන්දා
නෑයින් හැමට දන්වා
පොංගල් බත් උයා
බෙදාගෙන තුටු වෙමු...."


කාලය ඉකුත් වී
මගේ නෑයින් කෝ අද?
කෝ අද මගේ ගම
මට අහිමි අම්මාගේ ඔඩො-
ක්කුව....

නගුල අල්ලා
පොළොව අස්වද්දා
වියටෙන් - වියට වැපිරූ
සාර කෙත්බිම් කෝ අද?
ශෝකී වැළපුමක් නැඟ එන
මළගමක් වූ හැටි මගේ ගම....
නගුල ඇල්ලූ අත් කෝ?
නෑ සියන් සේ සිටි අය
පරවී වැටුණ මල් මෙන්
අද කොහේ හෝ තැන තැන...
අඳුරු සිව් රියනක
ඇතැමුන් සදා නින්දේ...
මව්බිම අතැ'ර පියඹා
ඇතැමුන් තනිව දුරු රට...
සිහිපත්ව රෑ මැද
ඉකිගසයි හදවත
පෑරී තුවාලව
රිදුම් දෙයි දරුණුව....

ඉපදී පය ගසා
වැටි වැටි ඇවිද ගිය
අම්මාගේ ඇකයයි - මගේ ගම
ඒ මව් තුරුළ කෝ අද?
දෑසින් දකින්නට - දෑතින් විඳින්-
නට
අනවසර මගේ මව්බිම...

කඳුළු වර්ෂාවක්ව වැගිරේ
සිත පිරුණු ළතැවුල

මට අහිමි කළ මගේ ගම
මා හැදූ මව් උණුසුම
ඔබ තුරුළ ලැබෙන තුරු
අලුත් පොංගල් නැහැ මට
අලුත් දිවියක් නැහැ මට....



**ජයසීලන් ඇන්තනී**
**(JDS වෙබ් අඩවියෙනි.)**



ඔබේ පියා කවුද? ඔහු සිටින්නේ කොහෙද? යන ප්‍රශ්නවලට මා පුංචි කාලයේ සිටම මුහුණ දීමට කැමති වුණේ නැහැ. මෙබඳු ප්‍රශ්න මගෙන් අසා නොසිටිනු ඇතැයි මම අපේක්ෂා කරමි. මාගේ පියා 1993 දී නාඳුනන තුවක්කු කරුවන් විසින් නින්දේ සිටියදී ඝාතනය කිරීම පිළිබඳ දුක්බර සිද්ධිය මම මිනිස්සුන්ට කියන්නට නොකැමැත්තෙමි. නමුත් මෙවැනි සිද්ධීන් 2013 දී 'විලාපය'ල 'පහන්' යන චිත්‍රමාලාවන් නිර්මාණය කිරීමට හේතු වුණා.

සියලු දෙනා සමානයි යන පදය දැන් වචනයක් පමණයි.

මෙවැනි වැරදි වැඩ කලේ කවුද? අද ඔවුන් කොහෙද? පීඩාවට පත් වූ මාගේ පවුල ඇතුලු අනිත් පවුල් වලට තිබෙන විසඳුම මොකද්ද යන ප්‍රශ්න මගේ මේ නිර්මාණයේ අන්තර්ගතව තිබේ.

චිත්‍රය : **පාක්කියරාජා පුෂ්පකාන්තන්**



**මහාචාර්ය වේලුපිල්ලෙයි කුහනේන්ද්‍රන්** මහතා සමඟ සංක්‍රාන්තික යුක්තිය පිළිබඳව සිදුකළ සාකච්ඡාවකි.



**මහාචාර්ය එස්.පද්මනාදන්** මහතා ද සාකච්ඡාවට සම්බන්ධ විය.

# සංක්‍රාන්තික යුක්තිය ක්‍රියාවලියට සිවිල් සමාජයෙන් ලැබෙන බලපෑම මදි

**සංක්‍රාන්තික යුක්තිය යන්න ඔබ දකින්නේ කෙසේ ද?**

**මහාචාර්ය වේලුපිල්ලෙයි කුහනේන්ද්‍රන් මහතා :** සංක්‍රාන්ති යුක්තිය යනු නිරන්තරයෙන් වෙනස්වෙන සංකල්පයක්. අප මෑත ලෝක ඉතිහාසයේ ඇතිවූ සිදුවීම් දෙස මදකට බැලූවහොත්, පළවෙනි සහ දෙවනි ලෝක යුද්ධ සිදුවූ කාලයේ පටන්ම ඇමරිකානු එක්සත් ජනපදය තම ආධිපත්‍ය වර්ධනය කරගැනීමට අවශ්‍ය ආර්ථික දියුණුව ළඟාකරගැනීම සඳහා මානව හිමිකම් පැහැර හැරපු ආකාරය දැක ගන්න පුළුවන්. ලෝක යුද්ධ වල, විශේෂයෙන් දෙවන ලෝක යුද්ධයේ අවසානයන් සමග මානව හිමිකම් යන සංකල්ප සහ පශ්චාත් යුද අවස්ථාවලදී මානව හිමිකම් වල ඇති විශේෂ වැදගත්කම ගැන ඇති දැනුවත්කම හෙමින් ප්‍රකටවන අයුරු දැක ගත හැකියි. මෙයට සමාන්තරව, අන්තර් ජාතික නීතියෙහි විකාශනය ද දකින්න පුළුවන්.

මානව හිමිකම් පිළිබඳව ඇති අවධානයේ ඇතිවූ වර්ධනයක් සමග අන්තර් ජාතික නීතියෙත් විවිධ වෙනස්කම් ඇති වුණා. මම දකින විදියට, සංක්‍රාන්තික යුක්තිය යන්න හැමවිටම අගතියට පත් වූ පුද්ගලයන්ගේ දෘෂ්ඨිකෝණයෙන් බැලිය යුතුයි. ලෝකයේ විවිධ රටවල්වල රජයන් තමන්ගේ බලය අවභාවිතා කරන අයුරු අපට දකින්න පුළුවන්. මේ හැම අවස්ථාවකම ඒවායේ විපාක විඳින්නේ සාමාන්‍ය පුරවැසියන් උදාහරණයක් වශයෙන් දකුණු අප්‍රිකාවේ අපාතයිඩ්

වර්ණවාදය පැවති යුගයේ සහ පිනොචේ චිලී දේශය පාලනය කළ යුගය දක්වන්න පුළුවන්.

ශ්‍රී ලංකාවේ පාලන තන්ත්‍රයේ ඇතිවූ වෙනස් වීමත් සමග සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලිය සඳහා රජයට බලපෑම් කිරීමට තිබූ උද්‍යෝගයේ අඩුවක් මම දකිනවා. සංක්‍රාන්ති යුක්තිය පිළිබඳව සමාජ කතිකාවතක් නැවත ඇති කිරීමට සටන් කරන සමාජ ව්‍යාපාර අද දකින්න ලැබෙන්නේ නැහැ. යම්තාක් දුරකට හරි මෙම සංවාදය ඇතිවෙන්න විදවතුන් අතර පමණයි.

අපි කාටත් සංවෘතිය (*closure*) කියන දේ අවශ්‍යයි. යුද්ධයේ දෙපාර්ශ්වය අතින්ම අපරාධ සිදුවී ඇති බව රහසක් නොවේ. අවුරුදු ගනනාවක් ඔස්සේ පැවති. ශ්‍රී ලාංකික රජයන් විසින් විවිධ අපරාධ සිදු කරලා තියනවා. 1950 ගණන් වල සිට ලංකාවේ ජීවත් වන දෙමළ වැසියන්, ගොඩක් දුරට ජීවත් වුණේ හදිසි නීතිය යටතේ.

**මහාචාර්ය එස්. පද්මනාදන් :** සංහිඳියාව වෙනුවෙන් තව බොහොදේ කරන්න තිබෙනවා රාජාණ්ඩු කාලයේ පටන් හින්දු ආගම සහ බුද්ධ ධර්මය අතර ඉතා කිට්ටු සම්බන්ධයක් තිබිලා තියනවා. එහෙත් අපගේ අධ්‍යාපන පද්ධතිය විසින් සිදුවන්නේ අප අතර තිබෙන සමානකම් වෙනුවට, අප අතර තිබෙන වෙනස්කම් උලුප්පා දැක්වීම සිංහල/දෙමළ ජනයා. සමගියෙන් ජීවත් වුන ආකාරය කියා දෙන්නෙ නැහැ. ඒ නිසා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, සංහිඳියා ක්‍රියාවලියේ වැදගත් කොටසක් විය යුතුයි.

**ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති යුක්තිය ඇති කිරීමේ ක්‍රියාවලිය සඳහා වෙනත් රටවලින් අපට ගත හැකි පාඩම් මොනවා ද?**

ශ්‍රී ලංකාව දිහා බැලුවොත්, සිංහල ජනයා මේ රටේ බහුතරය කියන එක කිසි කෙනෙක් අභියෝග යට ලක්කරන්නේ නැහැ. හැබැයි ප්‍රජාතන්ත්‍රවාදී පාලනය තුළින් රටේ ජීවත්වන වෙනත් ජන කණ්ඩායම් වල අයිතිවාසිකම් ද ආරක්ෂා විය යුතුයි. නියම ප්‍රජාතන්ත්‍රවාදය තුළ යුක්තිය හා සාධාරණත්වය සියලුම පුරවැසියන්ට ලැබිය යුතුයි.

**මහාචාර්ය වේලුපිල්ලෙයි කුහනේන්ද්‍රන් මහතා :** සංක්‍රාන්තික යුක්තිය වැනි සංකල්පයක්, බොහෝ විට එය සිදුවන සමාජ සංස්කෘතිය සන්දර්භය අනුව වෙනස් වෙනවා. බටහිර අත්දැකීම් සලකා බැලුවහොත් මට දැනෙන විදයට බටහිර රටවල් මෙවැනි විෂයන් ගැන අපි වගේ චින්තවේගාත්මකව බලන්නේ නැතුව, තාර්කිකව බලන්න පුරුදු වෙලා තිබෙනවා. මම හිතන්නේ මෙසේ සිදුවිය හැකි වෙලා තිබෙන්නේ, බටහිර රටවල, සමගිය කියන්නේ මනෝ විහිතියක් එය නියම වෙන්නේ ප්‍රජාත්ත්‍රවාදය සහ මහ ජනයාගේ කැමැත්ත කියන මූලධර්මය මත. ශ්‍රී ලංකාව දිහා බැලුවොත්, සිංහල ජනයා මේ රටේ බහුතරය කියන එක කිසි කෙනෙක් අභියෝගයට ලක්කරන්නේ නැහැ. හැබැයි ප්‍රජාතන්ත්‍රවාදී පාලනය තුළින් රටේ ජීවත්වන වෙනත් ජන කණ්ඩායම් වල අයිතිවාසිකම් ද ආරක්ෂා විය යුතුයි. නියම ප්‍රජාතන්ත්‍රවාදය තුළ යුක්තිය හා සාධාරණත්වය සියලුම පුරවැසියන්ට ලැබිය යුතුයි.

**සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලිය සඳහා ඇති බාධා හා අවස්ථා ලෙස ඔබ දකින්නේ මොනවාද ?**

**මහාචාර්ය වේලුපිල්ලෙයි කුහනේන්ද්‍රන් මහතා :** ගැටුම් තත්වයේ අවසානය සහ පැවති රෙජීමයේ වෙනස් වීමත් සමග යුද්ධයෙන් අවතැන්වූවන් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමුකළ යුතුයි. මෙය ජාත්‍යන්තර නීතියේ ඇති ප්‍රමිතීන්ට අනුකූලව සිදුවිය යුතුයි. අතුරුදහන්වූවන්ගේ ගැටලුවත් විශේෂ අවධානය යොමු කළ යුතු දෙයක්, මන්ද යත් එය යුද්ධයෙන් පීඩාවට පත් පවුල් රාශියක් මුහුණ දෙන ගැටලුවක් නිසා. මේ ක්‍රියාවලියේ දී අප නිතරම මතකයේ තබාගත යුතු දෙයක් වන්නේ, අපි ගනුදෙනු කරන්නේ මානුෂීක ගැටලු සමග යන්න සංක්‍රාන්තික යුක්ති සම්බන්ධ බොහෝ, නැත්නම් සියලුම ක්‍රියාවලි සංවෘතිය හා සම්බන්ධයි. අතුරුදහන් වූවන්ගේ පවුල් නිතරම ඔවුන්ගේ ගැටලු ඉදිරිපත් කරන්නේ ඔවුන්ට සංවෘතිය අවශ්‍ය නිසා.

ගැටුමක් අවසාන වූ පසු, එවිට පවතින රජය සිදුවූ දෙය පිළිබඳව පසුවිපරමක යෙදී, සිදුවූ වැරදි සහ, එය ජනතාවට බල පෑ ආකාරය පිළිබඳව අධ්‍යයනයක යෙදිය යුතුයි. මේ සඳහා අවශ්‍ය බලය සහිත සත්‍යය හා සංහිඳියා කොමිසමක් පත් කළයුතුයි. එහෙත්, දැනට සංක්‍රාන්තික යුක්තිය පිළිබඳව ගෙන ඇති ක්‍රියාමාර්ග සම්බන්ධයෙන්, සිවිල් සමාජයෙන් සිදුවී ඇති බලපෑම් සීමිතයි.

බාධා ගැන කතාකරනවා නම්, සංක්‍රාන්ති යුක්ති සංකල්පයට විරුද්ධව ඇති කථිකාවත හා රාජ්‍ය ආයතන තුළ ඇති නිලබලවාදය ඉන් කිහිපයක්. උදාහරණයක් වශයෙන්, පසුගිය පාලන සමයේදී, නීතිපති දෙපාර්තමේන්තුව සංක්‍රාන්ති යුක්තිය සඳහා ගත් බොහෝ ක්‍රියා මාර්ග අවහිර කිරීම දක්වන්න පුළුවන්. කොමිසම් කිහිපයක්ම පත් කෙරුනද, ඒවායෙන් කිසිම වාර්තාවක් හෝ නිර්දේශ කිසිවක් ඉදිරිපත් කර නැහැ. තවද, අපි කිසි විටක, පලි ගැනීම මත පදනම් වූ වගවීම් ක්‍රියාවලියකට යොමු විය යුතු නැහැ.

නැවත ගැටුම් තත්වයක් ඇති නොවීමට වගබලා ගැනීම, සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලියේ විශේෂ පියවරක්. අපි මේ සඳහා අවශ්‍ය ආයතන ගොඩනැගිය යුතුයි. අධ්‍යාපනික ප්‍රතිසංස්කරණ ඇති කළ යුතුයි. තවද සමාජය තුළ සදාචාරය සම්බන්ධ සාරධර්ම ප්‍රචලිත කළ යුතුයි මෙය තුළින්, අපගේ සමාජය තුළ ගැටුම් නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගත යුතුයි. පරමාදර්ශී ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක, රාජ්‍ය ආගමට වඩා පහලින් පැවතිය යුතුය. තවද, රජය බිය සමාජගත කරමින් ගෙනයන පාලන ක්‍රමය නැවැත්විය යුතුයි.

**දකුණේ ජීවත් වන ජනයා සමග සංක්‍රාන්ත යුක්තිය සම්බන්ධයෙන් සංවාදයක් ආරම්භ කළ හැක්කේ කෙසේ ද?**

**මහාචාර්ය වේලුපිල්ලෙයි කුහනේන්ද්‍රන් මහතා :** මට දැනුණ ආකාරයට, සිරිසේන ජනාධිපති තුමාගේ පළවෙනි කතාවේ ඔහු යුද්ධයෙන් උතුරෙත් දකුණෙත් ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ගේ ජීවිත අහිමි වූ බව පැවසූ ආකාරයෙහි සංකේතාත්මක වටිනාකමක් තිබුණා. එය මෙම සංවාදයට මුල පිරීමට හොඳ ආකාරයක්. තවද, ජාතික නිදහස් දින සැමරුමේදී, ජාතික ගීය දෙමළ බසින් ගැයීමත් මෙම සංවාදයට ගොඩක් දේ එක් කළා. සංවාදය ආරම්භ විය යුත්තේ මෙතනින්. සිංහල සමාජයත් දෙමළ සමාජයත් යුද්ධයට බොහෝ කැප කළා. එවැනි දෙයක් නැවත සිදුනොවීමට අප මග බලාගත යුතුයි. දකුණේ සමහර පවුල් 1970 ගණන්වල සිදුවූ කැරලි වලදී අතුරුදහන්වූවන්ව තවම සොයනවා. මෙය මේ සාකච්ඡාවට ඇරඹුමක් හොඳ ඇරඹුමක්. මෙම සංවාදය, විවිධ ස්ථර අතර සිදුවිය යුතුයි. උදාහරණයක් වශයෙන් ශිෂ්‍යයන් අතර හා වෘත්තීය සමිති අතර මේ ගැන සමාජයේ ඇති දැනුවත් කම වැඩි කරන්න අවශ්‍යයයි. මෙය විශේෂයෙන් අපක්ෂපාතී හා දේශපාලනයක් තොරව සිදුවිය යුතු ක්‍රියාවලියක්.

**දෙමළ ජනතාවගේ ආරක්ෂාව හා මානව හිමිකම් ආරක්ෂා කිරීමටත්, ගැටුමක් නැවත ඇති නොවීමටත් ව්‍යවස්ථාව තුළින් හා අධිකරණ ක්‍රියාවලියක් තුළින් වගබලාගත හැක්කේ කෙසේද ?**

**මහාචාර්ය වේලුපිල්ලෙයි කුහනේන්ද්‍රන් මහතා :** මේ සඳහා නීතියේ ආධිපත්‍ය ආරක්ෂා කිරීම ඉතාම වැදගත් - විශේෂයෙන්ම මානව හිමිකම් ප්‍රකාශනයක් තිබීම ඉතාම වැදගත් නව ව්‍යවස්ථාවක් තුළින්, සියලුම ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන මානව හිමිකම් ප්‍රකාශනයක් පැනවීම ඉතාම වැදගත්.

මේ සඳහා මාධ්‍යයටත් ලොකු කාර්යභාරයක් තිබෙනවා. විශේෂයෙන් අපක්ෂපාති ලෙස තොරතුරු බෙදාහැරීමට වගකීමක් තියෙනවා. එම නිසා දේශපාලන හා රජයේ ඇඟිලි ගැසීම් වලින් තොර මාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීම ඉතාම වැදගත්.

**මහාචාර්ය එස්. පද්මනාදන් :** අධ්‍යාපන පද්ධතිය ගැන සලකා බලන විට, විශ්ව විද්‍යාල පද්ධතිය නිර්දේශපාලනකරනය කළ යුතුයි. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම නාමයෝජනා ඉදිරිපත් කිරීම දේශපාලන ඇඟිලි ගැසීමකින් තොරව සිදුවිය යුතුය. අවාසනාවන්ත ලෙස දෙමළ ජාතික පුද්ගලයින් ජීවත්වන ප්‍රදේශවල මෙය සිදුවන්නේ නැහැ.

**මහාචාර්ය වේලුපිල්ලෙයි කුහනේන්ද්‍රන් මහතා :** ගෝලීය දෙමළ සංසදය විසින් මහජන නියෝජිත කමිටුවට නව ව්‍යවස්ථාවක් සඳහා නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කළා එම නිර්දේශ මෙම සිද්ධාන්ත මත පදනම් විය :

- මානව හිමිකම් ප්‍රකාශනයක් හා නීතියේ ආධිපත්‍ය.
- නිදහස් අධිකරණයක්, රාජය ආයතන අතර බලතල නිසි ලෙස බෙදී යෑම සහා ව්‍යවස්ථා අධිකරණයක් ඇති කිරීම.
- බලය බෙදීම සහ ස්වයං පාලනය අතර සංතුලිතතාව
- සියලු ම ජන කොටස්වලට සමන ප්‍රතිලාභ හා අවස්ථා ලබාදීම
- නොබෙදුනු ශ්‍රී ලංකාවක් තුළ බලය බෙදීම (පොලිස් බලතල ඇතුළු)
- ද්විමාණ්ඩලික ව්‍යවස්ථාදායකයක්
- විනිවිදභාවයෙන් යුතු පාලන තන්ත්‍රයක්
- නිර්ආගමික ව්‍යවස්ථාවක්

නව ව්‍යවස්ථාවක් මගින් මෙම මූලධර්ම නගාසිටුවුවහොත්, ශ්‍රී ලංකාවේ දෙමළ වැසියන්ට තමන්ගේ ආරක්ෂාව හා මානව හිමිකම් පිළිබඳව විශ්වාසයක් ඇතිවේ යැයි මම විශ්වාස කරනවා.

සම්මුඛ සාකච්ඡාව :
**රුවෙන්දි වක්වැල්ල**

සිංහල පරිවර්තනය :
**සෙනෙල් වන්නිආරච්චි**



www.colombotelegraph.com

# මහජන සහභාගිත්වය ප්‍රමාණවත් නෑ

නැගෙනහිර පළාත් ආණ්ඩුකාර හා ජනාධිපති උපදේශක **ඔස්ටින් ප්‍රනාන්දු**

**ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය සඳහා සංක්‍රාන්ති යුක්තිය වැදගත් වන්නේ මන් ද?**

ශ්‍රී ලංකාවේ පැවති දිගු කාලීන ලේවැකි ගැටුමකින් පසු විවිධ ජනයා -රාජ්‍ය සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් සම්බන්ධ විවිධ මට්ටම්වල දී කරන ලද මානුෂවාදී හා මානව හිමිකම් නීති උල්ලංඝනය කිරීම පිළිබඳ පැමිණිලි දකින්නට ලැබීම ස්වාභාවික යි. එබඳු උල්ලංඝනයන් සම්බන්ධව ප්‍රායෝගික වශයෙන් ආමන්ත්‍රණය කළ යුතු යි. ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති යුක්තිය විශේෂයෙන්ම යුක්තිය ඉටුවනු දැකීම හා වරද කරන ලද්දවුන් නීතියේ රැහැනට අසුකර ගැනීම සහතික කිරීම සඳහා අපරාධ ක්‍රියා සහ ඒවායේ ප්‍රතිවිපාකවලට ආමන්ත්‍රණය කිරීම අවශ්‍ය යි. එපරිද්දෙන්ම විශේෂයෙන් අතුරුදහන් වීම්, පැහැරගෙන යාම් ආදියට සම්බන්ධ අතීත සිදුවීම් පිළිබඳ තත්ත්වයක් තුළ සත්‍ය සෙවීම සඳහා ද ඉල්ලීමක් තිබෙනවා. වින්දිතයින් ජීවතුන් අතර සිටිය ද නැත ද ඔවුන්ට සිදු වූයේ කුමක් ද යන්න පිළිබඳව දැන ගැනීම

විපතට පත් පාර්ශ්වවල නෑදෑ මිත්‍රාදීන්ට අවශ්‍ය යි. ප්‍රතිසන්ධානයේ යහපත උදෙසා මේවා වැදගත් සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවන් වෙනවා. එවැනි ක්‍රියා අනුගමනය කරන විට පීඩාවට පත් ජනයාට හානි පූර්ණ ලබා දීමේ අවශ්‍යතාව නිර්මාණය කරනු ඇති අතර ඒවාට ප්‍රසිද්ධ සමාව ගැනීම් හෝ අනුස්මරණ දින නම් කිරීම ආදී අභිනයන් පවා අඩංගුවන්න පුළුවන්. බරපතල ලෙස සලකා බැලීමේ දී නැවත සිදු නොවීමේ තත්ත්වයන් ඇති කිරීම හා ආයතනික ප්‍රතිසංස්කරණත් ප්‍රතිසන්ධානය සඳහා වැදගත්. සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලීන් ඔස්සේ අපයෝජනයන්ට එරෙහිව ක්‍රියා කිරීමත් බරපතල මානව හිමිකම් උල්ලංඝනයන් නැවත ඇතිවීම හා දණ්ඩන මුක්තිය වැළැක්වීමත් සහතික කෙරෙන්න පුළුවන්. කෙසේ වුවත් මෙහි දී සංවෘත ක්‍රියා ලැයිස්තුවක් නැහැ. නිදසුන් විදියට ඇතැම් රටවල් අනුස්මරණය කිරීම වැනි පියවර එක්කර තිබෙනවා. අධිකාරීන් විසින් තිබෙන විවිධ අතුරු විපාක සැලකිල්ලට ගනු ලැබිය යුතුව තිබෙන නිසාත් විශේෂයෙන්ම සෑම අත්දැකීමකම දේශපාලන වාතාවරණයන් වෙනස් සහ වෙනස් අන්දමින් ප්‍රවේශ විය යුතු නිසාත් මෙම යාන්ත්‍රණයන් පිහිටුවීම හෝ මෙහෙයුම්කරණය රඳා පවතින්නේ එක් එක් රටේ තත්ත්වය මත යි. සියලුම සන්දර්භයන්ට ගැලපෙන එක සූත්‍රයක් නැහැ.

**මානව හිමිකම් කවුන්සිලය හමුවේ ආණ්ඩුව විසින් පිළිගන්නා ලද එකඟතා යෝජනාවෙහි ප්‍රධාන අංග මොනවා ද?**

ශ්‍රී ලංකා ආණ්ඩුව ප්‍රධාන වශයෙන් පොරොන්දු පහක් දුන්නා. එනම් සත්‍ය සෙවීමේ හා ප්‍රතිසන්ධාන කොමිසමක් පිහිටුවීම, අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයක් පිහිටුවීම, දේශීය වගවීමේ යාන්ත්‍රණයක් පිහිටුවීම, හානි පූර්ණ කාර්යාලයක් පිහිටුවීම හා නැවත ඇති නොවීම උදෙසාවන පියවර ගැනීම යන ඒවා යි. සඳහන් කරන ලද වැදගත් මෙහෙයුම් පියවරක් වූයේ මෙම යාන්ත්‍රණයන් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය තුළ වින්දිතයින් ඇතුළු පංගු පාර්ශවකරුවන් සමග අදහස් විමසීම් කර ගෙන යාම යි.

**සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසමක්, අතුරුදහන් වූවන් සම්බන්ධ කාර්යාලයක් හා විශේෂ අධිකරණයක් පිහිටුවීම ඇතුළු යාන්ත්‍රණ හා ක්‍රියාවලීන් ගණනාවක් ආණ්ඩුව පොරොන්දු වී තිබෙනවා. ආණ්ඩුව මෙම පොරොන්දු ඉටු කිරීමට සමත් වේ ද? අනෙක්වාට ඉහළින් සමහර ඒවා ප්‍රමුඛත්වය ලබයි ද?**

පොරොන්දු වූ මෙම සියලු පියවර වැදගත්. කෙසේ වුවත් ප්‍රමුඛතාව පිළිබඳව අවසන් තීරණයක් ගැනීමට පෙර සලකා බැලිය යුතුව තිබෙන විවිධ ප්‍රශ්න තිබෙනවා. මට ආණ්ඩුව වෙනුවෙන් කතා කරන්න බැහැ. එහෙත් මගේ ප්‍රමුඛතාව කුමක්දැයි දැන ගැනීමට ඔබ අපේක්ෂා කරන්නේ නම් මට කියන්න පුළුවන් ඒ අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාලයක් හා සත්‍ය කොමිසමක් හෝ සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසමක් යන දෙකින් ඔබට කිව හැකි ඕනෑ එකක් ප්‍රමුඛතාවට එනවා කියලා.

**ආණ්ඩුව ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ හා සංක්‍රාන්ති යුක්තිය යන දෙකම පොරොන්දු වී තිබෙනවා. ඉතාමත්ම මෑත දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් හා ප්‍රතිසන්ධාන මහ ලේකම් කාර්යාලයක් පිහිටුවන්නට පාර්ලිමේන්තුවේ එකඟතා යෝජනාවක් සම්මතවීම අපි දැක්කා. මෙම ක්‍රියාවලීන් දෙක අතර සම්බන්ධතාවන් ඇතිවේ ද? නැත්නම් ඒවා වෙන් වෙන්ව ගමන් කරයි ද? මෙම ක්‍රියාවලීන් දෙකට නායකත්වය දෙන වෙනස් වෙනස් නළුවන් සිටී ද?**

ආණ්ඩුක්‍රම සම්පාදන ක්‍රියාවලියට මම

ප්‍රතිසන්ධානයේ යහපත උදෙසා සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවන් අවශ්‍ය වෙනවා. එවැනි ක්‍රියා අනුගමනය කරන විට පීඩාවට පත් ජනයාට හානි පූර්ණ ලබා දීමේ අවශ්‍යතාව නිර්මාණය කරනු ඇති අතර ඒවාට ප්‍රසිද්ධ සමාව ගැනීම් හෝ අනුස්මරණ දින නම් කිරීම ආදී අභිනයන් පවා අඩංගුවන්න පුළුවන්. බරපතල ලෙස සලකා බැලීමේ දී නැවත සිදු නොවීමේ තත්ත්වයන් ඇති කිරීම හා ආයතනික ප්‍රතිසංස්කරණත් ප්‍රතිසන්ධානය සඳහා වැදගත්.



tamildiplomat.com

ආණ්ඩුකාරවරයා සංවර්ධන කටයුත්තක් නිරීක්ෂණය කරමින්

සම්බන්ධ වී නොමැති නිසා මට පරිසිද්ධිමය වර්ධනයන්වලට යන්න බැහැ. නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කිරීම යන්නට ප්‍රතිසන්ධාන හා සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලීන්ගෙන් දායකත්වය ලැබිය යුතු බව මම කියන්න ඕන. එය විශේෂයෙන් හා අනිවාර්යයෙන් අවශ්‍ය වන්නේ ඒවා නැවත ඇති නොවීමේ විසඳුම් මූලික අයිතිවාසිකම්වලට, මානව හිමිකම්වලට, මානුෂවාදී නීති මෙහෙයුම්වලට, ජාතියක් ලෙස එකඟවී තිබෙන හා අනාගතයේ දී එකඟ වීමට සිදුවනු ඇති විවිධ ජාත්‍යන්තර සම්මුතීන්ට හා ගිවිසුම්වලට කැපවීමට සම්බන්ධ නිස යි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කිරීම අධිකරණ පද්ධතීන්, අධිකරණය, පරිපාලනය, විශේෂයෙන් බලය බෙදා හදා ගැනීම, රාජ්‍ය ව්‍යුහය ආදියට අදාළ වෙනවා. මේවා ප්‍රතිසන්ධානයට හා ජාතික ප්‍රශ්නයට ආමන්ත්‍රණය කිරීමට අදාළ යි. මේවා ගැලපෙන ලෙස යොදා ගත හැක්කේ කෙසේ ද යන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයට හා එහි සහභාගිකයන්ට අයත් කරුණක්. තවදුරටත් කියනවා නම් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේ නිසි ක්‍රියාවලිය ඔස්සේ යා යුතුව තිබෙනවා. මෙම අවස්ථාවේ ක්‍රියාවලීන් දෙකෙහි නළුවන් වෙනස් කියලා මම විශ්වාස කරනවා. නමුත් අවසානයේ එය තීරණය කිරීම පාර්ලිමේන්තුවට අයත් කරුණක් (කලින් සඳහන් කරන ලද සංක්‍රාන්ති යුක්ති මෙවලම් පාර්ලිමේන්තු ව්‍යවස්ථාවක් මගින් නිර්මාණය කළ යුතුව තිබෙන බව සඳහන් කළ යුතු යි)

**පොදුවේ ගත් කල නැගෙනහිර ජනතාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ හා සංක්‍රාන්ති යුක්තිය සම්බන්ධයෙන් ආණ්ඩුවේ පොරොන්දුවලට ප්‍රතිචාර දැක් වූයේ කෙලෙස ද? ඊට සහායක් තිබෙනවා ද?**

මම කලින් කී පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදන ක්‍රියාවලියට මගේ කොහෙත්ම සම්බන්ධයක් නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කිරීම සම්බන්ධයෙන් සිදුවන්නේ කුමක් ද යන්න පිළිබඳව මට තිබෙන්නේ සාමාන්‍ය අවබෝධයක්. නැගෙනහිර දී මම ඒවා එකතුකර ගත්තේ ප්‍රාදේශීය දේශපාලනඥයින් සමග විටින් විට මා කළ සාකච්ඡා මගින්. ඔබ දන්නා පරිදි දේශපාලනඥයින් අයත් වන්නේ පක්ෂවලට. ඔවුන් මෙහෙයවනු ලබන්නේ විවිධ දේශපාලන කැපවීම් මගින්. පොදුවේ ඔවුන් මෙහෙයවනු ලබන්නේ පක්ෂ නායකත්වයන් හා පක්ෂ ප්‍රතිපත්ති මගින්. ඇත්ත වශයෙන්ම මගේ සම්බන්ධතා තිබෙන්නේ ජනතාව සමග, විපතට පත් අවතැන්වූවන් සහ අතුරුදහන් වීම් පිළිබඳ මා වෙත එන සමිති සමාගම් සමග. එවැනි පාර්ශව ආණ්ඩුව විසින් සංක්‍රාන්ති යුක්තිය හසුරුවනු ලබන ආකාරය පිළිබඳව සතුටට පත්ව සිටිනවා යයි මට හැඟෙ නවා. සත්තකින්ම කිසිවෙකු සම්පූර්ණයෙන් සතුටු කරන්නවත් කිසිවක් සම්පූර්ණයෙන් මුදුන්පත් කරන්නවත් බැහැ. මගේ ප්‍රකාශය පදනම් වන්නේ මෙම ප්‍රශ්නයම පිළිබඳව පසුගිය ආණ්ඩුවේ කාර්ය සාධනය පිළිබඳ සංසන්දනාත්මක ඇගයුමක් මත යි කියන කාරණය අමතක කරන්න එපා.

**සිය පළාත්වල ප්‍රතිසන්ධාන යාන්ත්‍රණයන්ගේ වැඩ ප්‍රවර්ධනය කිරීමේ දී හා ඒවාට ආධාර කිරීමේ දී පළාත් ආණ්ඩුකාරවරුන් රඟ පෑ යුතු භූමිකාව කුමක් ද?**

පළාත් ආණ්ඩුකාරවරයෙකු එක් අතකින් ප්‍රතිසන්ධාන පණිවිඩය ගෙන යාමේ දී

සහයෝගී විය යුතු යයි හා හැකි තරම් දුරට නායකත්වය ගත යුතු යයි ද අනෙක් අතින් ඔහුගේ/ඇයගේ පළාතෙහි රාජ්‍ය නායකයාගේ ප්‍රතිසන්ධාන කාර්ය සාධනය සමග හවුල්ව කටයුතු කළ යුතු යයි ද කියා මා සිතනවා. අපේක්ෂා කළ පරිදි ප්‍රතිසන්ධාන යාන්ත්‍රණයන් දැනටමත් සමාජයීය උවමනාවක් නිර්මාණයකර තිබෙනවා. මේ නිසා මහජනයා සමග අන්තර් ක්‍රියාකාරිත්වය සැලකිය යුතු තරම් වැදගත් වෙනවා. එහෙයින් ආණ්ඩුකාරවරයාට ද්වි මාර්ග ගමන් පථයක් තිබිය යුතු වෙනවා. ඊට අමතරව මා කලින් සඳහන් කළ ප්‍රතිසන්ධාන කුළුණු හතර මුදුන්පත්කර ගැනීමෙහිලා රඟ පෑ යුතු විස්තීරණ භූමිකාවක් ඔහුට තිබෙනවා. ඔබ අප සාම්පූර් නැවත පදිංචි කිරීම හැසිර වූ ආකාරය දෙස බලන්නේ නම් ආණ්ඩුකාරවරයාමත් කැප වන්නේ නම් මෙම සියලු අංග මුදුන්පත් කළ හැකිය යන්න සනාථ කරන බව දැකිය හැකියි.

**මේ දක්වා ප්‍රතිසන්ධාන වැඩ විශාල වශයෙන් ක්‍රියාවට නගනු ලැබ ඇත්තේ මධ්‍යම ආණ්ඩුව යි. ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය තුළ ප්‍රාදේශීය ක්‍රියාකාරකයන්ට හා නිලධාරීන්ට භූමිකාවක් තිබෙනවා ද? ඔවුන්ට රඟ පෑ හැකි භූමිකාව කුමක් ද?**

නැගෙනහිර දී ක්‍රියාත්මක කරනු ලැබූ විට කේන්ද්‍රය විසින් මෙහෙයවන ලද ප්‍රතිසන්ධානය පිළිබඳ ඔබේ ප්‍රකාශනය සමග මා එකඟ වන්නේ නැහැ. කේන්ද්‍රය - පරිධිය සම්බන්ධතාවය වැළැක්විය නොහැකි සංයෝජනයක්. සත්තකින්ම බොහොමයක් ප්‍රතිසන්ධාන කටයුතු කළමනාකරණය කරන කේන්ද්‍රයේ ආණ්ඩු යාන්ත්‍රණය - දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල යනු එම යාන්ත්‍රණයම යි. නමුත් නැගෙනහිර යටත් පිරිසෙයින් කේන්ද්‍ර හා පළාත් ධූරාවලීන් අතර හමුදාව සමග පවා සමීප සබඳතාව අපි දකිනවා. ආණ්ඩුකාරවරයා ක්‍රියාත්මක කරන්නෙකු වීම අවශ්‍ය නැහැ. නමුත් ප්‍රතිසන්ධානයේ නායකයෙකු, සහායකරුවෙකු හා සම්බන්ධීකාරවරයෙකු විය හැකියි. මම මේවා පිළිබඳව සංසන්දනයන් කරන්න අපේක්ෂා කරන්නේ නැහැ. නමුත් ඔබ කැමති නම් සංසන්දනයන් කරන්න ඔබට ඉඩ දෙන්න සතුටු යි.

**ජාත්‍යන්තර හා දේශීය සහභාගිකයින්ගේ මිශ්‍රණයකින් සංයුක්ත වන වගවීමේ යාන්ත්‍රණයන් පිළිබඳ ඔබ සිතන්නේ මොනවා ද? ඔබ සිතනවා ද මෙය ශ්‍රී ලංකාවට අවශ්‍ය යයි කියලා?**

මා නීතිඥයෙකු නොවන නිසා මිශ්‍ර සහභාගිත්ව අධිකරණ හොඳ ද නරක ද කියන එක ගැන විවරණයක් දෙන්න මට බැහැ. කෙසේ වුවත් පසුගිය වසරේ සැප්තැම්බර්වල ජිනීවා යෝජනාවෙන් පසු දේශීය වගවීමේ යාන්ත්‍රණය තුළ නම් කරන ලද ඇතැම් පාර්ශ්වවල සහභාගිත්වය තිබිය යුතු බවට බැඳීමක් තිබෙනවා. සමහර විට මෙම බැඳීම ''අවශ්‍යතාව'' අනිවාර්ය කරන්න පුළුවන්. මෙම සහභාගිත්වය ක්‍රියාවට නැංවිය යුත්තේ කෙසේ ද යන්නට විකල්ප කිහිපයක් තිබන්න පුළුවන්. වෘත්තීය කණ්ඩායමක් මෙම පශ්නය පිළිබඳව කටයුතු කරමින් ඉන්නා බව මම දන්නවා. මට දැකිය හැකි තාක් දුරට සහභාගිත්ව මිශ්‍රණයක් විශේෂ අධිකරණයක් සකස් කිරීම තුළ කරන්න පුළුවන්. නමුත් ඒ අධිකරණමය භාවිතය පිළිබඳ කලින් දෙන ලද අධිකරණ තීන්දු මගින් උපදෙස් දෙනු ලබන පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, අධිකරණ පනත් ආදිය ඇතුළත යි. දෙවනුව එය වෙනස් සැකසුම් මගින් විය හැකි යි. නිදසුන් ලෙස අයෙකු විශේෂ අධිකරණයක් ගැන සිතන විට අධිකරණයක්, විනිශ්චයකරුවන්, විමර්ශකයන්, අභිචෝදකයන් ආදී වශයෙන් ව්‍යාප්තවන අංග එයට තිබෙන්න පුළුවන්. ආධුනිකයෙකු විදියට මට දැකිය හැකි ක්ෂේත්‍ර ඒවා විය හැකි යි. නීති විශාරදයින් මේ ප්‍රශ්නය දෙස බලන විට තවත් බොහෝ ක්‍රියා ක්ෂේත්‍ර තිබිය හැකි යි. අපේ තත්ත්වයට යෝග්‍ය සැකසුම් සම්පාදනය කිරීමට අපි විශේෂඥයින්ට ඉඩ දෙමු.

පළාත් ආණ්ඩුකාරවරයෙකු එක් අතකින් ප්‍රතිසන්ධාන පණිවිඩය ගෙන යාමේ දී සහයෝගී විය යුතු යයි හා හැකි තරම් දුරට නායකත්වය ගත යුතු යයි ද අනෙක් අතින් ඔහුගේ/ඇයගේ පළාතෙහි රාජ්‍ය නායකයාගේ ප්‍රතිසන්ධාන කාර්ය සාධනය සමග හවුල්ව කටයුතු කළ යුතු යයි ද කියා මා සිතනවා.

ප්‍රතිසන්ධානයට දායකත්වයක් දෙන්නට අපේක්ෂා කරන්නේ නම් එය පෞද්ගලික මාධ්‍ය ආයතන හිමිකරුවන්ගේ ද තවත් ගැටුමක් සිදු නොවිය යුතු යයි දැකීමට උනන්දුවන පුද්ගලයින් ලෙස හා අපේ දරු මුනුපුරු මිනිපිරියන්ට වඩා හොඳ ලෝකයක් හා රටක් වෙනුවෙන් දායකත්වය සපයන්නන් ලෙස විද්‍යාර්ථීන්, ලේඛකයන්, මාධ්‍යවේදීන්, කතුවරුන් ආදීන්ගේ ද වගකීමක් වෙනවා. එහෙත් මාධ්‍ය අංශය තුළ අපට එවැනි උදාර පරමාදර්ශ හා පරමාදර්ශීන් සිටිනවා ද? මට නම් සැකයි.

**ආණ්ඩුව විසින් දෙනු ලැබ ඇති පොරොන්දුවක් වන්නේ හානිපූර්ණ සඳහා කාර්යාලයක් පිහිටුවීමයි. මෙය සංක්‍රාන්ති යුක්ති රාමුව තුළ ප්‍රධාන කුළුණක් ලෙස සැලකෙනවා. මෙම කාර්යාලය මෙම වසර තුළ පිහිටුවයි ද? එය අවධානය යොමු කරන ක්ෂේත්‍ර කුමන ඒවා වෙයි ද?**

මම හිතනවා හානි පූර්ණ කටයුතුවල නියැලෙන හානි පූර්ණ පද්ධති, ආයතන, කාර්ය පිරිස් තිබෙනවාය කියලා. මේවා 1983 කරදරවලින් පසු නිර්මාණය කෙරුණ හා 2004 සුනාමියෙන් පසුත් සකස් කරන ලද ඒවා යි. කෙසේ වුවත් එවැනි පවතින හානි පූර්ණ ප්‍රශ්න, පද්ධති, පිළිග ැනීම වත්මන් ඉල්ලීම්වලට සරිලන සේ ප්‍රමාණවත් නොවෙන්න පුළුවන්. නිදසුන් ලෙස මනෝ සමාජීය පුනරුත්ථාපනය වත්මන් පද්ධති තුළ නැහැ. නමුත් ඒවා විපතට පත් ප්‍රජාවන් විසින් ඉල්ලා සිටිය හැකි යි. කොහොම උනත් හානි පූර්ණ අවශ්‍ය කරන්නේ වින්දිතයින්ට හෙයින් ඔවුන්ගේ අවශ්‍යතාවන්ට ප්‍රමුඛතාව දිය යුතුව තිබෙනවා. එමනිසා මේවා නියත වශයෙන්ම වත්මන් අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි සංවර්ධනය කළ යුතු යි. අනුයාත ආණ්ඩු විසින් දශක ගණනාවක් පුරා සැලකිල්ලක් නැතිව සේවයේ යොදවා ගෙන තිබුණු එක්සත් ජනපද උපදේශකයෙකුවන ෆ්‍රෙඩි කනීගෙන් මට ලැබුණු උපදෙස් මත පුනරුත්ථාපන ලේකම් වශයෙන් මගේ සේවා කාලය තුළ නිර්මාණය කරන ලද (මම විශ්වාස කරනවා 1987 දී කියලා) ඒකාබද්ධ ආධාර වැඩසටහන මට මතකයි.  අලුත් ක්‍රමවේද සලකා බලන්නට හා පද්ධති හා ආයතන ශක්තිමත් කරන්නට ආණ්ඩුවට ඉඩ හරිමු. නව හානි පූර්ණ යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ කාල රාමු ගැන ජේන කීමට මට නොහැකි යි.

**සංක්‍රාන්ති යුක්තිය සම්බන්ධයෙන් සලකා බලන තාක් දුරට ප්‍රධාන ධාරාවේ මාධ්‍ය තුළ ප්‍රගතිය සඳහා යම් අවකාශයක් තිබේ ද? මෙම ක්ෂේත්‍රයේ වැදගත් ප්‍රශ්න වර්තමානයේ වාර්තා කරනුයේ අඩුවෙන් යයි ඔබ සිතනවා ද? ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානයේ වැදගත්කම පිළිබඳව වැඩි අවධානයක් ඇති කර ගත හැක්කේ කෙසේ ද?**

වැඩි දියුණු කිරීමක අවශ්‍යතාවක් තිබෙනවා කියලා මම විශ්වාස කරනවා. සංක්‍රාන්ත යුක්තිය හා ප්‍රතිසන්ධානය පිළිබඳ නිල ප්‍රකාශකයින් කිහිප දෙනෙක් ඉන්න බව මට සඳහන් කළ හැකියි. ඒ පිළිබඳව කතා කරන අය මට එක අතක ඇඟිලිවලින් ගණන් කරන්න පුළුවන්. එහෙත් ආණ්ඩුව විසින් සිදු කරන ලද සංක්‍රාන්ති ක්‍රියාවන්ට එරෙහිව බොහෝ  ඝෝෂාකාරී  හඬවල් ඇසිය හැකි යි. සංක්‍රාන්ති යුක්තියට පක්ෂ නොව විරුද්ධ බොහෝ දේවල්වලට වඩා වැඩි ප්‍රචාරයක් ලැබෙනවා. ප්‍රශ්නය රාජ්‍ය මාධ්‍යය හමුවට පැමිණෙනවිට වැඩි අවධානයක් නිර්මාණය කිරීම දේශපාලන ධූරාවලීන්ගේ වගකීමක් වෙනවා. එලෙසම ප්‍රශ්නය පෞද්ගලික මාධ්‍යය හමුවට පැමිණෙන විට ඔවුන් ප්‍රතිසන්ධානයට දායකත්වයක් දෙන්නට අපේක්ෂා කරන්නේ නම් එය පෞද්ගලික මාධ්‍ය ආයතන හිමිකරුවන්ගේ ද තවත් ගැටුමක් සිදු නොවිය යුතු යයි දැකීමට උනන්දුවන පුද්ගලයින් ලෙස හා අපේ දරු මුනුපුරු මිනිපිරියන්ට වඩා හොඳ ලෝකයක් හා රටක් වෙනුවෙන් දායකත්වය සපයන්නන් ලෙස විද්‍යාර්ථීන්, ලේඛකයන්, මාධ්‍යවේදීන්, කතුවරුන් ආදීන්ගේ ද වගකීමක් වෙනවා. එහෙත් මාධ්‍ය අංශය තුළ අපට එවැනි උදාර පරමාදර්ශ හා පරමාදර්ශීන් සිටිනවා ද? මට නම් සැකයි.

newyearsrilanka.blogspot.com



# සංක්‍රාන්තික යුක්තිය ඉටු කිරීමට තවමත් ප්‍රමාද නැත !

ලයනල් ගුරුගේ

සිංහල හින්දු අලුත් අවුරුදු සමය නිමා විය. අවුරුදු චාරිත්‍ර අතර සංක්‍රාන්තික කාලය යැයි විශේෂ කාල පරිච්ඡේදයක් නම් කර තිබේ. එය ඉතා වැදගත් අවස්ථාවකි. සියලු වැඩ අත්හැර ආගමික කටයුතුවල යෙදීම එහි ස්වභාවයයි. එනම් එය පෞද්ගලික අරමුණුවලට ලෝකෝත්තර අරමුණු වෙනුවෙන් කැපවෙන අවස්ථාවකි.

හින්දු ආගමික චාරිත්‍ර අතර ද මෙවැනි විශේෂ අවස්ථා පවතී. ඉස්ලාමිකයෝ තම උපවාස කාලය ජීවිතයෙහි ඉතා වැදගත් අවස්ථාවක් කොට සලකති. කිතුණුවෝ මහ සිකුරාදා දිනට පෙර මසක පමණ කාලයක් තමා ඉතා වැදගත් කොට සලකන කැමති ම ආහාරවලින් වැළකී සිටිති. මෙනයින් ශ්‍රී ලංකාවෙහි ජීවත්වන විවිධ ආගම්වලට අයත් ජනයාට සංක්‍රාන්තික කාලයක් පිළිබඳ සමීප අත්දැකීම් පවතී. එනම් එය ජීවිතයෙහි ඉතා වැදගත් කොටසක් බවට පත් ව ඇත.

මෑත අවදියෙහි සංක්‍රාන්තික යුක්තිය යන යෙදුම බහුල වශයෙන් වහරට එක්විය. තිස් වසරක් තිස්සේ ඇවිළ ගිය අති බිහිසුණු යුද්ධයක් නිමාවට පත් වීමෙන් පසු නැවත එවැනි තත්ත්වයක් ඇති නොවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම මෙහි සරල අදහසයි. දකුණු අප්‍රිකානු සත්‍ය හා ප්‍රතිසංවිධාන කොමිසමෙහි සාමාජිකයකු වන නීතිඥ හොවාර්ඩ් වානි පසුගිය දා ශ්‍රී ලංකාවට පැමිණ කළ දෙසුම් හා සාකච්ඡාවල දී ද සංක්‍රාන්තික යුක්තිය පිළිබඳව ඔහු සතු අගනා අත්දැකීම් සමුදායක් විවරණය කළේ ය.



යුද්ධයෙන් මියගිය දහස් ගණන් ජනතාව සහ කෝටි ගණන් වටිනා දේපළ සම්භාරය අනුව බලන විට පරාජයෙහි තරම පෙනේ. අවි බලය අනුව එක් පාර්ශ්වයක් දිනන විට මනුෂ්‍යත්වය පරාජයට පත් වෙයි. මනුෂ්‍යත්වයට ජයග්‍රහණය අත්පත් කර නොදුනහොත් යුද්ධය හට ගැනීම වැළැක්විය නොහැකි ය. එහෙයින් එය මනුෂ්‍යත්වයට අදාළ කරුණකි. සංක්‍රාන්තික යුක්තිය ඉෂ්ට කිරීම මගින් සිදු කෙරෙනුයේ අහිමි වූ මනුෂ්‍යත්වය යළි කැඳවීමෙන් ගිනිගත් හදවත් සංහිඳියාවෙන් මෘදු බවට පත් කරවීම ය.

හිටපු ජනපති මහින්ද රාජපක්ෂ විසින් පත් කරන ලද උගත් පාඩම් හො ප්‍රතිසංධාන කමිටු වාර්තාව ද සංක්‍රාන්තික යුක්තියට අදාළ කරුණු ගණනාවක් නිර්දේශ කරයි.

සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ වූ ක්‍රියාවලිය දෙස වපර ඇසින් බැලීමේ ප්‍රවනතාවක් ද දිස් වේ. යුද්ධයෙන් පසුව එය වීරත්වයට නැංවූ පාර්ශ්වයන්ට යුද මානසිකත්වයෙන් මිදීම අතිශය දුෂ්කර කටයුත්තකි. කිසිදු යුද්ධයකින් ජයග්‍රහණය කරන්නෙකු නැති. ජයගත් පාර්ශ්වය ද ලබා ඇත්තේ පරාජයකි. යුද්ධයෙන් මියගිය දහස් ගණන් ජනතාව සහ කෝටි ගණන් වටිනා දේපළ සම්භාරය අනුව බලන විට පරාජයෙහි තරම පෙනේ. අවි බලය අනුව එක් පාර්ශ්වයක් දිනන විට මනුෂ්‍යත්වය පරාජයට පත් වෙයි. මනුෂ්‍යත්වයට ජයග්‍රහණය අත්පත් කර නොදුනහොත් යුද්ධය හට ගැනීම වැළැක්විය නොහැකි ය. එහෙයින් එය මනුෂ්‍යත්වයට අදාළ කරුණකි. සංක්‍රාන්තික යුක්තිය ඉෂ්ට කිරීම මගින් සිදු කෙරෙනුයේ අහිමි වූ මනුෂ්‍යත්වය යළි කැඳවීමෙන් ගිනිගත් හදවත් සංහිඳියාවෙන් මෘදු බවට පත් කරවීම ය.

වින්දිතයන්හට සිදු වූ ශාරීරික හා දේපළ හානි, ඥාතීන් මිය යෑම යනාදී වශයෙන් කරුණු සියල්ල විමසා බලා හැකි පමණ පිළියම් යෙදිය යුතු ය. අවශ්‍ය වූ විට වන්දියක් ලබාදීම, ජීවිත නැවත ගොඩනැංවීම සඳහා පහසුකම් ලබාදීම යුද්ධයේ දී විරුද්ධ පාර්ශ්වය අතින් සිදු වූ වැරදි විමසා බලා සමාව දීම සඳහා වින්දිතයන් සූදානම් නොමැති නම් අවශ්‍ය නීතිමය පිළිසරණ ලබාදීම, වින්දිතයන් සහ චූදිතයන් පිළිබඳ සැබෑ යථාර්ථය ගවේෂණය කිරීම හා ඒ පිළිබඳ යළි සිතා බලන්නට දෙපාර්ශ්වය ම අවස්ථාව ලබාදීම, අහිමි වූ ඥාතින් සිහිපත් කිරීම හා අවශ්‍ය නම් ස්මාරක තනා ගැනීමේ නිදහස, මනුෂ්‍යයන් හැටියට ඔවුනට ලබාදීම යනාදී වශයෙන් සංක්‍රාන්ති යුක්තිය පිළිබඳව දිගු ක්‍රියාවලියක් පවතී.

යුද්ධයෙන් පසුව එහි ජයග්‍රහණය පිළිබඳ උද්දාමයෙන් ජනතාව මුසපත් කරවීම මිස ඊට වඩා මානුෂවාදී ක්‍රියා පිළිවෙතක් අනුගමනය කිරීමට පසුගිය රජය අපොහොසත් විය. එමෙන් ම උතුරු නැගෙනහිර ජනතාවට සිදුවූයේ අර්ධ මිලිටරි රාජ්‍යයක ජීවත් වීමට ය. හමුදාව සිවිල් කටයුතුවලට මැදිහත්වීමේ සීමාවක් නොවී ය. යුද්ධයෙහි දී හමුදාව බාරයේ තිබූ දෙමළ ජනයාට අයත් ඉඩම්වල හෝටල්, ගොවිබිම් සහ නොයෙකුත් ඉදිකිරීම් සිදුවූයේ හමුදාවේ මැදිහත්වීමෙනි. උතුරේ මෙන් ම දකුණේ ද මානව හිමිකම් කඩවීම් දිගට ම සිදු විය.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ අවධානය ශ්‍රී ලංකාව වෙත යොමුවූයේ



හමුදාව අත්පත් කරගෙන තිබූ ඉඩම්වලින් කොටසක් නැවත දෙමළ ජනතාවට ලබාදීම පැසසිය යුත්තකි. එහෙත් තවමත් විශාල ඉඩම් ප්‍රමාණයක් හමුදාව බාරයේ පවතී. හමුදාව නව තත්ත්වයට අනුගත කර ගැනීම දුෂ්කර කටයුත්තක් බව පෙනේ. පරාජිත පාර්ශ්වය ජාතික ආරක්ෂාවට තර්ජනයක් ඇති වී තිබේය යන මන්තරය මතුරන්නේ මෙවැනි වටපිටාවක ය.

එපරිද්දෙනි. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමක් පිහිටුවීමට ජනාධිපතිට සිදුවූයේ එක්සත් ජාතීන්ගේ බලපෑම අනුව ය.

එහෙත් එම කොමිසමෙහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සිදු වූයේ මන්දගාමීව ය. මේ නිසා ජාත්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වීමේ හා සම්බාධක පැනවීමේ අනතුරක් මතුවිය. *GSP+* සහනය අහිමි වීම, යුරෝපා සංගමය මෙරට මත්ස්‍ය අපනයනය අහෝසි කිරීම යනාදී වශයෙන් පැවතියේ අහිතකර තත්ත්වයකි. අර්ධ මිලිටරි රාජ්‍යයක ක්‍රියාකාරිත්වය හැම අතින්ම දිස් විය. දේශීය වශයෙන් ඊට එරෙහිව ආ ජන රැල්ලෙහි ප්‍රතිඵලය වූයේ ජනාධිපතිවරණයෙන් හා මහ මැතිවරණයෙන් පසුව නව නායකත්වයක් හා නව ආණ්ඩුවක් බිහි වීම ය.

යුද්ධයෙන් පසුව ඉෂ්ට නොවූ සැබෑ සංහිඳියාව ඇති කර ගැනීම සඳහා පියවර ගැනීම සම්මුති ආණ්ඩුවේ එක් පොරොන්දුවකි. එහෙත් නව රජයේ කටයුතු ද මන්දගාමී බව පෙනෙන්නට විය.

හමුදාව අත්පත් කරගෙන තිබූ ඉඩම්වලින් කොටසක් නැවත දෙමළ ජනතාවට ලබාදීම පැසසිය යුත්තකි. එහෙත් තවමත් විශාල ඉඩම් ප්‍රමාණයක් හමුදාව බාරයේ පවතී. හමුදාව නව තත්ත්වයට අනුගත කර ගැනීම දුෂ්කර කටයුත්තක් බව පෙනේ. පරාජිත පාර්ශ්වය ජාතික ආරක්ෂාවට තර්ජනයක් ඇති වී තිබේය යන මන්තරය මතුරන්නේ මෙවැනි වටපිටාවක ය.

එමෙන් ම සම්මුති ආණ්ඩුවේ වගකීම් ඉෂ්ට කිරීමට දැඩි අවධානයක් තම පක්ෂය ගොඩ නැගීම සඳහා කැපකරන්නට ජනාධිපතිවරයාට සිදුව තිබීම කණගාටුවට කරුණකි.

මෙහිදී ආණ්ඩුවේ මන්දගාමී පිළිවෙත සහ පක්ෂ දෙකේ සීතල බල අරගලය අනුව සංක්‍රාන්තික යුක්තිය ඉෂ්ට කිරීමේ බැරෑරුම් වගකීම දුර්වල වන අයුරක් පෙනේ. ජනාධිපතිවරයා තමා ඝාතනය කිරීමට තැත් කළ එල්ටීටීඊ සාමාජිකයාට සමාව දීම හොඳ පූර්වාදර්ශයකි. එමෙන් ම ජාතික ගීය දෙමළෙන් ගායනා කිරීමට ආරම්භ වීමත් යහපත් ආණ්ඩුකරණයකි. නමුත් මෙවැනි උඩ මට්ටමේ සිදුවීම්වලින් පමණක් සංහිඳියාව ගොඩනැගිය නොහැකි ය. එය බිම් මට්ටමේ සිට ඉහළටත්, ඉහළ සිට පහළටත් අවකව ම ඇති කළ යුතු වෙනසකි. නමුත් මේ වෙනස සිදුවන්නේ ඉබි ගමනෙනි.

මෙහි දී ජනමාධ්‍යයෙන් බහුතරය තවමත් පැවති ආණ්ඩුවේ සිංහලෝත්තමවාදී මතයට අනුව කටයුතු කරනු පෙනේ. ආණ්ඩුව මාධ්‍යයට බලපෑම් නොකරන නිසා මාධ්‍ය නිදහස අනිසි අයුරින් භාවිත කෙරේ. මෙහි දී ශක්තිමත් මාධ්‍ය ජාලයක් රජයට නොමැත. රජය සතු මාධ්‍ය ආයතන ප්‍රධානීන්ට සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ හරි දැක්මක් ද නොමැත.

මෙය මෙරට ජීවත්වන සියලු ජනවර්ගවලට ආගන්තුක දෙයක් නොවන බව වටහාදීමේ සන්නිවේදනය රජයට තිබිය යුතු ය. සියලු කලාකරුවන් සංක්‍රාන්තික යුක්තිය සම්බන්ධයෙන් නිර්මාණ ඉදිරිපත් කිරීම මෙන් ම භාවිතාව ද සාකච්ඡාව ද දුරස්ව සිටී. මේ මොහොතේ ඔවුනගේ වගකීම ද වන්නේ ඒ සඳහා සිය කලාව භාවිතයට ගැනීමයි.

සමාව දීම පිළිබඳ සද්චාරිත්‍රය මෙරට ජීවත්වන සියලු ආගමිකයන්ගේ දර්ශනවලට එකඟ ය.

සිංහල හින්දු අලුත් අවුරුදු සමය අර්ථවත් කෙරෙන එක් සිරිතක් වනුයේ මෙතෙක් තරහ මරහ තිබූ පාර්ශ්ව ද ඒවා අමතකර කර අවුරුදු කා ප්‍රීති වීම ය.

'අභය දානය' සංකල්පය රජ දවස ද පැවතිණ. දුටුගැමුණු එළාර යුද්ධය ජාතීන් දෙකක් අතර යුද්ධයක් නොව බල අරගලයක අවස්ථාවකි. එළාරගේ මිනිස්කම දුටුගැමුණු වටහා ගත්තේ ය. යුද්ධයෙන් ඇති වූ ජීවිත හානි පිළිබඳ වේදනාව ඔහුගෙන් පෙනිණ. එබඳු අතීත සම්ප්‍රදායක් ඇති රටක සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ අදහස ජන මනසට ගෙනෙමින් කෙටි කාලීන හා දිගු කාලීන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම රජයේ වගකීම වේ.

ජනාධිපතිවරයාගේ නිවුණු ස්වරය හා අගමැතිවරයාගේ විචක්ෂණභාවය අනුව ද සම්මුතියෙන් කටයුතු කිරීමේ ගුණය අනුව ද සිදු වී ඇති ප්‍රමාද දෝෂයන් නිවැරදි කර ගැනීම අසීරු නොවනු ඇත.

# නිමලරාජන්ගේ අම්මා

ආත්මය මිලානව තිබිණ

මම නිමල්ගේ අම්මාට ලියුමක් ලිව්මි

''කිසිදාක දැක නැති
දයාබර අම්මේ,
ඔබ දකින්නත් ආසයි
ඔබ දැක යන්න එන්නවත්
මුන් අපට ඉඩ දෙන්නෑ
අම්මාවරුන්වත් මෙහේ වුන් හඳුනන් නෑ
දරුකම කියන දේවත්
මේ කිසි කෙනෙක් දන් නෑ''

ඈ හැරෙන තැපෑලෙන්
මා අමතා තිබුණා ය
''පුතේ උඹේ අත් අකුරු
නිමල්ගේ අත් අකුරු වගෙමයි
උඹ බලන්නත් ආසයි''

ඇගේ ලිපියෙන්
මගේ ආත්මය යළි වරක් විකසිත විය

සියලු බැරියර් බිඳගෙන
මම ඈ දකින්නට ගියෙමි

ඇගේ ප්‍රේමය අබියස
දෙදණන් වැටී
ඉරි තැලුණු දෙපා සිම්බෙමි
''අම්මේ ඔබෙ දෙපා
අපේ අම්මගෙ දෙපා වගෙමයි''

ඇය නැඹුරු වී
ස්නේහයේ සුරතින්
මහිස පිරිමැද්දාය
''පුතේ උඹෙ හිස
නිමල්ගෙ හිස වගෙමයි''

මම සීරුවෙන්
ඈ අබියස සිට ගතිමි
''අම්මේ ඔබෙ සුරත
අපේ අම්මගෙ සුරත වගෙමයි''

ඇය නොසෙල්ලී
නෙතු පියන් නොසොල්ලා
මා දෙසම බලා උන්නා ය

මම සිනහසීමට අයත්න දැරිමි

''පුතේ උඹෙ සිනහව
නිමල්ගේ සිනහව වගෙමයි''

ඉක්බිති
ඈ දෙනෙත් අගිහින්
සිහින් දිය දහරක් ගලා හැලිණ

''අම්මේ ඔය කඳුළු
අපේ අම්මගෙ කඳුළු වගෙමයි''

**මංජුල වෙඩිවර්ධන**
(පිළිහුඩුවී කාව්‍ය සංග්‍රහයෙනි)





කිසිම මවක් තම දරුවා යුද්ධ කළ යුතුයැයි කියා හදා ගන්නේ නැහැ. සෑම ජීවිත නැතිවීමක්ම අතුරුදහන් වීමක්ම එම මවුවරුන්ට දහස් ගුණයක වේදනාවක් ලබා දෙනවා. පසුගිය දශක කීපයක යුද්ධය දහස් ගණන් ජීවිත අපට අහිමි කළා. පැහැරගැනීම් තුළින් අප සමාජයේ ඇතිව තිබෙන්නේ පිළිතුරක් නැති ප්‍රශ්න වැලක් පමණයි.

1. අපේ සංස්කෘතිය වැන්දඹුවන්ට නැවත කසාද බැඳීමේ අවස්ථාව උදාකරදේද?
2. යුද්ධය නිසා කී දෙනෙක් වැන්දඹුවන් වූවාද?
3. කාන්තාවක් පවුලකට නායකත්වය දීම සුළුපටු දෙයක්ද?
4. මැරුණු අයෙකුගේ සොහොන දැකීම තුළින් කී දෙනෙකුට සෙනෙහස ලැබෙයිද?
5. ඇඬීම තුළින් ප්‍රශ්න විසඳෙයි නම් ඒ කෙසේද?

මම මේ ප්‍රශ්නවලට උත්තර සොයමි. ඔබ ළඟ උත්තර තිබේ නම්....

චිත්‍රය : **සුසිමාන් නිර්මලවසන්**

# නිහඬ වින්දිතයෝ: ස්ත්‍රීන් සහ සංක්‍රාන්තික යුක්තිය




**රුවේන්දි වක්වැල්ල**


ශ්‍රී ලංකාව එහි නූතන ඉතිහාසය මුළුල්ලේම ඉක්මවාලිය නොහැකි පුරවැසියන් ප්‍රමාණයක් අවතැන් කරමින් හා ජීවිතවලට අහිමිකරමින් අවාසනාවන්ත බේදවාචකයන්ට මුහුණ දී තිබේ. සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලීන් සමයේ හා ඒ හා සමාන ක්‍රියාවලීන්හි දී දේශපාලන හිංසනයේ ආසන්න වින්දිතයින් ඉලක්ක කිරීම සම්ප්‍රදායික ස්වභාව ලක්ෂණයකි. කෙසේ වුව ද මෙය එලෙසම අනවධානීය ලෙස ගැටුමේ ද්විතීයික වින්දිතයින්, ප්‍රධාන වශයෙන් පවුලේ ස්ත්‍රී සාමාජිකයින් හා වින්දිතයින්ගේ ආදරණීයයන් මගහැර යන ලෝක දෘෂ්ටියකට



www.tsiuk.org

දායකත්වය දී තිබේ. සංක්‍රාන්ති යුක්ති යාන්ත්‍රණයන් පිළිබඳ බොහෝ අධ්‍යයනයන් ස්ත්‍රීන් ස්වකීය අවධානය කැප කළ යුතු හා වඩාත් ඉලක්ක කළ පිළියම් යෙදිය යුතු වෙනම අධ්‍යයනයක් ලෙස පිළිගැනීමට අසමත් ය. විශේෂයෙන්ම ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කල ස්ත්‍රීහු එහි විශේෂත්වය හේතු කොට ගෙන ලෝකය මුළුල්ලෙහිම වෙනත් ඕනෑම සිද්ධි අධ්‍යයනයකින් කැපී පෙනෙන අසීමිත දුෂ්කරතා සමුදායකට මුහුණ දෙති. ජනවාර්ගික අර්බුදය දශක ගණනාවක හිංසනය අවසන් කළා විය හැකි ය. නමුත් යුද්ධයේ කෲරකම්වලට භාජනයව සිටි ස්ත්‍රීන් සම්බන්ධව ස්ත්‍රී පුරුෂ සමාජභාව විශේෂිත ප්‍රශ්න යෝධ කන්දරාවක් නිරායාසවම නිර්මාණයකර තිබේ.

## අතුරුදහන්වීම්

අතුරුදහන් වූවන් පිළිබඳ කොමිසමේ මහජන අදහස් විමසීමේ සැසිවලට බහුලව පැමිණෙන හා පිටත විරෝධය පෑමෙහිලා එක් රොක්වන සිවිල් ජන සංඛ්‍යාව මෙම ප්‍රශ්නයට කඩිනම්ව ආමන්ත්‍රණය කිරීම හා අතුරුදහන් වූවන්ගේ සිද්ධි විමර්ශනය කිරීමේ නිසි ව්‍යුහයක් ස්ථාපිත කිරීම යන දෙකේම අවශ්‍යතාව ප්‍රකට කරයි. ශ්‍රී ලංකාවේ 1971 සිට 68,000ක් පමණ පුද්ගලයින් අතුරුදහන්ව තිබෙන බව හා ගණනය නොකර තිබෙන බව ඇස්තමේන්තු කර තිබේ. කොමිෂන් සභා පිළිබඳ විමසූ විට බොහෝ දෙනෙකු සිතන්නේ විමර්ශන විස්තීරණ නොවන හා විමර්ශන පවත්වන නිලධාරීන් ක්‍රියාවලිය තුළ එතරම් උනන්දුවක් නොදක්වන බව ය. ඔවුන්ගේ ආදරණීයයන් තව දුරටත් ජීවතුන් අතර නැති බව විශ්වාස කරන්නට ඔවුන්ව පෙළඹවීමට බොහෝ නිලධාරීන් උත්සුකවන බවට ඔවුහු චෝදනා කරති. ඔවුන් ''ඇතැම් විට මියගොස්'' ඇතැයි සැක කරමින් අතුරුදහන් වූ පුද්ගලයින් පිළිබඳව වූ අගමැතිවරයාගේ ප්‍රකාශය ද මෙය තහවුරු කර තිබේ. අයෙක් මෙම නැවත නැවත සිදුව තිබෙන අධෛර්යයට පත්වීම් සමග කෙනෙකු සිය ආදරණීයයන් සෙවීමේ බලාපොරොත්තුව හා ගැම්ම නැතිකර ගනු ඇතැයි සිතන්නට හැකි නමුත් එම න්‍යායට සම්පූර්ණ පරස්පරව සිතන ස්ත්‍රියක් මෙම ලේඛිකාවට මුණ ගැසුණි. තම අත්වල ලියුම් මිටියක් දරා ගෙන සිටි ඇය බලාපොරොත්තු රහිත ලෙස කියා සිටියේ මෙම ක්‍රියාවලියට සම්බන්ධව සිටින සියලු අධිකාරීන්ට ඇය ලියන ලද බවත් විවිධ පංගුපාර්ශවකරුවන් විසින් ඇයව යොමු කරන ලද පරිදි අවශ්‍ය සියලු පටිපාටි අනුගමනය කරන ලද බවත් එහෙත් කිසිදු ඵලයක් නොලැබුණු බවත් ය. ඇගේ සැමියා සෙවීමේ දී ඇගේ ජීවිතය සදහටම වෙනස් වූයේ කෙසේදැ යි විස්තර කරන විට අන්තිමට ඇය අඬා වැටුණා ය. අධිකාරීන් සැබෑ සාක්ෂි සහිතව ඇගේ සැමියාගේ මරණය පිළිබඳව ඇය දැනුවත් කරන ප්‍රවෘත්තිය දෙන තාක් කල් නොසැලී බලා සිටින්නට පවා ඇය සූදානම්ව සිටි බව පැවසුවාය. සිය ආදරණීයයන් තවමත් ජීවතුන් අතර සිටින්නේ යයි දැඩි ලෙස

විශ්වාස කරන හා ඔවුන් ඉන්නා තැනක් පිළිබඳව යම් තහවුරු කිරීමක් ලැබෙන තෙක් ඕනෑ තරම් දුරක් යාමට සූදානම් බොහෝ ස්ත්‍රීන් අතර ඇය එක් ස්ත්‍රියක් වන්නීය. මෙය සිදු වන්නේ මිය ගියා යයි අනුමානකර සිටි පුද්ගලයෙකු වඩාත් මෑත දී යලි මතු වූ ගමන්ම වාගේ ය. ඉහත කී ස්ත්‍රිය ඉතා දැඩි උවමනාවකින් වෙලී ගත් බලාපොරොත්තුවේ සේයාව වූයේ මෙය යි. තවත් අවස්ථාවක දී අවුරුදු ගණනාවක් තිස්සේ සිය තරුණ දියණියගේ අතුරුදහන්වීම ගැන සොයමින් සිටින අතරතුර සිය දියණිය ජනාධිපති සිරිසේන ළඟින් සිටින ඡායාරූපයක් ජනාධිපතිවරණ පෝස්ටරයක පළ වීමෙන් සිද්ධිය පිළිබඳව කෙරෙමින් විමර්ශනය විශ්මිත ආකාරයකට හැරුණු සිද්ධියට අදාළ කාන්තාවකගේ කතාව දැක්විය හැකි ය. එහෙත් කාරණය මහජන අවධානයට යොමුවෙමින් තිබියදීත් ඇය තවමත් ඇගේ දියණිය සම්බන්ධ යම් ප්‍රතිචාරයක් ලැබෙන තුරු බලා සිටී.

අතුරුදහන් වූවන් පිළිබඳ ප්‍රශ්නය ස්ත්‍රීන් සම්බන්ධයෙන් වෙනත් දුෂ්කරතාවන් ගණනාවක් ඇති කිරීමට හේතු වී තිබේ. බොහෝ විට අතුරුදහන්ව තිබෙන්නේ ගෙදර පිරිමියා ය (සැමියා, පුතුන්). එය ස්වයංක්‍රීයවම ස්ත්‍රියට ගෘහයේ ප්‍රධාන ජීවිකාව සපයන්නාගේ තතත්ත්වයට පත්වීමට බලකරන්නක් වී තිබේ. මෙම ස්ත්‍රීන් බොහොමයකට සම්පත් හෝ ලාභ උපයන වෘත්තීන්වල නියැලෙන්නට අවශ්‍ය අධ්‍යාපනය නැති නිසා ස්ත්‍රී මූලික ගෘහයන් ආර්ථික දුෂ්කරතාවන්ගෙන් බහුලව පවතී. මෙම ස්ත්‍රීන්ට ඔවුන්ගේ ආදරණීයයන් ඉන්නා තැන තහවුරු කිරීම ඔවුන්ගේ ප්‍රශ්නය සමාප්තියකට පත් කරයි. මෙය රාජ්‍ය ආයතන විසින් නිරර්ථක යයි සලකනු ලබන සංකල්පයකි. එහෙයින් මේ සම්බන්ධ ප්‍රතිචාරයක් ඔවුන්ගේ ජීවිතය පවත්වාගෙන යාමට සැලකිය යුතු අන්දමින් ආධාර කරනු ඇත.

1970 ගණන්වල හා 1980 ගණන්වල අම්මලා හා ආත්තම්මලා ක්‍රියාකාරී වූ හා අවසානයේ දී අතුරුදහන් වූවන් පිළිබඳ ජාතික කොමිසම (CONADEP) ස්ථාපිත කිරීමට මග පෑදූ ආර්ජන්ටිනාවේ සිද්ධිය මගින් පෙන්වා දී පරිදි විමර්ශන ඉදිරියට තල්ලු කිරීමෙහි හා වරදකරන ලද්දන් නීතියේ රැහැනට අසුකර ගැනීමෙහිලා ගතික භූමිකාවක් රඟපාන්නට ස්ත්‍රීන්ට පුළුවන. ආර්ජන්ටිනාවේ අතුරුදහන් වූවන් පිළිබඳ ජාතික කොමිසම එහි පශ්චාත් ජුන්ටා පාලන සමයෙහි දීර්ඝ සත්‍ය හා යුක්ති ක්‍රියාවලියක් ආරම්භ කළේ ය. 1980 බලහත්කාර හෝ අනිච්ඡානුග අතුරුදහන්වීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ වැඩ කණ්ඩායම පිහිටුවීමේ දී ද එම අම්මාවරු හා ආත්තම්මාවරු උපකාරී වූහ. එලෙස ඔවුහු සංක්‍රාන්ති යුක්ති භාවිතයන්හි දී ස්ත්‍රීන්ට රඟ පෑ හැකි හා ඔවුන් රඟ පෑ යුතු තීරණාත්මක කාර්යභාරය අවධාරණය කළහ. සංක්‍රාන්ති යුක්තිය උදෙසා මෙම ආණ්ඩුව දී ඇති පොරොන්දුව හා අතුරුදහන් වූවන් සම්බන්ධ කාර්යාලයක් පිහිටුවීමට දී ඇති පොරොන්දුව තිබෙන හෙයින් ස්ත්‍රීන් ඔවුන්ගේ ආදරණීයයන් ඉන්නා තැන් පිළිබඳව ඔවුන්ට තහවුරුවීම ලැබෙන තාක් ඔවුන් ගෙන ඇත ගැම්ම අත් නොහළ යුතු ය. අතුරුදහන් වූවන් පිළිබඳ ප්‍රශ්නය 2009 ගැටුම අවසන් වීමෙන් පසු උතුරේ හා නැගෙනහිර ස්ත්‍රීන් විසින් මුහුණ දෙනු ලැබ තිබෙන ප්‍රශ්නයක් පමණක් නොවේ. 1970

**ශ්‍රී ලංකාවේ ගැටුමේ කාල පරිච්ඡේදය තුළ ස්ත්‍රීන්ට එරෙහිව ලිංගික හිංසනය යොදා ගෙන තිබෙන අවස්ථා ප්‍රමාණයෙහි හිඟයක් තිබී නැත. වඩාත් අවධානයට යොමු කළ යුතු හා පැහැදිලි දෙය වන්නේ එහි අවසානයේ පටන් ගැටුම බහුලව පැවති ප්‍රදේශවල ලිංගික හිංසනය වැඩිවී තිබෙනවාය යන්න ය.**

ශ්‍රී ලංකාවේ හිටපු සටන්කරුවෝ විශේෂයෙන්ම හිටපු ස්ත්‍රී එල්ටීටීඊ සටන්කාරිනියෝ පශ්චාත් ගැටුම් සමාජයට නැවත ඒකාබද්ධකර ගැනීම සම්බන්ධයෙන් ගත් කල සුවිශේෂ දුෂ්කරතාවන්ට මුහුණ දෙති. එල්ටීටීඊය පැවති සමයේ දී මෙම ස්ත්‍රීන් සලකනු ලැබුවේ අධිකාරියකින් හා ගෞරවයකින් යුතුව ය. ඔවුහු තමන් අනාගත දමිළ ජනතාව නියෝජනය කරන බව හා ඔවුන් වෙනුවෙන් සටන් කරන බව විශ්වාස කළහ.

ගණන්වල අවසන් වූ කැරලිවල සිට දකුණේ ද ස්ත්‍රීහු තවමත් සිය ආදරණීයයන් සොයති. මෙය උතුරේ හා දකුණේ ස්ත්‍රීන් එකට බඳින වැදගත් පුරුකක් ද ස්ත්‍රීන් ශක්තිමත් බලයක් ලෙසින් එකට එක්ව දැන ගැනීමට තිබෙන සිය අයිතිය පිළිගන්නැයි ආණ්ඩු ක්‍රියාධරයන්ට එත්තු ගැන්වීමට උපයෝගීකර ගත හැකි පුරුකක් ද වේ.

## ලිංගික හිංසනය

මතක්කර ගැනීම සඳහා බොහොමයක් ඇති හෙයින් ගැටුම හා පශ්චාත් ගැටුම සමයේ ස්ත්‍රීන්ට එරෙහි ලිංගික හිංසනය පිළිබඳ ලබාගත හැකි සිද්ධි අධ්‍යයනයන්හි බහුලත්වය සඳහන් කිරීමට ලේඛිකාව අපේක්ෂා නොකරයි. ස්ත්‍රීන්ට එරෙහි ලිංගික හිංසනය පිළිබඳ කතිකාව පැහැදිලි ය. එය ආධිපත්‍යය යෙදවීමේ, භීතිය කාවැද්දීමේ හා අධිකාරියට අභියෝග කිරීමට අපේක්ෂා කරන ඕනෑම අයෙකු යටත් බවට පත්කර ගැනීමේ අවියක් ලෙස පොදුවේ යොදා ගනු ලබන්නකි. ශ්‍රී ලංකාවේ ගැටුමේ කාල පරිච්ඡේදය තුළ ස්ත්‍රීන්ට එරෙහිව ලිංගික හිංසනය යොදා ගෙන තිබෙන අවස්ථා ප්‍රමාණයෙහි හිඟයක් තිබී නැත. වඩාත් අවධානයට යොමු කළ යුතු හා පැහැදිලි දෙය වන්නේ එහි අවසානයේ පටන් ගැටුම බහුලව පැවති ප්‍රදේශවල ලිංගික හිංසනය වැඩිවී තිබෙනවාය යන්න ය. ස්ත්‍රී වින්දිතියට සිය යුක්තිය සොයා යන ගමනේ දී වරදකරන ලද්දවුන් විසින් තර්ජනය කරන ලද හා ශාරීරික වශයෙන් පවා ඇය හිංසනයට පත් කරන ලද 2010 විශ්වමඩු සිද්ධිය මෙම හිංසනයට පත් ස්ත්‍රීන් යුක්තිය සොයා යන ගමනේ දී ඔවුන් විසින් මුහුණ දෙනු ලබන්නා වූ බරපතල බාධක හා වැළැක්වීම් පැහැදිලිව විදහා දක්වයි. අවසානයේ යාපනේ මහාධිකරණය මෙම වසරේ දී ඇයට එරෙහිව අපරාධ කරන ලද්දවුන්ට ඔවුන්ගේ අපරාධ සම්බන්ධයෙන් ජීවිතාන්ත  දඬුවමක් නියම කරමින් දෙන ලද හිතකර තීන්දුව දිරි ගන්වන්නකි. මෙය 2001 මන්නාරමේ දී සමූහ දූෂණයකට ලක්කරන ලද ස්ත්‍රීන් දෙදෙනා වෙනුවෙන් ගොනු කරන ලද නඩුවේ තත්ත්වයට මුළුමනින්ම ප්‍රතිකූල ය. මන්නාරම නඩුවේ දී වින්දිත දෙදෙනා මහත් කෲරත්වයකට මුහුණ දුන් අතර නඩුව නතරකර දමනු ලැබීය. මෙය අවාසනාවන්ත ලෙස ගැටුම සමයෙහි ලිංගික හිංසනයට අදාළ බොහෝ නඩුවලට බොහෝ නරක ලෙසින් බලපෑ අතර ප්‍රතිඵල වශයෙන් එවැනි නඩු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ දී රටේ නීති පද්ධතියේ ඇති අප්‍රමාණවත්භාවය දැකීමෙන් පසු අනෙකුත් වින්දිතයින් ඒවාට එරෙහිව ඉදිරිපත් නොවන විට එය අසාධාරණයේ චක්‍රයකට මග පෑදී ය.

මෙම ප්‍රශ්නයේ බර අසමත් අධිකරණයක් කෙරෙහි රඳා පවතින තරමටම  සමාජයේ පීතෘමූලික සාරධර්ම කෙරෙහි ද විශාල වශයෙන්  රඳා පවතියි. පංගු පාර්ශවකරුවන් සමාජ විනාශයේ බෙහෙවින් විශාල පරාසයකට ස්ත්‍රීන්ට එරෙහි හිංසනය දායක වන්නේ කෙසේ දැ යි දැකීමට යළි යළිත් අසමත්ව තිබේ. පුරුෂයින්ට එරෙහි හිංසනය හා ස්ත්‍රීන්ට එරෙහි හිංසනය කේවල හා විශේෂිත අවධානය යොමු කිරීම අවශ්‍ය කරන අධ්‍යයනයන් දෙකකි. පවුලක අභිමානය රැඳී පවතින්නේ ප්‍රධාන වශයෙන් ම ස්ත්‍රී සාමාජිකයින්ගේ පවිත්‍රතාවය තුළ ය. ස්ත්‍රී සාමාජිකයින් ලිංගික හිංසනයට භාජනය වන විට පවුල් ඒකකය අනිවාර්යයෙන්ම විසිරී යාමට පටන් ගනී. සමාජය



www.tsiuk.org

ඔවුන් බැහැර කිරීමට පටන් ගන්නා අතර තරුණ අවිවාහක ස්ත්‍රීන් සම්බන්ධ කාරණයේ දී ඔවුහු විවාහයක් සඳහා සුදුසු අයෙකු සොයා ගැනීමේ දුෂ්කරතාවට මුහුණ දෙති. අනුයාත ශ්‍රී ලංකා ආණ්ඩු ඉහළ මට්ටම්වලදී පවා ලිංගික හිංසනයන් සිදු වූ බව දැන සිටි බවට හා ලිංගික හිංසනය පිළිබඳ සිද්ධිවලට, විශේෂයෙන්ම ආරක්ෂක හමුදා අතින් සිදු වූ ඒවාට ආමන්ත්‍රණය කිරීමෙහිලා සැකමුසුව ක්‍රියා කළ බවට විශ්වාස කළ හැකි බලගතු සාක්ෂි තිබේ. රජය සාර්ථක සංක්‍රාන්ති යුක්ති යාන්ත්‍රණයකට කැපවීමට අපේක්ෂා කරන්නේ නම් ලිංගික හිංසනය හදිසි හා කඩිනම් අවධානය යොමු කිරීම අවශ්‍ය ප්‍රධාන සංරචකයක් ය යන්න පැහැදිලිව පිළිගත යුතු ය. මේ සීමාව දක්වා ලිංගික හිංසන නඩු කඩිනම් කළ යුතු අතර වින්දිතයින් පැමිණිලි ගොනු කිරීමෙන් හෝ යුක්තිය අපේක්ෂා කිරීමෙන් කිසිදාක අධෛර්යයට පත් නොකරන බවට සහතික කෙරෙන පියවර ගත යුතු ය. මෙම ප්‍රශ්න පිළිබඳව වැඩි බලපෑමක් ඇති කරනු පිණිස නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ස්ත්‍රීන් සඳහා ස්වාධීන කොමිසමක් පත් කිරීමේ විධිවිධාන ඇතුළත් කළ යුතු ය.

## යුද වැන්දඹුවෝ/හිටපු සටන්කරුවෝ

ගැටුම හේතු කොට ගෙන යුද වැන්දඹුවන් විශාල වශයෙන් පීඩාවට පත් වී තිබේ. ඔවුන්ගේ සැමියන් අහිමි වීමත් සමග මෙම ස්ත්‍රීන් නිරායාසවම පවුලේ එකම ජීවිකා වෘත්ති උපයන්නන් බවට පත් ව තිබෙන අතර ඔවුන්ගේ මූල්‍ය කරදර ඉහළ නංවමින් තම විස්තෘත පවුල් රැක බලා ගැනීමට ද බොහෝ දෙනාට සිදුව තිබේ. මෙම ස්ත්‍රීන්ගෙන් විශේෂයෙන් උතුරු පළාතේ ස්ත්‍රීන්ගෙන් බොහෝ දෙනාට කිසිදු සාධ්‍ය ආදායම් මාර්ගයක් නොමැති හෙයින් (තිරසර වෘත්තියක් සඳහා තරග වැදීමට කිසිදු අධ්‍යාපන හෝ වෙනත් සුදුසුකම් ඔවුන් බොහෝ දෙනෙකුට නොමැති හෙයින්) ආදායමක් උපයා ගැනීම සඳහා ලිංගික වෘත්තියට හැරෙනු විනා වෙනත් විකල්පයක් ඔවුන්ට ඉතිරි වී නැත. ඔවුන්ට ආධාර කිරීම සඳහා ආණ්ඩුව විසින් බොහෝ උත්සාහයන් ගනු ලැබ තිබුණ ද ඒවා ඔවුන්ගේ අපේක්ෂාවන්ගේ මට්ටමට අඩු ය. එක් සිද්ධියක් මගින් පෙන්නුම් කර තිබෙන පරිදි යුද වැන්දඹුවන්ට ආදායම් උපයා ගැනීමේ මාර්ගයක් ලෙස ගව දෙනුන් ලබා දී තිබුණ ද එම බොහෝ ගව දෙනුන් වඳ හෝ ලෙඩ උන් වී තිබේ. එලෙස  මෙම ස්ත්‍රීන් යම් නිෂ්පාදනයක් ලබා ගැනීමට සමත්ව ඇත්තේ ගවයින් ඔවුන්ට අනවශ්‍යවන තෙක් හා ඇතැම් විට ඔවුන්ගේ වියදම්වලට එකතුවක් කරන තෙක් පළමුවන මාස දෙක සඳහා පමණි. මෙය අවධාරණය කරන්නේ යුද්ධයේ දී විපතට පත් ස්ත්‍රීන් මෙම ක්‍රියාවලියේ දී වැදගත් පංගු පාර්ශ්වකරුවන් ලෙස පිළිගැනීමේ හා මෙම ස්ත්‍රීන් සමග අදහස් හුවමාරුකර ගැනීමේ මුලපිරුම් පිහිටුවා ගැනීමේ අවශ්‍යතාවයි. එසේම වැඩිදුර කාර්යක්ෂමතාව සඳහා මෙම මුලපිරුම් අධීක්ෂණය කිරීම ද වැදගත් ය.

ශ්‍රී ලංකාවේ හිටපු සටන්කරුවෝ විශේෂයෙන්ම හිටපු ස්ත්‍රී එල්ටීටීඊ සටන්කාරිනියෝ පශ්චාත් ගැටුම් සමාජයට නැවත ඒකාබද්ධකර ගැනීම සම්බන්ධයෙන් ගත් කල සුවිශේෂ

සංක්‍රාන්ති යුක්ති මුලපිරුම්වලට මුහුණ දෙන ස්ත්‍රීන්ට සංගතියෙන් යුතුව වැඩ කිරීම සහතික කිරීම සඳහා ප්‍රමාණවත් ලෙස හානි පූර්ණ ලබා දිය යුතු ය, සත්‍යයට සේවය කළ යුතු ය, ඔවුන්ට හා ඔවුන්ගේ පවුල්වලට එරෙහිව කරන ලද අපරාධවලට යුක්තිය ඉටු කළ යුතු ය. ආරක්ෂාව හා නැවත ඇති නොවීම පිළිබඳ සහතික විය යුතු ය. පුරවැසියන් හා සිවිල් සමාජය ලෙස, පවුල හා ඇගේ පුරුෂවර්ගයා ලෙස මෙම සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලිය සමයේ කිසිදාක බලාපොරොත්තු කඩවීමේ, අධෛර්යයටපත් කරනු ලැබීමේ තනි කරනු ලැබීමේ හැඟීමක් ඇති නොවීම ස්ත්‍රීන්ට සහතික කිරීම අපේ යුතුකම ය.

දුෂ්කරතාවන්ට මුහුණ දෙති. එල්ටීටීඊය පැවති සමයේ දී මෙම ස්ත්‍රීන් සලකනු ලැබුවේ අධිකාරියකින් හා ගෞරවයකින් යුතුවය. ඔවුහු තමන් අනාගත දමිළ ජනතාව නියෝජනය කරන බව හා ඔවුන් වෙනුවෙන් සටන් කරන බව විශ්වාස කළහ. කෙසේ වුව ද යුද්ධයේ පසු අදියරයන්හි දී මෙම ස්ත්‍රීන්ගෙන් බොහෝ දෙනා ආරක්ෂක හමුදාවන්ට භාර වූ අතර පුනරුත්ථාපන කඳවුරුවලට යවනු ලැබිණ. ඔවුන් නිදහස් කරනු ලැබීමෙන් පසු ජනතාව වෙනුවෙන් සටන් කළ තමන් එම ජනතාව විසින්ම මග හරිනු ලබන්නේ යයි දැන් ඔවුහු සිතති. ඔවුන් සමග සම්මුඛව සාකච්ඡාවන්හි යෙදුණ විට මෙම ස්ත්‍රීන් කණගාටුවෙන් සඳහන් කළේ මේ ආකාරයෙන් ජීවත් වීමට බල කරනවා වෙනුවට යුද්ධය ඔවුන්ගේ ජීවිත ගත්තා නම් හොඳ යයි ඔවුන් කල්පනා කරන බව ය. සමාජය ඔවුන් සැක කරන නිසා ආරක්ෂක පියවරක් ලෙස මෙම ස්ත්‍රීන්ගෙන් බොහොමයක් විවාහයට එළඹි බව ප්‍රකාශ කරති. එහෙත් එක් ස්ත්‍රියක් ප්‍රකාශ කළ පරිදි ඇගේ සැමියා ඇය සැක කරන්නට පටන් ගෙන තිබේ. ඔහුගේ ආකල්පයෙහි අසාධාරණ වෙනස අවසානයේ දී ඔවුන්ගේ වෙන්වීමට මග පාදන තෙක්ම එන්ට එන්ටම ඔහු ඇය සැක කරන්නට වී තිබේ. පාලනයේ වෙනස ආරක්ෂක හමුදාවන්ගේ බලෙන් ඇතුළු වීමේ අඩුවක් ඇතිකර තිබේ දැ යි විමසූ විට පාලනයන් දෙක සම්බන්ධයෙන්ම ඇගේ උදාසීන ආකල්පය හඟවමින් ඇය ප්‍රකාශ කළේ හුදෙක් මාස තුනකට පෙර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පැමිණ ඇයගෙන් ප්‍රශ්න කළ බව ය. කුලය මත පදනම්ව වෙනස් කොට නොසලකීමේ මූලධර්මයක් පැවති එල්ටීටීඊ ව්‍යුහය යටතේ පුරුෂ සටන්කරුවන් සමග විවාහ වූ ස්ත්‍රී සටන්කාරිනියන් පිළිබඳ වාර්තා තිබේ. එහෙත් ඔවුන් භාර වීමෙන් හා සමාජයට අනුකලනය වීමෙන් පසු කුල වෙනස්කම සම්බන්ධ පීඩනය නැඟී ඇති අතර සැමියන් ඔවුන්ගේ බිරියන් අත්හැරීමට එය පැහැදිලිවම හේතු වී තිබේ. එවැනි ප්‍රශ්නවලට ආමන්ත්‍රණය කිරීම පිණිස මුල පිරුම් ගණනාවක් සැලකිල්ලට ගත යුතු ය. ඒවා නම් (ඒවාට පමණක් සීමා විය යුතු නොවේ) ස්ත්‍රීන් සඳහා ඉහළ ආදායමක් උපයා දෙන විශේෂිත පුහුණුවක් සපයන සරල මෙවලම්වලින් ඔබ්බට යන වෘත්තීය පුහුණුවක් ලබා දීම, ඔවුන් පිළිබඳ මුලපිරුම් සැලසුම් සකස් කිරීමට උත්සාහ කරන විට ස්ත්‍රීන්ගේ අදහස් ලබා ගැනීම, මෙම ස්ත්‍රීන්ගේ අවශ්‍යතාවන්ට ආමන්ත්‍රණය කරන දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම හා ඔවුන් වඩා හොඳට සමාජයට ඒකාබද්ධවිය හැකි වන සේ ඒ වටා සාකච්ඡාවක් ව්‍යාප්ත කිරීම හා අනෙක් ඒවා අතර හමුදාහරණයෙහි වැඩිවීමක් ඇති කිරීම වැනි ඒවා ය.

## සමාප්තිය

දිගට ඇදී ගිය ගැටුමේ අවසානයත් සමග ස්ත්‍රීන් පෙරට වඩා තවදුරටත් කේවෙල් කරන තත්ත්වයක් දක්නට තිබේ. ද්වීතියික වින්දිතයින්, ස්ත්‍රීන් ගැටුම් සමයේ වඩාත් වැඩියෙන් පීඩාවට පත් වූයේ වුව ද ආධාර ඉල්ලා ඔවුන් නැගූ හඬ කිසිදිනෙක නෑසී ගියේ නැත. පළාත් පාලනයේ ස්ත්‍රීන්ගේ කෝටාවක් හඳුන්වාදීමේ මෑත මුල පිරුම් හා ශ්‍රී ලංකාවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පිළිබඳ අවශ්‍යතාව ප්‍රකාශයට පත් කිරීමත් සමග ස්ත්‍රීන්ගේ තත්ත්වයෙහි කැපී පෙනෙන වර්ධනයක් දැකිය හැකිවනු ඇතැයි අපේක්ෂාවක් තිබේ. ගැටුම් සමය තුළ පටවන ලද බාධක, වාර්ගිකත්වය, ඉකුත් එදිරිවාදිකම්, නිෂේධාත්මක ආකල්ප හා යල්පැනගිය පීතෘමූලිකත්වය පැත්තකට දැමීම සඳහා කාලය ළඟා වෙමින් තිබේ. සංක්‍රාන්ති යුක්ති මුලපිරුම්වලට මුහුණ දෙන ස්ත්‍රීන්ට සංගතියෙන් යුතුව වැඩ කිරීම සහතික කිරීම සඳහා ප්‍රමාණවත් ලෙස හානි පූර්ණ ලබා දිය යුතු ය, සත්‍යයට සේවය කළ යුතු ය, ඔවුන්ට හා ඔවුන්ගේ පවුල්වලට එරෙහිව කරන ලද අපරාධවලට යුක්තිය ඉටු කළ යුතු ය. ආරක්ෂාව හා නැවත ඇති නොවීම පිළිබඳ සහතික විය යුතු ය. පුරවැසියන් හා සිවිල් සමාජය ලෙස, පවුල හා ඇගේ පුරුෂවර්ගයා ලෙස මෙම සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලිය සමයේ කිසිදාක බලාපොරොත්තු කඩවීමේ, අධෛර්යයටපත් කරනු ලැබීමේ තනි කරනු ලැබීමේ හැඟීමක් ඇති නොවීම ස්ත්‍රීන්ට සහතික කිරීම අපේ යුතුකම ය.

# ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති යුක්තිය

## සංක්‍රාන්ති යුක්තිය යනු කුමක්ද?

ප්‍රචණ්ඩ ගැටුම් ක්‍රියාදාමයකට පසු, සමාජයක් තුළ අතීතයේ සිදුවූ හිංසාකාරී උල්ලංඝනයන් සමඟ අනුයෝජනය වෙමින්, එම උල්ලංඝනයන් පිළිබඳ වගවීම සහතික කරගැනීමට හා සංහිඳියාව ළඟා කරගැනීමට එම සමාජය විසින් දරණ ප්‍රයත්නයන් හා සබැඳි ක්‍රියාවලීන් හා යාන්ත්‍රණයන් සමුදායයි

### දැනු ගැනීමට ඇති අයිතිය

සත්‍යය දැනු ගැනීමට වින්දිතයන්ට මෙන්ම සාමූහිකයක් ලෙස සමාජයටද ඇති අයිතිය

මතකය සංරක්ෂණය කිරීමට රජයට ඇති වගකීම

### යුක්තියට ඇති අයිතිය

සාධාරණ සහනයන් ලබා ගැනීම සඳහා වින්දිතයන්ට ඇති අයිතිය

විමර්ශනය පැවැත්වීමට සහ නඩු පැවරීමට රජයට ඇති වගකීම




### හානි පූරණයට ඇති අයිතිය

හානි පූරණය කර ගැනීමට වන්දි ලබා ගැනීම සඳහා වින්දිතයන්ට ඇති අයිතිය

පරිපූර්ණ හානි පූරණ ප්‍රතිපත්තියක් සහ වැඩසටහන් ලබා දීමට රජයට ඇති වගකීම

### නැවත සිදු නොවෙන බව සහතික කිරීම

නව දුරටත් ප්‍රචණ්ඩ ක්‍රියා සිදු වීමෙන් ආරක්ෂා වීමට වින්දිතයන්ට සහ සමාජයට ඇති අයිතිය

ප්‍රතිසංස්කරණ සිදු කිරීමට සහ නැවත සිදු වීම වැළැක්වීමට රජයට ඇති වගකීම

## 2015 දී රජය ලබා දුන් පොරොන්දු

| දැනු ගැනීමට ඇති අයිතිය | යුක්තියට ඇති අයිතිය | හානි පූරණයට ඇති අයිතිය | නැවත සිදු නොවෙන බව සහතික කිරීම |
|---|---|---|---|
| සත්‍යය, යුක්තිය, සංහිඳියාව සහ නැවත සිදුවීම වැළැක්වීම සඳහා කොමිෂන් සභාව<br><br>අතුරුදහන් වූවන් සඳහා වන කාර්යාලය<br><br>පෙර පැවති විමර්ශන කොමිෂන් සභාවල වාර්තා ප්‍රසිද්ධ ලෙස ප්‍රකාශයට පත් කිරීම<br><br>මානව හිමිකම් සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම සම්බන්ධ වාර්තා සංරක්ෂණය කිරීම/ආරක්ෂා කිරීම | විශේෂ නීතිඥවරයෙක් සහිත, පොදු රාජ්‍ය මණ්ඩලයේ සහ වෙනත් විදේශීය විනිසුරුවන්, විදේශීය වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයන් සහ බලයලත් අභිචෝදකයන් සහ විමර්ශකයින්ගේ සහභාගීත්වයෙන් යුත් අධිකරණ යාන්ත්‍රණයක්<br><br>මාධ්‍යවේදීන්ට, මානව හිමිකම් ආරක්ෂකයන්ට, සුළු ආගමික කොට්ඨාසවලට, සිවිල් සමාජයේ සාමාජිකයනට සහ ආගමික ස්ථානවලට ප්‍රහාර එල්ල කළ වැරදිකරුවන්ට නඩු පැවරීම<br><br>වධ හිංසා, ස්ත්‍රී දූෂණ සහ ලිංගික ප්‍රචණ්ඩත්වය සඳහා වගකිව යුතු අය වගවීමට සැලැස්වීම<br><br>එල්.ටී.ටී.ඊ.ය මගින් සිදු කළ උල්ලංඝනයන් සහ අපරාධ සඳහා වගවීමට සහ සංහිඳියාවට මුල පිරීම | හානි පූරණය සඳහා වන කාර්යාලය<br><br>සිවිල් වැසියන්ට අයත් ඉඩම් ආපසු දීම<br><br>හමුදාකරණය ඉවත් කිරීම<br><br>අතුරුදහන්වූවන්ගේ පවුල්වලට අතුරුදහන් බවට වූ සහතික ලබා දීම | ශ්‍රී ලංකා රජයේ පොරොන්දු ක්‍රියාවට නැංවීම සඳහා දේශීය නීති ප්‍රතිසංස්කරණය<br><br>ආරක්ෂක අංශයේ ප්‍රතිසංස්කරණයන්<br><br>සාක්ෂිකරුවන් සහ වින්දිතයන් ආරක්ෂා කිරීමේ නීති සමාලෝචනය<br><br>මාධ්‍යවේදීන්ට, මානව හිමිකම් ආරක්ෂකයන්ට, සුළු ආගමික කොට්ඨාසවලට, සිවිල් සමාජයට සහ ආගමික ස්ථානවලට ප්‍රහාර එල්ල කිරීම වැළැක්වීම<br><br>ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ අදාළ පනත් සමාලෝචනය කර අවලංගු කිරීම<br><br>බලහත්කාරයෙන් සිදු කරනු ලබන අතුරුදහන් කරවීම්වලට එරෙහි ජාත්‍යන්තර ප්‍රඥප්තිය අත්සන් කර අපරානුමත කිරීම සහ අතුරුදහන් කරවීම අපරාධ වරදක් ලෙස නීතිගත කිරීම<br><br>දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන් ක්‍රියාවට නැංවීම<br><br>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඔස්සේ දේශපාලන විසඳුමක් ලබා දීම |

ඒකමතිකව සම්මත වූ A/HRC/RES/30/1 යෝජනා සම්මුතය මගින් මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයාගේ කාර්යාලය සහ විශේෂ කාර්ය පටිපාටි සඳහා වටිනයෝග ලැබ ඇති පුද්ගලයන් සමඟ සම්බන්ධ වීම ඇතුළුව, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සුරැකීමේ සහ සංක්‍රාන්ති යුක්තියේ ප්‍රමිතිමාන සම්බන්ධයෙන් පුළුල් රාමුවක් සපයනු ලැබේ

වැඩි විස්තර සඳහා පිවිසෙන්න:
WWW.TJSRILANKA.ORG

20 වසරක් CPA 1996-2016

ISSN 955-1800-0061